INTERNATIONAL
CENTRE FOR
ETHNIC STUDIES

# නිදන්ගතව, මුල්බැසගෙන ඇති ශ්‍රී ලංකාවේ ජනවාර්ගික - ආගමික ප්‍රචණ්ඩත්වය



ගෙහාන් ගුණතිලක

# නිදන්ගතව, මුල්බැසගෙන ඇති
# ශ්‍රී ලංකාවේ
# ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය

**ගෙහාන් ගුණතිලක**

**ජනවාර්ගික අධ්‍යයනය සඳහා වන අන්තර් ජාත්‍යන්තර කේන්ද්‍රය**
**(International Centre for Ethnic Studies)**
**සහ**
**මානව හිමිකම් අධ්‍යාපනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රය**
**(Equitas)**

නිදන්ගතව, මුල්බැසගෙන ඇති ශ්‍රී ලංකාවේ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය - 2018

© 2017, ජනවාර්ගික අධ්‍යයනය සඳහා වන අන්තර් ජාත්‍යන්තර කේන්ද්‍රය සහ මානව හිමිකම් අධ්‍යාපනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රය

2, කින්සි ටෙරස්,
කොළඹ 08,
ශ්‍රී ලංකාව.

විද්‍යුත් ලිපිනය: admin@ices.lk
වෙබ් : www.ices.lk

ISBN 978-955-580-215-4

Copyright to this publication belongs to the International Centre for Ethnic Studies (ICES) and Equitas – International Centre for Human Rights Education. Any part of this book may be reproduced with due acknowledgement to the author and the publishers. The interpretations and conclusions expressed in the study are those of the author and do not necessarily reflect the views and policies of the ICES, Equitas or the donor. This publication is made possible with the financial support of the Government of Canada provided through Global Affairs Canada.

මුද්‍රණය
හොරයිසන් ප්‍රින්ටින් (පෞද්.) සමාගම
1616/6, හතරමං හන්දිය,
මාළඹේ පාර, කොට්ටාව,
පන්නිපිටිය.

කවර නිර්මාණය: නිෂිකා ෆොන්සේකා

# නිදන්ගතව, මුල්බැසගෙන ඇති
# ශ්‍රී ලංකාවේ
# ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය

**ගෙහාන් ගුණතිලක**

---

**ගෙහාන් ගුණතිලක** ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ අන්තර්ජාතික මානව හිමිකම් නීතිය පිළිබඳ ආචාර්ය උපාධි අපේක්ෂකයෙකි. එමෙන්ම ඔහු වෙරිටේ රිසර්ච් ආයතනයේ පර්යේෂණ අධ්‍යක්ෂ තනතුර ද, අන්තර්ජාතික මානව හිමිකම් සම්මුතීන් හා එකඟත්වය පළ කිරීම සම්බන්ධව විදේශ කටයුතු අමාත්‍යංශයේ උපදේශක තනතුර ද හොබවයි.

# නිදන්ගතව, මුල්බැසගෙන ඇති ශ්‍රී ලංකාවේ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය

**ගෙහාන් ගුණතිලක**

## පටුන

සංක්ෂිප්තය 3

පර්යේෂණ ක්‍රමය සහ ප්‍රවේශය 7

**පළමු පරිච්ඡේදය: පසුබිම සහ නව වර්ධනයන් 9**

1.1 ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය අරුත් ගැන්වීම 9

1.2 ඉකුත් සොයාගැනීම් සහ නිර්දේශයන් 13

1.3 නව වර්ධනයන් 16

1.3.1 සිංහල-බෞද්ධ කලහකාරී කණ්ඩායම් ප්‍රධාන ධාරාව බවට පත්වීම 19

1.3.2 මුස්ලිම් කල්ලි වාදය 23

1.3.3 දමිළ-හින්දු වාදය කරලියට පැමිණීම 28

**දෙවන පරිච්ඡේදය: සමකාලීන ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය 33**

2.1 සුළුතර කණ්ඩායම්වලට එරෙහි ප්‍රචණ්ඩත්වය 33

2.1.1 මුස්ලිම් භක්තිකයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය 33

2.1.2 ක්‍රිස්තියානි භක්තිකයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය 39

2.2 ඉරි තැලීම් යෑම් 45

2.2.1 සමාජ-සංස්කෘතික ඉරි තලා යෑම් 45

2.2.2 ආර්ථික ඉරි තලා යෑම් 53

2.2.3 දේශපාලනික ඉරි තලා යෑම් 57

**තුන්වන පරිච්ඡේදය: ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වයේ මුල් බැස ගැනීම** **62**

3.1 රාජ්‍යය සහ සුළු ජාතික සබඳතා 62

3.2 මුල්බැසගත් ප්‍රචණ්ඩත්වයේ කාරකයන් 70

3.2.1 හිමිකාරීත්ව සංකීර්ණය 72

3.2.2 පැවැත්ම පිළිබඳ හීතීන් 81

3.2.3 බෞද්ධ ආශ්‍රමික ව්‍යතිරේකවාදය 86

**හතරවන පරිච්ඡේදය: ජනවාර්ගික-ආගමික සබඳතා පරිණාමනය කිරීම** **93**

4.1 සංස්කෘතික සුජාතභාවය 93

4.2 සාමාන්‍ය සුචරිතයන් සහ සංස්කෘතික පරිණාමනය 96

# තුති පිදුම

මෙහි අත්පිටපත් සහ අදහස් සමාලෝචනයටත්, වටිනා ප්‍රතිචාරයන් ලබාදීමටත් තම කාලය නොමසුරුව වැය කිරීම වෙනුවෙන් ආචාර්ය මරියෝ ගෝමස්, ආචාර්ය බෙන්ජමින් ෂොන්ටාල්, ආචාර්ය කුමුදු කුසුම් කුමාර, ශමාරා වෙත්තමුණි, සන්ජයන් රාජසිංහම්, ආචාර්ය නිශාන් ඩි මෙල්, ආචාර්ය ගොඩ්ෆ්‍රි ගුණතිලක, ආචාර්ය නිමල් ගුණතිලක, ඩිලන් පෙරේරා, සරින්ද පෙරේරා, දීපාංජලී අබේවර්දන සහ මොහොමඩ් ආසීම් යන අයට කතුවරයා බෙහෙවින්ම කෘතඥ වේ. එසේම මෙම අධ්‍යයනයේ විෂය පථය සහ අන්තර්ගතය හැඩ ගැස්වීමෙහි ලා මෙහි ප්‍රකාශකයින් වන ජනවාර්ගික අධ්‍යයනය සඳහා වන ජාත්‍යන්තර කේන්ද්‍රයට (ICES) සහ මානව හිමිකම් අධ්‍යාපනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රයට (Equitas) කතුවරයා ණයගැති වේ.

කවරය නිර්මාණය කිරීම වෙනුවෙන් නිෂිකා ෆොන්සේකාටත්, සංස්කරණය සහ සෝදුපත් බැලීම වෙනුවෙන් ශානි ජයවර්ධනටත් කතුවරයා සහ ප්‍රකාශකයින් විශේෂයෙන්ම ස්තුතිවන්ත වේ. එලෙසින්ම ජනවාර්ගික අධ්‍යයනය සඳහා වන ජාත්‍යන්තර කේන්ද්‍රයේ කාර්ය මණ්ඩලයටද පර්යේෂණ දත්ත වෙත ප්‍රවේශය ලබාදීමෙන් දැක්වූ සහාය නොමඳව අගය කෙරෙනා බවද පැවසිය යුතුවේ.

# සංක්ෂිප්තය

2015 ජනවාරියේ දී වූ ප්‍රජාතාන්ත්‍රික සංක්‍රාන්තිය මගින් ශ්‍රී ලංකාවේ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වයට තිත තැබීම සඳහා ප්‍රතිඥා ලබා දුනි. නමුත් මේ මොහොත වනතුරුත්, ශ්‍රී ලංකාවේ පශ්චාත් යුධ තත්වය මගින්, කිසිදු ප්‍රතිවිපාකයකින් තොරව ප්‍රචණ්ඩ ක්‍රියා සිදුකරනා කලහකාරී කණ්ඩායම් සඳහා සහාය දැක්වීම මගින් එවැනි ප්‍රචණ්ඩ ක්‍රියා සඳහා හැකියාව ලබාදී ඇත. මෙසේ ගත් විට මෛත්‍රීපාල සිරිසේනගේ මැතිවරණ ජයග්‍රහණය වඩාත් සැලකිල්ලට ගත යුතු පරිද්දෙන් මහින්ද රාජපක්ෂගේ පරාජය රටේ පශ්චාත් යුධ අන්තර්-ප්‍රජා සබඳතාවන් විෂයෙහි හැරවුම් ලක්ෂ්‍යයක් ලෙසින් විදහා දැක්වුණි. සිරිසේනගේ ජයග්‍රහණය මහින්ද-විරෝධී බලවේගයන්ගේ සන්ධානයක් මගින් සිදුවූ අතර, එයට ආගමික සුළුතරයන්ද ඇතුළත් වුණි. කෙසේ වුවත් එයින් වසර තුනකට වැඩි කාලයක් ගත්වූ පසුවත්, ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය අවසන් කිරීමේ ප්‍රතිඥාව තවමත් සාක්ෂාත් වී නොමැත.

උග්‍ර සහ නිදන්ගතඃ ශ්‍රී ලංකාවේ පශ්චාත් යුධ සාමය ආගමික ප්‍රචණ්ඩත්වය (The Chronic and the Acute: Post-War Religious Violence in Sri Lanka) යන මැයින් වූ[1] 2015 වසරේ අධ්‍යයනයෙන් කතුවරයා විසින් ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය තීව්‍රතාවය අනුව වූ පරාසයක වර්ගීකරණය කරන්නට යෙදිණි. එනම්ඃ (1) නිදන්ගත දුස්සාධ්‍ය ප්‍රචණ්ඩත්වය, එනම් දිගින් දිගටම පවතින අඩු තීව්‍රතාවයක ප්‍රහාර, සහ (2) හදිසි උග්‍ර ප්‍රචණ්ඩත්වය, එනම් තනි තනිව සිදුවන දැඩි-තීව්‍රතාවයක ප්‍රචණ්ඩ සිදුවීම් ලෙසිනි. මෙම ප්‍රවර්ගයන් අපට සමකාලීන ශ්‍රී ලංකාවේ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය තව දුරට නොනැසී පවතින්නේදැයි වටහා ගැනීමට සහාය වනු ඇත. එක් අතකින් බලන විට සිරිසේන ජනපති ධුරයටපත් වූ පසුව හදිසියේ සිදුවන උග්‍ර ප්‍රචණ්ඩ ක්‍රියා අඩු වූ බවට පොදු සම්මුතියක් වේ. අනෙක් අතට රට පුරාම නිදන්ගත ප්‍රචණ්ඩ ක්‍රියා දිගින් දිගටම පවතී. ශ්‍රී ලංකාවේ නිදන්ගත ප්‍රචණ්ඩ ක්‍රියා සඳහා ප්‍රේරකයන් වන්නේ කුමක්ද යන්න තවදුරටත් මෙම සංසිද්ධිය මගින් පිළිබිඹු වේ. යම් කිසි ප්‍රචණ්ඩත්ව ආකාරයන් රාජ්‍ය අනුග්‍රහය මත නොයැපෙන අතර ගැඹුරින් නිදන්ගත වූ අවිචාරාත්මක පූර්ව මතයන් සහ විශ්වාසයන්ගෙන් පැන නගින බවත් සහ එවැනි ප්‍රචණ්ඩත්වයන් ප්‍රජාතාන්ත්‍රික සංක්‍රාන්තීන්ගෙන් වෙනස් කළ නොහැකි බවත් මෙයින් පෙන්නුම් කරයි. එසේම ශ්‍රී ලංකාවේ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වයේ මුල් බැසගෙන තිබිය හැකි ස්වභාවයද මෙයින් පෙන්නුම් කරයි.

ශ්‍රී ලංකාවේ ප්‍රචණ්ඩත්වය රඳා පැවතීම සම්බන්ධයෙන් අනන්‍යතා දේශපාලනයද ප්‍රධාන භූමිකාවක් දරා සිටී. ශ්‍රී ලාංකිකයින් ප්‍රධාන වශයෙන්ම තමන්ව ජනවාර්ගික සහ ආගමික

1 ගෙහාන් ගුණතිලක, The Chronic and the Acute: Post-War Religious Violence in Sri Lanka (Equitas සහ ICES 2015).

පෙළ ඔස්සේ හඳුන්වාගනී. එනමුත් රාජේෂ් වෙනුගෝපාල්[2] සහ ඩේවිඩ් ස්මොක්[3] ඇතුළු උගතුන් විසින් නිරීක්ෂණය කරන්නට යෙදුණේ, ජනවාර්ගිකත්වය සහ ආගම සමීපව අතිපිහිත වන බැවින්[4] ශ්‍රී ලංකාවේ ජනවාර්ගිකත්වය සහ ආගමික අතර රේඛාව බොහෝ විට බොඳ වී තිබෙනා බවයි. මෙම සන්දර්භයේ දී, ශ්‍රී ලංකාව තුළ පිරිසිදු 'ජනවාර්ගිකත්ව' හෝ 'ආගමිකත්ව' අනන්‍යතාවයකින් වෙනස්ව හඳුනාගත හැකි 'ජනවාර්ගික-ආගමික' අනන්‍යතාවයක සංකල්පිතයක් පැන නැගුණි. මෙම අනන්‍යතා කණ්ඩායම් වලට 'සිංහල-බෞද්ධ', 'මුස්ලිම්' (වැඩි වශයෙන් ඉස්ලාමයේ අනුගාමික යෝනකයින්ගෙන් සැදි) සහ 'හින්දු' (වැඩි වශයෙන් දමිළ ජනවර්ගයෙන් සැදි) ඇතුළත් විණි.[5] තවදුරටත් රෝමානු කතෝලික, ප්‍රොතෙස්තන්ත භක්තිකයින් සහ වෙනත් වර්ගයන්ගෙන් සමන්විත ක්‍රිස්තියානුවන් අවිකල්පයෙන්ම 'ජනවාර්ගික-ආගමික' අනන්‍යතාවයන් දරා සිටිනා අතර; ජනවර්ගය සම්බන්ධයෙන් ගත් විට ක්‍රිස්තියානි භක්තිකයින් සාමාන්‍යයෙන් සිංහල, දමිළ සහ බර්ගර් ප්‍රජාවන්ට අයත් වෙයි.

මෙම විවිධ කණ්ඩායම් වල ජනවිකාස සංකීර්ණත්වය මගින් පෙන්වා දෙන්නේ ශ්‍රී ලංකාවේ වර්ගවාදී ප්‍රචණ්ඩත්වය තුළ ගැඹුරෙහි ගැබ්වූ සංකීර්ණත්වයයි. මෙවැනි ප්‍රචණ්ඩත්වයේ මුල්බැසගත් ස්වභාවය, මෙවැනි ප්‍රචණ්ඩ ක්‍රියා පසුපස එහි පාලනය ඇති අනන්‍යතා දේශපාලනය හුදු 'ආගමික' ලෙසින් නොව 'ජනවාර්ගික-ආගමික' ලෙසින් සංකල්පනය කළ විට ඇතැම් විට වඩා හොඳින් තේරුම් ගැනීමට හැකිවනු ඇත. ආගමට වඩා අනන්‍යතා සලකුණක් ලෙසින් ජනවාර්ගිකත්වය වඩාත් මුල්බැසගෙන ඇති බව නොකිවමනායි. එනිසා ශ්‍රී ලංකාවේ සමකාලීන වර්ගවාදී ප්‍රචණ්ඩත්වයට හේතු විසංයෝජනය කිරීම සඳහා, ජනවාර්ගිකත්වය සහ ආගම එක්ව සංකීර්ණයක් - ජනවාර්ගික-ආගමික පෙළ මත මුල්බැසගත් අනන්‍යතාවයක් නිර්මාණය කරනා ආකාරය වටහා ගැනීම වැදගත් වනු ඇත.

මෙම අධ්‍යයනය මගින් ශ්‍රී ලංකාවේ පශ්චාත්-2015 ජනවාරි සන්දර්භය තුළ අන්වේෂණය කරමින්, ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය - විශේෂයෙන්ම එහි නිදන්ගත ආකාරයෙන් පැවතුනේ කෙසේදැයි යන්න විමසා බලනු ඇත. මෙම අධ්‍යයනය මගින් ප්‍රශ්න දෙකක් නැගීම ඉලක්ක කරගනු ඇත. එනම්ඃ ශ්‍රී ලංකාවේ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය සඳහා නිධාන හේතු මොනවාද? එවැනි හේතු සම්බන්ධයෙන් ආමන්ත්‍රණය සඳහා කුමනාකාරයේ මැදහත්වීම් අවශ්‍ය වේද? යන ඒවායි.

---

2. ෆ්‍රාන්සිස්ස්ටුවර්ට්, 'Religion versus Ethnicity as a Source of Mobilisation: are there differences?' Crise කාර්ය පත්‍රය අංක (ජූලි 2009), පිටුව8, රාජේෂ්වෙනුගෝපාල්ව උපුටමින්.

3 ඩේවිඩ් ස්මොක්, 'Religion in World Affairs: Its Role in Conflict and Peace'" එක්සත් ජනපද සාම ආයතනයේ 201විශේෂ වාර්තාව(2008 පෙබරවාරි), පිටුව2.

4 ස්ටුවර්ට්, පෙර සඳහන්, පිටුව8.

5 ජනගහණයෙන් 74.9%ක් සිංහලයන්ගෙන් සැදුම් ලබයි. දමිළයින් (වතුකරය පදනම් වූ 'ඉන්දියානු සම්භවය සහිත දමිළ' ලෙසින් හැඳින්වෙන 4% ද සමග) 15.2%ක් වන අතර, ජනගහණයෙන් 9.2%ක් යෝනකයන්ගෙන් සැදුම් ලබයි. ජනගහණයෙන් 70% කටත් අධික ප්‍රමාණයක් බෞද්ධ වේ. හින්දූන්, මුස්ලිමුන් (එනම් ඉස්ලාම් භක්තිකයින්) සහ ක්‍රිස්තියානුවන් පිළිවෙලින්12.6%, 9.7% සහ 7.4% ලෙසින් ජනගහණය නියෝජනය කරයි. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ Census of Population and Housing of Sri Lanka (2012) බලන්න.

මෙම අධ්‍යයනය පරිච්ඡේද සතරකින් ඉදිරිපත් කර තිබේ. මුල් පරිච්ඡේදයෙන් ශ්‍රී ලංකාවේ 'ජනවාර්ගික-ආගමික' අනන්‍යතාවය සාකච්ඡාවට බඳුන් කිරීම සහ එම අනන්‍යතාවයේ සංකල්පනය කතුවරයාගේ මින් පෙර අධ්‍යයනයේ ප්‍රධාන සොයාගැනීම් වෙත සම්බන්ධ කිරීමත් කෙරේ. දෙවන පරිච්ඡේදය මගින් ශ්‍රී ලංකාවේ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වයේ වත්මන් තත්වය විශ්ලේෂණය කෙරේ. එහිදී ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සන්ධානය (NCEASL) සහ මුස්ලිම් මහලේකම් කාර්යාලය වැනි රාජ්‍ය නොවන සංවිධාන මගින් එක් රැස් කළ දත්ත මත පදනම්ව මෙම ප්‍රචණ්ඩත්වයේ නවතම සංඛ්‍යාලේඛනයන් පිරික්සයි. එම පරිච්ඡේදය ඉන් අනතුරුව රටේ හඳුනාගත් ස්ථානයන්හි ක්‍රියාත්මක කරනු ලැබූ පර්යේෂණයන් මත පදනම් වූ ස්ථානගත ඉරිතලා යෑම් විශ්ලේෂණයට බඳුන් කරයි. තුන්වන පරිච්ඡේදය මගින් ශ්‍රී ලංකාවේ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වයේ සුවිශේෂී ලක්ෂණ විශ්ලේෂණය කරන අතර, 2015 ජනවාරි මස සිදුවූ ප්‍රජාතාන්ත්‍රික සංක්‍රාන්තියට පසුවත් මෙවැනි ප්‍රචණ්ඩත්වයක් පවතින්නේ මන්ද යන්න පිළිබඳව උපකල්පිතයක් ලබාදේ. මෙහි දී මෙවැනි ප්‍රචණ්ඩත්වය මුල්බැස ගැනීම සඳහා හේතුවන කාරකයන් අඩු තරමින් තුනක්වත් තිබෙනා නිසා, ශ්‍රී ලංකාවේ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය ප්‍රජාතාන්ත්‍රික සංක්‍රාන්තියකින් පමණක් වැළැක්විය නොහෙන බවට තර්ක කොට සිටී. එම කාරකයන් නම්: සිංහල-බෞද්ධ බහුතරයේ පවත්නා හිමිකාරීත්ව සංකීර්ණය, සිංහල-බෞද්ධ බහුතරය තුළ පැවැත්ම පිළිබඳව ඇති භීතීන් සහ බෞද්ධ සංඝයා වහන්සේලාට සලසා දී ඇති සුවිශේෂී තත්වය හෙවත් ව්‍යතිරේකත්වය වේ. මෙම අධ්‍යයනයේ අවසන් පරිච්ඡේදය මගින් මැදිහත්වීම සඳහා වන උපාය මාර්ගයන් සාකච්ඡා කෙරේ. එයින් ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වයට එරෙහිව සටන් කිරීම සඳහා මෑතකදී උපයෝගී වූ උපාය මාර්ගයන්ගේ බලපෑම මෙන්ම තිරසාර සාම ස්ථාපන සහ මානව හිමිකම් අධ්‍යාපනය ලබාදීමේ මුල්පිරීම් වල සඵලතාවය තක්සේරු කරන්නට යෙදේ. ශ්‍රී ලංකාවේ පවත්නා ජනවාර්ගික - ආගමික ප්‍රචණ්ඩකාරකයන්ට අභියෝග කිරීම සංස්කෘතික පරිවර්තන ක්‍රියාවලියක් තුළින් හැකිවනු ඇතිද යන්න ප්‍රත්‍යවේක්ෂණය කරමින් මෙම පරිච්ඡේදය සමාප්ත වේ.

## පර්යේෂණ ක්‍රමය සහ ප්‍රවේශය

මෙම අධ්‍යයනයෙන් පර්යේෂණ ගැටළු දෙකකට පිළිතුරු ලබාදීමට බලාපොරොත්තු වේ:

1. ශ්‍රී ලංකාවේ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වයේ ප්‍රධානතම කාරකයන් මොනවාද?
2. ශ්‍රී ලංකාවේ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වයේ කාරකයන් නැති කිරීම සඳහා අවශ්‍ය වන මැදිහත්වීම් මොනවාද?

මෙම පළමු ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා, 2015 නව රජය පත්වීමේ සිට දිගින් දිගටම පැවතුනු ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වයේ යටින් දිවෙන සමාජ-සංස්කෘතික, ආර්ථික සහ දේශපාලනික ඉරිතැලීම් මෙම අධ්‍යයනය මගින් පිරික්සනු ලැබේ. මෙම අධ්‍යයනය

පෙර පැවති ඉරිතැලීම් වලට මෙන්ම මෙවැනි ප්‍රචණ්ඩත්වයන්ට සම්බන්ධ නව වර්ධනයන් වෙතද අවධානය යොමු කොට සිටී. දෙවෙනි ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා, අධ්‍යයනය මගින් අතීතයේ නිර්දේශ කෙරුණු මැදිහත්වීම් ඇගයුම් කරන අතරම, ශ්‍රී ලංකාවේ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වයේ මුල් ඇදුණු හේතු හා කටයුතු කිරීම සඳහා වඩාත් රැඩිකල් මැදිහත්වීම්වල අවශ්‍යතාවයද තක්සේරු කර සිටී.

මෙම අධ්‍යයනය, ප්‍රමාණාත්මක සහ ගුණාත්මක සංරචකයන් සහිත මිශ්‍ර ක්‍රමවේදී ප්‍රවේශයක් යොදාගෙන ඇත. ප්‍රමාණාත්මක තලයේදී එය ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සන්ධානය (NCEASL) සහ මුස්ලිම් මහලේකම් කාර්යාලය වැනි රාජ්‍ය නොවන සංවිධානවලින් එක් රැස් කරගත් ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය පිළිබඳ දත්ත උපුටා දක්වමින් විශ්ලේෂණය කරයි. එසේම එය නිශ්චිත ස්ථානයන්හි දේශපාලන හා ජනවිකාස සංයුතීන් සහ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩ ක්‍රියාවන් ඇතිවීම් අතර සම්බන්ධතාවයන් සළකුණු කිරීම සඳහා, ඡන්ද ප්‍රකාශ කිරීමේ රටාවන් සහ ජනවිකාස දත්ත පිරික්සා බලයි. මෙම විශ්ලේෂණය ගොඩනැංවෙන්නේ කතුවරයාගේ මින් පෙර කෘතිය වූ The Chronic and the Acute මතයි.

ගුණාත්මක මට්ටමේදී මෙම අධ්‍යයනය මගින් ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වයට හේතු පිළිබඳ තොරතුරු එක් කිරීම සහ විශ්ලේෂණය කිරීම සඳහා ඇරඹුමක් ගනී. මෙම හේතු විශ්ලේෂණය සඳහා මෙය ප්‍රකාශිත ග්‍රන්ථ, නව වාර්තාවන් සහ උනන්දුව දක්වන්නන්ගේ දෘෂ්ටීන් මත යැපේ. කතුවරයා විසින් කල්මුණේ සහ සායින්දමරුදු (අම්පාර දිස්ත්‍රික්කයේ), කාත්තාන්කුඩි සහ මඩකලපුව නගරය (මඩකලපුව දිස්ත්‍රික්කය), යාපනය සහ කුරගම යන නගරයන්හි වැසියන් හා සිවිල් සමාජ නියෝජනය කරන්නන් සමගින් සම්මුඛ සාකච්ඡාවන් සිදුකොට ඇත. එසේම මඩකලපුව, කල්මුණේ සහ සායින්දමරුදු වල ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා සීමිත සංඛ්‍යාවකටද කතුවරයා සහභාගී වී ඇත. මේ එක් එක් ස්ථානයක් හඳුනාගෙන ඇත්තේ සමකාලීන ජනවාර්ගික-ආගමික සබඳතාවන්ට අදාළ විවිධ සාධක මත පදනම් වෙමිනි. පළමු සාධකය සම්බන්ධ වන්නේ අභ්‍යන්තර මුස්ලිම් කල්ලි වාදයටයි. කාත්තාන්කුඩි, කල්මුණේ සහ මඩකලපුව වැනි ප්‍රදේශ තෝරා ගැනුනේ මුස්ලිම් ප්‍රජාව තුළ නැග එන්නා වූ ආතතීන් සහ දුක්ගැනවිලි සමහරක් පිළිබඳ වඩාත් හොඳ අවබෝධයක් ලබාගැනීමේ ඉලක්කය සමගිනි. දෙවනුව, කල්මුණේ සහ මඩකලපුව ප්‍රදේශ, ජනවාර්ගික-ආගමික ගැටුම් වල ප්‍රධාන කාරකයක් වන සම්පත් සඳහා වන අන්තර්-ප්‍රජා තරඟය අවබෝධ කරගැනීම සඳහා වැදගත් වේ. තුන්වනුව යාපනය තෝරාගැනීම තිබුණේ, නවමු ජනවාර්ගික ආතතියක් අනාගතයේදී නිර්මාණය කිරීමට ශක්‍යතාවක් ඇති ප්‍රපංචයක් වන දමිළ-හින්දුවාදය පිළිබඳ ගැටළුවේ ප්‍රධාන නිරීක්ෂකයින් හා සම්බන්ධවීමේ අරමුණ සහිතවයි. අවසාන වශයෙන් කුරගල තෝරාගැනී තිබුණේ ශුද්ධ වූ භූමියක් වෙනුවෙන් සුවිශේෂී ස්ථානගත අර්බුදයක් තිබෙනා නිසාවෙනි. මෙය සිංහල බෞද්ධ කලහකාරී කණ්ඩායම් සහ මුස්ලිම් බැතිමතුන් අතර ජනවාර්ගික-ආගමික ගැටුමක් පිරික්සිය හැකි විෂය අධ්‍යයනයක් ලෙසින් ප්‍රයෝජනවත් විණි.

මෙම ප්‍රමාණාත්මක සහ ගුණාත්මක විශ්ලේෂණයන් හරහා පහත කල්පිතය ස්ථාපනය කිරීම සඳහා මෙම අධ්‍යයනය සැරසී සිටී. ශ්‍රී ලංකාවේ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය සංස්කෘතික, සමාජ-දේශපාලනික සහ රාජ්‍ය ව්‍යුහයන් තුළ 'මුල් බැසගෙන' ඇති හෙයින්, ඒ මැඩපැවැත්වීම සඳහා රැඩිකල් මැදිහත්වීම් අවශ්‍ය වේ. ශ්‍රී ලංකාවේ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය හා සටන් වැදීම උදෙසා නව්‍යනිර්දේශයන් පද්ධතියක් සඳහා පසුබිම සකස් කිරීම මෙම කල්පිතයේ ඉලක්කයයි. මෙවැනි නිර්දේශයන් මගින් උත්සාහ ගැනෙන්නේ ප්‍රචණ්ඩත්වය මැඩපැවැත්වීම පමණක් නොවේ. අනාගතයේදී නිදන්ගත සහ හදිසියේ මතුවන ප්‍රචණ්ඩ ක්‍රියා තිරසාරව වැළැක්වීම සඳහා වන කතිකාවන් පරිණාමනයට බඳුන් කිරීමද එහි අරමුණ වනු ඇත.

# පළමු පරිච්ඡේදය
# පසුබිම සහ නව වර්ධනයන්

## 1.1 ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය අරුත් ගැන්වීම

ප්‍රචණ්ඩත්වය නිර්වචනය කිරීම 'ප්‍රචණ්ඩ ලෙසින්ම අසීරු' යැයි විලෙම් ඩි හාන් නිරීක්ෂණය කරන්නේ එහි ඇති 'බහුවිධ දෘෂ්ටීන්' සහිත ස්වභාවය නිසාවෙනි.[6] ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන ප්‍රචණ්ඩත්වයේ ස්වභාවය අවබෝධ කර ගැනීම උදෙසා වර්ගීකරණ අක්ෂයන් දෙකක් ප්‍රයෝජනවත් වනු ඇත. අනෙක් අතට යම් විටක ප්‍රචණ්ඩත්වය එහි තීව්‍රතාවය අනුව 'නිදන්ගත' තත්වයේ සිට 'ක්ෂණික උග්‍ර' තත්වය දක්වා වූ පරාසයක වර්ගීකරණය කිරීමට හැකිවනු ඇත. මෙම අධ්‍යයනය The Chronic and the Acute හි'නිදන්ගත ප්‍රචණ්ඩත්වය' යන්න දිගින් දිගටම පවතින, අඩු තීව්‍රතාවයක් සහිත ප්‍රහාර ලෙසින් නිර්වචනය වී ඇත. මෙවැනි ප්‍රචණ්ඩත්වයට වෛරී අදහස් සහිත ව්‍යාපාරයන් සහ ප්‍රචාරයන්, තර්ජනයන්, බියවැද්දීම්, බලාත්කාරකම් හෝ බලපෑම්, සුළු දේපළ හානි සහ ඉඳ හිට සිදුවන ශාරීරික අඩන්තේට්ටම් ඇතුළත් වේ.[7] මෙයට ප්‍රතිවිරුද්ධ ලෙසින් 'ක්ෂණික උග්‍ර ප්‍රචණ්ඩත්වය', පොදුවේ සිදුවන ශාරීරික ප්‍රහාරයන්, දේපළ හානි සහ පොදුවේ නීතියේ සහ සාමයේ බිඳ වැටීම ඇතුළත්ව ඉහළ තීව්‍රතාවයක් සහිතව විටින් විට ඇතිවන ප්‍රචණ්ඩත්වය ලෙසින් නිර්වචනය වේ.[8] අනෙක් අතට ප්‍රචණ්ඩත්වය එහි ස්වරූපයෙන් ගෙන වර්ගීකරණය කිරීමද කළ හැක. එනම් ශාරීරික, ශාරීරික නොවන සහ ව්‍යුහාත්මක ලෙසිනි. මෙම පළමු ආකාර දෙක, ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් ලබා දී ඇති නිර්වචනය වැනි ප්‍රචණ්ඩත්වය පිළිබඳ සාම්ප්‍රදායික නිර්වචනයන් තුළ ඇතුළත් වේ. ''ආබාධයක්, මරණය, මානසික හානිය, වර්ධනය හෝ වියෝගයක් ඇති කරමින් හෝ ඇතිවීමේ ඉහළ ඉඩකඩක් ඇතිව, තමන් වෙතම හෝ කණ්ඩායමක් වෙත හෝ ප්‍රජාවක් වෙත සැබෑ ලෙසින්ම හෝ තර්ජනයක් ලෙසින්, චේතනාන්විතව භෞතික බලපෑමක් හෝ බලයක් ඇති කිරීම" එයයි.[9] ප්‍රචණ්ඩත්වයේ සාකල්‍ය නිර්වචනයකට ප්‍රචණ්ඩත්වයේ ව්‍යුහාත්මක ආකාරයන්ද ඇතුළත් විය යුතුම වේ. යොහාන් ගොල්ටන්ග් නිරීක්ෂණය කරන ආකාරයට, පුද්ගලයින්ට තම මූලික අවශ්‍යතාවයන් සපුරාගැනීමට ඉඩ වළක්වාලමින් ඔවුන්ට හානි සිදුකරන සමාජ ව්‍යුහයන් හෝ සමාජ ආයතනයන්, ඔහු පවසන 'ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වය' යටතට ගැනිය හැක.[10] භෞතික හෝ භෞතික නොවන ප්‍රචණ්ඩත්වය යටතට නොගැනෙන අගතිගාමීව

---

6 විලෙම් ඩි හාන්, 'Violence as an Essentially Contested Concept' සොෆීබොඩ්-ජෙන්ඩ්‍රොට් සහ පීටර් ස්පියරෙන්බර්ඩ් (සංස්කරණය), Violence in Europe( Historical and Contemporary Perspectives (ස්ප්‍රින්ගර් 2008), පිටු28.

7 ගුණතිලක, The Chronic and the Acute" පෙර සඳහන්, පිටු33-34.

8 එහිම.

9 ලෝක සෞඛ්‍ය සංවිධානය, Global Status Report on Violence Prevention 2014 (2015), පිටු2.

10 යොහාන් ගොල්ටන්ග්, 'Violence" Peace" and Peace Research' (1969) 6(3) Journal of Peace Research 167-191; එසේම බලන්න, ආර්.ඊ.එස්.ටැනර්, Violence and Religion: Cross-cultural Opinions and Consequences (කොන්සෙප්ට්පබ්ලිෂින්ග් සමාගම. 2007), පිටු5.

කොන් කිරීමේ/වෙනස් ලෙසින් සැලකීමේ පරිචයන්ද ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වයේ විෂය පථයට අයත් වනු ඇත.

මෙම අධ්‍යයනය මගින් භෞතික, භෞතික නොවන සහ ව්‍යුහාත්මක යන ආකාරයන් ඇතුළත්ව ප්‍රචණ්ඩත්වය සඳහා වන වඩාත් පුළුල් නිර්වචනයක් යොදා ගනී. ශ්‍රී ලංකාවේ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වයේ ඇති ව්‍යුහයන්හි මුල් ඇදී ගිය ස්වභාවය නිසා එය වටහා ගැනීම සඳහා පුළුල් නිර්වචනයක් වැදගත් වේ. මෙසේ මෙම අධ්‍යයනය එහි ප්‍රචණ්ඩත්වයේ නිර්වචනය තුළට විශාල පරාසයක ක්‍රියාකාරකම් ඇතුළත් කරයිඃ ඒවා නම්, (1) ශාරීරික පහරදීම්; (2) දේපළ හානි; (3) බියවැද්දීම්, තර්ජනයන් සහ බලපෑම්; (4) වෛරී අදහස් ඇති ව්‍යාපාර හෝ ප්‍රහාරයන්; සහ (5) කොන් කිරීමේ/වෙනස් ලෙසින් සැලකීමේ භාවිතාවන් ලෙස දැක්විය හැක.[11]

මෙම අධ්‍යයනය මින් පෙර අධ්‍යයනයෙන් (The Chronic and the Acute) වෙනස් වන්නේ, මෙහි සැලකිල්ලට ගැනෙනා ප්‍රචණ්ඩත්වය හුදු 'ආගමික' ප්‍රචණ්ඩත්වය යන්නට විරුද්ධ ලෙසින් 'ජනවාර්ගික-ආගමික' ප්‍රචණ්ඩත්වය ලෙසින් විස්තර කිරීමෙනි.[12] මෙම පාරිභාෂික අපගමනය මගින් අදහස් කරන්නේ, සුළුතර ප්‍රජාවන් මුහුණ දෙන ආකාරයේ ප්‍රචණ්ඩත්වය විශේෂයෙන්ම පැන නගින්නේ එයට වගකිව යුත්තන්ගේ හුදෙක් 'ආගමික' අනන්‍යතාවයෙන්ය යන්නට විරුද්ධ ලෙසින් එය පැන නගින්නේ වගකිව යුත්තන්ගේ 'ජනවාර්ගික -ආගමික' අනන්‍යතාවයෙන් වන බව විදහා දැක්වීමයි. මෙම දැක්වීමට රුකුල් දීමක් ලෙසින් හේතු කිහිපයක්ම සඳහන් කොට තිබීමට හැක.

පළමුව, ශ්‍රී ලංකාවේ ජනවාර්ගික අනන්‍යතාවය සංකීර්ණ වන අතර, එය එකකින් අනෙක හා ස්වාධීනව ජනවාර්ගිකත්වයට හෝ ආගමිකත්වයට ලඝු කළ නොහැක. ස්ටීවන් වෝර්නර් විසින් පෙන්වා දී ඇති පරිදි ජනවාර්ගික-ආගමික අනන්‍යතාවයන් විශේෂයෙන්ම සංකීර්ණ වන අතර, බොහෝ මානව වංශ අධ්‍යයනයන්හි සෑහෙන ලෙසින් අවබෝධ කරගැනී නොමැත.[13] මේ අතර ශ්‍රී ලංකාවේ අනන්‍යතාවය විෂයෙහිදි ජනවාර්ගිකත්වය සහ

11 මීට සමාන වර්ගීකරණයක් 2014දී One Text Initiative මගින් ප්‍රකාශයට පත් වාර්තාවෙන් මුලින්ම ඉදිරිපත් කෙරිණි.. බලන්න, ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය, Religious Violence in Sri Lanka( January 2013 - December 2013 (2014).එය එතැන් සිට ආගමික ප්‍රචණ්ඩත්වය පිළිබඳව වූ අධ්‍යයනයන් ගණනාවක් සඳහා සම්මත වර්ගීකරණය ලෙසින් භාවිතා විණි. උදහරණ සඳහා බලන්න, වෙරිටේ රිසර්ච් සහ ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සන්ධානය, Silent Suppression: Restrictions on Religious Freedoms of Christians, 1994-2014 (2016).

12 ප්‍රචණ්ඩත්වය සහ 'ශුද්ධ වූ දේ' අතර අන්තර්ක්‍රියාව රෙනේජිරාර්ඩ් විසින් ගැඹුරින් ප්‍රශ්න කොට තිබේ. ආධිපත්‍යය ඇති ප්‍රජාව තුළ සමාජ ක්‍රමය පවත්වා ගැනීම වෙනුවෙන් උප විඥාණික උත්සාහයක් ලෙසින් 'අනෙකාව' 'බිල්ලට දීමට' ආගමික සංස්කෘතීන් කටයුතු කරන්නේ කෙසේද යන්න වටහා ගැනීමට ඔහුගේ අධ්‍යයනය වැදගත් වේ. බොහෝ විට ආගමික ප්‍රචණ්ඩත්වය ඇතිවන්නේ මෙම සන්දර්භය තුළ පිහිටමිනි. බලන්න රෙනේජිරාර්ඩ්, Violence and the Sacred (ඒ ඇන්ඩ් සී බ්ලැක්1988), පිටු43. එසේම බලන්න ඩොමිනික්ඇකුමොන්, Religion and Violence( A Dialectical Engagement through the Insights of Bernard Lonergan (ජේම්ස් ක්ලාර්ක් සහ සමාගම 2016), පිටු18. කෙසේ වුවත් මෙම වත්මන් අධ්‍යයනය, ප්‍රචණ්ඩත්වය සහ අනන්‍යතාවය -විශේෂයෙන්ම ජනවාර්ගික-ආගමික අනන්‍යතාවය අතර සංකීර්ණ අන්තර්ක්‍රියාවන් ග්‍රහණය කොට ගැනීමේ උත්සාහයක් ලෙසින් 'ජනවාර්ගික-ආගමික' ප්‍රචණ්ඩත්වය යන පාරිභාෂිකය යොදාගෙන ඇත.

13 බලන්න ස්ටීවන් වෝර්නර්, New Immigrant Religion( An Update and Appraisal, ගේට්වේසිටීස් ව්‍යාපෘතිය, නිව් ස්කූල් සරසවිය, සමාරම්භක දේශනය (ඔක්තෝබර්12, 1999).

ආගම අතර අතිපිහිත වීම පිළිබඳ න්‍යායික විස්තරය සම්බන්ධයෙන් ෆ්‍රාන්සිස් ස්ටුවර්ට් විසින් රාජේෂ්වෙනු ගෝපාල්ව උපුටා දක්වයි.[14] වෙනුගෝපාල් විසින් නිරීක්ෂණය කරනා අන්දමටඃ ශ්‍රී ලංකාවේ වාර්ගිකත්වය සමගින් ආගම සමීපව අතිපිහිත වෙයි. එසේම යම් තාක් දුරකට ආගමික අනන්‍යතාවය මගින් ජනවාර්ගික අනන්‍යතාවයේ හරය නිර්මාණය කරයි.[15]' එක්සත් රාජධානියේ වාසය කරනා ශ්‍රී ලාංකික සංක්‍රමණිකයින්ගේ අනන්‍යතාවය නිර්මාණය පිළිබඳව කීර්තිසිරි ප්‍රනාන්දු විසින් මීට සමාන නිරීක්ෂණයක් කරයි.[16] මෙම බලාපොරොත්තු සුන්වීම මගින් ජනවාර්ගිකත්වය සහ ආගම අතර රේඛාව බොඳ කර ඇති අතර, ඒ නයින් 'ජනවාර්ගික-ආගමික' අනන්‍යතා දහරාවන් ස්ථාපනය කොට ඇත.

බොහෝ සිංහල-බෞද්ධයින් හට 'සිංහල' සහ 'බෞද්ධ' අනන්‍යතා සලකුණු යනු, ඔවුන්ව ක්‍රිස්තියානි භක්තිකයින් වැනි අනෙකුත් ආගම් උරුම කොටගත් සිංහලයන්ගෙන් හෝ සිංහල නොවන බෞද්ධයින්ගෙන් (ලෝකයේ වෙනත් රටවල) වෙන් කොට දක්වන්නා වූ තනි අනන්‍යතා ධාරාවක එක සමානව වැදගත් මුහුණුවර වේ.[17] මෙම ජනවාර්ගික-ආග මික අනන්‍යතාවය, ශ්‍රී ලංකාව යනු 'සිංහල-බෞද්ධ' රටක්ය යන ජාතිකවාදී විශ්වාසයේ ගර්භයේ ඇත. තමන් අයත් වන බවට වන මෙම සංකල්පිතය, මෙම රට සිංහල මෙන්ම බෞද්ධද වන බවට වන ප්‍රකාශයෙන් වෙනස් වේ. මෙය බෞද්ධ නොවන සිංහලයින් සහ න්‍යායිකව සිංහලයින් නොවන බෞද්ධයින්ද ජනවාර්ගික ගම්‍යාර්ථය අනුව අයත් විය හැකි යැයි පැවසෙන සිංහල සහ බෞද්ධ හිමිකාරීත්වයේ එකතුවක් හෝ සංයුක්ත වීමක් නොවේ. ඒ වෙනුවට මෙම සංකල්පිතය, ජනවාර්ගිකත්වය සහ ආගම එකට මුණගැසී 'සිංහල-බෞද්ධ' යන නමින් වූ එකිනෙකට වෙනස් ජනවාර්ගික-ආගමික අනන්‍යතා ධාරාවක් නිර්මාණය කරන බලාපොරොත්තු සුන්වීමේ අවකාශයකට නිදසුනක් ලෙසින් සැලකිය හැක. මෙවැනි අනන්‍යතා නිර්මාණය වීම් සිංහල-බෞද්ධයින්ට පමණක් සීමා නොවේ. මුස්ලිම්වරුන්ද යම් විටක ජනවාර්ගික-ආගමික ප්‍රජාවක් ලෙසින් හැඳින්විය හැකි අතර, 'ඔවුන් එක් එක් කාලයන්හිදී තමන්ට අවශ්‍ය වන යම් යම් භෞතික, සමාජයීය සහ දේශපාලනික ප්‍රතිලාභයන්ට අනුව තම ජනවාර්ගික අනන්‍යතාවයට වඩා ආගමික අනන්‍යතාවය ඉහළින් තැබීම හෝ ආගමික අනන්‍යතාවයට වඩා ජනවාර්ගික අනන්‍යතාවය ඉහළින් තැබීම' වාසියක් ලෙසින් භාවිතා කොට ඇත.[18] ෆර්සානා හනීෆා විසින් නිරීක්ෂණය කර ඇති ලෙසට 'මුස්ලිම් ආගමික අනන්‍යතාවය, ජනවාර්ගික ලේබනගත කිරීමේදීද

---

14 ස්ටුවර්ට්, පෙර සඳහන්,පිටුව 8

15 එහිම.

16 බලන්න කීර්තිසිරි ප්‍රනාන්දු, Religion and Identity( Comparing Sinhala Buddhists and Christians in and Around London (ගොඩගේ ජාත්‍යන්තර ප්‍රකාශන 2009).

17 සිංහල-බෞද්ධ අනන්‍යතාවය ඉතිහාසය පුරා නිර්මාණය වූයේ බුදුන්ගේ ඉගැන්වීම් අනුගමනය කළවුන් - ප්‍රධාන වශයෙන් සිංහලයන්, සහ වැදි ජනයා වැනි එසේ නොකළවුන්ගෙන් වෙන් කොට හඳුනාගැනීමේ ක්‍රමයක් ලෙසින් 'ප්‍රතිවිරෝධී' ආකාරයකිනි. එසේම මෙය යුධ සමයේදී සිංහලයින් සහ දමිළයින් අතර ද දක්නට ලැබිණි. බලන්න ගණනාත් ඔබේසේකර, 'Buddhism" Ethnicity" and Identity( A Problem of Buddhist History' (2003) 10 Journal of Buddhist Ethics 192-242.

18 මොහොමඩ් ෆස්ලාන් සහ නඩීන් වන්නියසින්කම්, Fracturing Community( Intra-group Relations among the Muslims of Sri Lanka (ICES 2015), at 17'

බල පැවැත්වේ.[19] 'ඈ පැහැදිලි කරන්නේ බොහෝ මුස්ලිම්වරුන් දමිළ කථාකරන්නේය යන කරුණ තිබියදී වුවත්, 'දමිළ මුස්ලිම්වරුන්' යන හැඟවීම ශ්‍රී ලාංකීය සන්දර්භයේදී 'දැඩි අභියෝගාත්මක දේශපාලනික ප්‍රකාශයක්' වන අතර, එය අර්ථාන්විත අනන්‍යතා සළකුණක් නොවන බවයි.[20] මෙයට ප්‍රතිවිරුද්ධ ලෙසින්, මෙම අධ්‍යයනයෙන් කිඳා බැසීමට බලාපොරොත්තු වන සුවිශේෂී ඓතිහාසික වර්ධනයන් හේතුවෙන්, මෑතක් වනතුරුම දමිළ-හින්දුවාදය විශාල වශයෙන් අක්‍රිය අනන්‍යතා දහරාවක් ලෙසින් පැවතිණි. මෙසේ ඓතිහාසිකව ගත් විට, දමිළ ජාතිකවාදය අඩු හෝ වැඩි වශයෙන් ජනවාර්ගික-භාෂාමය සීමාවන් තුළ පැවතුණු අතර, එය 'ජනවාර්ගික-ආගමික' අරගලයක් ලෙසින් පහසුවෙන් හැඳින්වීම කළ නොහැක.

දෙවෙනුව, ශ්‍රී ලංකාවේ පශ්චාත්-යුධ ජනවාර්ගික දේශපාලනය, වඩාත් ප්‍රබල ආගමික තලයක්ද ඇතුළත් වන තැනට පරිණාමය වී ඇත. ධම්මික හේරත් සහ හර්ෂණ රඹුක්වැල්ල විසින් නිවැරදි ලෙසින් නිරීක්ෂණය කළ පරිදිඃ '2009 ට පෙරාතුව ජනවාර්ගිකත්වය යනු නිර්ණය සාධකයක් වුණි නම්, ශ්‍රී ලංකා සන්දර්භය තුළ හැඟීම් හා ආතතීන්ගෙන් පිරි සහ බොහෝ විට ව්‍යාකූල යෙදුමක් වූ ආගම, 2009 න් පසු ශ්‍රී ලාංකීය රාජ්‍ය සංස්ථාව තුළ නව නිර්ණය කිරීමේ බලවේගයක් ලෙසින් ඉස්මතු වීම ඇරඹුණි.[21]' මෙම ආගමික මානය, ජනවාර්ගික මානය වෙනුවට ආදේශකයක් වී නොමැත. එනමුත් ජනවාර්ගික මානය සමගින් සංයෝජනය වෙමින් වඩාත් සංකීර්ණ සහ වෙනස් 'ජනවාර්ගික-ආගමික' මානයක් නිර්මාණය කිරීමට එහි ඇති හැකියාව, පශ්චාත් යුධ සමය තුළ වඩාත් කැපී පෙනේ. යුද්ධයේ අවසන් වසර කිහිපය තුළදී පවා, නීල් ඩිවෝටා සහ ජේසන් ස්ටෝන් වැනි විද්‍යාර්ථීන් නිරීක්ෂණය කර සිටියේ, සාම ගිවිසුම් මන්ත්‍රණ ප්‍රයත්නයන් පවා 'සංකීර්ණ' කළ, ජනවාර්ගික -ආගමික අනන්‍යතා දේශපාලනයේ නැඟීමයි.[22] මෙම සන්දර්භය තුළ, ජාතික මට්ටමේදී මෙන්ම පළාත්බද මට්ටමේදී පශ්චාත් යුධ ප්‍රචණ්ඩත්වයට වගකිව යුතු කලහකාරී කල්ලි 'ජනවාර්ගික-ආගමික' ලෙසින් හොඳින්ම නිර්වචනය කෙරුණේ, මෙම වගකිවයුත්තන් බොහෝ විට තමන් වෙනස් ජනවාර්ගික ආගමික පෙළක් තුළ තමන්වම හඳුන්වා දුන් බැවිනි.

මෙසේ මෙම අධ්‍යයනය මඟින් ජාතීන් අතර පවත්නා වත්මන් පශ්චාත්-යුධ ප්‍රචණ්ඩත්වය ජනවාර්ගික-ආගමික දෘෂ්ටියක් තුළින් සාකච්ඡා කෙරෙනු ඇත. මෙය ඉලක්ක කොටග

19 ෆර්සානා හනීෆා, 'Piety as Politics amongst Muslim Women in Contemporary Sri Lanka' (2008) 42(2/3) Modern Asian Studies 347-75, 351හි. එසේම බලන්න අමීර් අලි, 'The Quest for Cultural Identity and Material Advancement( Parallels and Contrasts Muslim Minority Experience in Secular India and Buddhist Sri Lanka' (1992) 13(1) Journal Institute of Muslim Minority Affairs 33-58" සහඩෙනිස් බී.මැක්ගිල්වි" 'Arabs Moors and Muslims( Sri Lankan Muslim Ethnicity in Regional Perspective' (1998) 32(2) Contributions to Indian Sociology 433-483.

20 හනීෆා, 'Piety as Politics', පෙර සඳහන්,.එසේම බලන්න එම්.ඒ.නුහ්මාන්, Understanding Sri Lankan Muslim Identity" ICES ජනවාර්ගිකත්ව පාඨමාලා පෙළ 4 (ICES 2002).

21 ධම්මික හේරත් සහ හර්ෂණ රඹුක්වැල්ල, Self" Religion" Identity and Politics (Buddhist and Muslim Encounters in Contemporary Sri Lanka (ICES 2015), පිටුව2.

22 නීල් ඩිවෝටා සහ ජේසන්ස් ටෝන්, 'Jathika Hela Urumaya and Ethno-Religious Politics in Sri Lanka' (2008) 81 (1) Pacific Affairs 31-51, පිටුව32.

න්නේ ජනවාර්ගික සහ ආගමික ගැටුම් වල අත්‍යාවශ්‍ය ගුණාංගයන් විසංයෝජනය කිරීම මගින්, ශ්‍රී ලංකාවේ පශ්චාත්-යුධ වර්ගවාදී ප්‍රචණ්ඩත්වය මෙම ආකාර දෙකේම ගැටුම් වල ගුණාංගයන්ගෙන් සමන්විත වන බවට උපකල්පනය කිරීමයි. ප්‍රතිපත්ති සම්පාදකයින් සහ වෘත්තිකයින්, ශ්‍රී ලංකාවේ ගැටුම් විපර්යාසය පිළිබඳ යම් යම් මූලික උපකල්පනයන් වෙත නැවත බැලිය යුත්තේ මෙම හේතුව නිසාවෙනි. ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය යනු වැළැක්වීමට හෝ අවම කිරීමට අතිශයින්ම අසීරු දෙමුහුම් ආකාරයක ප්‍රචණ්ඩත්වයක්, මැඩපැවැත්වීම සඳහා සමාජය රැඩිකල් පරිවර්තනයකට බඳුන් වීම අවශ්‍ය වන මුල්බැසගත් ආකාරයේ ප්‍රචණ්ඩත්වයක් වීමට හැක.

## 1.2 ඉකුත් සොයාගැනීම් සහ නිර්දේශයන්

වත්මන් අධ්‍යයනය ප්‍රධාන වශයෙන්ම අරමුණු කොටගන්නේ, The Chronic and the Acute මගින් ආරම්භ කළ කාර්යයේ අන්තර්ගතය පදනම ලෙසින් ගෙන ගොඩනැංවීමයි. මෙම පසුතලය යටතේ එම අධ්‍යයනයේ ප්‍රධාන සොයාගැනීම් පුනරුච්ඡාරණය කිරීම සුදුසුයි[23].

පළමුව මෙම අධ්‍යයනය මගින් ශ්‍රී ලංකාවේ වර්ග අතර ප්‍රචණ්ඩත්වයට යටින් ඇති යම් යම් සමාජ-සංස්කෘතික, ආර්ථික සහ දේශපාලනික ඉරිතලා යෑම් පරීක්ෂා කෙරිණි. සමාජ-සංස්කෘතික තලයකදී, විධිමත් සහ අවිධිමත් අධ්‍යාපන මාර්ග ඔස්සේ පතළ වූ මහාවංශික ඓතිහාසික ආඛ්‍යානය මගින් තමන් මෙම රටේ 'සත්කාරකයින්' වන බවට වූ සිංහල බෞද්ධ හිමිකාරීත්වය පිළිබඳ හැඟීම මුල්බැසගන්නට කටයුතු යෙදිණි. සුළුතර කණ්ඩායම් 'පිටස්තරයා' ලෙසින් සලකමින් ඔවුන් 'අමුත්තන්' ලෙසින් නිරූපණය කිරීමට මෙම ආඛ්‍යානයන් උපයෝගී වී තිබිණි[24]. මුස්ලිම් ජනගහණ වර්ධනය හා ආර්ථික ව්‍යාප්තිය සහ ක්‍රිස්තියානි ධර්ම ප්‍රචාරණ ඉලක්කයන් පිළිබඳ හැඟීම් වලට මෙම 'සත්කාරක-ආගන්තුක' ගතිකයට බාධා පැමිණවීමට හැකිවාක් මෙන්ම ජනවර්ගයන් අතර ඉරිතලා යෑම් නිර්මාණයට දායකත්වයක්ද ලබාදීමටද හැක[25]. ආර්ථිකමය තලයේදී දේශපාලනික අනුග්‍රාහක ව්‍යුහයන්ට හානි පැමිණවූ වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණයන්[26] සහ පශ්චාත්-නූතන ආර්ථික ලාභාංශයන් අත්පත් කර ගත නොහැකි වීම, සිංහල-බෞද්ධයින් සහ සුළුතර කණ්ඩායම් අතර එදිරිවාදිකම වැඩිදියුණු කරන ලදී. පශ්චාත්-යුධ සන්දර්භයේදී විශේෂයෙන්ම මුස්ලිම්වරුන් ආර්ථිකමය වාසි ඒකාධිකාරීත්වයක් ලබාගන්නා බවට වැටහීමක් වූ අතර,

23 ගුණතිලක, The Chronic and the Acute පෙර සඳහන්,පිටු50-52.

24 එහිම50පිටුව. එසේම වෙරිටෙරිසර්ච්. මාධ්‍ය විශ්ලේෂණය, වෙලුම 3 අංක 4 නිකුතුව (2013 පෙබරවාරි 4 සිට 10 දක්වා).

25 බලන්න, සසංක පෙරේරා, The Ethnic Conflict in Sri Lanka: A Historical and Sociopolitical Outline (World Bank 2001); ආර්.ඒ.එල්.එච්.ගුණවර්ධන, 'The Peo ple of the Lion( The Sinhala Identity and Ideology in History and Historiography' (1979) 5(1) සහ (2) The Sri Lanka Journal of the Humanities 1-36; රිචර්ඩ් ගොම්බ්‍රිජ් සහ ගණනාථ ඔබේසේකර, Buddhism Transformed( Religious Change in Sri Lanka (ප්‍රින්ස්ටන් සරසවි මුද්‍රණ 1988).

26 බලන්න, නිව්ටන් ගුණසිංහ, 'The Open Economy and its Impact on Ethnic Relations in Sri Lanka' මයිකල් ඩී වූස්ට් (සංස්කරණයෙන්), Economy" Culture" and Civil War in Sri Lanka (ඉන්දියානා සරසවි මුද්‍රණ 2004), 99-108.

කලහකාරී කණ්ඩායම් ඒ අනුව ආර්ථික පසුබෑස්මට හේතුව ලෙසින් දෝෂදර්ශනයට ලක්වන බිල්ල බවට මුස්ලිම්වරුන්ව පත් කිරීමට බලාපොරොත්තු විණි[27]. දේශපාලනික තලයේදී ජාතික හෙළ උරුමය (JHU) වැනි ජනවාර්ගික-ආගමික සහ ජාතිකවාදී දේශපාලන පක්ෂයන් පැන නැගීම මගින් ආගම දේශපාලනීකරණය කිරීමට මං සැලසුණු අතර, ඒ මගින් ජනවාර්ගික -ආගමික රේඛාවන් තුළ ඇති ඡන්ද පදනම උත්තේජනයට මාර්ගය එළිපෙහෙළි විණි[28]. මෙවැනි පක්ෂයන් ලබාගත් ජනප්‍රියත්වය මගින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (SLFP) වැනි ප්‍රධාන ධාරාවේ පක්ෂයන්ද වැඩි වැඩියෙන් ජාතිකවාදී වාගාලංකාරයන් යොදා ගැනීම සහ උග්‍ර-ජාතිකවාදී පක්ෂයන් හා සන්ධානයන්ට එළැඹීම මගින් තරග කිරීමට පොළඹවනලදී. මේ අතරේදී බොදුබල සේනා (BBS), සිංහල රාවය සහ රාවණා බලය වැනි ජනවාර්ගික-ආගමික කලහකාරී කණ්ඩායම්ද දේශපාලන සන්දර්භය තුළ තමන්ට දඬුවම් නොලැබීම සමගින් ශක්තිමත් වූ අතර, සෘජුව සහ වක්‍රාකාරීව රජයේ අනුග්‍රහයද භුක්ති විඳින්නට යෙදිණි.

ආගමික සුළුතරයන්ට එරෙහිව නිදන්ගත ප්‍රචණ්ඩත්වය බොහෝ විට සිදුවන්නේ, සුවිශේෂ ස්ථානයක් තුළ සන්දර්භගත සාධකයන් එකට මුණගැසී 'සත්කාරකයා-බලහත්කාරයෙන් ඇතුළුවන්නා' ආකාරයේ ගතිකයක් නිර්මාණය වූ විට වේ. තවදුරටත් 2013 සිට 2014 අතර කාලය තුළ ග්‍රෑන්ඩ්පාස් සිදුවීම සහ අලුත්ගම කෝලාහල වැනි උදාහරණයන්ගෙන් දකින්නට ලැබෙන ආකාරයට, එවැනි සිදුවීම් සුවිශේෂී ප්‍රාදේශීය සන්දර්භයක්, 'ප්‍රේරකයක් ලෙසින් ක්‍රියා කරන සිදුවීමක්' සමගින් එක්ව ඇතිවන එය අතර බොහෝ විට නිදන්ගත ප්‍රචණ්ඩත්වය ක්ෂණික උග්‍ර ප්‍රචණ්ඩත්වයට දියුණු වීම පහදයි. එපරිද්දෙන් මෙම අධ්‍යයනය මගින් අනාවරණය කර ගැනුනේ, ක්ෂණිකව උග්‍ර වන ප්‍රචණ්ඩත්ව සිදුවීම් වෙත සමාජ-සංස්කෘතික, ආර්ථික හෝ දේශපාලන සන්දර්භයන්හි සමස්තයට වඩා විශේෂයෙන්ම ප්‍රාදේශික වූ සන්දර්භයන් වැඩි දායකත්වයක් දක්වන බවයි.මෙසේ නිශ්චය වන්නේ මෙම සංකීර්ණ සන්දර්භගත වාතාවරණයකට ප්‍රතිචාර දැක්වීමේදී, නීති ක්‍රියාත්මක කිරීමේ අධිකාරීන් සහ ආයතනයන් වෙත වන ප්‍රතිසංස්කරණයන්ගෙන් ඔබ්බට විස්තෘත වූ ප්‍රවේශයක් අවශ්‍ය වන බවයි. එනම් මෙම ප්‍රාදේශීය සන්දර්භයන් ගැඹුරින් පිරික්සීම, අවසානයේදී විසඳුම් අනාවරණය කර ගැනීම හා ප්‍රජා තලයකදී ඒවා ක්‍රියාවට නැංවීම අතිශයින්ම වැදගත් වේ.

27 බලන්න, අහිලන් කදිරගාමර්, ''The Political Economy of Anti-Muslim Attacks', The Island, 2013 මාර්තු 2, http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=73829 අවසන් සංස්කරණය 2017 අගෝස්තු 29 දී]; සුමුදු ජයසිංහ, Mapping among the Minority-Majority( Understanding the Context and Identifying Strategies (උපාය මාර්ගික සැලසුම් අධ්‍යයනයන් සඳහා වූ ප්‍රාදේශීක කේන්ද්‍රය 2016), එහි 6පිටුව. එසේම බලන්න, ෆර්සානාහනීෆා, Competing for Victimhood Status( Northern Muslims and the Ironies of Post-War Reconciliation" Justice and Development" ICES පර්යේෂණ පත්‍රිකා අංක.13 (ICES 2014), 24 පිටුව.

28 බලන්න, මහින්ද දීගල්ල, 'Politics of the Jathika Hela Urumaya Monks (Buddhism and Ethnicity in Contemporary Sri Lanka' (2004) 5(2) Contemporary Buddhism 83-103.

දෙවෙනුව, මෙම අධ්‍යයනය මගින් අනාවරණය කර ගැනුනේ ආගමික නිදහස ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය මෙන්ම ජනවාර්ගික ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා ශ්‍රී ලංකාවේ ඇති නෛතික හා ප්‍රතිපත්ති රාමුව සෑහෙන තරමට ප්‍රමාණවත් බවයි. ව්‍යාප්තව ඇති ව්‍යවස්ථාදායක සහ ආඥා පනත් රාමුව, ප්‍රචණ්ඩත්වය වැළැක්වීමට, අනතුරට බඳුන් විය හැකි ප්‍රජාවන් රැකීමට මෙන්ම අපරාධකරුවන් නීතිය ඉදිරිපිටට ගෙන ඒමට ප්‍රමාණවත් විෂය පථයකින් යුතුවේ. මෙම අධ්‍යයනයෙන් සොයාගැනුනේ ශ්‍රී ලංකාවේ මුහුණ දෙන්නට වන මූලික ගැටළුවක් වන්නේ එක් නීති අධිකාරිය වන බවයි. එනිසා ක්ෂණිකව ඇතිවන උග්‍ර ප්‍රචණ්ඩත්වය දිගින් දිගටම පැවතීම සහ පොදුවේ අපරාධකරුවන් දඬුවමින් ආරක්ෂා වීම ඇතැම් විට රාජ්‍යයේ අක්‍රියාකාරීත්වයට සහ නීතිය ක්‍රියාත්මක කිරීමට නීති බලාත්මක කිරීමේ අධිකාරීන් පැකිළීමට හේතුවීම නිසා හට ගනු ඇත. මෙම අධ්‍යයනයට අනුව උක්ත සඳහන් උදාසීනත්වයට ගැලපෙනම උදාහරණයක් වන්නේ, 2007 වසරේ අංක 56 දරණ සිවිල් සහ දේශපාලන අයිතීන් (ICCPR) පණතෙහි ජාත්‍යන්තර ප්‍රඥප්තියයි. මෙම පනතේ 3 (1) වගන්තිය මගින් 'කොන් කිරීමට, එදිරිවාදීකම් වලට හෝ ප්‍රචණ්ඩත්වයට පොළඹවන ජාතික, ජනවාර්ගික හෝ ආගමික වෛරී අදහස්' වලට පක්ෂව කටයුතු කිරීම තහනම් කෙරෙන අතර, එවැනි අපරාධයන් විභාග කිරීමට මහාධිකරණයට බලතල ලබාදේ. පශ්චාත්-යුධ සමයේ සෑමතැනම පැතිර ගිය වෛරී අදහස් වැපිරවීම් තිබුණත්, මෙම ප්‍රතිපාදන යටතේ එකදු අපරාධකරුවෙකු හෝ චූදිතයකු කර නොමැත. මේ අනුව මෙම අධ්‍යයනය මගින් තර්ක කෙරෙනුයේ, සිවිල් සහ දේශපාලන පනත යටතේ අපරාධකරුවන්ට නඩු පැවරීම, අඩු තරමින් ක්ෂණිකව උග්‍රත්වයෙන් ඇතිවන ආගමික ප්‍රචණ්ඩත්වයේ එක් අමුද්‍රව්‍යයක් හෝ එනම් ප්‍රචණ්ඩත්වයට වන පෙළඹවීම ඉවත් කිරීම සඳහා අතිශයින්ම තීරණාත්මක වන බවයි. මෙසේ මෙම අධ්‍යයනය මගින් නිශ්චය කෙරෙන්නේ, වඩාත් දැඩිව නීති බලාත්මක කිරීම සහ වඩාත් ශක්තිමත්ව ආයතනික ප්‍රතිසංස්කරණයන් කිරීම හා ඒ මගින් වඩාත් සාධනීය ලෙසින් නීති බලගැන්වීමේ අධිකාරීන් ක්‍රියාත්මක වීම මත ජනවාර්ගික ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීම රඳා පවත්නා බව වේ.

අවසන් වශයෙන් මෙම අධ්‍යයනය මගින් අනාවරණය කර ගැනුනේ, ආගමික වෛරය සහ ප්‍රචණ්ඩත්වයට ප්‍රතිකූලව කටයුතු කිරීමට අවශ්‍ය ප්‍රජාතාන්ත්‍රික අවකාශය පවත්වා ගැනීම සඳහා සමාජ ජාලයන් උපකාරී වන බවයි. වෛරී අදහස් සම්ප්‍රේෂණය කිරීම සඳහා සමාජ ජාලයන් මාර්ගයක් වීමට හැකි වුවත්, ප්‍රධාන ධාරාවේ මාධ්‍ය කෙරෙහි රජයේ ඇති පාලනයට ප්‍රතිරෝධය දැක්වීම සඳහා එය තීරණාත්මක අවකාශයක් වේ. රාජ්‍ය-අනුගහය සහිත ප්‍රචණ්ඩත්වය ලියැවී තිබෙන සහ වාර්තා කෙරෙන එකම සීමා බාධකයන් බල නොපැවැත්වෙන මාර්ගය බවට සමාජ මාධ්‍ය පත්ව ඇති ආකාරය මෙම අධ්‍යයනය මගින් විස්තර කෙරේ. තවදුරටත් මෙම අධ්‍යයනය මගින් තර්ක කෙරෙන්නේ, පොදු විෂය පථයක් තුළ වෛරී කථනයන් නිශ්ක්‍රිය කිරීම සිදුකරනා 'ප්‍රති-සන්නිවේදනය'යන අරමුණ

සඳහා සමාජ ජාල අවකාශයන් අති වැදගත් වන බවටයි.[29] ඒ අනුව නිශ්චය වන්නේ සමාජ ජාල මාධ්‍ය අවභාවිතා විය හැකි අවදානම තිබුණ ද, රාජ්‍ය-අනුග්‍රහය සහිත ප්‍රචණ්ඩත්වයට ප්‍රතිරෝධය දැක්විය හැකි එකම විශ්වාසනීය ආකාරයක් වන්නේ සමාජ ජාල වන බැවින් නිදහස් සමාජ ජාල අවකාශයක් පවත්වා ගැනීම එම අවදානමට වඩා වටනා බව වේ.

මෙම අනාවරණයන් මත පදනම්ව The Chronic and the Acute අධ්‍යයනය මගින් මැදිහත් වීම් කිහිපයක්ම නිර්දේශ කරන්නට යෙදිණි.පළමුව, කලහකාරී කණ්ඩායම් වලින් ප්‍රචණ්ඩත්වය ඇති කිරීම වැළැක්වීම සඳහා වෛරී අදහස් වැපිරවීම වෙනුවෙන් වඩාත් දැඩි නීති බලාත්මක කිරීම එයින් නිර්දේශ කෙරිණි. දෙවෙනුව, ප්‍රචණ්ඩත්වය සඳහා වඩාත් සාධනියව ප්‍රතිචාර දැක්වීම සහ ආගමික නිදහස ප්‍රවර්ධනය සහතික කරගැනීම සඳහා, ආයතනයන් - විශේෂයෙන්ම නීති ක්‍රියාත්මක කිරීමේ කාර්යය හිමි ආයතනයන්-ශක්තිමත් කිරීමටද එයින් නිර්දේශ විණි. තුන්වනුව ආගමික ආතතීන් නිශ්ක්‍රීය කිරීම සහ ප්‍රචණ්ඩත්වය පැන නැගීම වැළැක්වීම පිණිස ප්‍රජා-පාදක පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති, සාමය ගොඩනැංවීමේ ව්‍යාපාරයන් සහ මානව හිමිකම් පිළිබඳ අධ්‍යාපනය වැනි වඩාත් දීර්ඝ කාලීන මැදිහත් වීම්ද එයින් නිර්දේශ කෙරිණි. අවසාන වශයෙන්, රාජ්‍ය-අනුග්‍රහය සහිත ප්‍රචණ්ඩත්වයට එරෙහි විරෝධතාවයට අත්‍යාවශ්‍ය මූලාශ්‍රයක් ලෙසින් සහ වෛරී අදහස් පැතිරවීමට එරෙහි ප්‍රති-සන්නිවේදන ක්‍රමයක් ලෙසින් සමාජ ජාල මාධ්‍ය පවත්නා හෙයින්, රජයේ අයුතු පාලනයෙන් සමාජ ජාල අවකාශය ආරක්ෂා කිරීමේ වැදගත්කමද මෙම අධ්‍යයනය මගින් අවධාරණය කෙරිණි.

මෙම ප්‍රධාන අනාවරණයන් සහ නිර්දේශයන්ගෙන් වත්මන් අධ්‍යයනයේ පර්යේෂණ ගොඩනැංවීම සිදු කෙරේ. එසේ එම අනාවරණයන් හා නිර්දේශයන් මතින් වත්මන් අධ්‍යයනය ගොඩනැංවීම ඉලක්ක කෙරෙන අතර, ශ්‍රී ලංකාවේ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වයේ සමකාලීන තත්වය කෙරෙහි නව පර්යාවලෝකයක් ලබා දීම ද සිදුවනු ඇත.

## 1.3 නව වර්ධනයන්

The Chronic and the Acute අධ්‍යයනය ප්‍රකාශ කොට ශ්‍රී ලංකාවේ ප්‍රචලිත වී වසර දෙකක් ගෙවී ඇත. මෙම අධ්‍යයනය සිය අවධානය කේන්ද්‍රගත කොට තිබුණේ පොදුවේ පශ්චාත්-යුධ කාල සීමාව වුවත්, 2015 ජනවාරි සිදුවූ ප්‍රජාතාන්ත්‍රික බලය මාරුවීමෙන් පසු සිදු වූ සංවර්ධනයන්ද ඒ මගින් සංක්ෂිප්තව ග්‍රහණය කොට ගෙන ඇත.

මෛත්‍රීපාල සිරිසේනගේ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශය මගින් රටේ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය හා කටයුතු කිරීමට සිය කැපවීම ප්‍රකාශ වී තිබිණි. එම ප්‍රතිපත්ති ප්‍රකාශයට

29 ශිල්පා සමරතුංග සහ සන්ජන හත්තොට්ටුව, Liking violence: A study of hate speech on Facebook in Sri Lanka (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය 2014), 63පිටුව.

අනුව 'ආගමික කැළඹීම්' ඇතිවීමට හේතු වී තිබුණේ 'අන්තවාදී ආගමික නිකායන්' වල ක්‍රියාකාරකම් වුණි[30]. ඉන් පැවසී තිබුණේ 'අන්තවාදී කණ්ඩායම් එකිනෙකාව අන්‍යෝන්‍ය ලෙසින් පෝෂණය කරනා' බවයි[31]. මෙම 'නිකායන්' යන හැඳින්වීම යම් තාක් දුරකට අරුම බවක් පෙනී යන්නේ, බොදු බල සේනා වැනි සංවිධානයන් 'නිකායන්' ලෙසින් අරුත් ගැන්විය නොහැකි බැවිනි. ඒවා වඩාත් සාධාරණව 'කණ්ඩායම්' ලෙසින් වර්ගීකරණය කළ හැක. එම සන්දර්භයෙදී, 'නිකායන්' යන සඳහන සිදුකෙරෙන්නට ඇත්තේ මුස්ලිම් ආගමික නිකායන් හැඳින්වීමට විය හැකි අතර, 'කණ්ඩායම්' යන සඳහන බොදු බල සේනා වැනි කලහකාරී කණ්ඩායම් සඳහා යෙදෙන්නට ඇත. ඒ කෙසේ වුවත් ජනපති සිරිසේන, ප්‍රචණ්ඩත්වය අවසන් කිරීමට සහ ආගම් අතර සහජීවනය ප්‍රතිස්ථාපනය කිරීමට ප්‍රතිඥා දුනි. මෙම පසුබිම යටතේ ආගමික සුළුතරයන් විසින් 2015 ජනාධිපතිවරණයේදී ස්ථිරවම සිරිසේනට වාසි සහගත වන ලෙසින් සිය ඡන්දය ප්‍රකාශ කොට තිබිණි.

The Chronic and the Acute, අධ්‍යයනයේදී කතුවරයා විසින් 'ආගමික සුළුතරයන්ගේ ඉහළ සංකේන්ද්‍රණයක්' සහිත, එනම් ජනගහණයෙන් තුනෙන් දෙකකට වඩා ආගමික සුළුතර ප්‍රජාවන්ගෙන් සමන්විත ප්‍රාදේශීය ලේකම් (D'S') කොට්ඨාස හඳුනාගනී.[32] ලබාගත හැකි ජනවිකාස දත්ත පදනම් කරගනිමින් ඇතැම් විට මෙවැනි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 76ක් හඳුනා ගැනී ඇත.[33] ඉන්පසු මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, සුවිශේෂී ඡන්ද කොට්ඨාස 31 කට සිතියම් ගත කෙරී ඇත. මෙම කොට්ඨාසයන්හි ඡන්ද ප්‍රතිඵල සුවිශේෂී වේ. සිරිසේන විසින් මෙම ඡන්ද කොට්ඨාස 31න් 30ක් ඉතාම පහසුවෙන් දිනාගත් අතර, සමස්තයෙන් වෙන්ව පවතින එකම දත්තය වන්නේ වෙන්නප්පුවයි (පුත්තලම දිස්ත්‍රික්කය). එහි බහුතර ජනගහණය රෝමානු කතෝලිකයින් වුවත් (78%)[34], මහින්ද රාජපක්ෂ විසින් සිරිසේනට වඩා ඡන්ද 4,305ක් මෙහිදී ලබාගෙන ඇත. පහත වගුව මගින් මෙම ඡන්ද කොට්ඨාසයන්හි සිරිසේනගේ මැතිවරණ ප්‍රමුඛත්වයේ ප්‍රමාණය පෙන්නුම් කෙරේ.

---

30 යහපත් මෛත්‍රී පාලනයක් - ස්ථාවර රටක්,නව ප්‍රජාතාන්ත්‍රික පෙරමුණ ප්‍රතිපත්ති ප්‍රකාශය (2014 නොවැම්බර්), 25 පිටුව බලන්න

31 එහිම.

32 ගුණතිලක, The Chronic and the Acute, පෙර සඳහන්,30පිටුව

33 කතුවරයා විසින්, විවෘත අන්තර්ජාල මූලාශ්‍රයක් වන http://www'opendemarcations.lk/මත යැපෙන අතරම, ආගමික සුළුතරයන්ගේ ඉහළ සංකේන්ද්‍රණයක් සහිත ඡන්ද කොට්ඨාස හඳුනා ගැනීම සඳහා ජනසංඛ්‍යාලේඛන දත්ත හා ඉහත අංක නැවත පරීක්ෂා කිරීමක්ද කරයි. මෙම විෂය සම්බන්ධයෙන් ජනීන් ප්‍රනාන්දුගේ අදහස් හා දෘෂ්ටිය කෙරෙහි කතුවරයා කෘතඥ වෙයි.

34 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව,පෙර සඳහන්,එහි වයඹ පළාත, පුත්තලම දිස්ත්‍රික්කය බලන්නඃ A4වගුවඃප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, ආගම සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව ජනගහණය

## වගුව 01- ඉහළ ආගමික සුළුතර සංකේන්ද්‍රණයන් සහිත ඡන්ද කොට්ඨාසයන්හි 2015 ජනාධිපතිවරණ ප්‍රතිඵල[35]

| ඡන්ද කොට්ඨාසය | වලංගු ඡන්ද | සිරිසේන ලැබූ ඡන්ද | % | රාජපක්ෂ ලැබූ ඡන්ද | % | වෙනස |
|---|---|---|---|---|---|---|
| උතුරු කොළඹ | 68,649 | 51,537 | 75.07 | 16,423 | 23.92 | 35,114.00 |
| මැද කොළඹ | 101,497 | 82,495 | 81.28 | 17,779 | 17.52 | 64,716.00 |
| වත්තල | 95,311 | 56,541 | 59.32 | 38,001 | 39.87 | 18,540.00 |
| මීගමුව | 79,482 | 53,331 | 67.10 | 25,432 | 32.00 | 27,899.00 |
| ජා ඇල | 112,797 | 58,669 | 52.01 | 53,481 | 47.41 | 5,188.00 |
| මහනුවර | 30,715 | 20,316 | 66.14 | 10,200 | 33.21 | 10,116.00 |
| නුවරඑළිය/මස්කෙලිය | 234,996 | 171,578 | 73.01 | 57,718 | 24.56 | 113,860.00 |
| කයිට්ස් | 14,678 | 8,144 | 55.48 | 5,959 | 40.60 | 2,185.00 |
| වඩුක්කෝඩෙයි | 29,997 | 20,873 | 69.58 | 7,791 | 25.97 | 13,082.00 |
| කන්කසන්තුරය | 25,616 | 18,729 | 73.11 | 5,705 | 22.27 | 13,024.00 |
| මානිපේ | 35,627 | 26,958 | 75.67 | 7,225 | 20.28 | 19,733.00 |
| කෝපෙයි | 35,074 | 27,161 | 77.44 | 6,211 | 17.71 | 20,950.00 |
| උඩුප්පිඩි | 23,052 | 18,137 | 78.68 | 3,937 | 17.08 | 14,200.00 |
| පේදුරු තුඩුව | 22,320 | 17,388 | 77.90 | 4,213 | 18.88 | 13,175.00 |
| චාවකච්චේරි | 30,456 | 23,520 | 77.23 | 5,599 | 18.38 | 17,921.00 |
| නල්ලූර් | 31,212 | 24,929 | 79.87 | 5,405 | 17.32 | 19,524.00 |
| යාපනය | 23,096 | 17,994 | 77.91 | 4,502 | 19.49 | 13,492.00 |
| කිලිනොච්චි | 53,886 | 38,856 | 72.11 | 13,300 | 24.68 | 25,556.00 |
| මන්නාරම | 53,500 | 45,543 | 85.13 | 6,824 | 12.76 | 38,719.00 |
| වවුනියාව | 74,080 | 55,683 | 75.17 | 16,678 | 22.51 | 39,005.00 |
| මුලතිවු | 44,889 | 35,441 | 78.95 | 7,935 | 17.68 | 27,506.00 |
| කල්කුඩා | 72,075 | 60,342 | 83.72 | 10,337 | 14.34 | 50,005.00 |
| මඩකලපුව | 121,637 | 97,779 | 80.39 | 21,473 | 17.65 | 76,306.00 |
| පදිරුප්පු | 54,412 | 44,485 | 81.76 | 8,216 | 15.10 | 36,269.00 |
| සමන්තුරේ | 55,333 | 46,827 | 84.63 | 7,797 | 14.09 | 39,030.00 |
| කල්මුණෙ | 50,561 | 45,411 | 89.81 | 4,683 | 9.26 | 40,728.00 |
| පොතුවිල් | 105,148 | 81,547 | 77.55 | 22,425 | 21.33 | 59,122.00 |
| ත්‍රිකුණාමලය | 62,759 | 49,650 | 79.11 | 12,056 | 19.21 | 37,594.00 |
| මුතූර් | 65,719 | 57,532 | 87.54 | 7,132 | 10.85 | 50,400.00 |
| පුත්තලම | 84,277 | 58,844 | 69.82 | 24,235 | 28.76 | 34,609.00 |
| වෙන්නප්පුව | 75,339 | 35,218 | 46.75 | 39,523 | 52.46 | -4,305.00 |
| **එකතුව** | **1,968,190.00** | **1,451,458.00** | **73.75** | **478,195.00** | **24.30** | **973,263.00** |

35 ශ්‍රී ලංකා මැතිවරණ කොමිසම, 2015ජනාධිවරණයඃ ඡන්ද කොට්ඨාස අනුව දිස්ත්‍රික් ප්‍රතිඵල සහ දිවයින පුරා ප්‍රතිඵල (2015).

ආගමික සුළුතර ප්‍රජාවගේ ඉහළ සාන්ද්‍රණයක් සහිත ඡන්ද කොට්ඨාස 31 තුළ රාජපක්ෂට වඩා ඡන්ද 973,263ක් සිරිසේන විසින් ලබාගෙන තිබිණි. මෙම ප්‍රදේශයන්හි ඡන්ද මින් පෙර ලැබී තිබුණේ රාජපක්ෂට බැව් නොකිවමනාය. 2010 ජනාධිපතිවරණයේදී, රාජපක්ෂගේ විරුද්ධ අපේක්ෂකයා වූ සරත් ෆොන්සේකා විසින් මෙම ඡන්ද කොට්ඨාස 31 න් 27 ක් දිනාගන්නා ලදී. එනමුත් ෆොන්සේකා විසින් මෙම කොට්ඨාස දිනාගෙන තිබුණු සමස්ත වැඩි ඡන්ද ප්‍රමාණය වූයේ 385,936 කි. මෙසේ 2010 හා සංසන්දනය කරන විට, 2015 වසරේ රාජපක්ෂගේ විරුද්ධ අපේක්ෂකයා මෙම විශේෂ ඡන්ද කොට්ඨාසයන්හි සිය ඡන්ද පදනම 587,327 කින් ඉහළ නංවාගෙන ඇත. ඇතැම් විට මෙයින් බොහෝමයක් ඡන්ද අයත් වන්නේ අභිනවයෙන් ලියාපදිංචි වූ ඡන්දදායකයන්ට විය හැක[36]. එසේම සිරිසේන විසින් මෙම සමස්ත මැතිවරණය දිනාගනු ලැබුවේ ඡන්ද 449,072 කින්වීමද සුවිශේෂී වේ. එනිසා ඔහුගේ සමස්ත ජයග්‍රහණය බැර කළ හැක්කේ - අනෙකුත් සාධකද අතර- ආගමික සුළුතරයන්ගේ වැඩි සාන්ද්‍රණයක් සහිත ඡන්ද කොට්ඨාසයන්හි සැලකිය යුතු ලෙසින් වැඩිවී ඇති රාජපක්ෂ-විරෝධී ඡන්දයන්ට වේ.රාජපක්ෂ පාලනය සහ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වයත් අතර ඇති සම්බන්ධය මගින් යම් යම් ඡන්ද දායකයින්ගේ තීරණයන් හැඩසවීමට ඇතැයි සිතිය හැක.[37]

ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය අවසාන කරන බවට සිරිසේන විසින් ලබාදුන් ප්‍රතිඥාව මගින්, රජය මගින් අපරාධකරුවන්ව යුක්තිය ඉදිරියට ගෙන එනු ඇතැයිද, ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා සාධනීය නිවාරක ක්‍රියාමාර්ග හඳුන්වා දෙනු ඇතැයිද යනුවෙන් ආගමික සුළුතරයන් අතර බලාපොරොත්තු ප්‍රාණවත් කරන්නට යෙදිණි. බලය මාරුවත් සමගින් රටේ පොදුවේ දක්නට ලැබුණු මනෝභාවය මගින් මෙම බලාපොරොත්තුවේ හැඟීම විශාල වශයෙන් පිළිබිඹු කර සිටී. කෙසේ වුවත් ක්ෂණිකව පැන නගිනා උග්‍ර ජනවාර්ගික-ආග මික ප්‍රචණ්ඩත්වයේ අඩුවක් නිරීක්ෂණය කිරීමට හැකි වුවත්,[38] නිදන්ගත ප්‍රචණ්ඩත්වයේ මට්ටම විශාල වශයෙන් වෙනස් නොවීපැවතිණි. මෙසේ බැලූ විට ශ්‍රී ලංකාවේ නව දේශපාලනික සන්දර්භය මගින්, ආගමික නිදහස විෂයෙහි ලා ප්‍රබල පරිවර්තනයක් සිදු කොට නොතිබුණි. ඒ වෙනුවට ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය සීමා කිරීමේ ආන්තික දියුණුවක් පමණක් ඇතැම් විට නිරීක්ෂණය කිරීමට හැක. මේ අතරේදී නව වර්ධනයන් තුනක්ද සාවධානාත්මක විමර්ශණයක් ඉල්ලා සිටින්නට යෙදුණේ, ඒවායින් ප්‍රජාවන් අතර නව ඉරිතැලීම් නිර්මාණයට හෝ තිබෙනා ඉරිතැලීම් තවත් දියුණු කිරීමට හේතු වූ බැවිණි. මෙම එක් එක් වැඩි වර්ධනයන් මගින්, ශ්‍රී ලංකාවේ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වයට එරෙහිව සටන් කිරීමෙහි ලා නව අභියෝගයන් නිර්මාණය කර ඇත.

---

36 මෙම ඡන්ද කොට්ඨාසයන් මගින් 2010 ට වඩා 2015 දී වලංගු වැඩි ඡන්ද 533,562ක් වාර්තා කර ඇත. මෙයින් විශාල ප්‍රමාණයක් අභිනවයෙන් ලියාපදිංචි ඡන්ද දායකයින් විසින් ලබාදීමේ හැකියාවක් තිබෙනා නමුත්, ඡන්දය ප්‍රකාශ කරන්නන්ගේ සංඛ්‍යාවේ වර්ධනය සහ අවලංගු ඡන්ද සංඛ්‍යාවේ පහත වැටීමද මෙම වැඩි වර්ධනයට දායක වන්නට ඇත.

37 ගුණතිලක, The Chronic and the Acute, පෙර සඳහන්, 49 පිටුව බලන්න. එසේම බලන්න, ගෙහාන් ගුණතිලක, 'Two Faces of Sri Lankan Media( Censorship and Resistance' සහනා උඩුප හා ස්ටීවන් ඩී.මැක්ඩොවෙල් (සංස්කරණයෙන්), Media as Politics in South Asia (රවුට්ලෙජ්2017).

38 එක්සත් ජනපදයේ රාජ්‍ය දෙපාර්තමේන්තුව - ප්‍රජාතාන්ත්‍රික කටයුතු කාර්යාංශය, මානව හිමිකම්, සහ ශ්‍රමික, '2015 ශ්‍රී ලංකා ජාත්‍යන්තර ආගමික නිදහස් වාර්තාව' International Religious Freedom Report for 2015 (2016).

### 1.3.1 සිංහල-බෞද්ධ කලහකාරී කණ්ඩායම් ප්‍රධාන ධාරාව බවට පත්වීම

බොදු බල සේනා, සිංහල රාවය සහ රාවණා බලය වැනි සිංහල-බෞද්ධ කලහකාරී කණ්ඩායම් වල නිශ්චිත සාමාජික සංඛ්‍යාව ප්‍රකටව නොමැත. කෙසේ නමුත් ඔවුන්ගේ බලපෑම කෙතරම් දුරට විහිදී ඇතිදැයි යන්න පිළිබඳව මූලික වැටහීමක් ලබාගැනීමට ප්‍රවේශයන් ද්විත්වයක් ප්‍රයෝජනවත් විය හැක. පළමුව, මෙම කණ්ඩායම් වල සමාජ ජාල අනුගාමිකත්වය මගින් ඔවුන්ට සහාය දක්වන පදනම සම්බන්ධයෙන් දළ වශයෙන් හැඟවුමක් කරනු ඇත. උදාහරණයක් ලෙසින් දක්වන්නේ නම්, 2017 නොවැම්බර් මස වනවිට බොදුබල සේනා සඳහා වූ ෆේස්බුක් අනුගාමික සංඛ්‍යාව දළ වශයෙන් 73,000 ක් විණි.[39] මේ අතරේදී, සිංහල රාවය සහ රාවණා බලය සඳහා වූ ෆේස්බුක් අනුගාමික සංඛ්‍යාව පිළිවෙලින් පරිශීලකයින් 8,500 සහ 1,800 වී තිබිණි. මෙම සංඛ්‍යාවන් මගින් පැහැදිලිවම පිළිබිඹු වන්නේ, වර්තමානය වන විට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන සිංහල-බෞද්ධ කළහකාරී කණ්ඩායම් අතරින් බොදුබල සේනා ආධිපත්‍යය දරණා බවයි.

දෙවෙනුව, මැතිවරණ සංඛ්‍යා ලේඛනයන් මගින්ද මෙම සිංහල-බෞද්ධ කළහකාරී කණ්ඩායම් වලට ඇති සහාය පදනම පිළිබඳව අවබෝධයක් ලබාදෙනු ඇත. උදාහරණයක් ලෙසින් දක්වන්නේ නම් 2015 පාර්ලිමේන්තු මැතිවරණය සඳහා බොදු බල සේනා කණ්ඩායම, බොදු ජන පෙරමුණ (BJP) ලෙසින් තරග කළ අතර, ඔවුන් ඡන්ද 20,370ක් ලබාගැනීමට සමර්ථ වුණි[40]. වගු අංක 2 මගින්, දිස්ත්‍රික් අනුව බොදු ජන පෙරමුණ ලබාගත් ඡන්ද සංඛ්‍යාව වෙන් කොට දක්වා ඇත.

**වගුව 2: දිස්ත්‍රික්ක අනුව බොදු ජන පෙරමුණ ලබාගත් ඡන්ද[41]**

| දිස්ත්‍රික්කය | | ඡන්ද ප්‍රමාණය |
|---|---|---|
| 1. | කොළඹ | 2,137 |
| 2. | ගම්පහ | 1,664 |
| 3. | කළුතර | 5,727 |
| 4. | නුවර | 2,305 |
| 5. | මාතලේ | 402 |
| 6. | නුවර එළිය | 313 |
| 7. | ගාල්ල | 3,041 |
| 8. | මාතර | 0 |
| 9. | හම්බන්තොට | 419 |

39 බොදුබල සේනා ඇතැම් ෆේස්බුක් අනුගාමිකයින් එම සමූහය හා රැඳී සිටින්නේ හුදු කුතුහලය හෝ අන්තර්ගතයන් නිරීක්ෂණය කිරීමේ අරමුණෙන් මිස, මතවාදයන් සමපාත වීම නිසාම නොවිය හැකි බවද සඳහන් කළ යුතුවේ.

40 ශ්‍රී ලංකා මැතිවරණ කොමිසම, 2015 පාර්ලිමේන්තු මැතිවරණයඡන්ද කොට්ඨාස අනුව දිස්ත්‍රික්ක ප්‍රතිඵල සහ සමස්ත ලංකා ප්‍රතිඵල (2015).

41 එහිම.

| | | |
|---|---|---|
| 10. | යාපනය | 0 |
| 11. | වන්නි | 0 |
| 12. | මඩකලපුව | 0 |
| 13. | දිගාමඩුල්ල | 64 |
| 14. | ත්‍රිකුණාමලය | 0 |
| 15. | කුරුණෑගල | 788 |
| 16. | පුත්තලම | 441 |
| 17. | අනුරාධපුර | 285 |
| 18. | පොළොන්නරුව | 160 |
| 19. | බදුල්ල | 688 |
| 20. | මොණරාගල | 0 |
| 21. | රත්නපුර | 413 |
| 22. | කෑගල්ල | 1,530 |
| **එකතුව** | | **20,370** |

බොදු ජන පෙරමුණට පාර්ලිමේන්තුවේ ආසනයක් සුරක්ෂිත කරගැනීමට ප්‍රමාණවත් තරමේ ඡන්ද ලබාගැනීමට නොහැකිවූවත්, 20,000 කට වැඩි ඡන්ද ලබාගනිමින් කුඩා ඡන්ද පදනමක් තමන් වෙනුවෙන් පෙන්වා දීමට ඊට හැකියාව ලැබිණි. 2013 සහ 2014 වසර වලදී වූ ජනවාර්ගික -ආගමික ප්‍රචණ්ඩ ක්‍රියාවන් තුළ ඉදිරි පෙළ සිටීමේ බොදු බල සේනා ඉතිහාසය දෙස බලනා විට, මැතිවරණමය වශයෙන් අල්ප වූවත් ඔවුන්ගේ සහාය දක්වන්නන්ගේ සංඛ්‍යාව සැළකිල්ලට ගත යුතු තරම් වේ. එසේම බොදුජන පෙරමුණේ ඉහළම ඡන්ද සංඛ්‍යාව වාර්තා වන්නේ, 2014 දී අලුත්ගම කෝලාහල ඇතිවූ කළුතර දිස්ත්‍රික්කයේ වීම විශේෂයෙන්ම බිය ගෙනදෙනා කරුණක් වේ.  රටේ ඇති සියලුම ඡන්ද කොට්ඨාසයන්ගෙන් අලුත්ගම පිහිටා ඇති ඡන්ද කොට්ඨාසය වන බේරුවලදීම පොදුජන පෙරමුණ ඔවුන්ගේ ඉහළම ඡන්ද ප්‍රමාණය (2,119) වාර්තා කර ඇත. අලුත්ගම කෝලාහලයේදී ප්‍රචණ්ඩ ක්‍රියාවන් සිදුකළ අපරාධකරුවන් සැබවින්ම එම ප්‍රදේශයේ පදිංචිකරුවන් බවට එහි වින්දිතයින් විසින් කළ ප්‍රකාශයන්, මෙම මැතිවරණ ප්‍රතිඵලය මගින් තහවුරු වේ.[42] මෙම සංඛ්‍යාලේඛනයන් මගින්, ආගමික සුළුතරයන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සහ සහ එම සුවිශේෂී ස්ථානයේ බොදු බල සේනා ලබා ඇති ජනප්‍රියත්වය පිළිබඳව සිත කළඹවන සුළු සම්බන්ධයක් පිළිබිඹු කරයි. වගු අංක 3 මගින්  බොදු ජන පෙරමුණ විසින් ඉහළම ඡන්ද ප්‍රමාණයන් ලබාගත් ඡන්ද කොට්ඨාසයන් අට පෙන්වා දී ඇත. මෙම ස්ථානයන්ගෙන් බොහෝමයක් තුළ 2013 සහ 2014 වසර වලදී ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වයන් -විශේෂයෙන්ම මුස්ලිම් ප්‍රජාවට එරෙහිව- වාර්තා වී ඇති බව මවිතය උපදවන කරුණක් නොවේ.

42 ෆර්සානාහනීෆා, හරිනි අමරසූරිය සහ විශාකා විජේනායක, Where Have All the Neighbours Gone@ Aluthgama Riots and its Aftermath: A Fact Finding Mission to Aluthgama" Dharga Town" Valipanna and Beruwela (Law & Society Trust 2015), 24 පි.

## වගුව 03 - බොදු ජන පෙරමුණ මගින් ඉහළම ඡන්ද සංඛ්‍යාවන් ලැබූ කොට්ඨාසයන්[43]

| ඡන්ද කොට්ඨාසය | ඡන්ද ප්‍රමාණය |
|---|---|
| බේරුවල | 2,119 |
| අම්බලංගොඩ | 1,236 |
| මතුගම | 953 |
| බලපිටිය | 867 |
| කරන්දෙණිය | 803 |
| කළුතර | 652 |
| මාවනැල්ල | 623 |
| පානදුර | 520 |

බොදු බල සේනා විසින් බොදු ජන පෙරමුණ ලෙසින් දේශපාලනයට පිවිසීම, මෙම කණ්ඩායම තමන්ව උග්‍ර-ජාතිකවාදී ඡන්ද දායකයින්ගේ මැතිවරණ අපේක්ෂකයන් ලෙසින් තහවුරු කරගැනීමේ අරමුණක් ඇතිව සිටිනා බව ඉඟි කරන්නකි. සැබවින්ම 2017 නොවැම්බරයේ දී ගිංතොට ප්‍රචණ්ඩ ක්‍රියාවන් සිදුවූ වහාම බොදු බල සේනා මහලේකම් ගලගොඩ අත්තේ ඥාණසාර ස්ථවිරයන් විසින් විකට සහගත ලෙසින් රඟදක්වන්නට යෙදුණු 'සාමදූත' භූමිකාව මගින් පිළිබිඹු වන්නේ, බොදු බල සේනා තමන්ගේ ප්‍රතිරූපය ප්‍රතිස්ථාපනය කිරීම සඳහා පූර්ව සූදානමක් ඇතිව කළ උත්සාහයකි.[44] පාලනය නොකළහොත් හෝ නොනැවැත්වුවහොත්, බොදු බල සේනා ව්‍යාපාරයේ සංවිධාන යාන්ත්‍රණය සංවර්ධනය වීමේ වැඩි ඉඩක් ඇති අතර, කාලයත් සමගින් එය තම ඡන්ද පදනම වර්ධනය කරගනු ඇත.

සාධනීය මැතිවරණ විකල්පයක් ලෙසින් බොදු බල සේනාව ක්‍රමිකව නැවත උත්පාදනය හේතු දෙකක් නිසා භයානක වනු ඇත. පළමුව ප්‍රචණ්ඩ කලහකාරී කණ්ඩායම් වලට මැතිවරණ දේශපාලනය තුළ ක්‍රියා කිරීමට ඉඩ ලබාදීමෙන් ඔවුන්ගේ න්‍යාය පත්‍රයන් සුජාත භාවයට පත් කිරීම මෙන්ම ඔවුන්ව ධෛර්යමත් වීමද සිදුවිය හැක. බොදු බල සේනා වැනි කණ්ඩායම් මගින් දේශපාලන නායකයන් අතර තමන්ට වලංගු භාවයක් ලබා ගැනීම උදෙසා, ඔවුන් ජනගහණයෙන් සැලකිය යුතු ප්‍රමාණයක දුක්ගැනවිලි නියෝජනය කරන්නේය යන කරුණ වාසි සහගත ලෙසින් භාවිතා කරන්නට ඉඩ ඇත. ඇතැම් විට බොදු බල සේනාව 2016 ජනවාරි 18 දින, සිදුවීමට අඩු ඉඩක් තිබූ ජනපති මෛත්‍රීපාල

43 ශ්‍රී ලංකා මැතිවරණ කොමිසම, 2015පාර්ලිමේන්තු මැතිවරණ, පෙර සඳහන්,.

44 ධරිෂා බැස්ටියන්, 'Gintota and the shadows of extremism'" Daily FT" 23 November 2017, http://www.ft.lk/opinion/Gintota-and-the-shadows-of-extremism /14-643843 [අවසන් වතාවට ප්‍රවිශ්ට වුයේ 2017 නොවැම්බර් 29].

සිරිසේන සමගින් හමුවක් ලබාගැනීම සාක්ෂාත් කරගන්නේත්,[45] 2016 නොවැම්බරයේදී අධිකරණ අමාත්‍ය විජයදාස රාජපක්ෂ මුණගැසෙන්නේත්[46] උක්ත සන්දර්භය තුළ විය හැක.

දෙවෙනුව ප්‍රධාන ධාරාවේ දේශපාලනය තුළට කලහකාරී කණ්ඩායම් පැමිණීම මගින් බොහෝ විට ප්‍රධාන ධාරාවේ දේශපාලනය යම් මට්ටමකට රැඩිකල් ආස්ථානයන් ගැනීමේ ඉඩක් ඇත. උග්‍ර-ජාතිකවාදී ඡන්ද සඳහා තරග කරනා පක්ෂයන්, එම ඡන්ද ආකර්ෂණය කර ගැනීම උදෙසා එකිනෙකාට 'පරදා ලංසු තැබීමට' ඉලක්කය ගනු ඇත. නීල් ඩිවෝටා විසින් මෙම සංසිද්ධිය නිර්වචනය කරන්නේ, 'දේශපාලකයින් විසින් තමන්ගේ විරුද්ධවාදීන් යොදාගෙන ඇති සුළුතර-විරෝධී ස්ථාවරයන්'පරදවා ලංසු තැබීමට' වැඩසටහන් සහ අවකාශයන් නිර්මාණය කරනා වෙන්දේසියකට සමාන ක්‍රියාදාමයක්' ලෙසිනි.[47] ඔහු පැහැදිලි කරන්නේ මේ ආකාරයේ ජය ගැනීම සඳහා ලංසු තැබීම්, නිදහස ලැබීමේ සිටම ශ්‍රී ලංකාවේ තිබූ භාවිතාවක් වූ බවටයි. 1950 දී ස්වභාෂා ව්‍යාපාරය ලෙසින් ආරම්භ වුණු, ඉංග්‍රීසි බස වෙනුවට සිංහල සහ දමිළ භාෂාවන් යොදාගැනීම ඉක්මනින්ම 'ජය සඳහා ලංසු තැබීමේ' බහුතරවාදී දේශපාලනය බවට පරිණාමය විණි.[48] රටේ ජනගහණයෙන් හතරෙන් තුනක්ම සිංහල බව වටහා ගැනීමත් සමගින්, රටේ ප්‍රධාන පක්ෂයන් දෙක (එක්සත් ජාතික පක්ෂය සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය) මගින් 'සිංහල ප්‍රජාව වෙනුවෙන් වඩාත් හොඳ ගනුදෙනුවක් ලබාදෙන්නේ කවුරුන්ද යන්න පිළිබඳව ලංසු තබා දිනීමට' පරිශ්‍රම දරණ ලදී.[49] දශක කිහිපයක් පුරා, මෙම සිංහල දේශපාලන පක්ෂයන්හි එකිනෙකා පැරදවීමට ලංසු තැබීම භාෂාමය ජාතිකවාදයෙන් එපිටට පැතිරිණි.[50] ඩිවෝටා ට අනුව ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂයන් විවිධ කරුණු සඳහා එකිනෙකාව පරදවා ලංසු තැබීම දිගින් දිගටම සිදුකළ අතර', එයින් එම භාවිතාව දිවයිනේ දේශපාලන සංස්කෘතිය තුළ මුල් බැසගන්නට යෙදුණි.[51]

මැතිවරණයන් සමගින් බොදු බල සේනාවේ විද්‍යමාන වීම මිශ්‍ර වීම මගින් ඇතැම් විට ජාතික හෙළ උරුමය සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළ මහින්ද රාජපක්ෂට සහාය පළ කරනා කොටස වැනි අනෙකුත් ජාතිකවාදී පක්ෂයන් මගින් එකිනෙකාව පරදවා ලංසු තැබීම

45 'President meets BBS leaders'" Ceylon Today, 2016 ජනවාරි 19.

46 බලන්න රසික ජයකොඩි, 'Justice Minister's statement earns ire of Muslim Ministers'" The Sunday Observer, 2016 නොවැම්බර් 27, http://www'sundayobserver.lk/2016/11/27/justice-minister]E2]80]99s-statement-earns-ire-muslim-ministers [අවසන් වතාවට ප්‍රවිශ්ටවුයේ29අගෝස්තු2017].

47 නීල් ඩිවෝටා, 'From Ethnic Outbidding to Ethnic Conflict( The Institutional Bases for Sri Lankazs Separatist War' (2005) 11(1) Nations and Nationalism 141-159, 141-144හි. ජනවාර්ගික වැඩි ලංසු තැබීමට කොන්දේසි හතරක් මගින් අවකාශ සපයන බව කතුවරයා කියයි. එනම් දේශපාලන ව්‍යුහය, අයහපත් නායකයින්, සමාජ-ආර්ථික අයුක්තීන් සහ භෞමිකත්වය වේ.එසේම බලන්න නීල් ඩිවෝටා, Blowback( Linguistic Nationalism" Institutional Decay" and Ethnic Conflict in Sri Lanka (ස්ටැන්ෆර්ඩ් සරසවි මුද්‍රණාලය 2004).

48 ඩිවෝටා" 'From Ethnic Outbidding to Ethnic Conflict'" 142හි.

49 එහිම.

50 එහිම.

51 එහිම. 143හි. එසේම බලන්න නීල් ඩිවෝටා, 'Sri Lanka's Political Decay( Analysing the October 2000 and December 2001 Parliamentary Elections' (2003) 41(2) Commonwealth and Comparative Politics 115-142.

සඳහා වඩ වඩාත් උග්‍ර-ජාතිකවාදී ස්ථාවරයන් ආරූඪ කරගැනීම සඳහා තල්ලු කෙරෙනු ඇත. මාධ්‍යවේදියෙකු සහ දේශපාලන අදහස් දක්වන්නෙකු වන රසික ජයකොඩි මෙසේ නිරීක්ෂණය කරයිඃ "2015 පාර්ලිමේන්තු මැතිවරණයට පෙරාතුව බොදුබල සේනාවේ සහ හිටපු ජනපති රාජපක්ෂගේ මැතිවරණ ව්‍යාපාරයන් අතර ප්‍රබල සමපාත වීම් තිබිණි.[52]" ජයකොඩි විසින් තර්ක කරන්නේ මෙම මැතිවරණ ව්‍යාපාරයන් දෙකම ප්‍රබලව උග්‍ර-ජාතිකවාදී වාගාලංකාරයන් මත යැපුණු අතර, බොහෝ බොදු බල සේනා ආධාරකරුවන්ද උපාය මාර්ගිකව බලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ රාජපක්ෂ පිලට ඡන්දය ලබාදෙන්නට ඇති බැවින් බොදු බල සේනාවේ සැබෑ අනුග්‍රාහක පදනම එය ලබාගත් ඡන්ද ප්‍රමාණයට වඩා බොහෝ විශාල විය හැකි බවටත් වේ.[53]

මේ අතරවාරයේදී බොදු බල සේනාව සිය න්‍යාය පත්‍රය වඩාත් පුළුල් කරන්නට යෙදුණේ පෙනෙනා ලෙසට වඩාත් පෘතුල අනුග්‍රාහක පදනමක් සඳහා සිය ආකර්ෂණය විස්තීර්ණ කිරීම සඳහායි. 2013 සහ 2014 කාලය අතරතුරදී බොදු බල සේනාව අවධානය යොමු කොට තිබුණේ මුස්ලිම්-විරෝධී මතයක් ගෙන යෑමටයි. 2015 ජනවාරි බල පෙරළියෙන් පසු කාලය තුළදී එය තම න්‍යාය පත්‍රය, හමුදා සාමාජිකයින්ට එරෙහි වගවීම් ක්‍රියාමාර්ග යන්ට එරෙහි වීම දක්වා දිගු කරන ලදී. මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ අතුරුදන් වීම සම්බන්ධයෙන් වූ නඩුවේ විභාග කිරීමේ කටයුතු බොදු බල සේනාව විසින් කඩාකප්පල් කිරීම, මෙම විස්තාරණයට උදාහරණයක් ලෙසින් දැක්විය හැක. බොදු බල සේනා මහලේකම් ගලගොඩ අත්තේ ඥාණසාර ස්ථවිරයන් 2016 ජනවාරි 25 වන දිනදී හෝමාගම අධිකරණයට කඩාවැදී සාක්ෂ්‍යකරුවන්ට ආක්‍රොශ පරිභව කළ අතර, නීතිපති දෙපාර්තමේන්තුව ද එයට මැදිහත් විණි. ඔහු ප්‍රකාශ කොට සිටියේ මෙම නඩුවේදී හමුදා සාමාජිකයින්ව අයුතු ලෙසින් චෝදනාවට ලක් කොට ඇති බවයි. මෙම අශෝභන මැදිහත්වීම පසුව ඔහුට විරුද්ධව අධිකරණයට අපහාස කිරීමේ චෝදනා එල්ල වීම දක්වා දිගු විණි.[54] මෙම බොදු බල සේනා න්‍යාය පත්‍රයේ විස්තාරණය, යුධ සමයේ සහ පශ්චාත් යුධ සමයේ සිදුවූ මානව හිමිකම් අවභාවිතාවන් කෙරෙහි වගවීම් ලබාදීම සඳහා කැපවන බවට නව රජය විසින් ප්‍රකාශ කිරීම හා අනුරූප වේ. මෙම වගවීමේ ක්‍රියාමාර්ගයන් අත්පත් කරගෙන ඇත්තේ ඉතාමත් සීමා සහිත ප්‍රගතියක් වූවත්,[55] බොදු බල සේනාව බලාපොරොත්තු වූයේ දකුණේ සිංහල-බෞද්ධ ප්‍රජාවන් -විශේෂයෙන්ම ත්‍රිවිධ හමුදාවන්ට සම්බන්ධකම් ඇති අයවලුන්- අතරේ පැවතිය හැකි වගවීම්-විරෝධී මතයන්ගෙන් වාසි ලබාගැනීමටයි. එපරිද්දෙන් බොදු බල සේනාවේ මෙම පියවර මගින් සිංහල-බෞද්ධයන්ගේ දුක්ගැනවිලි සඳහා හඬ නැගීමට බොදු බල සේනාවට ඇති සුජාත භාවය වැඩි දියුණු කෙරෙන්නට ඉඩ ඇත.

---

52 ජයකොඩි, පෙර සඳහන්,.

53 එහිම.

54 'Punish those who disrupt Court hearing of Eknaligoda abduction case( FMM'" The Daily FT) 28 January 2016, at http://www.ft.lk/article/521594/Punish-those-who-disrupt-Court-hearing-of-Eknaligoda-abduction-case(--FMM [අවසන් වතාවට ප්‍රවිශ්ටවුයේ2017 අගෝස්තු 29]

55 බලන්න වෙරි තෙරිසර්ච්, Sri Lanka: Resolution 30/1 Implementation Monitor - Statistical and Analytical Review No' 2 (2017 මාර්තු).

## 1.3.2 මුස්ලිම් කල්ලි වාදය

ශ්‍රී ලංකාවේ ජනවාර්ගික වර්ගයන් අතර ප්‍රචණ්ඩත්වය දෙස ජනවාර්ගික-ආගමික කෝණයකින් බැලීමෙන් සිදුවිය හැකි එක් අඩුපාඩුවක් වන්නේ, එයින් වර්ගයක් තුළ පවත්නා කල්ලිවාදය සැඟව යා හැකි වීමයි. මෙම සංකීර්ණතාව විශේෂයෙන්ම මුස්ලිම් සමාජය තුළ දක්නට ලැබෙනා අතර, එය බොහෝ විට 'ඒකල ආගමික-සහ-ජනවාර්ගික සන්ථවයක්' ලෙසින් වරදවා වටහා ගැනිණි.[56] යම් ප්‍රජා අභ්‍යන්තර ගැටුම් සහ ජනවාර්ගික -ආගමික ප්‍රචණ්ඩත්වයේ වඩාත් පුළුල් ප්‍රවණතාවයන් විමසා බැලීම මගින් උක්ත සඳහන් අඩුහුහුඩුකම හා කටයුතු කිරීමට උත්සාහ ගැනීම මෙම කොටස මගින් සිදුවේ.

ශ්‍රී ලංකාවේ මුස්ලිම් ජන සමාජය තුළ අභ්‍යන්තර ගැටුම් සහ රැඩිකල්කරණය පිළිබඳව වැඩි වැඩියෙන් සාක්ෂ්‍ය දකින්නට ලැබේ.[57] මෙවැනි වර්ධනයක් මගින් ජනවාර්ගික-ආගමික ආතතියට සහ ප්‍රචණ්ඩත්වයට නව ප්‍රභවයන් සැපයිය හැක. ඩෙනිස් මැක්ගිල්ව්‍රි විසින් ආගම් අභ්‍යන්තර ආරාවුල් සහ පොදු ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය අතර සම්බන්ධතාවය පිළිබඳව තියුණු නිරීක්ෂණයක් සිදුකොට ඇත.[58] ඔහු තර්ක කොට සිටින්නේ අරාබියානු ඇඳුම් ආයිත්තම්, පොදු දේවධාර්මික ගැටුම් සහ නව යැදුම් ස්ථාන ඉදිකිරීම යන ආකාරයන්ගෙන් වන සංකේතීය'ඉස්ලාම්කරණය' හරහා බොහෝවිට ඉස්ලාමයේ භාවිතය සම්බන්ධයෙන් වන 'තියුණු අභ්‍යන්තර අර්බුද' ඇතිවන බවයි.[59] ශ්‍රී ලංකාව තුළ ඉස්ලාමයේ ඉතිහාසයේ බොහෝ ප්‍රමාණයක් මුළුල්ලෙහි 'භක්තිය සහතික කර පෙන්වන්නා වූ පිටස්තර විද්‍යමාන වීම් විශාල වශයෙන් නොමැති බැවින්', මෙම ඉස්ලාම්කරණය සාපේක්ෂ වශයෙන් නව සංසිද්ධියක් වෙයි.[60] මෙම අභ්‍යන්තර අර්බුදයන්ගේ බාහිර දෘශ්‍යමාන වීම් මගින්, සමස්තයක් ලෙසින් ඉස්ලාමය'පෙනෙනා ප්‍රමාණය' වැඩි කොට ඇත. පෙර සිටම ජනවාර්ගික-ආගමික ඉරිතලා යැම් ඇති පසුතලයක මෙම 'පෙනෙනා ප්‍රමාණයට' අනෙකුත් ජන ප්‍රජාවන් අතර භීතිය සහ සැකය ඇවිස්සීමට හැක.

ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් පිළිබඳව ලෝනා දේවරාජා විසින් කළ මූලික වැඩ කොටස මගින්, ඉතිහාසය පුරාවට මුස්ලිම්වරුන්ගේ අනන්‍යතාවය නිර්මාණය සම්බන්ධයෙන් වැදගත්

---

56 බෙන්ජමින් ෂොන්තාල්, 'Environments of Law'( Islam" Buddhism" and the State in Contemporary Sri Lanka' (2016) 75(1) The Journal of Asian Studies 137-156, 144හි. එසේම බලන්න ක්වදිරිඉස්මායිල්, 'Unmooring Identity( The Antinomics of Elite Muslim Self-Representation in Modern Sri Lanka' ප්‍රදීප් ජෙගනාදන් හා ක්වදිරිඉස්මායිල් (සංස්කාරකවරු), Unmaking the Nation( The Politics of Identity and History in Modern Sri Lanka (ICES 1995), 55-105හි.

57 'මුස්ලිම්' යන පදය පොදුවේ භාවිතා වන්නේ ඉස්ලාම් දහම පිළිපදින ශ්‍රී ලාංකීය යෝනක ප්‍රජාව හැඳින්වීමටයි. යෝනකවරුන්ට අමතරව මැලේ, බෝරා හා මෙමොන් ඇතුළු වෙනත් ප්‍රජාවන්ද ඉස්ලාමය පිළිපදී.

58 ඩෙනිස් මැක්ගිල්ව්‍ර, 'Sri Lankan Muslims( Between Ethno-Nationalism and the Global Ummah' (2011) 17 (1) Nations and Nationalism 45-64.

59 එහිම'McGilvray's observation is cited in Faslan and Vanniasinkam" op' cit'" at 2.

60 විජය සමරවීර, 'The Muslim Revivalist Movement, 1880-1915' මයිකල් රොබර්ට්ස් (සංස්කරණය), Sri Lanka( Collective Identities Revisited: Vol. 1 (මාර්ග ආයතනය1997), 296හි.

අවබෝධයක් ලැබේ.[61] දේවරාජා විසින් සඳහන් කරන්නේ මුස්ලිම් ආගමික භක්ති පුනර්වන ව්‍යාපාරය, දහනව වන සියවසේ අගභාගයේ වූ බෞද්ධ සහ හින්දු පුනර්වනවාදයන් සමගින් සමපාත වන බවයි.[62] පිටුවහල් කළ ඊජිප්තියානුවෙකු වූ ඔරාබිපාෂා වැනි ප්‍රතිසංස්කරණ වාදීන්ගේ මුල්කාලීන නායකත්වය යටතේ වූ මෙම ව්‍යාපාරයේ ප්‍රතිඵලයන් ලෙස මුස්ලිම් අධ්‍යාපන ආයතන ස්ථාපනය සහ මුස්ලිම් පුවත්පත් ප්‍රචාරණය සිදුවිය.[63] මේ මගින් මුස්ලිම්වරුන් අතර ස්වකීයත්වය පිළිබඳ අදහස් ජනනය වීමට මෙන්ම නියෝජනය කිරීමට ඇති අයිතියේ හිමිකාරීත්වය සඳහා පෙළඹවීමක් ලබාදුනි.[64] එසේ වුවත් මුස්ලිම් කල්ලිවාදය ප්‍රජා-අභ්‍යන්තර ගතිකයක් ලෙසින් පැන නැගුණේ විසිවන සියවස මැදදී පමණි. මොහමඩ් ෆස්ලාන්ට සහ නඩීන් වන්නියසිංකම්ට අනුව, '1950 සිට මුස්ලිම් ප්‍රජාව තුළ නොයෙක් කණ්ඩායම් සහ උප-කණ්ඩායම් වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙසට, මුස්ලිම් ප්‍රජාව කැබලි කැඩී භේද බින්න වීම සිදුවුණි.'[65] මෙම සංසිද්ධිය සඳහා කරුණු දෙකක් හේතු වූවා විය හැක. පළමුව ෆස්ලාන් සහ වන්නියසිංහම් විසින් සඳහන් කළ පරිදි, 1970 අග භාගයේ ඇතිවූ නිදහස් ආර්ථිකය මගින් ශ්‍රී ලංකාවේ ඉස්ලාම් උගතුන්ට නිදහසේ ලෝක ව්‍යාප්ත ඉස්ලාමීය හා සම්බන්ධතා පැවැත්වීමට ඉඩ ලැබිණි.[66] කාලයත් සමගින් මෙම සම්බන්ධතා පැවැත්වීම මගින් -දේශීය මුස්ලිම් පරිචයන් සිංහල, දමිළ හෝ ඉන්දියානු සූෆි සංස්කෘතික ආභාෂයන් ලැබූ බවට විවේචනයන් එල්ල කළ - පාරිශුද්ධවාදී නැතිනම් 'මූලධර්මවාදී' ඉස්ලාම් ව්‍යාපාරයන්ට උත්ප්‍රේරණය සපයන ලදී. ඉක්බිති මුස්ලිම් ප්‍රතිසංස්කරණවාදීන්, සාම්ප්‍රදායික ආගමික නායකයින් මත විශ්වාසය තබනු වෙනුවට භක්තිවන්තතාවය සහ පාඨ ග්‍රන්ථ විෂයික දැනුම මත පදනම් වූ අධිකාරීත්වයක් ගොඩනැංවීමට අවධානය යොමු කිරීම අරඹන ලදී.[67] මෙම විතැන් වීම මගින් භක්තිවන්තයින් මත සංකේන්ද්‍රිය වූ අධිකාරීත්වය වැඩි වැඩියෙන් අසීරු කළ අතර, නානාවිධ ඉස්ලාම් කණ්ඩායම් නිර්මාණයටද ඉඩ සලසන ලදී.[68] බර්ට් ක්ලෙම් ඒ අනුසාරයෙන් සඳහන් කරන්නේ, මුස්ලිම්වරුන් - විශේෂයෙන්ම නැගෙනහිර පළාතේ වෙසෙනා මුස්ලිම්වරුන්- අවසානයේදී 'නානාප්‍රකාර ලක්ෂණ ඇති සහ එකිනෙකාගෙන් වෙනස්' ලෙසින් මතුවී ඇති බවයි.[69] මෙම පසුබිම යටතේ, ජමාතී ඉස්ලාමි සහ තබ්ලිගි ජමාත් වැනි දකුණු ආසියාතික මූලධර්මවාදී ආභාෂයන් සහිත කණ්ඩායම් මගින් ආරම්භයේදී ශ්‍රී ලංකාවේ ඉස්ලාමය ඊනියා පවිත්‍රකරණය කිරීමේ කටයුත්තේ පෙරමුණ ගෙන තිබිණි. මෙම කණ්ඩායම් මගින් අබ්දූර් රවූෆ් කණ්ඩායම

61 ලෝනා දේවරාජා, The Muslims of Sri Lanka: One Thousand Years of Ethnic Harmony, 900-1915 (ලංකා ඉස්ලාමීය පදනම 1994).

62 එහිම.153හි.

63 එහිම.153-154හි.

64 එහිම.154හි.

65 ෆස්ලාන් හා වන්නියසිංහම්, පෙර සඳහන්., 3හි.

66 එහිම. aඑ 13.

67 බෙන්ජමින් ෂොන්තාල්, 'Environments of Law', පෙර සඳහන්, 146හි, හනීෆා උපුටා දක්වමින්, 'Piety as Politics',පෙර සඳහන්,

68 එහිම.

69 බාර්ට් ක්ලෙම්, 'Islam" Politics and Violence in Eastern Sri Lanka' (2011) 70(3) Journal of South Asian Studies 730-753, ෆස්ලාන් හා වන්නියසිංහම්හි සඳහන්, පෙර සඳහන්, 3හි.

වැනි සුෆිමතවාදීමය කණ්ඩායම් සමගින් ගැටුණු අතර, ඔවුන් 'එදිරිවාදී' ලෙසින් යම් විටක හැඳින්වූවත්, එම විස්තර කිරීම විවාදාපන්න වී තිබිණි.[70] දෙවෙනුව සවුදි අරාබියානු තෙල් සම්පත නැගී ඒම වැනි ගෝලීය සංවර්ධනයන් මගින් ඉස්ලාමීය පුනර්ජීවනයට මහා පරිමාණයෙන් අරමුදල් සැපයීමට හැකියාව ලැබිණි.[71] ඉස්ලාමීය බුද්ධිමතෙකු වන අශ්-ෂෙයික්මුනීර් මුලාෆර්ට අනුව, 1970 අගභාගයේ සිට දේශීය මුස්ලිම් කණ්ඩායම් සහ සවුදි අරාබියානු චින්තකයින් අතර ක්‍රමයෙන් වැඩිවූ විද්වත් සබඳතා හරහා ඉස්ලාමයේ කලහකාරී ධාරාවන් ශ්‍රී ලංකාවට ලඟා වී ඇත.[72] උදාහරණයක් ලෙසින් දක්වන්නේ නම්, තව්හීද් ජමාත් වැනි කණ්ඩායම් වෙත ප්‍රබල සවුදි අරාබියානු වහාබි ආභාෂයන් ඇත. දකුණු ආසියානු මූලධර්මවාදී කණ්ඩායම් වලට ප්‍රතිපක්ෂ ලෙසින්, මෙම සාපේක්ෂව නවමු වහාබි කණ්ඩායම් චර්යානුගතව ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් අතර ප්‍රචණ්ඩත්වය අවුළුවා ඇත.[73] කාලයත් සමගින් තව්හීද් ජමාත් බහුවිධ උප කණ්ඩායම් බවට කැඩී බිඳී ගොස් ඇත. කොළඹ පදනම් කොටගත් උප කණ්ඩායම් වන දාරුස්සලාෆ්, සමස්ත ලංකා තව්හීද් ජමාත් (ACTJ) සහ ශ්‍රී ලංකා තව්හීද් ජමාත් (SLTJ) මෙන්ම මඩකළපුව පදනම් කොටගත් ධාරුල්අධාර් සහ කාත්තාන්කුඩි පදනම් කොටගත් ජාතික තව්හීද් ජමාත් (NTJ) යන කණ්ඩායම්ද උක්ත සඳහන් උප-කණ්ඩායම් වෙත ඇතුළත් වේ.[74] තව්හීද් ජමාද් කණ්ඩායම් අතරින් වඩාත්ම කලහකාරී කණ්ඩායම වන්නේ ජාතික තව්හීද් ජමාද් විය හැක. 2000 දී සහ 2006 දී කාත්තාන්කුඩියෙන් අබ්දුර් රාවුෆ් කණ්ඩායම ප්‍රචණ්ඩ ලෙසින් පිටමං කිරීම බැර වන්නේ අවසානයේදී ජාතික තව්හීද්ජමාද් නිර්මාණය කළවුන්ට වේ.[75] මේ අතරේදී සාම්ප්‍රදායික සුෆි කණ්ඩායම් එක්තරා ප්‍රමාණයකට ජාතික දේශපාලනය තුළ සහ තමන් ඉස්ලාමීය දේවධර්මයේ අග්‍ර සංවිධානය ලෙසින් හඳුන්වා ගන්නා ආයතනයක් වන සමස්ත ලංකා ජමියතුල් උලමා (ACJU) තුළ නියෝජනය වී ඇත.[76]

2009 දී මෙම සුෆි-වහාබිගැටුම සැලකිය යුතු ලෙසින් තියුණු විණි. 2009 පෙබරවාරියේදී වාර්තා වූ ආකාරයට තව්හීද් ජමාද් සාමාජිකයින් විසින් උකුවෙල පිහිටි වසර 150ක් පැරණි දේවස්ථානයක් විනාශ කරන ලදී.[77] 2009 ජූලි මාසයේදී බේරුවලදී තව්හීද් ජමාද් සහ ක්වඩ්‍රි

70 ෆස්ලාන් හා වන්නියසිංහම්, පෙර සඳහන්, 13-14හි.

71 ජයිල්ස් කපෙල්, Jihad: on the Trail of Political Islam (හාවර්ඩ් සරසවි මුද්‍රණාලයේ බෙල්ක්නැප් ප්‍රකාශනය 2002), 69-75හි.

72 'Religious Freedom in Sri Lanka( Confrontation or Cooperation' යන මැයින්, ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි කවුන්සිලය මගින් 2017 සැප්තැම්බර් 18 -20 දක්වා මීගමුවේදී පැවැත්වුණු සම්මන්ත්‍රණයේදී, 2017 සැප්තැම්බර් 18 වෙනි දින ජාතික සහ පැවැත්මේ ෂූරා මණ්ඩලයේ කමිටු සාමාජික ඇෂ්-ෂෙයික්මුනීර්මුලාෆෆේර් විසින් පැවැත්වූ දේශනය

73 ෆස්ලාන් හා වන්නියසිංහම්, පෙර සඳහන්, 14හි.

74 එහිම.15.

75 එහිම. 15-16'

76 සමස්ත ලංකා ජමියතුල්උලමා වෙබ් අඩවිය බලන්න, at http://www.acju.lk/en/about-us [අවසන් වතාවට ප්‍රවිශ්ටවුයේ2017 අගෝස්තු 29%.එසේම බලන්න ෂොන්තාල්, 'Environments of Law', පෙර සඳහන්, 147හි (15 සටහන බලන්න). කතු සටහන්: 'සමස්ත ලංකා ජමියතුල්උලමා සංවිධානය විශේෂිත උප කමිටු දහයකින් සමන්විත වේ. ඊට අධ්‍යාපන කමිටුවක්, ප්‍රකාශන කමිටුවක්,ප්‍රචාරණ කමිටුවක් (අන්‍යාගම්කරණයට කැපවූ, දා'වා), ඉස්ලාමීය බැංකු උපදේශන කමිටුවක්, හලාල්-සහතික කිරීම් කමිටුවක් සහ පසුගිය වසර 8 තුළ ෆත්වා 160 ක් නිකුත් කොට ඇති තිස්පස් පුද්ගල ෆත්වා කමිටුවක් ඇතුළත් වේ

77 බලන්න ස්ටීවන් ෂ්වාට්ස් සහ ඉර්ෆාන් අල්-අලාවි, 'The Wahhabi Invasion of Sri Lanka'" Colombo Telegraph, 2013 මාර්තු 27, https://www'colombotelegraph'com/index'php/එhe-wahhabi-invasion-of-sri-lanka/ys[අවසන් වතාවට ප්‍රවිශ්ටවුයේ2017 අගෝස්තු 29].

(Qadivi) සුෆි කාණ්ඩය අතර ප්‍රචණ්ඩත්වය පුපුරා යන ලදී. මෙම සිදුවීම හරහා දෙදෙනෙකු මරු දැක, 40 කට වැඩි පිරිසකට තුවාල සිදුවූ අතර, 132 දෙනෙකු අත් අඩංගුවට ගැනිණි.[78] මෙම ගැටුම සිදුවූයේ, ප්‍රදේශයේ තිබූ වහාබි මුස්ලිම් දේවස්ථානයක් වූ මස්ජිදුර් රහ්මාන් පල්ලියේ අනුගාමිකයින් විසින් තමන්ව 'මිත්‍යා දෘෂ්ටිකයින්' ලෙසින් හැඳින්වූ බවට ක්වඩ්‍රි (Qadivi) භක්තිකයින් විසින් කළ ප්‍රකාශයන් හේතුවෙනි. මෙම බේරුවල සිදුවීම මගින් සමස්ත ලංකා ජමියතුල් උලමා ඇතුළු මුස්ලිම් ප්‍රජාව තුළ වූ යම් කොටස් තුළ, තම විවිධත්වය සඳහා අවකාශය පවත්වා ගන්නා අතරතුරදීම මුස්ලිම් එක්සත් භාවයක් ඇති කරගැනීමේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් අන්තරාවලෝකනයක් සිදුකිරීම සඳහා මඟ පාදන ලදී.[79]

මුස්ලිම් කල්ලිවාදය මගින් රට තුළ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වයේ සමස්ත ස්වභාවය විෂයෙහි එකිනෙකට වෙනස් වූ ප්‍රතිඵලයන් ද්විත්වයක් කරා මග සාදන ලදී. එක් අතකින් මුස්ලිම් ප්‍රජා-අභ්‍යන්තර ගැටුම් මගින් අනන්‍යතාවයේ තිර ප්‍රකාශයන් සඳහා ප්‍රේරණයක් ලබාදුන් අතර, යම් යම් ඉස්ලාමීය ප්‍රගුණයන් පෙනෙනා ප්‍රමාණය වැඩිකරන්නටද යෙදිණි. නැගෙනහිර පළාතේ නිරීක්ෂකයින් විසින් ප්‍රකාශ කළ ආකාරයට, සාපේක්ෂව ඉහළ මට්ටමක ඊකියා වියුක්තියද හා එක්තැන් වූ මෙවැනි මුස්ලිම් ප්‍රජා-අභ්‍යන්තර ගැටුම් මගින්, මුස්ලිම් තරුණයින්ව ගතානුගතික ඉස්ලාම් සාරධර්මයන් ප්‍රචාරණය කිරීමේ දැක්මක්ද සහිතව මද්රසා, එනම් ඉස්ලාමීය ඉගැන්වීම් සහිත පාසැල් තුළ පූර්ණකාලීනව සේවය කිරීමට ආකර්ෂණය කොට ගෙන ඇත.[80] මෙම සාරධර්ම හරයන්ගේ බාහිර විද්‍යාමාන වීම, සුදු පැහැ ජුබ්බා හැඳීම සහ දිගු රැවුල වැවීම යනාදියෙන් නිරීක්ෂණය කළ හැක. තවදුරටත් මුස්ලිම් කාන්තාවන් පොදු ස්ථානවලදී හිජාබය (විවිධාකාරයේ හිස් ආවරණයන්) පැළඳීමද අපේක්ෂා කෙරේ. එම්. ඒ. නුහුමාන් වැනි උගතුන් තර්ක කොට සිටින්නේ, හිජාබය යනු නියමාකාර 'මුස්ලිම් අනන්‍යතාවයේ සංකේතයක්' බවටයි.[81] මෙසේ බලනා විට මෙම ආගමික විද්‍යමානවීම් යනු අනන්‍යතාවයේ ප්‍රකාශනයන් ලෙසින් අවබෝධ කරගත යුතුවේ. මුස්ලිම් කණ්ඩායම් මගින් ෂරියාව දැඩිව පිළිපදින්නන් ලෙසින් තිරව පෙන්වීමේදී එකිනෙකාව පරයා සිටීමට තරග කරනා හෙයින්, මුස්ලිම් කල්ලිවාදය මගින් ඉහත ආකාරයේ ප්‍රකාශනයන්ට දිරිය ලබාදීමට සහ ගතානුගතික මුස්ලිම් භාවිතයන් පෙනෙනා ප්‍රමාණය වැඩි කිරීමට කටයුතු කිරීමේ නැඹුරුවක් ඇත. මෙම දිරිගැන්වීම් ආර්ථික සාධකයන්ගෙන් තවදුරටත් සංයුක්ත වී ඇත. උදාහරණයක් ලෙසින් දක්වන්නේ නම් මඩකළපුව නිරීක්ෂණය කලවුන් ප්‍රකාශ කොට සිටියේ, ප්‍රදේශයේ සිටින එකිනෙකාට විරුද්ධවාදී වහාබි කණ්ඩායම් සවුදි අරාබියෙන් අරමුදල් ලබාගැනීම සඳහා එකිනෙකාව පරයා සිටීමට නිතරම උත්සාහ ගන්නා බවයි.[82] මෙවැනි අරමුදල් සාමාන්‍යයෙන් ෂරියාව වඩාත් දැඩිව

78 එහිම.

79 ෆස්ලාන් හා වන්නියසිංහම්, පෙර සඳහන්, 20.

80 2017 මාර්තු 31 දින, කල්මුනේ වෙළඳ සංගමය සමගින් ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාවක්..

81 එම්.ඒ.නුහ්මාන්, Sri Lankan Muslims( Ethnic Identity within Cultural Diversity (ICES 2007) 205හි.

82 2017 මාර්තු 30, මඩකළපුව සිවිල් සමාජ ෆෝරමයේ සාමාජිකයෙකු හා සම්මුඛ පරීක්ෂණය.

පිළිපැදීම සහ ගතානුගතික වහාබි භාවිතයන් වෙත බැඳී ඇත. මෙම සංසිද්ධියට හොඳ උදාහරණයක් වන්නේ නිකාබය, එනම් හිජාබය අඳිනා කාන්තාවන්ගේ මුහුණ ආවරණය කරනා රෙදිකඩ පළඳින බවට කාත්තාන්කුඩියේ කාන්තාවන් වෙත පනවා තිබූ විධානයයි. මෙසේ මුස්ලිම් කල්ලිවාදය විසින් පුරුෂාධිපතිවාදී ආකල්පයන් ස්ථාවර කිරීම සහ ඇතැම් මුස්ලිම් ආධිපත්‍යය ඇති ප්‍රදේශයන්හි ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවයට හානි කිරීම සිදුකර ඇත.

මේ අතරේදී, මෙවැනි ඉස්ලාමීය භක්තියේ මතභේදකාරී විද්‍යමාන වීම් මගින්, නිකාබය තහනම් කරනා ලෙසින් බල කර සිටිනා බොදුබල සේනා වැනි සිංහල-බෞද්ධ කලහකාරී කණ්ඩායම්වල අවධානය තමන් වෙත යොමුකොට ගෙන ඇත.[83] මෙම කණ්ඩායම් මගින් මතුකරනා තර්කය වන්නේ නිකාබය පැළඳ සිටින්නාගේ අනන්‍යතාවය තහවුරු කරගැනීමට නොහැකි වන නිසාවෙන් එයින් ආරක්ෂාවට තර්ජනයක් එල්ල වන බවයි. මෙම තර්කය මගින්, මුස්ලිම්වරුන් සාමයට සහ ආරක්ෂාවට තර්ජනයන් වන බවට වන ඉස්ලාම් භීතිකා විදහා දැක්වීම් බලගැන්වෙයි. තවදුරටත්, මෑතකදී කළ ගැටුම් සිදුවීම් සිතියම්ගත කිරීම් මගින් හෙළිදරවු වන්නේ, මුස්ලිම්වරුන් තමන්ව අනෙක් ප්‍රජාවන්ගෙන් වෙන් කොට තබාගැනීමට සහ අනෙක් ප්‍රජාවන් හා අන්තර් සම්බන්ධතා පැවැත්වීම ප්‍රතික්ෂේප කිරීමට නැඹුරුතාවක් දක්වන බවට සිංහල-බෞද්ධ ප්‍රජාව තුළ වන පොදු වැරදි වැටහීමයි.[84] මෙසේ මුස්ලිම් කල්ලිවාදය මගින් ඉස්ලාමීය භාවිතාවන් දැඩි නිරීක්ෂණයක් යටතට පත් කොට ඇතිවාක්සේම, අචේතනාන්විතව ශ්‍රී ලංකාවේ මුස්ලිම්-විරෝධී හැඟීම් ඇතිවීම කෙරෙහි දායකත්වයක්ද ලබා දී ඇත.

අනෙක් අතට, මුස්ලිම් කල්ලිවාදය මගින් ආත්ම පරීක්ෂාවක් සඳහා උනන්දුවක් ඇති කිරීම සහ මුස්ලිම් ප්‍රජාව තුළ යම් 'හරි වැරදි පරීක්ෂාව හරහා සීමාවන් පැනවීමක්' නිර්මාණය කර තිබීමද සිදුව තිබිණි.[85] යම් යම් අවස්ථාවන්හි දී මුස්ලිම් කණ්ඩායම් අතර වූ ගැටුම් මගින් මුස්ලිම් නායකයින් හට එක්සත් බව, මධ්‍යස්ථභාවය සහ විවිධ දේවධාර්මික දෘෂ්ටීන් ඉවසීම සඳහා ඉල්ලා සිටීමට බල කෙරී ඇත.[86] මුස්ලිම්වරුන් නිරන්තරයෙන් මුහුණ පානා බරපතළ අගතීන් සඳහා ප්‍රජාවක් ලෙසින් මුස්ලිම්වරුන්ටම වරද පැටවෙනා අවස්ථාවක, 'වින්දිතයින්ට වරද පැටවීමේ' කතිකාවක් මග හැරීම වැදගත් වේ. එනමුත් මුස්ලිම්වරුන්ගේ පටු ආකල්පයන් සහ ඉස්ලාම් සිරිත් විරිත් පිළිබඳ සැක ශංකාවන් සම්බන්ධව ගැඹුරින් තිබෙන්නා වූ වැරදි වැටහීම් නැති කර දැමීම සඳහා, එවැනි අන්තරාවලෝකනයක් වැදගත් විය හැක. සිංහල-බෞද්ධ ප්‍රජාවේ යම් යම් කොටස් තුළ වන එවැනි වැරදි වැටහීම් සහ සැක සංකාවන් නැති කිරීම, අනාගතයේදී සිංහල-බෞද්ධ සහ මුස්ලිම් සබඳතාවයන්

83 මෙසාරා ටෙගාල්, 'BBS calls for ban on Niqab'" The Sunday Leader, 2013 ජූනි 23, http://www'thesundayleader.lk/2013/06/23/bbs-calls-for-ban-on-niqab/ [අවසන් වතාවට ප්‍රවිශ්ටවුයේ2017 අගෝස්තු 29].

84 ජයසිංහ, පෙර සඳහන්, 11හි.

85 ෆස්ලාන් හා වන්නියසිංහම්, පෙර සඳහන්, 25හි.

86 එහිම.

නැවත ස්ථාපනය කිරීම සඳහා වන ප්‍රවේශය වනු ඇත. මෙසේ රටේ ජනවාර්ගික-ආගමික සබඳතා කෙරෙහි මුස්ලිම් කල්ලිවාදය සංකීර්ණ සහ යම් පමණකට විරුද්ධාභාසී බලපෑමක් තිබී ඇත.

### 1.3.3 දමිළ-හින්දු වාදය කරලියට පැමිණීම

පෙනෙනා ලෙසට දමිළ-හින්දු වාදය මෑතකදී, දමිළ ජාතිකවාදී අරගලය තුළ සුවිශේෂී ධාරාවක් ලෙසින් නැවත-මතුවී තිබේ. එය යම් යම් ඓතිහාසික මූලයන් ඇති ධාරාවක් වන නමුත්, ශතවර්ෂයකට ආසන්න කාලයක් එය ඉඳුරාම අක්‍රියව පැවතිණි. ඒ.ජේ.විල්සන්ට අනුව, හින්දු පුනර්ජීවන ව්‍යාපාරය ආරම්භ වූයේ බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරයටත් බොහෝ පෙරාතුවය.[87] දහ නව වන සියවසේ අපර භාගය තුළ ශෛවත (ශිව දෙවිඳුන්ගේ හින්දු අනුගාමිකයින්) හින්දු දහම ආරක්ෂා කිරීමට සහ ව්‍යාප්ත කිරීමට සිදුකළ වැඩ කොටස හරහා, උක්ත කී පුබුදුවට ආරුමුකනාවලර් මූලිකව වගකියයි. ඔහුගේ මුඛ්‍ය අවධානයට ලක් වූයේ ක්‍රිස්තියානි අන්‍යාගමිකකරණයට එදිරිව ක්‍රියා කිරීමයි.[88] විල්සන් විසින් තර්ක කොට සිටින්නේ, 'නාවලර් විසින් ශෛවත හින්දු කුල සැකැස්ම තුළ දමිළ වෙල්ලාල කුලීනයන්ගේ ප්‍රමුඛතාවය හඳුනාගැනීමෙන් අපගමනය නොවූයේය' යන කාරණය නිසා දමිළ දේශපාලනයේ ප්‍රභූ පිරිස් නාවලර්ගේ න්‍යාය පත්‍රයට සහාය ලබාදුන් බවටයි.[89] කෙසේ වුවත් නාවලර් විසින් දරා සිටින මතය වන්නේ, නාවලර් විසින් සුවිශේෂයෙන් හින්දු දර්ශනය දමිළ දේශපාලනයට සම්බන්ධ නොකළ බවයි. එනිසා මෙම හින්දු පුනර්වන ව්‍යාපෘතිය මගින් සෘජුවම දමිළ-හින්දු වාදය යන සංකල්පය බිහි කිරීමට නොයෙදෙන්නට හැක. එසේ වුවත් මුරුගර් ගුනසිංගම්ට අනුව, හින්දු පුනර්වන ව්‍යාපාරය මගින් 'දමිළ ස්වයං-විඥාණය' ඇතිවීමට පෙළැඹුම ලැබූ අතර, දමිළ ජාතිකවාදී ව්‍යාපාරයටද එය පදනම එළන ලදී.[90]

කෙසේ වෙතත් විශාල වශයෙන් පැවතුණු ප්‍රධානතම හින්දු අනන්‍යතාවයක් විශාල වශයෙන් අනාගාමිකව පැවති දමිළ ජාතික දේශපාලනය තුළ විද්‍යමාන නොවුණි. අඩු තරමින් ඓතිහාසික වර්ධනයන් දෙකක් මගින් මෙවැනි අනාගමිකත්වයක් ඇතැම් විට පැහැදිලි කරනු ඇත. පළමුව, නිදහස ලැබීමෙන් පසු දමිළ දේශපාලනයේ නායකත්වය ලැබුණේ, ආගමික වෙනස්කම් නොසලකා දමිළ හින්දූන්ගේ සහාය භුක්ති විඳි ක්‍රිස්තියානුවන් වෙතට විණි. මෙම සහාය පැන නැගුනේ, පොන්නම්බලම් රාමනාදන් වැනි මුල් හින්දු

87 ඒ.ජෙයරත්නම් විල්සන්, Sri Lankan Tamil Nationalism( Its Origins and Development in the Nineteenth and Twentieth Centuries (UBC මුද්‍රණාලය 2000), 53හි.ගොම්බ්‍රිච් හා ඔබේසේකර හි සිංහල-බෞද්ධ පුනර්වන ව්‍යාපාරය යම් ගැඹුරකින් සාකච්ඡා වී ඇත,

පෙර සඳහන්, 202-238හි. එසේම බලන්න කේ.කෛලාසපති, සමාජ විද්‍යාඥයින්ගේ සංගමයෙහි 'Cultural and Linguistic Consciousness of the Tamil Community', Ethnicity and Social Change in Sri Lanka (සමාජ විද්‍යාඥයින්ගේ සංගමය 1984).

88 එහිම.එසේම බලන්න රාධිකාකුමාරස්වාමි සහ නිමන්ති පෙරේරා-රාජසිංහම්, 'Being Tamil in a Different Way( A Feminist Critique of the Tamil Nation' ආර්.චීරන් (සංස්කරණය), Pathways of Dissent( Tamil Nationalism in Sri Lanka (SAGE ප්‍රකාශන 2009) 113-114හි.

89 එහිම, 53-54හි.

නායකයින් 1930 දී සර්වජන ඡන්ද බලයට විරුද්ධ වූ බවට වන අවබෝධයත් සමග විය හැක. විල්සන් විසින් දරණ මතය වන්නේ එවැනි විරුද්ධත්වයක් තිබුණේ, සර්වජන ඡන්දය හඳුන්වා දුන්නේ නම් දමිළ ප්‍රජාවේ ලැදියාවන්ට එරෙහිව සිංහලයන්ට ලැබෙනා සංඛ්‍යාත්මක වාසියෙන් එම ලැදියාවන් ආරක්ෂා කිරීමට බවයි.[91] එසේ වුවත් ආනන්ද ගුරුගේ වැනි කතුවරුන් ඇතුළු අනෙකුන් විසින් යෝජනා කොට සිටියේ සර්වජන ඡන්ද බලය සඳහා විරුද්ධ වීමට රාමනාදන්ගේ පෙළැඹවීම පාදක වී ඇත්තේ කාන්තාවන්ට සහ වෙල්ලාල නොවන කුල සඳහා ඡන්ද අයිතිය පිරිනැමීමට හින්දු ආගම තුළින් පැමිණෙන විරුද්ධත්වය මත බවයි.[92] මෙම ප්‍රකාශයේ සත්‍යතාවය කුමක් වුවත්, උතුරේ සහ නැගෙනහිර වසන දමිළ ප්‍රජාවගේ වඩාත් පුළුල් වශයෙන් වූ පොදු පිරිසකට අනාගමික අරගලයක් ආකර්ෂණීය වීමේ හැකියාවක් ඇත. එනිසා ෆෙඩරල් පක්ෂයේ එස්.ජේ.වී.චෙල්වනායගම් වැනි පශ්චාත්-නිදහස් නායකයින්ව ඔවුන්ගේ ක්‍රිස්තියානි අනන්‍යතාවය තිබියදීවුවත් හින්දු බහුතරය වෙසෙන උතුර හා නැගෙනහිර පළාත් වල නායකයින් ලෙසින් පිළිගැනිණි. චෙල්වනායගම් විසින් 1947, 1956, 1960, 1965, 1970 හා 1975 යන වසර වලදී, හින්දු බහුතරය වෙසෙන ප්‍රදේශයක් වන කන්කසන්තුරෙයි ආසනය දිනාගන්නාලදී.[93] මේ අනුව ඩී. බී. එස්. ජෙයරාජ් විසින් නිරීක්ෂණය කරන්නට යෙදුණේ, ශ්‍රී ලංකාවේ දමිළ සමානාත්මතාවය සඳහා වූ දේශපාලන අරගලය ජනවාර්ගික-භාෂාමය නැඹුරුවක[94] පිහිටි අතර ජනවාර්ගික-ආගමික නැඹුරුවක නොපිහිටි බවයි.[95]

දෙවනුව, එල්ටීටීඊය යටතේ වූ දමිළ දේශපාලනය විශේෂයෙන්ම අනාගමික විණි. එල්ටීටීඊ නායකත්වය විසින්, ඉන්දියාවෙන් වඩාත් ඉහළ සහායක් ලබාගැනීම සඳහා හින්දු අනන්‍යතාවය වැළඳ ගන්නා ලෙසින් හින්දු සටන්කාමීන්ගෙන් පැමිණි පීඩනයට ප්‍රතිරෝධය දක්වන ලදී. එල්ටීටීඊ නායකත්වය පවත්වාගෙන ගිය අදහස වූයේ, තම ව්‍යාපාරයට දමිළ කතෝලික පූජකයින්ගෙන් සහ ප්‍රොතෙස්තන්ත ක්‍රිස්තියානිවරුන්ගෙන් සහාය ලැබුණු බවත් එවැනි සහායක් නැති කර ගැනීමට නොහැකි බවත් වේ.[96] එනිසා දමිළ-හින්දු අනන්‍යතාවයක් වගා දිගා කරගැනීමට තිබූ ඕනෑම පෙළඹවීමක් මැඩ පැවැත්වුණේ, හරි හෝ වැරදි හෝ එල්ටීටීඊ පාලනය අතරතුරදී දමිළ ජනවාර්ගික-භාෂාමය සමජාතීය අනන්‍යතාවයට අනුග්‍රහයක් දක්වමිනි. දමිළ-හින්දුවාදය මුඛ්‍ය මතවාදය ලෙසින් හඳුන්වා දීම සඳහා වූ ඕනෑම ප්‍රයත්නයක් මෙම ප්‍රවේශය ඔස්සේ නිශේධනය විණි.

---

90 බලන්න මුරුගර්ගුණසිංහම්, Sri Lankan Tamil Nationalism: A Study of its Origins (MV ප්‍රකාශන 1999).

91 ඒ.ජෙයරත්නම් විල්සන්, The Break-up of Sri Lanka( The Sinhalese-Tamil Conflict (සී.හර්ස්ට් සහ සමාගම ප්‍රකාශන 1988), 9-11හි. එසේම බලන්න කේ.එම්.ඩි සිල්වා" 'The Construction of a Democratic Electoral System' දුෂ්‍යන්ත මෙන්ඩිස් (සංස්කරණය), Electoral Processes and Governance in South Asia (SAGE ප්‍රකාශන 2007), 135හි.

92 ආනන්ද ගුරුගේ, Peace at Last in Paradise (AuthorHouse ප්‍රකාශන 2011) 217 හා 259හි.

93 ඩී.බී.එස්.ජෙයරාජ්, 'Tamil —Extremists^ target Sampanthan and Sumanthiran of the TNA as —Traitors^'" Daily Mirror" 2015 පෙබරවාරි 27, http://www'dailymirror.lk/65029/tamil-extremists-target-sampanthan-and-sumanthiran-of-the-tna-as-traitors#sthash'9dHXTLuh'dpufys [අවසන් වතාවට ප්‍රවිශ්ටවුයේ2017 අගෝස්තු 29].

94 එහිම.

96 එස්.රත්නජීවන් එස්.හූල්, 'The Ethnic Conflict in Sri Lanka: The Christian Response and the Nationalist Threat' (1996) 2(2) ධර්ම දීපිකා 122-150, 125හි.

උතුරේ සහ නැගෙනහිර පශ්චාත්-එල්ටීටීඊ දේශපාලන ක්‍රමය තුළ දමිළ-හින්දුවාදය මුඛ්‍ය මතවාදය ලෙසින් හඳුන්වාදීමට එරෙහිව ප්‍රධාන විරෝධතාවයන් අන්තර්ගත නොවිණි. එම සන්දර්භය තුළ, අංකුරයක් ලෙසින් පැළවීගෙන එන දමිළ-හින්දු ව්‍යාපාරයක් මෑතකදී පැන නැගිණි. මෙම ව්‍යාපාරයේ නියත ශක්‍යතාවය පිළිබඳ සැබෑ නිශ්චිතභාවයකින් මත පළකිරීමට තවමත් වේලාසන වැඩි විය හැක.[97] එසේ වුවත් සිව සේනෛ යනුවෙන් වූ සංවිධානයක් මරවන් පුලවුසච්තානන්දන්ගේ නායකත්වය යටතේ මෑතකදී නිර්මාණය වූ අතර, එය ශිව සේනා වැනි ඉන්දියාවේ වඩාත් තිරව ස්ථාපනය වූ ජනවාර්ගික-ආගමික මතවාදීය කණ්ඩායම් වල සහායද සුරක්ෂිත කොට ගැනීමට සමත්ව තිබිණි.[98] සච්තානන්දන්ට අනුව, ශිවසේනෛහි අරමුණ වන්නේ, ''අනෙකුත් ආගමික කණ්ඩායම් වලින් පැමිණෙන තර්ජනයන්ගෙන් හින්දූන්ව ආරක්ෂා කිරීමයි''.[99] ඔහු ප්‍රකාශ කරනා ආකාරයට උතුරේ සහ නැගෙනහිර වෙසෙනා හින්දූන්, බෞද්ධ කොලනිකරණය හා ක්‍රිස්තියානි හරවා ගැනීම් නිසා පැවැත්ම පිළිබඳ තර්ජනයන්ට මුහුණ පා සිටී.[100] එසේම ඔහු චෝදනා කරනා ආකාරයට, මුස්ලිම්වරුන් සහ ක්‍රිස්තියානිවරුන් හට, තම ධර්ම ප්‍රචාරණයන් සඳහා විදෙස් රටවලින් ප්‍රතිපාදන ලැබේ.[101]

ශිව සේනෛ වැනි සංවිධානයන්ගේ සහ දමිළ-හින්දුවාදයේ පැන නැගීම, කරුණු දෙකක් නිසාවෙන් ශ්‍රී ලංකාවේ ජනවාර්ගික-ආගමික සබඳතාවයන්ට අනර්ථකාරී විය හැක. පළමුව මේ ආකාරයේ ස්වභාවයකින් යුක්ත සංවිධානයන් මගින් ජනනය කරනා කතිකාවන් නිසාවෙන් ප්‍රජාවන් අතර එදිරිවාදීකම් වැඩිදියුණු වීමේ හැකියාවක් ඇත. දමිළ හින්දුවාදය වනාහි සිංහල බෞද්ධවාදයේ අත්‍යන්තයෙන්ම විරුද්ධ පස ලෙසින් හැගිය හැක.[102] එනිසාවෙන් ශිව සේනෛ වැනි රැඩිකල් දමිළ-හින්දු කණ්ඩායම්, බොදුබල සේනා වැනි සිංහල බෞද්ධ කලහකාරී කණ්ඩායම් වල සතුරු ප්‍රතිවාදීන් විය හැක. මෙවැනි කණ්ඩායම් අතර ඇතිවන නිදන්ගත ප්‍රචණ්ඩත්වය - සහ ඇතැම් විට ක්ෂණිකව උග්‍ර වන ප්‍රචණ්ඩත්වය

---

97 මෙම විෂය පිළිබඳ තම අදහස් හා ආවර්ජනාවන් බෙදාගැනීම පිළිබඳව, අඩයාලම් ප්‍රතිපත්ති පර්යේෂණ කේන්ද්‍රයේ පර්යේෂණ අධ්‍යක්ෂ කේ.ගුරුබරන් වෙත කතුවරයා කෘතඥ වේ.

98 'Siva Senai in Sri Lanka gets Shiv Sena support'" The ෂික්බා, 2016 ඔක්තෝබර් 14, http://www.island.lk/index'php@page_cat}article-details&page}article-details)code_title}153748ys [අවසන් වතාවට ප්‍රවිශ්ට වුයේ 2017 අගෝස්තු 29].

99 'Now" a 'Siva Senai' group in Sri Lanka'" The Hindu, 2016 ඔක්තෝබර් 13, http://www'thehindu.com/news/international/south-asia/Now-a-]E2]80]98Siva-Senai]E2]80]99-group-in-Sri-Lanka/article16070094'ece [අවසන් වතාවට ප්‍රවිශ්ටවුයේ2017 අගෝස්තු 29% නැගෙනහිර පළාතේ ජනවාර්ගික-ආගමික සබඳතා පිළිබඳව කළ මෑතකාලීන අධ්‍යයනයකට අනුව, මඩකළපුවේ කළ ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාවන්හි දී හෙළිදරවු වූයේ දමිළ-හින්දු ප්‍රජාව අතරශිවසේනෛ කණ්ඩායම සඳහා සහායක් පවතින බවයි. බලන්න ජනවාර්ගික අධ්‍යයනයන් පිළිබඳ ජාත්‍යන්තර කේන්ද්‍රය, Community Perceptions of Religious Tolerance and Religious Tensions in Batticaloa and Trincomalee (ඉදිරියේදී).

100 එහිම.

101 එහිම.

102 සිංහල-බෞද්ධ සහ දමිළ-හින්දුත්ව කොටස් අතර එදිරිවාදීත්වයක් පිළිබඳ පැහැදිලි ඓතිහාසික සාධක නොමැති අතර, පසුව කියූ මතවාදය බොහෝ කොටම පැන නැගුණේ සිංහල-බෞද්ධ ආධිපත්‍යයට විරුද්ධත්වයක් ලෙසින් නොව බ්‍රිතාන්‍ය කොලනිවාදයට විරුද්ධත්වයක් ලෙසිනි. කෙසේ වුවත්, වර්තමාන සන්දර්භයේදී විශේෂයෙන්ම දමිළ-හින්දුවාදයදමිල ජාතිකවාදීන් විසින් සිංහල-බෞද්ධ ආධිපත්‍යයට විරුද්ධ වීමක් ලෙසින් යොදාගතහොත්, උක්ත කී ආකාරයේ එදිරිවාදීත්වයක් පැන නැගීමේ ඉඩක් ඇත.

පවා- නොසලකා හැර සිටිය නොහැක. දෙවෙනුව ශිව සේනෙ වැනි කණ්ඩායම් විසින්, ''බලහත්කාරයෙන් ආගම් වලට හැරවීම'' තහනම් කිරීමට ක්‍රියා කරන බවට ශපථ කොට ඇත. මෙම අරමුණෙහිදී දමිළ-හින්දු කණ්ඩායම්, කුඩා ක්‍රිස්තියානි කණ්ඩායම් මගින් කරන ක්‍රිස්තියානි ධර්ම ප්‍රචාරණය මර්දනය කිරීමෙහි ලා සිංහල බෞද්ධ කණ්ඩායම් සහ රෝමානු කතෝලික පල්ලිය වැනි මහා ධාරාවේ සභාවන්ට[103] ඌණපූරණය කිරීමේ හැකියාවක් ඇත. මෙහිදී සැලකිල්ලට ගත යුත්තේ ජාතික හෙළ උරුමය වැනි සිංහල බෞද්ධ ජාතිකවාදී පක්ෂයන් සහ හින්දු ආගමික සංවිධානය යන දෙකොටසම, 2004 වසරේ මුල් බලාත්කාරයෙන් අන්‍යාගම් වලට හැරවීම තහනම් කිරීමේ පනත ජයග්‍රහණය කරවීමට පක්ෂ වූ බවයි. එනිසා ''බලාත්කාරයෙන් අන්‍යාගම් වලට හැරවීම'' කෙරෙහි වන විවාදය නැවත පණගැන්වීමේ ශිවසේනෙ අරමුණ මගින්, ''සදාචාර විරෝධී අන්‍යාගම්කරණය'' තහනම් කිරීමේ නීති සඳහා අනුග්‍රහය දැක්වීම කෙරෙහි හින්දු කණ්ඩායම් වල ඓතිහාසික සම්බන්ධ වීම නිසැකවම ආකර්ෂණය කරගනු ඇත.[104] සැලකිය යුතු පරිද්දෙන්, අතීතයේදී හින්දූන් සහ බෞද්ධයන් හට ''සදාචාරාත්මක නොවන අන්‍යාගම්කරණය'' පිළිබඳව නීති සම්පාදන හඳුන්වා දීම සඳහා සහයෝගය දක්වන ලෙසින් ඉල්ලීම් සිදුවී තිබිණි.[105] එවැනි නීති නැවත හඳුන්වා දීම ඔස්සේ ක්‍රිස්තියානිවරුන්ට එරෙහිව වන ව්‍යුහගත ප්‍රචණ්ඩත්වය සඳහා අවකාශ සැපයීමක් විය හැක. ධර්ම ප්‍රචාරණය ඔස්සේ තම ආගමික විශ්වාසයන් ප්‍රකට කිරීමට උත්සාහ ගන්නා ක්‍රිස්තියානිවරුන්ට මෙවැනි නීති මගින් අවිවාදාත්මකව විසම, අගති සහගත ලෙසින් වෙනස් කොට සැලකීමක් සිදුවිය හැක.

මම කොටසේ සාකච්ඡාවට ගෙන ඇති වර්ධනයන් මගින්, ශ්‍රී ලංකාවේ අද්‍යතන ජනවාර්ගික -ආගමික සබඳතාවයන් තුළට නව සංකීර්ණත්වයන් කාවැද්දවීම සිදුවී ඇත. මෙම අධ්‍යයනයේ තුන්වන පරිච්ඡේදයෙන් සාකච්ඡා වී ඇති පරිදි එවැනි සංකීර්ණත්වයන්, සිංහල බෞද්ධ බහුතරයේ හිමිකාරීත්ව සංකීර්ණයන් හා පැවැත්ම පිළිබඳ භීතීන් වැනි සිංහල බෞද්ධ බහුතරය අනුගමනය කරනා ගැඹුරින් නිදන්ව ඇති සාධක පෝෂණය කිරීම සහ එම සාධක මතින් පෝෂණය වීම සිදුවේ. මෙම සාධක මගින් සිදුවන්නේ, ශ්‍රී ලංකාව තුළ වූ ශාරීරික, ශාරීරික නොවන හා ව්‍යුහගත ප්‍රචණ්ඩත්ව ආකාරයන් ස්ථාපනය කිරීම සඳහා මෙහෙ කිරීමයි.

---

103 බලන්න අජිත් අලහකෝන්, 'Cardinal calls for new laws to ban forcible conversion'" The ෂික්බා, 2017 මාර්තු 29, http://www.island.lk/index'php@page_cat}article-details&page}article-details&code_title}162777]C2]A0]C2]A0]20]C2]A0]20ys'[අවසන් වතාවට ප්‍රවිශ්ටවුයේ2017 අගෝස්තු 29%

104 උදාහරණ ලෙසින් දක්වන්නේ නම්, සමස්ත ලංකා හින්දු කොංග්‍රසය (ACHC), සමස්ත ලංකා තරුණ හින්දු සංගමය සහ ශ්‍රී ලංකා හින්දු කවුන්සිලය වැනි හින්දු සංවිධාන ගණනාවකම සහාය හින්දු-බෞද්ධ කාරක සභාවට ලැබුණු අතර, 2003 වසරේ ආගමික නිදහස පනත නම් පනත් කෙටුම්පතක් සැකසීමෙහි ලා ඔවුන් අතිවැදගත් විය. මෙම පනත් කෙටුම්පත මගින් සදාචාර විරෝධී අන්‍යාගමීකරණයි තහනම් කිරීමට බලාපොරොත්තු විණි. මෙම පනත් කෙටුම්පත එවකට බුද්ධ ශාසන අමාත්‍ය රත්නසිරි වික්‍රමනායක විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළත්, එය පාර්ලිමේන්තුව මගින් සම්මත කර නොගන්නා ලදී. බලන්න මයිකල් හර්ට්ස්බර්ග්, The Anti-Conversion Bill: Political Buddhism" Unethical Conversions" and Religious Freedom in Sri Lanka" Dissertation for the degree of philosophiae doctor (ජයෘ) at the University of Bergen (2016), at 242-244.

105 හර්ට්ස්බර්ග්, පෙර සඳහන්, 244හි. කතුවරයා සඳහන් කරන්නේ, The Buddhist Timesවාර සංග්‍රහයේ ලිපි පෙළක් 2003 සැප්තැම්බරයේදී 'Buddhism and Hinduism under Assault' යන මාතෘකාවට වෙන් වූ බවත්, සදාචාරාත්මක නොවන අන්‍යාගමිකකරණයට එරෙහිව ප්‍රතිචාර දැක්වීමේදී බෞද්ධයින් හා හින්දූන් අතර සහයෝගය ඉල්ලා සිටි බවත් වේ.

# දෙවන පරිච්ඡේදය
# සමකාලීන ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය

2015 ජනවාරි 9 වන දින රජයයන් මාරු වීමෙන් පසුව ශ්‍රී ලංකාවේ දක්නට ලැබුණු ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩ ක්‍රියාවන්ගේ ස්වභාවය මෙම පරිච්ඡේදය මගින් පිරික්සෙනු ඇත. මෙහිදී රාජ්‍ය නොවන සංවිධාන මගින් එක් රැස් කරනු ලැබූ, මුස්ලිම්වරුන්ට හා ක්‍රිස්තියානිවරුන්ට එරෙහිව වූ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වයන්ගේ සිදුවීම් වාර්තාවන් සහ සංඛ්‍යාලේඛන තොරතුරු වෙත අවධානය යොමු කෙරෙනු ඇත. එසේම 2015 ජනවාරි බල සංක්‍රාන්තියෙන් පසු කාලය තුළ, නිදන්ගත සහ සිදුවීමට ඉඩ ඇති ක්ෂණික උග්‍ර ප්‍රචණ්ඩත්වය ගැඹුරෙහි ඇති නව හෝ විකාසනය වූ සමාජ-සංස්කෘතික, ආර්ථික, දේශපාලන හෝ දේශීය සන්දර්භයානුගත ඉරිතැලීම් හඳුනා ගැනීමද ඒ මගින් සිදුවනු ඇත. ශ්‍රී ලංකාවේ ප්‍රජාතාන්ත්‍රික සංක්‍රාන්තීන් සිදුවූවද, ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය හා ඒ ගැඹුරෙහි පිහිටි ඉරිතලා යෑම් නොනැසී පවතින බව පැහැදිලි කිරීම මෙම පරිච්ඡේදයේ අරමුණයි.

## 2.1 සුළුතර කණ්ඩායම් වලට එරෙහි ප්‍රචණ්ඩත්වය

### 2.1.1 මුස්ලිම් භක්තිකයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය

2013 වසරේදී මුස්ලිම්වරුන්ට එරෙහිව වූ ශාරීරික, ශාරීරික නොවන හා ව්‍යුහගත ප්‍රචණ්ඩ ක්‍රියා සිදුවීම් 200 කට වැඩි ප්‍රමාණයක් වාර්තා විණි.[106] මේ අතරේ 2014 වසරේදීද මුස්ලිම්වරුනට එරෙහිව වූ ප්‍රචණ්ඩ ක්‍රියා දළ වශයෙන් 200 ක් පමණ වාර්තා විණි. [107]2013 සහ 2014 වසර වලදී මුස්ලිම්වරුන්ට එරෙහිව සිදුවූ ප්‍රචණ්ඩ ක්‍රියාවන් සිදුකිරීම විශාල වශයෙන් රාජ්‍ය අනුදැනුම සහිතව සිදුවිණි. මෙම රාජ්‍ය අනුදැනුම යන්න, සෘජුව ගත් විට බොදු බල සේනා වැනි කණ්ඩායම් සඳහා රාජ්‍ය අනුග්‍රහය දැක්වීම සහ වක්‍රාකාරයෙන් ගත් විට ප්‍රචණ්ඩකාරී සිදුවීම් අතරතුරදී රජය විරුද්ධ නොවීම හෝ අක්‍රියාකාරීව හිඳීම ඔස්සේ දැකිය හැක. 2015 දී, ප්‍රචණ්ඩ ක්‍රියා සිදුකරන්නන් හට රජය මගින් සෘජු සහාය ලබාදීම පහත වැටීම ඔස්සේ, මුස්ලිම්වරුන්ට එරෙහිව වන ප්‍රචණ්ඩත්වය පහත වැටෙනු ඇතැයි බලාපොරොත්තු විණි.

අනෙක් අතට මුස්ලිම් ප්‍රජාවට විරුද්ධව වූ ක්ෂණිකව උග්‍ර වන ප්‍රචණ්ඩ ක්‍රියාවන්, 2015 රජය මාරුවෙන් පසු පහත වැටිණි. මෙම ක්ෂණික උග්‍රතා ප්‍රචණ්ඩත්වයට, පුළුල්ව පැතිරුණු ශාරීරික ප්‍රහාරයන්, දේපළ විනාශ කිරීම් හා පොදුවේ නීතිය හා සාමයේ බිඳ වැටීම සම්බන්ධ වේ.

106 බලන්න ගුණතිලක, Chronic and the Acute, op. cit. 21හි. මෙහිදී සැලකිය යුතු වන්නේ, එකම සිදුවීම එක් ප්‍රචණ්ඩත්ව ආකාරයකට වඩා ගණනකට සම්බන්ධ විය හැකි බවයි. එහිදී සිදුවීම් ගණන, ප්‍රචණ්ඩ ක්‍රියාවන්ගේ සමස්ත ගණනට සමාන නොවේ.

107 එම, 24හි.

2015 ජනවාරි සහ 2017 නොවැම්බර් යන කාල පරාසය තුළ, අලුත්ගම කලබල හෝ ග්‍රෑන්ඩ්පාස් සිදුවීම හා සමාන කිසිදු සිදුවීමක් වාර්තා නොවුණි.[108] අනෙක් අතට ජනවාරි 2015 බල පෙරළියෙන් පසුව කාලය අතරතුරදීද මුස්ලිම්වරුන්ට එරෙහිව නිදන්ගත අන්දමේ ප්‍රචණ්ඩත්වයන් දිගින් දිගටම සිදුවිණි. උදාහරණ ලෙසින් දක්වන්නේ නම්, 2015 ජනවාරි සහ සැප්තැම්බර් අවසානය අතර කාලය තුළ, මුස්ලිම්වරුන් සඳහා වන මහලේකම් කාර්යාලය මගින් 'වෛරී ප්‍රකාශයන්, වෙනස් කොට සැලකීමේ ක්‍රියාවන්, මුස්ලිම් ආගමික ස්ථාන කෙළෙසීමට හෝ වැනසීමට තැත් කිරීම් සහ වාචික අපහාසයන් හෝ මුස්ලිම් සංස්කෘතික විධි හා චාරිත්‍ර වාරිත්‍රයන් ශාරීරික බලය යොදා වැළැක්වීමට තැත් කිරීම් යන සිදුවීම් 82 ක් වාර්තා කොට තිබිණි.[109] මෙම ප්‍රචණ්ඩ ක්‍රියා දිගින් දිගටම සිදුවන හා ස්වභාවයෙන්ම අඩු තීව්‍රතාවයකින් යුතු වන හෙයින් ඒ නිදන්ගත ප්‍රචණ්ඩත්වය යටතට වැටේ.

නිදන්ගත ප්‍රචණ්ඩත්වය දක්නට ලැබෙනා වඩාත්ම ප්‍රමුඛ ස්ථානයක් වන්නේ, සබරගමුව පළාතේ කුරගල පිහිටි දෆ්තාර් ජෛලානි මුස්ලිම් දේවස්ථානයයි. මෙම පරිශ්‍රය තුළ පුරාණ බෞද්ධ සෙනසුනක් තිබුණු බවට ප්‍රකාශ කෙරී ඇත.[110] එනිසා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින්, 1940 වසරේ අංක 8 දරණ පුරාවස්තු ආඥා පණත යටතේ මෙහි කැණීම් ආරම්භ කරන ලදී. ඉන් පසුව මුස්ලිම්වරුන් විසින් ප්‍රකාශ කරන්නට යෙදුණේ, සූෆි ඉස්ලාම් ශාන්තුවරයෙකු වූ ෂෙයික් මොහියුද්දීන් අබ්දුල් කදීර්ජිලානි ගේ අවශේෂයන් මෙම භූමියෙන් හමුවූ බවටත්, එනිසා මෙම සිද්ධස්ථානය මුස්ලිම් ප්‍රජාවට ආගමික වැදගත්කමකින් යුක්ත වන බවටත් වේ.[111]

2017 මාර්තු මස පැවැත්වුණු සම්මුඛ සාකච්ඡාවකදී දේවස්ථානයේ උප භාරකාර තැන විසින් නිරීක්ෂණය කොට තිබුණේ, දේවස්ථානයේ වන සූෆි පූජාසනය වෙත වසර පුරාම වන්දනාකරුවන් ආශක්ත වන බවයි.[112] වසරේ ප්‍රධානතම අංගය වන්නේ කන්දූරි උත්සවය වන අතර, ඊට දහස් ගණන් වන්දනාකරුවන් ආකර්ෂණය වේ. දේවස්ථානයේ පැවැත්වෙන නියම කන්දූරි උත්සවයක් සම්බන්ධයෙන් ඩෙනිස් මැක්ගිල්ව්‍රේ විසින් විචිත්‍ර චිත්‍රයක් නිර්මාණය කොට දක්වයි:

---

108 බලන්න එක්සත් ජනපදයේ රාජ්‍ය දෙපාර්තමේන්තුව, පෙර සඳහන්,

109 එහිම6හි.

110 කැමේලියානතානියෙල්. 'Kuragala( Buddhist Sacred Site or Sufi Shrine@' The Sunday Leader, 2013 ජූනි 2, http://www.එhesundayleader.lk/2013/06/02/kuragala-buddhist-sacred-site-or-sufi-shrine/ [අවසන් වතාවට ප්‍රවිශ්ටවුයේ2017 අගෝස්තු 29].

111 එහිම.එසේම බලන්න ඩෙනිස් බී.මැක්ගිල්ව්‍රේ, 'Jailani: A Sufi Shrine in Sri Lanka' ඉම්තියාස් අහ්මඩ් හා හෙල්මුත්රෙයිෆීල්ඩ් (සංස්කරණ.), Lived Islam in South Asia( Adaptation" Accommodation and Conflict (සමාජ විද්‍යා මුද්‍රණ 2004), 273-289හි.

112 2017 මාර්තු 31 දිනැති සම්මුඛ සාකච්ඡාව.

> ආරම්භක කොඩිය එසවීමේ උත්සවය සහ අවසාන මංගල්‍ය දිනය යන දෙකේදීම, වන්දනාකරුවන්ගේ ඉඳුම් හිටුම් ස්ථානයන් පිරී ඉතිරී යයි. තේ කඩ සහ කෑම කඩ ජනයාගෙන් පිරී ගොස් ඇත. සමරු සිහිවටන අලෙවි කරනා කඩපිල් දරුවන් සමගින් වූ වන්දනාකරුවන්ගේ ඕනෑ එපා කම් පිරිමසයි... මෙම මහ සෙනඟ ඉවසිලිවන්ත හා ආචාරශීලී වේ. විස්මය දනවන ලෙසින් ඥාති කණ්ඩායම් විශ්‍රාම සුවයෙන්, එකිනෙකා හා උරෙනුර ගැටී හිඳ සිටී.[113]

දේවස්ථානයේ උප භාරකාර තැනට අනුව, ප්‍රදේශයේ වෙසෙන සියලුම ප්‍රජාවන් අතීතයේ සිටම මෙම උත්සවය නිසා සහ පැමිණෙන වන්දනාකරුවන් නිසා ප්‍රතිලාභ ලබාගෙන ඇත. උදාහරණයක් ලෙසින් දක්වන්නේ නම්, සිංහල වෙළෙඳුන් විසින් ආහාර සහ බඩු භාණ්ඩ වන්දනාකරුවන්ට විකිණීම සඳහා කඩපිල් පිහිටුවාගෙන ඇත. තවදුරටත් ඔහු පවසා සිටින්නේ, සිංහල ගම්වාසීන්, මුස්ලිම් වෙළෙඳුන් හා සැදැහැවතුන් ඓතිහාසිකව පවා සහ පැවැත්මෙන් වාසය කොට ඇති බවයි. එනිසා මෙම දේවස්ථානය සම්බන්ධ ජනවාර්ගික - ආගමික ආතතීන් ප්‍රාදේශීය මූලයන්ගෙන් පැන නොනගින බව පෙනී යයි. අනෙකුත් විසින් නිරීක්ෂණය කර ඇති ආකාරයට, ප්‍රදේශයේ බෞද්ධ සිද්ධස්ථානයේ ප්‍රධාන භික්ෂූන් වහන්සේ 'මෙම මුස්ලිම් දේවස්ථානය ඉවත් කරනා ලෙසට කලබල කරනා සිංහල-බෞද්ධ කණ්ඩායම් එක්වීමක් හෝ සම්බන්ධතාවයක් තිබීමක් ඇති බවක් නොපෙනේ'.[114] එසේම ප්‍රදේශයේ සිංහල හා මුස්ලිම් ජනතාව 'යහපත් සම්බන්ධතාවයක්' පවත්වා ගෙන යන බවද නිරීක්ෂණය වී තිබිණි. [115]

කුරගල ප්‍රදේශයේ සිංහල හා මුස්ලිම් ජනතාවගේ යහපත් සම්බන්ධතාවයන් සහ ඓතිහාසික සහ පැවැත්ම තිබියදී වුවද, සිංහල-බෞද්ධ කලහකාරී කණ්ඩායම් විසින් දෆ්තාර් ජෙලානි දේවස්ථානය ඉවත් කරන ලෙසින් ව්‍යාපාරයක් ගෙන යයි. මෙම ප්‍රයත්නයන් 2015 ජනවාරි මැතිවරණයටද එපිට කාලයක් දක්වා දිව යයි. බොදු බල සේනා, සිංහල රාවය හා රාවණ බලය වැනි කණ්ඩායම් මෙම දේවස්ථානය බිඳ හෙළීම සඳහා වන ව්‍යාපාරයන් ආරම්භ කරන්නට යෙදුණේ 2013 වසරේදී වේ.[116] 2013 වසරේ අප්‍රේල් මාසයේදී එවකට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ විසින් මෙම භූමියට පැමිණි අතර, දේවස්ථානය වටා ඇති කඩපිල් ඇතුළු සියලුම 'අනවසර' ඉදිකිරීම් ඉවත් කරනා ලෙසට ඔහු විසින් ප්‍රාදේශීය අධිකාරීන්ට උපදෙස් දෙනු ලැබිණි.[117] අවසානයේදී මෙම ඉදිකිරීම් ඉවත් කෙරුණු අතර, දේවස්ථානය පමණක් එසේම පැවතිණි.

113 මැක්ගිල්වේ" 'Jailani( A Sufi Shrine in Sri Lanka', පෙර සඳහන්, 277හි.

114 මුස්ලිම්වරුන් සඳහා වන ලේකම් කාර්‍යාලය, Of Sacred Sites and Profane Politics (Tensions over Religious Sites and Ethnic Relations - Volume I Kuragala/Jailani and Devanagala (2015ජූනි), 41හි.

115 එහිම.

116 එහිම.6හි.

117 එහිම.

2015 ජනවාරි මස මැතිවරණයෙන් පසුව පැමිණි කාලය පවා, දෆ්තාර් ජෛලානි දේවස්ථානයේ මුස්ලිම් භාරකරුවන්ට හා සැදැහැවතුන්ට එරෙහිව වූ නිදන්ගත ප්‍රචණ්ඩත්වයේ අවසානයක් සළකුණු නොකරන ලදී. 2015 ජනවාරි 13 වන දින රාවණා බලය මගින් පරිශ්‍රයට ප්‍රහාරයක් එල්ල කළ අතර, සොහොන්වලට හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිල්ලකට එයින් හානි සිදුවිණි.[118] 2015 පෙබරවාරි 10 වන දින මාධ්‍ය හමුවේ විස්තර සැපයීමකදී බොදු බල සේනා මහලේකම් ගලගොඩ අත්තේ ඥාණසාර හිමි විසින් නිවේදනය කොට සිටියේ මෙම දේවස්ථානය ඉවත් කිරීම සඳහා බොදු බල සේනා විසින් ව්‍යාපාරයක් ගෙන යන බවට වන අතර, 'මිත්‍යා දෘෂ්ටික මුස්ලිමුන්ට කුරගල කෝලාහල කිරීමට' තම සංවිධානය ඉඩ නොදෙන බවටත් ප්‍රකාශ කරන්නට යෙදිණි.[119] 2015 අප්‍රෙල් 5 වන දින සිංහල රාවය මගින් කුරගලදී පෙළපාලියක් සංවිධානය කළ අතර, දේවස්ථානය ඉවත් කරන මෙන් එයින් ඉල්ලන ලදී. පොලිසිය මගින් එවැනි විරෝධතාවයන් පැවැත්වීම තහනම් කරනා උසාවි නියෝගයක් ලබාගන්නා ලදී. ඒ අනුව සිංහල රාවය සභාපති අක්මීමන දයාරත්න හිමි ඇතුළු කිහිප දෙනෙක්ම එම උසාවි නියෝගය උල්ලංඝනය කිරීම නිසාවෙන් බලංගොඩ මහේස්ත්‍රාත් ඉදිරියට පමුණුවන ලදී.[120] මෙම සැකකරුවන් පසුව ඇප මත නිදහස් කෙරිණි. මෙසේ 2015 ජනවාරි බල පෙරළියෙන් පසුව වුවත්, දෆ්තාර් ජෛලානි දේවස්ථානය ජනවාර්ගික-ආගමික ආතතීන් සහිත භූමියක් ලෙසින් පැවතිණි. එක් අතකින් රජය මගින් නිදන්ගත ප්‍රචණ්ඩත්වය ක්ෂණිකව උග්‍ර වන ප්‍රචණ්ඩ ක්‍රියා දක්වා ඉහළ නැගීමෙන් වැළැක්වීම සඳහා යම් යම් පියවර ගෙන තිබුණත්, අනෙක් අතට වැරදි තොරතුරු සහ අක්‍රියාකාරීත්වය ඔස්සේ එවැනි නිදන්ගත ප්‍රචණ්ඩත්වය පැවතීම සඳහා පාර කපා තිබිණි. උදාහරණයක් ලෙසින් දක්වන්නේ නම්, සංස්කෘතික කටයුතු රාජ්‍ය අමාත්‍ය නන්දිමිත්‍ර ඒකනායක විසින් 2015 අප්‍රේල් 23 වන දින නිවේදනය කරන්නට යෙදුණේ මුස්ලිම් ප්‍රජාව හා උපදෙස් විමසීම් මන්ත්‍රණයන්ගෙන් පසුව මෙම දේවස්ථානය වෙනත් තැනකට ගෙන යාම සඳහා රජය තීරණය කොට ඇති බවටයි.[121] කෙසේ වුවත් වාර්තා වන ලෙසින් දේවස්ථානයේ භාරකාර තැන වන රොෂාන් අබුසාලි විසින් ඊට ප්‍රති-ප්‍රකාශයක් කරමින් කියා සිටියේ දේවස්ථානය වෙනත් තැනකට ගෙන යෑම සඳහා එවැනි කිසිදු තීරණයක් ගෙන නොමැති බවටයි.[122]

2015 මෙම මුල් කාලය අතරතුරේදීද මුස්ලිම් ප්‍රජාවට එරෙහිව වූ භෞතික ප්‍රචණ්ඩත්වය සමගින් වූ සිදුවීම් කඩින් කඩ වාර්තා විණි. උදාහරණ ලෙසින් දක්වන්නේ නම්, 2015

118 එහිම.

119 එක්සත් ජනපදයේ රාජ්‍ය දෙපාර්තමේන්තුව, පෙර සඳහන්,7හි.

120 මුස්ලිම්වරුන් සඳහා වන ලේකම් කාර්‍යාලය, Of Sacred Sites and Profane Politics - Volume I" පෙර සඳහන්,46හි.

121 දීපාල් වර්ණකුලසූරිය, 'Minister affirms relocation of Kuragala mosque', The Nation, 2 May 2015, http://www.nation.lk/edition/news-online/item/40494-ministeraffirms-]20relocation-of-kuragala-mosque'html[අවසන් වතාවට ප්‍රවිශ්ටවුයේ 2017 අගෝස්තු 29%.

122 Secretariat for Muslims, Of Sacred Sites and Profane Politics - Volume ෂ, පෙර සඳහන්,46හි.

පෙබරවාරි 01 වන දින දෙහිවල මුස්ලිම් ව්‍යාපාරයකට ගල් ගැසීමක් කර තිබුණේ ඊට පෙර දින පාරිභෝගිකයෙකු සහ ව්‍යාපාරයේ කළමනාකාරීත්වය අතර ඇතිවූ හබයකට පසුයි. [123] මෙම පාරිභෝගිකයා විසින් කාන්තා පාරිභෝගිකයෙකුට ආක්‍රෝෂ පරිභව කොට තිබුණේ ඇය ඉස්ලාම් හිස් පළඳනාවක් පැළඳ සිටීම නිසාවෙන් වන අතර, ඔහු ඉන් අනතුරුව කළමනාකාරීත්වයට තර්ජනය කොට තිබිණි.[124] ව්‍යුහගත ප්‍රචණ්ඩත්වය විදහා දක්වන විශේෂයෙන් මුස්ලිම් කාන්තාවන් ඉලක්ක කොටගත් සිදුවීම්ද මෙම කාලය තුළ වාර්තා වී තිබිණි. උදාහරණ ලෙසින් දක්වන්නේ නම්, 2015 මාර්තු මසදී සේරුවිල ප්‍රාදේශීය ලේකම්වරයා විසින් කාර්ය මණ්ඩලයට අබායා (එදිනෙදා ඇඳුම් වලට පිටින් පළඳිනලෝගුවක්) පැළඳ කාර්යාලයට පැමිණීම තහනම් කරමින් නියෝග නිකුත් කොට තිබිණි.[125] මෙම නියෝගයන්ට අනුගත වීමට අකමැති වූ කාර්යාල සාමාජිකයින් හට රාජකාරියට පැමිණීමෙන් වළකින ලෙසට පවසා තිබිණි. මීට සමාන ලෙසින් බදුල්ලේ තාක්ෂණික විද්‍යාලයේ මුස්ලිම් සිසුවියක් ඇය හිජාබය පැළඳ විද්‍යාලයට ප්‍රවිශ්ට වීමෙන් වළක්වා තිබුණි.[126] පසුව බදුල්ල දිස්ත්‍රික්කයේ මුස්ලිම් මණ්ඩලයේ සභාපතිවරයාගේ මැදිහත්වීමෙන් පසුව අදාළ සිදුවීම සමථයකට පත්ව, සිසුවියට සිය ඉගෙනුම් කටයුතු කරගෙන කරගෙන යාමට හැකියාව ලැබිණි.

සුළු ජාතික අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයට (MRG) අනුව, 2015 නොවැම්බර් සිට 2016 ජූනි දක්වා කාල සීමාව තුළ මුස්ලිම්වරුන්ට එරෙහිව සිදුවූ ප්‍රචණ්ඩ ක්‍රියා සිදුවීම් 64 ක් වාර්තා වී තිබේ.[127] මෙම සිදුවීම් වලින් ආසන්න වශයෙන් 75% ක්ම ශාරීරික නොවූ, නිදන්ගත ස්වභාවයේ වූ අතර; ඒවා වෛරී සහගත ප්‍රකාශයන් (52%) හෝ තර්ජනයන් හා බියවැද්දීම් (20%) විණි. [128]

මෙම කාලය තුළ දක්නට ලැබුණු වඩාත්ම සුවිශේෂී වෛරී සහගත ක්‍රියා මාලාව වූයේ 'සිංහ ලේ' ව්‍යාපාරයයි. මෙම 'සිංහ ලේ' යන හැඳින්වීම 'සිංහයාගේ රුධිරය' නැතිනම් සිංහල රුධිරය යන්නත් සමගින් නිර්මාණය වන අතර, සිංහලයින් යනු කාන්තාවකගේ සහ සිංහයෙකුගේ සහවාසයෙන් උපන් සිංහබාහු ගෙන් පැවත එන්නන් බවට වන විශ්වාසය හා බැඳේ.[129] මෙම ව්‍යාපාරය 'රුධිරගත පාරිශුද්ධ භාවය' යන අදහස හැඟවූ අතර, එය

123 මුස්ලිම්වරුන් සඳහා වන ලේකම් කාර්යාලය මගින් එක් රැස් කළ සිදුවීම් වාර්තා බලන්නඃ 'Anti Muslim Sentiment in Sri Lanka( Hate Incidents - January To April 2015'" Colombo Telegraph" 19 June 2015, https://www.colombotelegraph.com/index'php/anti-muslim-sentiment-in-sri-lanka-hate-incidents-january-to-april-2015$ys[අවසන් වතාවට ප්‍රවිශ්ටවුයේ 2017 අගෝස්තු 29%.

124 එහිම.

125 එහිම.

126 එහිම.

127 රෝහිණී වික්‍රමසිංහConfronting Intolerance( Continued Violations Against Religious Minorities in Sri Lanka (සුළු ජාතික අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය2016), 15හි.

128 එහිම.16හි.

129 ගණනාත් ඔබේසේකර, ඔයැ උදරන දෙ ක්‍ෂකඑමරුැ හපඉදකසජ ඔර්බ්දෙරප්එසදබ සබ ඡිහජයද්බ්කහිසි'බා'බඑයරදෙවදකදටහ (චිකාගෝ සරසවි මුද්‍රණාලය 1990), 145-146හි.

මුස්ලිම්වරුන් ඉලක්ක කොටගනිමින් වෛරී ප්‍රකාශයන් හා කලහකාරී ක්‍රියාවන් ලෙසින් අර්ථ ගැන්වුණු සිංහල-බෞද්ධ ජාතිකවාදී මතවාදයක කොටසක් විණි. [130] උදාහරණ ලෙසින් දක්වන්නේ නම්, 'සිංහ ලේ' යන්න 2016 ජනවාරි මාසයේදී මුස්ලිම් නිසාව කිහිපයකම තාප්ප වල හා ගේට්ටු වල ස්ප්‍රේකැනයන් මගින් පින්තාරු කොට තිබිණි.[131] තවදුරටත් දක්වන්නේ නම් කොළඹ හා තදාසන්න ප්‍රදේශයන් ඔස්සේ 'සිංහ ලේ යනුවෙන් සඳහන් වාහන ස්ටිකරයන් හා තාප්ප වල වූ කුරුටු චිත්‍රයන් දක්නට ලැබීම ශීඝ්‍රව වැඩි වී තිබිණි.[132] මෙම ව්‍යාපාරය, රටේ සුළුතර ප්‍රජාවන් නිරූපණය කරනා කොළ හා තැඹිලි ඉරි රහිත ජාතික කොඩිය එසවීම වැනි තවත් සංකේතාත්මක ව්‍යාපාරයන් හා සමපාත වී තිබිණි. උදාහරණ ලෙසින් දක්වන්නේ නම්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ප්‍රකාශයක් ලබාදීම සඳහා ගෝඨාභය රාජපක්ෂව කැඳවනු ලැබූ විටදී, ඒ ඉදිරිපිට විරෝධතාකරුවන් විසින් මෙවන් කොඩියක් ඔසවන්නට යෙදිණි.[133]

ශ්‍රී ලංකාවේ පශ්චාත්-යුධ සමයේ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වයේ එක් පැහැදිලි ලක්ෂණයක් වූයේ, වරදකරුවන්ට කිසිදු විපාකයක් නොලැබීමයි. 2015 ජනවාරි මස ජනාධිපතිවරණයෙන් අනතුරුව කලහකාරී කණ්ඩායම් වෙත දැක්වුණු රාජ්‍ය අනුග්‍රහය තුරල් වී ගියද, වගකිව යුත්තන් යුක්තිය ඉදිරියට ගෙන ඒමට අපොහොසත් වීම ඔස්සේ මෙම කිසිදු විපාකයක් නොලැබීමේ ස්වභාවය සවිබල ගැන්විණි. මෙම දුර්විපාක නොලැබීමේ ස්වභාවයේ උච්ච ලක්ෂ්‍යය 2017 දී උදා විණි.

2017 අප්‍රේල් හා මැයි මාසයන් තුළ සති පහක කාලයක් පුරාවට, මුස්ලිම් ප්‍රජාවට එරෙහිව වූ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩ ක්‍රියා සිදුවීමේ ක්ෂණික වැඩිවීමක් වාර්තා විණි. සිදුවීම් විස්සක් වාර්තා වූ අතර, ඒවායින් බොහෝමයක් දේපළ විනාශ කිරීම් විණි. උදාහරණ ලෙසින් දක්වන්නේ නම්, 2017 අප්‍රේල් 16 වන දින ගොඩපිටිය, පෝරුව මුස්ලිම් හිමිකාරීත්වය සහිත වෙළෙඳසැල් හතරක් වෙත පැට්‍රල් බෝම්බ ප්‍රහාරයන් එල්ල විණි.[134] ඉන් පසුව 2017 මැයි 15 සිට 22 දක්වා කාලසීමාව තුළරට පුරා මුස්ලිම් නිවාස හා දේවස්ථාන වෙත ප්‍රහාරයන් රැල්ලක් වාර්තා විණි. 2017 මැයි 15 වෙනි දින පානදුර මුස්ලිම් දේවස්ථානයට ගිනි තැබූ අතර ඒ සම්බන්ධයෙන් කලහකාරී කණ්ඩායම් සැක කෙරිණි. 2017 මැයි 15 සහ 16 දිනවලදී හඳුනා නොගත් කිහිප දෙනෙකු විසින් කොහිලවත්ත ඊබ්‍රාහිම් ජුම්මා දේවස්ථානයට පහර එල්ල කළ අතර, එයින් දේපළ හානි සිදුවිණි. 2017 මැයි 16 වන දින ත්‍රිකුණාමලයේ තෝප්පූර්හි සෙල්වා නගර් වෙත කඩු පොලු සහිතව ඇතුළු වූ 200 කට ආසන්න පිරිසක් විසින් වාර්තා වන අන්දමට මුස්ලිම්වරුන්ට අයත් නිවාස හා ව්‍යාපාර

130 වික්‍රමසිංහ, පෙර සඳහන්, 15හි.

131 එහිම.

132 එහිම

133 Colombo Telegraph, 2015ජූනි 19, පෙර සඳහන්,

134 හිල්මි අහ්මඩ්, 'Escalating Violence( Renewed Assaults on the Muslim Community', Groundviews, 22 May 2017, http://groundviews.org/2017/05/22/escalating-violence-renewed-assaults-on-the-muslim-community/ [අවසන් වතාවට ප්‍රවිශ්ටවුයේ2017 අගෝස්තු 29].

16 කට අලාභ හානි සිදුකරනලදී. 2017 මැයි 17 වන දින පානදුර මුස්ලිම්වරුන්ට අයත් සාප්පු දෙකකට බරපතල හානි සිදුකරමින් එල්ල වූ ප්‍රහාරයක් වාර්තා විණි. 2017 මැයි 18 වන දින වෙන්නප්පුවේ මුස්ලිම් හිමිකාරීත්වය සහිත විද්‍යුත් උපකරණ ප්‍රදර්ශනාගාරයක් මුළුමනින්ම ගිනිබත් කෙරිණි. 2017 මැයි 21 වන දින බොදු බල සේනා පෙළගැසීමකින් අනතුරුව මල්ලවපිටිය මුස්ලිම් දේවස්ථානය වෙත පැට්‍රල් බෝම්බ හයක් විසිකරනු ලැබ, ගොඩනැගිල්ලට හානි සිදුවිණි. 2017 මැයි 21 වන දින එලිපිටියේ මුස්ලිම් රූපලාවණ්‍ය අලෙවි සැලකට ගිනි තබා බරපතළ හානි සිදුවිණි. එසේම 2017 මැයි 22 දින මහරගම විජේරාම පෙදෙසේ මුස්ලිම් සම් භාණ්ඩ අලෙවි සැලකට ගිනි තබා තිබිණි. [135]

මෙම දේපළ වලට හානි සිදුකිරීම ඇතුළු ප්‍රචණ්ඩ ක්‍රියා රැල්ල මගින්, 2017 වසරෙ කලහකාරී කණ්ඩායම් වල උපක්‍රමයන්ගේ තියුණු වෙනස්වීමක් පිළිබිඹු කරයි. ඊට පෙරාතුව වසර දෙක තුළ විශාල වශයෙන් ඉවසා දරා සිටි භෞතික නොවන නිදන්ගත ප්‍රචණ්ඩත්වය, භෞතික ප්‍රචණ්ඩ ක්‍රියා දක්වා වැඩි විණි. මෙම ප්‍රචණ්ඩ ක්‍රියාවන්ද ස්වභාවයෙන් 'නිදන්ගත' ආකාරයේ වුවත්, මෙම ප්‍රහාරයන් බොහෝ විට 'ක්ෂණික උග්‍රතා' අන්දමේ වඩාත් ප්‍රචණ්ඩ ක්‍රියාවන් වෙත පූර්ව නිමිති වේ. 2017 නොවැම්බර් 17 වෙනි දින ගාල්ල දිස්ත්‍රික්කයේ ගිංතොටදී ඇතිවුණු ප්‍රචණ්ඩ සිදුවීමකි. සතියකට පෙරාතුව සිදුවුණු රිය අනතුරක් මගින්[136] ප්‍රදේශයේ ප්‍රජාවන් අතර ආතතීන් ඇතිකළ අතර, 2017 නොවැම්බර් 16 වෙනි දින ප්‍රදේශයේ මුස්ලිම් දේශපාලකයෙකු ප්‍රධාන කොටගත් කණ්ඩායමක් මගින් සිංහල පදිංචිකරුවන්ට පහර දුන් බවට වූ ප්‍රවෘත්තියක් සමගින් මෙම ආතතීන් කුපිත විණි.[137] ඉන් පසුව මීලඟ දිනයේ පුළුල්ව පැතිර ගිය සංවිධානය වුණු ප්‍රචණ්ඩ ක්‍රියාවන් මගින් 'මුස්ලිම් නිවාස හා ව්‍යාපාර ගණනාවක' විනාශ වීමත්, පුද්ගලයින් කිහිප දෙනෙකු හට තුවාලත් සිදුවිණි.[138] මාධ්‍යවේදිනියක වන ධරීෂා බැස්ටියන්ට අනුව, මෙම ප්‍රචණ්ඩත්වයේ ප්‍රධානතම පොළඹවන්නෙකු වූයේ අම්බලන්ගොඩ සුමේධානන්ද හිමි බවට ඇතැම් නිරීක්ෂකයින් පෙන්වා දී තිබිණි.[139] ථූපාරාමය විහාරස්ථානයේ ප්‍රධාන භික්ෂූන් වන සුමේධානන්ද හිමියන් විසින් මෙම ප්‍රචණ්ඩ ක්‍රියා පැන නැගීමට ප්‍රථමයෙන් මහජන රැස්වීමක් පැවැත්වූ බවට වාර්තා විණි.[140] කෙසේ හෝ මෙහිදී සිදුවූ ජීවිත හා දේපළ හානි 2014 වසරේ අලුත්ගමදී දක්නට ලැබුණු ප්‍රචණ්ඩ ක්‍රියාවන්ගේ ප්‍රමාණයට නොපැමිණියත්, ගිංතොට සිදුවීම් මගින් එක් පැහැදිලි සත්‍යයක් පිළිබිඹු වේ. එනම් 2015 ජනවාරි වලින් පසු කාලයේදී රජය විසින්

135 එහිම.

136 බැස්ටියන්ස්, පෙර සඳහන්,

137 එහිම.

138 එහිම. එසේම බලන්න ජෙහාන් පෙරේරා'Government needs to close the space for hate speech'" The Island" 20 November 2017,http://www.island.lk/index'php@page_cat}article-details&page}article-details&code_title=175315 [අවසන් වතාවට ප්‍රවිශ්ටවුයේ2017 අගෝස්තු 29].

139 බැස්ටියන්ස්, පෙර සඳහන්,

140 එහිම. එසේම බලන්න රත්නසිරි මලලගම සහ නන්දන නන්නෙත්ති, 'Sri Lanka: Racialist attack on Muslims in Gintota'" World Socialist Website, 2017 නොවැම්බර් 21,https://www'wsws.org/en/articles/2017/11/21/gint-n21.html [අවසන් වතාවට ප්‍රවිශ්ටවුයේ2017 අගෝස්තු 29].

මෙම ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට දුර්විපාක නොලබා සිටීම හා සටන් කිරීමට සහ සිදුවීම් සම්බන්ධ වගවීම ඉදිරියට ගෙන යාමට අසමර්ථ වීම ඔස්සේ, කලහකාරී කණ්ඩායම් ධෛර්යමත් වී ඇත. මෙම කණ්ඩායම් දැන් වෛරී ප්‍රකාශයන්ට හා තර්ජනයන්ට පමණක් සීමා නොවී, මුස්ලිම් ප්‍රජාවට විරුද්ධව වඩාත් සාහසික ලෙසින් ප්‍රචණ්ඩ ක්‍රියාවන් සිදු කිරීමට නිර්භීත වී ඇති අතර, මෙය පශ්චාත්-යුධ සමයේ රාජපක්ෂ පාලනය යටතේ දක්නට ලැබුණු ජනවාර්ගික -ආගමික ප්‍රචණ්ඩත්වය සිහියට නංවයි.

### 2.1.2 ක්‍රිස්තියානිවරුන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය

2013 වසරේදී ක්‍රිස්තියානිවරුන්ට එරෙහිව වූ ප්‍රචණ්ඩ ක්‍රියාවන් 60 කට වැඩියෙන් වාර්තා වී තිබෙන අතර[141], 2014 දී එවැනි සිදුවීම් 80 කට වඩා වාර්තා වී ඇත.[142] ක්‍රිස්තියානි භක්තිකයින්ට විරුද්ධව වෙනස් ලෙසින් සැලකීම වැනි ව්‍යුහගත ප්‍රචණ්ඩත්වය 2014 දී ඉහළ ගොස් ඇති අතර, එයට ප්‍රධාන වශයෙන්ම 2008 දී වැඳුම් පිදුම් කරන ආගමික ස්ථානයන් රජයේ ලියාපදිංචි විය යුතු බවට නිකුත් වූ චක්‍රලේඛය හේතු වූවා විය හැක.[143] රජය මගින් සිදුකරනා ක්‍රිස්තියානියට එරෙහි වෙනස් ලෙසින් සැලකීම, මුස්ලිම් ප්‍රජාව විසින් මුහුණ දෙන ප්‍රචණ්ඩත්වයේ ආකාරයට වඩා වෙනස් වේ. මුස්ලිම්වරුන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය බොහෝ ලෙසින් මුදාහැරුණේ කලහකාරී කණ්ඩායම් හා දේශපාලන බලයන් මගිනි. ක්‍රිස්තියානිවරුන් පිළිබඳ කාරණයේදී ප්‍රාදේශීය අධිකාරීන් හා නීති බලාත්මක කිරීමේ ආයතනයන් වඩාත් සම්බන්ධ වූ අතර, වාර්තා වූ බොහෝ ව්‍යුහගත ප්‍රචණ්ඩත්වයන් සම්බන්ධ වූයේ ආගමික වැඳුම් පිදුම් නවත්වන ලෙසට හෝ 'ලියාපදිංචි නොවූ' වැඳුම් පිදුම් ස්ථානයන් වසා දමන ලෙසට නිකුත් වූ නියෝගයන් වේ.[144]

2015 ජනවාරි මාසයේ රජය මාරු වීමෙන් පසුව වුවද ක්‍රිස්තියානි ප්‍රජාවට එරෙහිව වූ නිදන්ගත ප්‍රචණ්ඩත්වයේ රැල්ල විශාල වශයෙන් වෙනස් නොවී පැවතිණි. එක් වාර්තාවකට අනුව, ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිස්තියානි ඉවැන්ජලික සන්ධානය (NCEASL) මගින් 2015 වසරේදී ක්‍රිස්තියානිවරුන්ට විරුද්ධව වූ ප්‍රචණ්ඩ ක්‍රියා සිදුවීම් 87 ක් වාර්තාගත කර ඇත.[145] 2017 මැයි මාසයේදී ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිස්තියානි ඉවැන්ජලික සන්ධානය (NCEASL) මගින් නිකුත් කළ ප්‍රකාශයක් මගින් දැක්වෙන්නේ, 2015 නව රජය පත්වීමෙන් පසුව 'පල්ලි, පූජකවරුන් හා ක්‍රිස්තියානි භක්තිකයින්ට එරෙහිව වූ ආගමික ප්‍රචණ්ඩ ක්‍රියා සිදුවීම්

---

141 බලන්න ගුණතිලක, Chronic and the Acute" පෙර සඳහන් 22හි.

142 එහිම.25හි. මෙහිදී සැලකිය යුතු වන්නේ, එකම සිදුවීම එක් ප්‍රචණ්ඩත්ව ආකාරයකට වඩා ගණනකට සම්බන්ධ විය හැකි බවයි. එහිදී සිදුවීම් ගණන, ප්‍රචණ්ඩ ක්‍රියාවන්ගේ සමස්ත ගණනට සමාන නොවේ.

143 ආගමික කටයුතු හා සදාචාර වර්ධන අමාත්‍යාංශය,නව වන්දනාමාන ස්ථාන ඉදිකිරීම පිළිබඳ චක්‍රලේඛය (2008 ඔක්තෝබර් 16). බලන්න වෙරිතෙරිසර්ච් සහ NCEASL, පෙර සඳහන් 17-18හි.

144 වෙරිතෙරිසර්ච් සහ හකීබ්, පෙර සඳහන්, 18හි.

145 එක්සත් ජනපදයේ රාජ්‍ය දෙපාර්තමේන්තුව, පෙර සඳහන්, 6හි.

190 ක් වාර්තාගතව ඇත' යනුවෙනි.[146] එසේම 2017 දී ක්‍රිස්තියානිවරුන්ට එරෙහිව වූ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් ගත් විට එම සිදුවීම්වල තීව්‍රතාවයේ වැඩිවීමක් සහ ප්‍රාදේශීය රාජ්‍ය නිලධාරීන්ගේ වඩාත් සක්‍රිය මැදිහත්වීමක් දක්නට ලැබෙනා බව මෙම ප්‍රකාශය මගින් තවදුරටත් නිරීක්ෂණය කරයි.[147]

2015 ජනවාරියෙන් පසුව කාලය තුළ ක්‍රිස්තියානි භක්තිකයින්ට එදිරිව වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ වෙන් වෙන්ව දැක්වෙන දත්ත පහසුවෙන් සොයාගැනීමට නැත. කෙසේ වුවත් ප්‍රචණ්ඩත්වයේ නැඹුරුතාවයන් අවබෝධ කර ගැනීම උදෙසා, මෙම සමස්ත කාලසීමාව තුළ වූ විශේෂිත කාලසීමාවන්ට අයත් දත්ත ඇතැම් විට විශ්ලේෂණය කෙරෙනු ඇත. උදාහරණ ලෙසින් දක්වන්නේ නම්, 2015 නොවැම්බර් හා 2016 සැප්තැම්බර් කාලය අතරතුරදී වාර්තා වුණු ප්‍රචණ්ඩ ක්‍රියා සිදුවීම් 47 ක් සුළු ජාතික අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය (MRG) මගින් විශ්ලේෂණය කොට ඇත.[148] මෙම විශ්ලේෂණයට අනුව, මෙම ප්‍රචණ්ඩ ක්‍රියාවන්ගෙන් විශාල ප්‍රමාණයක් (81%) නිදන්ගත, භෞතික නොවන ස්වභාවයක -එනම් තර්ජනයන්, බිය වැද්දීම්, බලපෑම් කිරීම් හා ප්‍රචාරණයන් වේ.[149] මෙහිදී සිත් කලබල කරන ලෙසින් මෙම වාර්තාගත සිදුවීම් වලින් 35% ක් සඳහා රජයේ නිලධාරීන්ගේ ක්‍රියාවන් සම්බන්ධ වී තිබිණි. ක්‍රිස්තියානිවරුන්ට එරෙහිව වූ ප්‍රචණ්ඩ සිදුවීම් සඳහා ප්‍රාදේශීය රාජ්‍ය නිලධාරීන්ගේ සම්බන්ධයන් ඇති බවට NCEASL මගින් පසුව කළ නිරීක්ෂණයන් හා මෙම නැඹුරුතාව සමපාත වේ. මේ අතර සුළු ජාතික අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයට (MRG) අනුව, මෙම කාලය අතරතුර වාර්තාගත සිදුවීම් වලින් 11% ක් සඳහා භෞතික ප්‍රචණ්ඩත්වයත්, එම සිදුවීම් වලින් 8% ක් සඳහා යම් ආකාරයක ව්‍යුහගත ප්‍රචණ්ඩත්වයත් (උදා: වෙනස් ලෙසින් සැලකීම/කොන් කිරීම) භාවිත වී ඇත. බොහෝ විට රජයේ ක්‍රියාවන් හෝ රජයේ අක්‍රියාකාරීත්වය සම්බන්ධ මෙම ඇතැම් සිදුවීම් සඳහාද වෙනස් කොට සැලකීම අදාළ වන්නට ඇත. එනිසා MRGහි වාර්තාව මගින් බොහෝ කොට ක්‍රිස්තියානිවරුන්ට විරුද්ධව වන ව්‍යුහගත ප්‍රචණ්ඩත්වය අවතක්සේරු වී තිබෙනවා විය හැක.[150] මෙම වාර්තාව මගින් සක්‍රීය වරදකරුවන් සම්බන්ධ තොරතුරුද ලබාදේ.

146 ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිස්තියානි ඉවැන්ජලික සන්ධානය, 'Increase in Attacks on Religious Minorities in Sri Lanka', 2017 මැයි 27 නිකුත් වූ පුවත්පත්නිවේදනය http://mailchi.mp/0f02c4911569/press-release-increase-in-attacks-on-religious-minorities-in-sri-lanka-1208153 [අවසන් වතාවට ප්‍රවිශ්ටවුයේ2017 අගෝස්තු 29%. ක්‍රිස්තියානි බැතිමතුන්ට එරෙහිව වූ ප්‍රචණ්ඩ ක්‍රියාවන් සම්බන්ධ සංඛ්‍යාලේඛනයන් ජනනය කිරීම සඳහා භාවිතා වූ ක්‍රමවේදය වටහාගනු වස්, කතුවරයා විසින් NCEASL හි නීති හා උපදේශන ප්‍රධානීගේ (ආගමික නිදහස කොමිසම) අදහස් විමසන ලදී. එම නිලධාරියා විසින් ප්‍රකාශ කොට සිටියේ, සියලුම සිදුවීම් වාර්තාවන් NCEASL වෙත ඔවුන්ගේ දේවස්ථාන ජාලය ඔස්සේ ලැබුණු බවත්, NCEASL මගින් සහතික කොටගත් බවත්, එසේ සහතික කොට ගැනීමෙන් පසුව පමණක් ප්‍රකාශයට පත් කෙරුණු බවත් වේ.

147 එහිම.එක් එක් සිදුවීමේ විස්තරාත්මක සටහන් සඳහා බලන්න,https://slchurchattacks.crowdmap.com/reports [අවසන් වතාවට ප්‍රවිශ්ටවුයේ2017 අගෝස්තු 29].

148 සුළු ජාතික අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය, op. cit. at 9.

149 එහිම.10හි.

150 එහිම.14හි. සුළු ජාතික අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ 8% ක අගය යනු වෙනස් ලෙසින් සැලකීමේ සිදුවීම් 4 ක් පමණි. කෙසේ වුවත් මෙම වාර්තාව මගින්ම ප්‍රකාශ කෙරී ඇත්තේ, 2008 වසරේ චක්‍රලේඛය බලාත්මක කිරීම හා අදාළ වන සිදුවීම් 14 ක්, විමර්ශන කාලවකවානුව තුළ වාර්තාගත වූ බවටයි. මෙම එක් එක් සිදුවීමක් අවිකල්පයෙන්ම යම් ආකාරයක වෙනස් කොට සැලකීමක් හා සම්බන්ධ වනවා විය යුතුය. තවදුරටත්, 2015 නොවැම්බර් සිට 2016 ජූලි දක්වා කාලය අතරතුරදී NCEASL විසින් අඩු තරමින් වෙනස් කොට සැලකීමේ සිදුවීම් 11 ක් වත් වාර්තා කරයි. බලන්න හකීබ, ෂබජසාැබඑ Reports 2015-2016, http://nceasl.org/category/incident-reports/අවසන් වතාවට ප්‍රවිශ්ටවුයේ 2017 අගෝස්තු 29].

රජයේ ඉහළ ප්‍රමාණයක සම්බන්ධ වීමක් හැරුණු කොට, මෙම වාර්තාව මගින් මෙම සිදුවීම් සඳහා (සිදුවීම් 29% ක් සඳහා) ආගමික නායකයින් -බොහෝ විට බෞද්ධ භික්ෂූන්- සම්බන්ධ වූ බවට වන වන චෝදනාවන්ද දක්වා සිටී.[151] මේ අතර මෙම වාර්තාව මගින් ක්‍රිස්තියානිවරුන්ට එරෙහිව වාර්තාගත වූ ප්‍රචණ්ඩ සිදුවීම් සඳහා රජය සම්බන්ධ වන ආකාරය පිළිබඳව වැදගත් අන්තර්දෘෂ්ටියක් ද ලබා දෙයි.[152] MRG වාර්තාවට අනුව මෙම සිදුවීම් වලින් භාගයකට වඩා ප්‍රමාණයකට (60%) රජය මගින් 'සෘණාත්මකව' ප්‍රතිචාර දක්වා ඇත. මෙවැනි සෘණාත්මක මැදිහත් වීම් වලට වින්දිතයින්ට එරෙහිව වෙනස් ලෙසින් සැලකීමේ/කොන් කිරීමේ ක්‍රියාවන්, පැමිණිලි වාර්තාගත කිරීම ප්‍රතික්ෂේප කිරීම ඇතුළු අක්‍රියාකාරීත්වය හා නීති පටහැණි ක්‍රියා සඳහා ක්ෂමාව ලබාදීමද ඇතුළත් වේ.[153]

NCEASL හි දත්ත සම්පූර්ණයෙන්ම නව විශ්ලේෂණයකට බඳුන් කිරීම ඔස්සේ ක්‍රිස්තියානි භක්තිකයින්ට එරෙහිව වූ ඉහළ මට්ටමක වෙනස් ලෙසින් සැලකීමක් නිරීක්ෂණය කළ හැක.[154] පශ්චාත් 2015 ජනවාරි කාලය තුළ ක්‍රිස්තියානිවරුන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ NCEASL දත්ත සාම්පලයක්, 2015 ජනවාරි සහ 2016 ජූලි දක්වා කාලය අතරතුර NCEASL හිසිදුවීම් වාර්තාවන්ගෙන් උපුටා ගත හැක. මෙම මාස දහ අටක කාලසීමාව අතරතුරදී ක්‍රිස්තියානිවරුන්ට එරෙහිව සිදුවූ ප්‍රචණ්ඩ සිදුවීම් හැත්තෑ පහක් වාර්තා වී ඇත. මෙම සම්පූර්ණ කාලය පුරාවටම සිදුව ඇත්තේ ව්‍යුහගත ප්‍රචණ්ඩත්වය බව පෙනේ. සැබවින්ම වාර්තා වූ සිදුවීම් 28 ක්ම (36%) සඳහා හේතු වී තිබුණේ, රජයේ නිලධාරීන් පුරුද්දක් වශයෙන් 2008 චක්‍රලේඛය භාවිතයට ගැනීමයි.

2015 ජනවාරි සහ 2016 ජූලි අතර කාලයේ වාර්තාගත සිදුවීම් වලින් ආසන්න වශයෙන් 40% ක පමණ රජය සම්බන්ධ වූ බවට චෝදනා නැගෙනා අතර, රජය සක්‍රීයව එම සිදුවීම් වලට සම්බන්ධ වී ඇත්තේ සෘජුව ගත් විට වෙනස් කොට සැලකීමේ ක්‍රියාවන්ගෙන් සහ වක්‍රාකාරයෙන් ගත් විට මෙම සිදුවීම් වලට පුද්ගලික කාරකයන් වගකිව යුතු අවස්ථාවන්හි දී අක්‍රියාකාරීත්වයෙන් හා විරුද්ධ නොවීමෙනි. මෙම රැල්ල, 2014 වසරේ වාර්තාගත වූ මේ ආකාරයේ රැලි හා විශාල වශයෙන් සමානුපාත වූ බව පෙනී යන ලදී. මෙම බොහෝ සිදුවීම් වල මධ්‍යයේ තිබුණේ, පොලිසිය සහ ප්‍රාදේශීය රාජ්‍ය නිලධාරීන් විසින් 2008 වසරේ චක්‍රලේඛය බලාත්මක කිරීමට යෑමයි. රජයේ මෙම සම්බන්ධය හැරුණු විට, සිදුවීම් වලින් තවත් විශාල ප්‍රමාණයකට (ආසන්න වශයෙන් 30% ක් පමණ) -බොහෝ

151 සුළු ජාතික අයිතීන් පිළිබඳ සංවිධානය, පෙර සඳහන්, 12හි.

152 එහිම.

153 එහිම.මෙම වාර්තාව මගින් 2016 මැයි මාසයේදී වේයන්ගොඩ පල්ලියකට සිදුවූ කලහකාරීන්ගේ ප්‍රහාරයක් උදාහරණයක් ලෙස උපුටා දක්වයි. පොලිසිය මෙයට මැදිහත්වීමට හෝ ප්‍රහාරකයින්ව අත්අඩංගුවට ගැනීමට අපොහොසත් වූවා පමණක් නොව, ඔවුන් පල්ලිය භාරව සිටි පාස්ටර්වරයාට උපදෙස් දුන්නේ දේවමෙහෙය නවත්වා, පල්ලියේ නීත්‍යානුකූල භාවය සනාථ කිරීම සඳහා ලියකියවිලි සාක්ෂ්‍ය ඉදිරිපත් කරන ලෙසයි. පොලිසියේ මැදිහත්වීම සැලකුණේ, 'ක්‍රිස්තියානි එක් රැස් වීම් නීත්‍යානුකූල නොවීමට ඉඩ ඇතැයි යනුවෙන් ප්‍රහාරකයින් දැරූ ස්ථාවරය අනුමත කිරීමක්' ලෙසිනි.

154 NCEASL, Incident Reports 2015-2016, at http://nceasl.org/category/incident-reports/ [last retrieved 29 August 2017].

විට සිදුවීම් වූ ප්‍රදේශයන්හි වෙසෙනා බෞද්ධ භික්ෂූන් විසින් නායකත්වය දුන්- හඳුනා නොගත්කලහකාරී පිරිස්ද සම්බන්ධ වී තිබිණි.

2015 ජනවාරි සහ 2016 ජූලි මාසය අතරතුර සිදුවූ ක්‍රිස්තියානිවරුන්ට එරෙහි මෙම ප්‍රචණ්ඩ ක්‍රියාවන් භූගෝලියව ගත් විට විසිරී ඇත. සැබවින්ම ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක 25 න් 18 ක්තුළම මෙවන් සිදුවීම් වාර්තා වූ අතර, වැඩිම සිදුවීම් ප්‍රමාණයක් වාර්තා කරන්නේ කෑගල්ල දිස්ත්‍රික්කයයි.

**වගුව 4:**

**සිදුවීම් ප්‍රමාණයන් දිස්ත්‍රික්ක අනුව-2015 ජනවාරි සිට 2016 ජූලි දක්වා[155]**

| දිස්ත්‍රික්කය | සිදුවීම් ප්‍රමාණය |
|---|---|
| කෑගල්ල | 13 |
| පුත්තලම | 8 |
| මඩකලපුව | 7 |
| ගම්පහ | 7 |
| කළුතර | 6 |
| කොළඹ | 5 |
| කුරුණෑගල | 5 |
| ගාල්ල | 4 |
| නුවර | 4 |
| රත්නපුර | 3 |
| අම්පාර | 2 |
| මන්නාරම | 2 |
| මාතර | 2 |
| පොලොන්නරුව | 2 |
| ත්‍රිකුණාමලය | 2 |
| හම්බන්තොට | 1 |
| යාපනය | 1 |
| වවුනියාව | 1 |
| **සමස්තය** | **75** |

155 ඉහත

මෙම කාලසීමාව තුළ වූ ඇතැම් සුවිශේෂී සිදුවීම් අවධානයට ගැනීමට වටනේය. මෙම සිදුවීම් ඇතැම්විට ඉදිරිපත් වී ඇත්තේ ඒවායේ සන්දර්භයානුගත විශේෂත්වයන් අනුව වේ. පළමුව, 2015 සැප්තැම්බර් 9 දින වූ සිදුවීමක් මගින් උදාහරණ කොට දැක්වුණේ, 2008 චක්‍රලේඛයේ ඇති විපුල ප්‍රයෝජනයි. වාර්තාවන අන්දමට කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ආගමික කටයුතු අංශයේ නිලධාරීන් සිවුදෙනෙකු, යහපත් එඬේරාගේ ශුභාරංචි මධ්‍යස්ථානයේ වසනා පාස්ටර්වරයා හමුවීමට ගොස් ඇත.[156] නිලධාරීන් විසින් පාස්ටර්වරයාට නියෝග කර ඇත්තේ මධ්‍යස්ථානය 2008 චක්‍රලේඛය යටතේ ලියාපදිංචි කරන ලෙසින් වන අතර, ඔහු එය ප්‍රතික්ෂේප කරන්නේ නම් මධ්‍යස්ථාන පරිශ්‍රය සීල් තබන බවට තර්ජනය කොට ඇත.[157] දෙවෙනුව ක්‍රිස්තියානිවරුන්ට එරෙහිව පුළුල්ව පැතිර ගිය භෞතික ප්‍රචණ්ඩත්වයේ භාවිතාවන්ට උදාහරණ ලෙසින්, 2015 මැයි 24 වන දින ගම්පහ සපුගස්කන්ද ප්‍රදේශයේ පාස්ටර්වරයෙකුව පැහැර ගෙන ගොස් අපයෝජනයට ලක් කිරීම, 2016 අප්‍රේල් 9 දින නුවර ගම්පොළ පාස්ටර්වරයෙකුගේ නිවසකට ගල් ගැසීම සහ 2016 ජූනි 26 දින කළුතර මොරගහහේන පල්ලියකට ගල් ගැසීම දැක්විය හැක.[158] තුන්වනුව, බෞද්ධ භික්ෂූන් විසින් නායකත්වය දුන් හඳුනා නොගත්කලහකාරී පිරිස් විසින් විශාල පරිමාණයකින් ක්‍රිස්තියානිවරුන්ව බියවැද්දීමට සාක්ෂ්‍ය ලෙසින්, 2017 මැයි 18 වන දින මාතර දෙවිනුවර සිදුවූ විරෝධතාවය වැනි වාර්තාගත සිදුවීම් දැක්විය හැක. වාර්තාගත අන්දමට බෞද්ධ භික්ෂූන් 30 කට ආසන්න පිරිසක් සහ 2000 කට ආසන්න ප්‍රමාණයකින් සැදි කලහකාරී පිරිසක් විසින් ක්‍රිස්තියානි වැඳුම් පිදුම් ස්ථානයකට එරෙහිව විරෝධතාවය දක්වා ඇත.[159] අවසන් වශයෙන් හින්දු බහුතරය වෙසෙනා ප්‍රදේශයන්හි ක්‍රිස්තියානිවරුන්ට එරෙහිව වන ප්‍රචණ්ඩත්වයට උදාහරණ ලෙසින්, 2015 පෙබරවාරි 11 දින මඩකලපුවේ චෙන්කලාඩිහිදී පාස්ටර්වරයෙකුගේ නිවසට මැර ප්‍රහාරයක් එල්ල වූ බවට චෝදනාවන් වේ.[160] එසේම 2015 ඔක්තෝබර් 16 වන දින මඩකලපුවේ සන්දිවෙළිහි මියගිය ක්‍රිස්තියානි භක්තිකයෙකු භූමදානය කිරීමට බාධා කිරීම[161] සහ, 2016 මාර්තු 16 දින මඩකලපුවේ මන්දූර්හි භූමදාන චාරිත්‍රයන් සිදු කිරීමට ඉඩ නොදීම සහ පාස්ටර්වරයෙකුට හිරිහැර කළේය යන චෝදනාව දැක්විය හැක. මෙම අධ්‍යයනයේ සමාජ-සංස්කෘතික

156 United States Department of State" op. cit. at 5.

157 Ibid'

158 NCEASL, 'Pastor Abducted and Harassed in Sapugaskanda' in Incident Reports 2015-2016, 2015 ජුනි 5 at http://nceasl.org/pastor-abducted-and-harassed-in-sapugaskanda/ [last retrieved 29 August 2017] NCEASL" 'Pastor's Home in Gampola Stoned' in Incident Reports 2015-2016, 4 July 2016" at http://nceasl.org/pastors-home-in-gampola-stoned/ [last retrieved 29 August 2017] NCEASL" 'Unidentified Group Pelts Stones at Church' in Incident Reports 2015-2016" 18 August 2016" at http (//nceasl.org/unidentified-group-pelts-stones-at-church/ [last retrieved 29 August 2017].

159 NCEASL, මාධ්‍ය නිවේදනය 2017 මැයි 27, op. cit.

160 NCEASL" 'Mob Attack Pastors Premises in Chenkaladi" Batticaloa Again' in Incident Reports 2015-2016" 2 April 2015, at http://nceasl.org/mob-attack-pastors-premises-in-chenkaladi-batticaloa-again/ [last retrieved 2017 අගෝස්තු 29].

161 NCEASL, 'Mob Obstructs Burial of Deceased Christian' in Incident Reports 2015-2016, 2015 foieïn 22, at http://nceasl.org/mob-obstructs-burial-of-deceased-christian/ [last retrieved 2017 wf.daia;= 29].

ඉරිතැලීම් කොටසේදී, [162]මෙම භූමදාන චාරිත්‍රයන් සම්බන්ධ සිදුවීම් වඩාත් විස්තර සහිතව පිරික්සා බැලෙනු ඇත.

2015 ජනවාරියට පසු කාලය තුළ ක්‍රිස්තියානිවරුන්ට එරෙහිව වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ ලබාගත හැකි සංඛ්‍යාලේඛනයන්ට ප්‍රතිචාර ලෙසින් නිරීක්ෂණයන් දෙකක් වේ. පළමුව, රජය මාරු වීම මගින් ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානිවරුන්ට එරෙහිව වන ප්‍රචණ්ඩත්වයේ ස්වභාවය සහ පැතිරීම සම්බන්ධයෙන් කිසිදු සැබෑ බලපෑමක් සිදුව ඇති බවක් නොපෙනේ.[163] තව දුරටත් ප්‍රචණ්ඩත්වයන්ගේ ස්වභාවයන් අනුව අනු කාණ්ඩයන්ට කළ බෙදීම ඉඳුරාම වෙනස් නොවී පවතී.

තර්ජනයන්, බියවැද්දීම් හා බලාත්කාරයන් වැනි භෞතික නොවන ආකාරයේ ප්‍රචණ්ඩත්ව ආකාරයන් සහ වෙනස් ලෙසින් සැලකීම වැනි ව්‍යුහගත ප්‍රචණ්ඩත්ව ආකාරයන්, 2015 බලය මාරුවීමට පෙර මෙන්ම එයින් පසුව ද වඩාත්ම පැතිර පවත්නා ප්‍රචණ්ඩත්ව ආකාරය ලෙසින් පවතී. එසේම 2015 ජනවාරියෙන් පෙර හා පසු කාල වකවානු දෙකම තුළ වඩාත්ම බහුලව ප්‍රචණ්ඩත්ව ක්‍රියාවන් සිදුකළවුන් ලෙසින් ප්‍රාදේශීය මට්ටමේ රාජ්‍ය බලධාරීන් සිටී. එනිසා 2015 ජනවාරි රජයයන් මාරු වීම, ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි භක්තිකයින්ට විරුද්ධව වන ප්‍රචණ්ඩත්වයේ අඩුවීමක් වීමට හේතුසාධක වී නොමැති යැයි නිශ්චයකට පැමිණීම සාධාරණ වේ.

දෙවෙනුව, ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි ප්‍රජාවට එරෙහිව වන ප්‍රචණ්ඩත්වය පෙනෙනා ලෙසට නිරන්තරයෙන්ම 'ප්‍රාදේශීය මට්ටමක' සිදුවේ. සැබවින්ම 2015 ජනවාරි සිට 2016 ජූලි දක්වා වාර්තාගත සිදුවීම් 75 ම සිදුවී තිබුණේ වඩාත් ප්‍රාදේශීය තලයක වූ අතර, ජාතික තලයේ දේශපාලන බලයන් සෘජුවම ඊට සම්බන්ධ බවට සාධක නොමැත. මෙම සිදුවීම් සඳහා වගකිව යුත්තන් ලෙසින් හඳුනා ගැනීමට හැකිවූවන් ගත් විට ඔවුන් පූජ්‍ය පක්ෂයේ අයවලුන්, ගම්වැසියන් සහ ප්‍රාදේශීය මට්ටමේ රාජ්‍ය නිලධාරීන් විණි.කෙසේ වුවත් සැලකිල්ලට ගත යුතු වන්නේ, අවක්‍රියාවන්ට දුර්විපාක නොලැබීමේ ජාතික මට්ටමෙන් ඇති නැඹුරුව මගින් ප්‍රාදේශීය මට්ටමේ බලවේගයන් වෙත අවිකල්පයෙන්ම දිරි දී ඇති බවයි. මෙසේ ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට වගකිව යුත්තන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ජාතික මට්ටමේ ක්‍රියාකාරිකයින් දක්වන අක්‍රියාකාරීත්වය සහ සුළුතරයන් ඉලක්ක කොටගත් ජාතික මට්ටමේ දේශපාලඥයින්ගේ වාගාලංකාරයන් මගින්, ප්‍රාදේශීය තලයේ අයවලුන් විසින් තම ක්‍රියාවන්ට විපාක නොලබා නිදහසේ ක්‍රියා කිරීම ධෛර්‍යවත් වී ඇත. මෙම අධ්‍යයනයේ තුන්වන පරිච්ඡේදයේ සාකච්ඡා වන අන්දමට, බෞද්ධ භික්ෂූන් වෙත

162 NCEASL" 'Burial Rites Denied Pastor Harassed at Christian Funeral' in Incident Reports 2015-2016" 6 July 2016" at http://nceasl'org$burial-rites-denied-pastor-harassed-at-christian-funeral-2/[last retrieved 29 August 2017]'

163 බලන්න Janeen Fernando and Shamara Wettimuny, 'Religious Violence in Sri Lanka: A New Perspective on an Old Problem' The Daily FT, 2017 මැයි 26, at http://www.ft.lk/article/617872/Religious-violence-in-Sri-Lanka:-A-new-perspective-on-an-old-problem [last retrieved 2017 අගෝස්තු 29].

ලැබී ඇති 'ව්‍යතිරේකත්වය' මෙම විපාක නොලැබීමේ නැඹුරුවේ මධ්‍යයේම ඇත. නීති ක්‍රියාත්මක කරනා ආයතනයන්, පූජ්‍ය පක්ෂයේ අයවලුන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමට දක්වන පැකිලීම මගින් ප්‍රචණ්ඩ ක්‍රියා සිදුකරනා බොහෝ දෙනෙකුට ආවරණය ලැබී ඇති අතර, ප්‍රාදේශීය මට්ටමෙන් සෘජුවම දුර්ක්‍රියාවන්ට දුර්විපාක නොලැබෙනා සංස්කෘතියක් ස්ථාපනය කොට ඇත.

## 2.2 ඉරි තලා යෑම්

පශ්චාත්-යුද ශ්‍රී ලංකාවේ ප්‍රජාවන් අතර ප්‍රචණ්ඩත්වයේ ගැඹුරේ ඇති ප්‍රධාන සමාජ-සංස්කෘතික, ආර්ථික හා දේශපාලනික ඉරිතැලීම් කිහිපයක්ම The Chronic and the Acute මගින් හඳුනා ගෙන ඇත. සුවිශේෂී ප්‍රාදේශීය සන්දර්භයන් සහ ගතිකයන්, ප්‍රචණ්ඩත්වය ඇතිවීමට සහ වැඩිවර්ධනය වීමට විශාල වශයෙන් බලපා ඇති බවට තවදුරටත් මෙම අධ්‍යයනය මගින් තර්ක කරයි. මෙම ඉරිතැලීම් අද ද පවතින අතර, වර්තමානයේ රටේ පවත්නා ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩ ක්‍රියාවන් බොහෝමයකට පසුබිම සපයා සිටී. එසේ වුවත් 2015 ජනවාරි ප්‍රජාතාන්ත්‍රික බල සංක්‍රාන්තියෙන් පසුව වූ වර්ධනයන් මගින් මෙම පූර්වයේ සිට පැවති ඉරිතැලීම් වෙත නව මානයන් එක් කොට ඇත. මෙම කොටස මගින් උත්සාහ කෙරෙන්නේ, සිදුකර තිබූ විශ්ලේෂණය මත ගොඩනැංවෙමින් මෙම නව මානයන්ගෙන් ඇතැමෙක් පිරික්සා බැලීමටයි.

### 2.2.1 සමාජ-සංස්කෘතික ඉරි තලා යෑම්

මෙම කොටසේ හඳුනාගෙන තිබෙනා සමාජ-සංස්කෘතික මානයන් සැබවින්ම නවමු නොවේ. ඒ වෙනුවට ඒවා, ප්‍රධාන වශයෙන්ම 2015 ජනවාරි බල පෙරලියෙන් පසුව පැන නැඟුණු පූර්වයේ සිටම පැවතුණු ආතතීන්ගේ වඩාත් උග්‍ර අතට හැරුණු ආකාරයන් වේ. මෙවැනි මානයන් තුනක් හඳුනාගැනීමට හැක. ඒවා නම් පළමුව ස්ත්‍රීපුරුෂ සමාජභාවය පාදක වූ මානයන්; දෙවෙනුව භූමදාන චාරිත්‍රයන් සම්බන්ධයෙන් වූ ආතතීන්; සහ තුන්වනුව පූජනීය හා පුරාවිද්‍යාත්මක භූමීන් සම්බන්ධයෙන් වූ ගැටුම් ලෙසින් දැක්විය හැක.

#### ස්ත්‍රීපුරුෂ සමාජභාවය

ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වයේ ස්ත්‍රීපුරුෂ භාවයේ මානය සංකීර්ණ වන අතර, එය මෙම අධ්‍යයනයෙන් ලබාදෙනවාට වඩා ගැඹුරු විමසුමක් ඉල්ලා සිටී.[164] එසේ වුවත්

164 ජනවාර්ගික-ආගමික ජාතිකත්වය ස්ත්‍රී පුරුෂ සමාජභාවය කෙරෙහි බල පා ඇත්තේ කෙසේදැයි පිළිබඳ හොඳ විග්‍රහයක් සඳහා බලන්න, ස්මිරිති ඩැනියල්, සයිනාබ් ඉබ්‍රහිම්, දර්ශි තෝරදෙණිය එඩිනා මල්කාන්ති සහ ඉවන්ජලින් ද සිල්වා Ethno-Religious Nationalism and Sexual and Reproductive Health and Rights in Sri Lanka: A Social Media, Print Media and Policy Review (Women and Media Collective and Asian-Pacific Resource and Research Centre for Women 2016).

ක්ෂේත්‍ර සම්මුඛ සාකච්ඡාවන් හා සංවාදයන්හිදී, ස්ත්‍රීපුරුෂ සමාජභාවය සුවිශේෂී ලෙසින් සඳහන් වූ බව කීම වැදගත් වේ. ජීවිතයන්හි සෑම කොණක් දක්වාම සහ අන්තර්-ප්‍රජා සම්බන්ධතාවයන් තුළ පුරුෂ මූලික සාරාර්ථ පැතිර ඇති බවට සාක්ෂ්‍ය තිබේ. මෙම උප කොටස මගින් සාකච්ඡා කෙරෙනුයේ, ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වයට සම්බන්ධ විශේෂී ඉරිතැලීම් නිර්මාණය කරනා ස්ත්‍රීපුරුෂ සමාජභාවය පදනම් වූ මානයන් දෙකකි.

පළමුව, මුස්ලිම් පුද්ගලික නීති ප්‍රතිසංස්කරණය කිරීමෙහි ලා පවතින දීර්ඝකාලීන සංවාදය, ජනවාර්ගික-ආගමික ආතතීන්හි මූලාශ්‍රයක් ලෙසින් පැන නැගී ඇත. පුද්ගලික නීති යනු, විශේෂයෙන්ම යම් යම්ප්‍රජාවන් සඳහා - සාමාන්‍යයෙන් පුද්ගලික ජීවිතය සම්බන්ධ විෂයයන් වන විවාහ හා ප්‍රවේණිය කරුණු සඳහා යෙදෙන නීති වේ. ප්‍රතිසංස්කරණය සඳහා සැලකිල්ලට ගැනෙනා පුද්ගලික නීති අතර, 1951 වසරේ අංක 13 දරණ මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (MMDA) ද වේ. මෙම පනතේ වඩාත්ම සැලකිල්ලට ලක්ව ඇති විධිවිධානය වන්නේ විවාහ වීමේ වයස සහ විවාහ වීමට අදාළ පුද්ගලයාගේ කැමැත්ත ලබාදීම සම්බන්ධයෙන් වේ. මෙම පනතේ 23 කාණ්ඩය මගින් ගම්‍ය වන්නේ, මෙම පනතට යටත් වන කාන්තාවකට විවාහ වීම සඳහා අවම වයසක් නොමැති බවයි. එනම් වයස අවුරුදු 12 ට අඩු දැරියකට වුවත්, පනත යටතේ පත් කොට ඇති අධිකරණ නිලධාරියෙකු වන ක්වාසිවරයාගේ අවසරය යටතේ විවාහ කරදිය හැක. එනිසා මුස්ලිම් ප්‍රජාවට අයත් වන දැරියන් බාලවයස්කාර විවාහයන්ට ගොදුරු වීමේ අවදානමක් ඇත. තවදුරටත් මෙම පනතේ 18 වන කාණ්ඩය මගින් විවාහය සඳහා කාන්තාවක් නියමාකාරයෙන් කැමැත්ත ලබාදීමේ අවශ්‍යතාවය අත් හැර දමා ඇත. එයින් ඉල්ලා සිටින්නේ විවාහය ලියාපදිංචි කරන අවස්ථාවේදී විවාහයට පත් වන පුරුෂ පාර්ශවයේ සහ වාලිවරයාගේ (කාන්තාවගේ භාරකරු) නිල කැමැත්ත පමණි.[165] එනිසා මුස්ලිම් ප්‍රජාවේ කාන්තාවන් හා දැරියන් බලහත්කාරයෙන් කරනා විවාහ හෝ බල කිරීම මත කරනා විවාහයන්ට ලක්වීමේ අවදානම යටතේ සිටී. මෙම විධිවිධානයන් විශේෂයෙන්ම කාන්තා අයිතිවාසිකම් පිළිබඳ කණ්ඩායම් වල[166] සහ ජාත්‍යන්තර මානව හිමිකම් ආයතනයන්හි[167] දැඩි විවේචනයට විෂය වී තිබිණි. ඒ මගින් යම් පුද්ගලයන්ගේ ස්ත්‍රී පුරුෂ භාවය හා ජනවාර්ගික-ආගමික අනන්‍යතාවය පදනම් කරගනිමින් ඔවුන්ව වෙනස් කොට සැලකීමට ලක් වන අතර, ඒ මගින් මුස්ලිම් කාන්තාවන්ට එරෙහිව ව්‍යුහගත ප්‍රචණ්ඩත්වයේ බැරෑරුම් ආකාරයක්

165 විවාහයට පෙර සිය පියා හෝ පිය පාර්ශවයේ සීයා නොවන කෙනෙකු වාලිගේ ප්‍රකාශනය අත්සන් තබන්නේ නම් පමණක් කාන්තාවගේ කැමැත්ත අපේක්ෂා කෙරේ. එමන්ම, විවාහය සඳහා වාලිගේ කැමැත්ත ලබා ගැනීමේ නිල අවශ්‍යතාව සඳහා වන ව්‍යතිරික සඳහා පනතේ 47(2) සහ (3) බලන්න. වැලි විසින් අසාධාරණ ලෙස කැමැත්ත නොදී සිටී නම් හෝ කාන්තාවකට වැලි කෙනෙකු නැත්නම් මෙම ප්‍රතිපාදන යටතේ කාතිවරයකුට ද එම බලතල ඇත.

166 See Women and Media Collective, Sri Lanka: Collective Oral Statement to CEDAW Committee (2017), at http://womenandmedia.org/sri-lanka-collective-oral-statement-to-cedaw-committee/ [last retrieved 13 October 2017]; 'Statement: We demand accountability on MMDA reforms', at https://mplreforms.com/2017/04/04/statementactnow/#more-858[last retrieved 13 October 2017]; Women and Media Collective, Sri Lanka Shadow Report (2017), at http://womenandmedia.org/wp-content/uploads/2017/02/SHADOW-REPORT-TO-CEDAW-ALL-ISSUES.pdf[last retrieved 13 October 2017].

167 කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් තුරන් කිරීමේ කමිටුවල Concluding Observations on the Eighth Periodic Report of Sri Lanka (2017), at http://tbinternet.ohchr.org/_layouts/treatybodyexternal/Download.aspx?symbolno=CEDAW%2fC%2fLKA%2fCO%2f8&Lang=en[last retrieved 13 October 2017].

නිර්මාණය කරනු ලබයි. තවදුරටත් ශ්‍රී ලංකාවේ වර්තමාන ව්‍යවස්ථාව මගින් 1978 කාලයට පෙරාතුව තිබූ සියලුම ලිඛිත හා අලිඛිත නීති විශේෂයෙන්ම ආරක්ෂා කරන අතර, ඒවා ව්‍යවස්ථාවේ ඇති මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය හා නොගැළපුනද එය නොතකා හැරී ඇත.[168] එනිසා ව්‍යවස්ථාවේ ඇති වෙනස් ලෙසින් සැලකීම් නොකිරීමේ විධිවිධාන පදනම් කරගනිමින් මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතට සාර්ථකව අභියෝග කිරීමක් සිදුවීමට ඉඩක් නොමැති තරම් ය.

මුස්ලිම් විවාහ හා දික්කසාද පනත ප්‍රතිසංස්කරණය කිරීම 1950 ගණන් වල සිටම සැලකිල්ලට බඳුන් විණි.[169] කෙසේ වුවත් රජය මගින් ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය ආරම්භ කිරීම උදෙසා යම් වුවමනාවක් හෝ පෙන්වා සිටියේ 2009 දී වේ. අධිකරණ අමාත්‍ය මිලින්ද මොරගොඩ විසින් මෙම පනත අධ්‍යයනය කොට ප්‍රතිසංස්කරණයන් නිර්දේශ කිරීම උදෙසා ඉස්ලාමීය පෞද්ගලික නීති ප්‍රතිසංස්කරණ කමිටුවක් පත් කරන ලදී. කෙසේ වුවත් ප්‍රධාන වශයෙන්ම ඉස්ලාමීය සංවිධානයන්ගෙන් වන පීඩනය නිසාවෙන්, මෙම කමිටුව සිය වාර්තාව තවමත් ප්‍රකාශයට පත් කොට නැත. උදාහරණ ලෙසින් දක්වන්නේ නම්, 2016 නොවැම්බර් මසදී ශ්‍රී ලංකා තව්හීද්ජමාත් (SLTJ) මගින් මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතට වූ යෝජිත ප්‍රතිසංස්කරණයන්ට එරෙහිව විරෝධතාවයක් සංවිධානය කෙරිණි. වාර්තා වූ අන්දමට ශ්‍රී ලංකා තව්හීද් ජමාත්හි මහලේකම් අබ්දුල් රසීක් විසින් ප්‍රකාශ කොට සිටියේ, විවාහය සඳහා වාලිවරයාගේ කැමැත්ත ඇතුළු මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතේ දැනටමත් අඩංගු කොන්දේසි ප්‍රමාණවත් වන බවත්, විවාහය සඳහා පත් වන කාන්තාවගේ වයස යන කරුණ වැදගත් නොවන බවත් වේ.[170] මේ අතර 2017 දී සමස්ත ලංකා ජමියතුල් උලමා (ACJU) සංවිධානයේ සභාපති හා මුස්ලිම් පෞද්ගලික නීති ප්‍රතිසංස්කරණ කමිටුවේ සාමාජිකයෙකු වූ රිස්වි මුෆ්ති විසින් සඳහන් කොට සිටියේ, මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතේ 'වර්තමාන තත්වය පරිපූර්ණ' වන බවටයි.[171] මෙසේ මුස්ලිම් පෞද්ගලික නීතියේ පැහැදිලිවම පෙනෙනා වෙනස් ලෙසින් සැලකීම් සිදුකරන විධිවිධාන සම්බන්ධයෙන් වන ප්‍රතිසංස්කරණයන්ට ගතානුගතික මුස්ලිම් සංවිධාන මගින් දැඩි ප්‍රතිරෝධයක් එල්ල වූ අතර, එයින් මුස්ලිම් කාන්තාවට එරෙහිව වන ව්‍යුහගත ප්‍රචණ්ඩත්වය චිරස්ථායී වී ඇත.

168 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(2) ව්‍යවස්ථාව මගින් සියලු තැනැත්තන් වර්ගය, ආගම හෝ ලිංගිකත්වය මත වෙනස් කොට සළකනු ලැබීමෙන් ආරක්ෂා කරන අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16(1) ව්‍යවස්ථාව පහත පරිදි වේ: මෙම (මූලික අයිතිවාසිකම්) පරිච්ඡේදයේ විධිවිධානවලට අනනුකූල වන බව නොතකා සියලු ලිඛිත සහ අලිඛිත නීති බලපවත්වයි. එහෙයින්, මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත 12(2) ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනනුකූල වුවත් වලංගු සහ ක්‍රියාත්මක ස්වභාවයේ පවතී.

169 'FAQs about MMDA', at: https://mplreforms.com/aboutmmda[last retrieved 13 October 2017].

170 'Marriage and Divorce Laws: Muslims protest against proposed changes', Ceylon Today, at http://www.ceylontoday.lk/print20160701CT20161030.php?id=8622[last retrieved 13 October 2017].

171 'ACJU and the MMDA – A statement of clarification', at http://www.acju.lk/en/news/acju-news/item/1108-acju-and-the-mmda-a-statement-of-clarification[last retrieved 13 October 2017]. මුෆ්තිගේ ප්‍රකාශය කාති උසාවි ක්‍රමයේ පරිපාලන ප්‍රතිසංස්කරණවලට බාධාවක් නොවන බව සමස්ත ලංකා ජමියතුල් උලමා සංවිධානය පැහැදිළි කළේය. එමෙන්ම බලන්න, 'ACJU 'strongly opposes' changes to Muslim Personal Law', adaderana.lk, 11 November 2016, at http://www.adaderana.lk/news/37807/acju-strongly-opposes-changes-to-muslim-personal-law [last retrieved 1 September 2017].

දෙවෙනුව, කාන්තාවන්ගේ ඇඳුම් ආයිත්තම් මුස්ලිම් ප්‍රජාව තුළ මෙන්ම ඉන් පිටතද තියුණු ගැටළුකාරීතත්වයන් ඇති කරවීමට සමත්ව ඇත. ප්‍රජාව තුළදී, නිඛාබයද ඇතුළුව හිජාබය පැළඳීමේ හා අබායා පැළඳීමේ භාවිතාව, කාන්තාවගේ ඇඳුම් ආයිත්තම් සම්බන්ධයෙන් වන ආගමික පුරුෂාධිපත්‍යයික පාලනය හා සම්බන්ධ වේ. නැගෙනහිර පළාතේ නිරීක්ෂකයින් විසින් සඳහන් කළ ආකාරයට, මෙම භාවිතාව ක්‍රමයෙන් ඉහළ යයි.[172] මෙම භාවිතාවන් ෆර්සානා හනීෆා පවසන ලෙසට පුද්ගලික භාවිතාවන්[173] ආගමික භක්තියේ ප්‍රදර්ශනයන් ලෙසින් ඉදිරිපත් කිරීමට වුවමනා කරනා 'භක්ති' ව්‍යාපාරයන් සමගින් සම්බන්ධ වීමට ඉඩ ඇති අතර, එයින් බොහෝ විට කාන්තාව වෙත වෙනස් ලෙසින් වූ බලපෑමක් සිදුකරයි. කෙසේ හෝ හනීෆා විසින් මෙම භාවිතාවන් හා සම්බන්ධ වූ සංකීර්ණතාවයන් සටහන් කරයි. ඇයගේ නිරීක්ෂණයන් මෙසේයි:

> කිසිදු භක්ති කණ්ඩායමකට අයත් නොවන, විවිධ පංති හා ප්‍රදේශයන්ට අයත් කාන්තාවන් මේ වන විට හිජාබය සහ එපමණක් නොව අබායාවද පළඳී. අද වනවිට මෙම වස්ත්‍රයන් සංස්කෘතික වෙනස්කම සලකුණු කරන්නක් බවට පත්ව ඇත.එසේම එය අභිනවයෙන් සවිඥාණිකව වැළඳගත් පෞද්ගලික භක්තියකට වඩා, බහුවාර්ගික රාජ්‍යයක මුස්ලිම් බවේ සංකේතයක් බවට පත්ව ඇත. එනිසා වැළඳගත් ස්වපුද්ගලභාවය මුස්ලිම් වන අතර, සෑමවිටම එය රැඩිකල් ලෙසින් ආගමික නොවේ.[174]

එනිසා, කාන්තාවන්ගේ ඇඳුම් පැළඳුම් සම්බන්ධයෙන් මුස්ලිම් භාවිතාවන් සම්පූර්ණයෙන්ම 'ප්‍රතිගාමී' යැයි සැළකීම මගින්, අද්‍යතන මුස්ලිම් කාන්තාවන් සිය අනන්‍යතාවය පවත්වාගන්නේකෙසේද යන්න සහ ප්‍රජා සබඳතා ගොඩනගා ගන්නේ කෙසේද යන්න සම්බන්ධයෙන් ඇති සංකීර්ණත්වයන් සැඟවී යෑමේ අවදානමක් පවතී.[175] එසේ වුවත් මෙම භාවිතාවන් අවිවාදාත්මකව උක්ත කී ආකාරයට ප්‍රතිගාමී යැයි හැඳින්වෙන අතරම, ජනවාර්ගික-ආගමික ආතතීන් සඳහා මූලයක්ද වී ඇත.

මුස්ලිම් පෞද්ගලික නීතිය සහ ඇඳුම් පැළඳුම් සම්බන්ධයෙන් වන භාවිතාවන්, මුස්ලිම් ප්‍රජාව තවදුරටත් පවිටු ලෙසින් හුවාදැක්වීමට බොදු බල සේනා වැනි සිංහල-බෞද්ධ කලහකාරී කණ්ඩායම් වෙත අවස්ථාව සලසා දී ඇත. මෙම ගැටළු මගින් මුස්ලිම්වරුන් සම්බන්ධයෙන් ප්‍රාදේශීය තලයේ වන හැඟීම් තවදුරටත් හැඩ ගස්වා ඇත. උදාහරණ ලෙසින් දක්වන්නේ නම්, මෑතක දී නැගෙනහිර පළාතේ පැවැත්වුණු ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාවන්හි දී හෙළිදරවු වූ පරිදි, අනෙකුත් ප්‍රජාවන් (සිංහල-බෞද්ධ, සිංහල, දමිළ ක්‍රිස්තියානි සහ දමිළ හින්දු) බොහෝ විට දරා සිටි අදහසක් වූයේ මුස්ලිම් පුරුෂ පක්ෂය

172 කල්මුණේ වෙළඳ සංගමය සමඟ සිදු කළ ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාව 2017 මාර්තු 31.

173 හනීෆා, 'Piety as Politics', op. cit. at 347.

174 එම at 357.

175 එම at 357-358

නිරන්තරයෙන්ම කාන්තාවන්ව පීඩනයට, මර්දනයට ලක් කරනා බවයි. මෙවැනි දෘෂ්ටීන් මගින් මුස්ලිම් ප්‍රජාව කෙරෙහි වන ඍණාත්මක ඒකාකෘතික කිරීම් වඩාත් අවධාරණය කරවයි. එනිසා කලහකාරී කණ්ඩායම් මගින් භාවිතා කරනා මුස්ලිම්-විරෝධී වාග් මාලාවන් බොහෝ විට ප්‍රාදේශීය තලයේ වන පූර්ව-කල්පනාවන් සහ සැකයන් හා සමපාත වන අතර, ඒ ඔස්සේ ජනවාර්ගික-ආගමික ආතතීන් සඳහා අවශ්‍ය තත්වයන්ද, ඒ ඔස්සේ බොහෝ විට ප්‍රචණ්ඩ ක්‍රියාද නිර්මාණය වේ. [176]

## භූමදාන චාරිත්‍ර වාරිත්‍ර

මින් පෙර උප කාණ්ඩයක සඳහන් කළ ආකාරයට, ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩ ක්‍රියා සිදුවීම් ගණනාවක්ම භූමදාන චාරිත්‍ර වාරිත්‍ර සම්බන්ධව සිදු වී ඇත. අඩු තරමින් වාර්තාගත ක්‍රිස්තියානිවරුන්ට එරෙහි ප්‍රචණ්ඩ ක්‍රියා සිදුවීම් පහක් හෝ, ක්‍රිස්තියානි මියගියවුන්ව භූමදානය කිරීමෙහිදී වූ ගැටුම් හා සම්බන්ධ වී ඇත.[177] 2015 ජූනි 8 වෙනි දිනවාර්තා වූ ආකාරයට පුත්තලමේ කරුවලගස්වැව, සිංහල බෞද්ධ ගම්වාසීන් 50 ක පමණ පිරිසකගෙන්සැදි කලහකාරී පිරිසක් විසින් ප්‍රදේශයේ පල්ලියක සිදුවෙමින් තිබූ අවමංගල්‍ය මෙහෙයකට  බාධා කළ අතර, එම මෙහෙය පවත්වමින් සිටි පාස්ටර්වරයාටද ආක්‍රෝශ පරිභව කරන ලදී.[178] 2016 ජනවාරි 31 වන දින ත්‍රිකුණාමලයේ දමිළ හින්දු ගම්වාසීන් පිරිසක් විසින් ක්‍රිස්තියානු භූමදානයකට බාධා කළ අතර, එය ග්‍රාමයේ බහුතර ආගමෙහි -එනම් හින්දු දහමෙහි- ආකාරයට සිදුකළ යුතු බවට බල කරන ලදී.[179] මඩකළපුවේදී 2015 ඔක්තෝබර් 16 සහ 2016 මාර්තු 16 දිනයන්හිදී සිදුවූ සිදුවීම් ඇතුළු මෙම බොහෝමයක් සිදුවීම් වලදී, එහි වින්දිතයින්ට එක්කෝ ප්‍රදේශයේ බහුතර ආගම අනුව භූමදාන කටයුතු සිදුකිරීමට බලකෙරුණු අතර නැතිනම් සරලවම වෙනත් සුසාන භූමියකට යැමට සිදුව තිබිණි.[180]

මේ මගින් යම් යම් ප්‍රාදේශීය සන්දර්භයන්හි වන ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වයන් ගැඹුරෙහි ගැබ්ව ඇති සමාජ-සංස්කෘතික යතාර්ථයන් පිළිබිඹු වේ.මෙම යතාර්ථයන්ගේ මධ්‍යයෙහි ක්‍රිස්තියානි අන්‍යාගමිකකරණයේ ගැටළුව පවත්නා අතර, බොහෝ විට

176 ජනවාර්ගික අධ්‍යයනය සඳහා වන ජාත්‍යන්තර කේන්ද්‍රය, Community Perceptions of Religious Tolerance and Religious Tensions in Batticaloa and Trincomalee (forthcoming), at 31.

177 NCEASL, 'Villagers Disrupt Christian Burial Service in Karuwalagasweva' in Incident Reports 2015-2016, 21 July 2015, at http://nceasl.org/villagers-disrupt-christian-burial-service-in-karuwalagasweva/ [last retrieved 29 August 2017].

178 NCEASL, 'Villagers Disrupt Christian Burial Service in Karuwalagasweva' in Incident Reports 2015-2016, 21 July 2015, at http://nceasl.org/villagers-disrupt-christian-burial-service-in-karuwalagasweva/ [last retrieved 29 August 2017].

179 NCEASL, 'Burial Rites Denied; Pastor Harassed at Christian Funeral' in Incident Reports 2015-2016, 1 March 2016, at http://nceasl.org/burial-rites-denied-pastor-harassed-at-christian-funeral/ [last retrieved 29 August 2017].

180 බලන්න, MRG, op. cit. at 10-11 නිදසුනක් ලෙස 2016 ජනවාරි මස දී සේරුකැලේ ක්‍රිස්තියානි අවමංගල්‍ය සේවාවක් ප්‍රදේශයේ වැසියන් විසින් අවහිර කරන ලදී. අවසානයේ භූමදානය වෙනත් ගමකට ගෙන යන ලෙස පොලීසිය විසින් පල්ලියේ පියතුමාට උපදෙස් දුනි.

යම් ප්‍රදේශයක බහුතර ආගමේ සාමාජිකයින් විසින් ක්‍රිස්තියානියට හැරුණු මියගිය තැනැත්තෙකුගේ අවමංගල මෙහෙයට විරුද්ධකම් දක්වන බව පෙනී ගිය කරුණකි. එවැනි විරුද්ධතාවයන් සිංහල බෞද්ධ ආධිපත්‍යය පවත්නා ප්‍රදේශයන්හි වසර ගණනක සිට පැතිර පවතී. 2015 දෙසැම්බර් 20 වෙනි දින ඌව පළාතේ ලුණුගලදී සිංහල බෞද්ධ වැසියන් කණ්ඩායමක් විසින් ප්‍රදේශයේ සොහොන් පිටියක මියගිය ක්‍රිස්තියානි භක්තිකයෙකු භූමදාන කිරීමට විරුද්ධත්වය දක්වන ලදී.[181] තවදුරටත් දක්වන්නේ නම් 2008 දී වාර්තාගත වන ලෙසට ජාතික ක්‍රිස්තියානි සමූහයේ ගරු රොහාන් ඒකනායක පියතුමා විසින් ප්‍රකාශ කරන්නට යෙදුණේ, ක්‍රිස්තියානියට හැරුණු බෞද්ධයින්ව ක්‍රිස්තියානි ආකාරයට මිහිදන් කිරීම බෞද්ධ භික්ෂූන් විසින් වළක්වන්නට යෙදුණු බවත්, මියගියවුන්ගේ පවුලේ අයගේ කැමැත්ත හෝ නොතකා එම මළසිරුරු බලෙන් රැගෙන බෞද්ධ වතාවත් අනුව භූමදානය කිරීමට කටයුතු කළ බවත් වේ.[182] මීට සමාන ලෙසින්, මින් පෙර උප කාණ්ඩයකද විස්තර කොට ඇති පරිදි, හින්දු ආධිපත්‍යය පවත්නා ප්‍රදේශයන්හි ද ක්‍රිස්තියානි භූමදාන චාරිත්‍රයන්ට විරුද්ධත්වය පෑම් දක්නට ලැබිණි. බෞද්ධ හා හින්දු බහුතර ප්‍රදේශයන් හරහා වන පොදු සාධකයක් වන්නේ, අන්‍යාගමිකකරණයට විරුද්ධව දක්වන සතුරු බවයි. සැබවින්ම බෞද්ධ මෙන්ම හින්දු කණ්ඩායම්ද මගින් අන් ආගම් වලට හැරවීම පිළිබඳ නියාමනයට සහාය පළ කරන්නට යෙදුණේ, මෙවන් අන්‍යාගමිකකරණය විෂයෙහි වන ශංකාවන් නිසාවෙනි.[183]

මයිකල් හර්ට්ස්බර්ග් විසින් විස්තර කරන්නේ, අන් ආගම් වලට හැරවීමට දැක්වෙන බෞද්ධ විරෝධය සැබවින්ම 'ආගමික වෙළෙඳ ආකෘතිය' අතින් බලනා විට තාර්කික බවටයි.[184] ඔහු තර්ක කොට සිටින්නේ 'ආගම යන්න ජාතික අනන්‍යතාවය සම්බන්ධ හැඟීම් හා බැඳී පවතින විට, අන් ආගමකට හැරවීමේ ක්‍රියාවක් මගින් වෙනස් තලයන්හි -එනම් ආගමික මෙන්ම ජාතික තලයන් යන දෙකේම - ද්‍රෝහීත්වයක් හඟවන බවයි.[185] වෙනත් ආගමකට හැරවීමත්, ඊට දැක්වෙන විරෝධතාවයත් හුදු 'ආගමික' ගැටළුවක් නොවී 'ජනවාර්ගික-ආගමික' ගැටළුවක් වන්නේ මේ හෙයිනි. පළාත්බද හෝ ඇතැම් විට ප්‍රාදේශීය බහුතර අනන්‍යතාවය සම්බන්ධයෙන් වන සමාන්තර හැඟීම්, ඇතැම් විට අන්‍යාග මිකකරණය කෙරෙහි වූ හින්දු විරෝධය උත්ප්‍රේරණය කරනවා විය හැක. මේනිසා අන් ආගමකට හැරවීම බොහෝ විට විරුද්ධත්වය සමගින් සම්බන්ධ වන අතර, ආගම් සම්බන්ධ

181 See United States Department of State – Bureau of Democracy, Human Rights, and Labour, 'Sri Lanka 2005 International Religious Freedom Report' in International Religious Freedom Report for 2005 (2006), at https://www.state.gov/j/drl/rls/irf/2006/71444.htm [last retrieved 29 August 2017].

182 සොනාලි සමරසිංහ, 'And then they came for me...', The Sunday Leader, 17 August 2008, at http://www.thesundayleader.lk/archive/20080817/spotlight.htm [last retrieved 29 August 2017].

183 See Hertzberg, op. cit. at 242-244.

184 එම. at 172.

185 එම.

ඇතැම් බොහෝ 'ඇවිලෙන සුළු' ගැටුම්ද ඇති කරවයි.[186] ගෞරි විශ්වනාදන් විසින් තර්ක කරනා ආකාරයට, අන් ආගමකට හැරවීම - විශේෂයෙන්ම සුළුතර ආගමකට හැරවීම- විසම්මුතියේ ප්‍රකාශයක් ලෙසින් පිළිගැනෙන්නේ එයින් 'ස්ථිර, වෙනස් කළ නොහැකි අනන්‍යතාවයන් යන සංකල්පය' නිශ්ප්‍රභා කෙරෙන අතර, 'ස්වාත්මය, පුරවැසිබව, ජාතිකත්වය සහ ප්‍රජාවන් අර්ථ දැක්වුණු සීමා මායිම් කළඹවා, ඒවා පාරගම්‍ය සීමාවන් ලෙසින් නිරාවරණය කිරීම' නිසාවෙනි.[187]

භූමදාන චාරිත්‍ර වාරිත්‍රයන්ට ඉඩ නොදීම පසුපස ඇති පෙළඹවීම ඇතැම් විට එකකට එකක් සම්බන්ධ සාධක දෙකකට සබැඳි විය හැක.එක් අතකට ක්‍රිස්තියානි භූමදානයන්ට එරෙහිව ඇති විරෝධය දේශපාලනමය සැළකිලිමත්වීම් මගින් උත්ප්‍රේරණය වූවා විය හැක. ප්‍රජාවන් තුළ ක්‍රිස්තියානු අවමගුල් මෙහෙයන්හි හෝ භූමදාන චාරිත්‍රයන් ඉහළ මට්ටමකින් දර්ශනය වන සුළු බව (එනම් බොහෝ විට අතිශයින්ම සුලභව හඳුනාගත හැකි ක්‍රිස්තියානි කුරුස සංකේතය නිසා), සැලකිල්ලට ලක් වන බහුතර ආගමේ ආධිපත්‍යය ලඝු විය හැක. භූමදාන භූමියද අනුස්මරණයේ භූමි භාගයක් වන අතර, එය ප්‍රජාව තුළ ක්‍රිස්තියානි බලපෑමේ- විශේෂයෙන්ම ක්‍රිස්තියානියට හරවා ගැනීමේ සාර්ථකත්වයේ සිහිපත් කරවීමක් ලෙසින් තිබෙනු ඇත. එනිසා මෘත ශරීර අත්අඩංගුවට ගැනීම සහ බලාත්කාරයෙන් ප්‍රදේශයේ බහුතරයකගේ ආගමට අනුව භූමදාන චාරිත්‍ර පැවැත්වීම මගින් මෙම ක්‍රිස්තියානියට 'හරවාගැනීම' අවලංගු කිරීමට සහ එසේ හැරවුණු තැනැත්තාගේ එම වෙනත් ආගමකට ගිය අතීතය මකා දැමීම සිදුවීම විය හැක. මෙම ක්‍රියාව, එසේ හැරවීමට පෙරාතුව තිබූ යථා තත්වය ප්‍රතිස්ථාපනය කිරීම- එනම් බහුතර ආගමේ ආධිපත්‍යය සවිබල ගැන්වීම සඳහා වේ.

අනෙක් අතට ක්‍රිස්තියානි භූමදානය කිරීම් නවත්වාලීම සඳහා ආධ්‍යාත්මික පෙළඹවීමක්ද තිබිය හැක. නූතන බෞද්ධ හා හින්දු භාවිතාවන්ට අනුව මියගිය තැනැත්තා භූමදානය කිරීම නොව ආදාහනය කිරීම සිදුවේ. මෙම ආගමික විශ්වාස පද්ධතීන් දෙකම තුළ පුනර්භය නැතිනම් ප්‍රතිසන්ධිය - එනම් නව සිරුරක් යන අදහස අන්තර්ගත වේ. එනිසා බුද්ධිමතුන් විසින් තර්ක කරනා ආකාරයට භූමදානය වෙනුවට ආදාහනය මගින් සම්පූර්ණයෙන්ම ශරීරය විනාශ කිරීම බොහෝ විට කෙරෙන්නේ, ඒ මගින් 'මියගිය තැනැත්තාගේ රූපාන්තරණය' සිදුවන්නේය යන අදහස සමගින් වේ.[188] මීට ප්‍රතිවිරුද්ධ

186 බෙන්ජමින් ශෝන්තාල්, Buddhism, Politics and the Limits of Law: The Pyrrhic Constitutionalism of Sri Lanka (Cambridge University Press 2016), at 217.

187 ගෞරි විශ්වනාතන්, Outside the Fold: Conversion, Modernity and Belief (Princeton University Press 1998), at 16.

188 ස්ටේසි වෝර්ඩ් සහ නැන්සි ටෙයිල්ස්, 'Cremation in Mainland Southeast Asia' in Marc Oxenham and Hallie Buckley (eds.), The Routledge Handbook of Bioarchaeology in Southeast Asia and the Pacific Islands (Routledge 2015), at 241.

ලෙසින් ක්‍රිස්තියානින් භූමදානයට දක්වන කැමැත්තට පදනම් වන්නේ, භක්තිකයින්ගේ සිරුරු ක්‍රිස්තුන්ගේ දෙවන පැමිණීමේදී උත්ථානය වනු ඇත යන විශ්වාසයයි.[189] ක්‍රිස්තියානි භූමදානයන්ට එරෙහිව වන ප්‍රතිවිරෝධය පැන නගින්නේ මෙම මූලික වෙනසින් විය හැක. එනම් ප්‍රදේශයේ බහුතර ප්‍රජාව විසින්, ක්‍රිස්තියානියට හැරවූවෙකු භූමදානය කිරීම මගින් බෞද්ධ හෝ හින්දු ආදාහනය මගින් හැඟවෙන රූපාන්තරණයට සෘජුවම අවමන් කිරීමක් ලෙසින් සැලකීම නිසා විය හැක. මෙම සන්දර්භය තුළ, භූමදාන චාරිත්‍ර වාරිත්‍රයන් සම්බන්ධයෙන් වන ගැටුම් සහ ආතතීන්, ප්‍රාදේශීය තලයේ නිදන්ගත ප්‍රචණ්ඩත්වයට මූලාශ්‍ර විය හැක.

## පූජනීය හා පුරාවිද්‍යාත්මක භූමීන්

2015 දී මුස්ලිම්වරුන් සඳහා වන මහලේකම් කාර්යාලය මගින් යන මැයෙන් වූ වෙලුම් දෙකක ග්‍රන්ථ මාලාවක් එළිදැක්වූ අතර, එහි පූජනීය හා පුරාවිද්‍යාත්මක භූමීන් සඳහා වූ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධ විෂය අධ්‍යයනයන් හතරක් අන්තර්ගත විය. මෙයින් පළමු වෙළුම කුරගල හා දෙවනගල ගැටුම්[190] පිළිබඳව කථා කරනා අතර, දෙවන වෙළුම මගින් දීඝවාපියේ හා දඹුල්ලේ ගැටුම්[191] පිරික්සා බලයි. මෙම සෑම අවස්ථාවකදීම සිංහල බෞද්ධ කලහකාරී කණ්ඩායම් විසින් එම විශේෂිත ප්‍රදේශය බෞද්ධාගමට අනුව 'පූජනීය' බවට චිත්‍රණය කිරීමට බලාපොරොත්තු විණි. ඇතැම් අවස්ථාවන්හිදී මුස්ලිම්ප්‍රජාවද, භූමියක ඉස්ලාමීය සුවිශේෂීත්වය සම්බන්ධයෙන් ප්‍රති-හිමිකම් ඉදිරිපත් කොට ඇත. උදාහරණ ලෙසින් දක්වන්නේ නම් මින් පෙර වූ කොටස තුළදීද විමර්ශණයට ලක් කළ පරිදි, කුරගල මුස්ලිම් සිද්ධස්ථානය සම්බන්ධයෙන් වූ ආරෝවෙහිදී සිංහල-බෞද්ධ මෙන්ම මුස්ලිම් කණ්ඩායම්ද මගින් එම භූමිය තමතමන්ගේ ප්‍රජාවන්ට පූජනීය වන බව හා පුරාවිද්‍යාත්මකව වැදගත් වන බව දැක්වීමට තරගකාරී හිමිකම් දැක්වීම් සිදුකරන ලදී. මීට සමාන ලෙසින් කැගල්ලේ දෙවනගල පර්වතයද සිංහල බෞද්ධයින් හා මුස්ලිම්වරුන් අතර ගැටුම් වලට හේතු වූ භූමියක් විණි. සිංහල-බෞද්ධයින් විසින් මෙම පර්වතය මත තමන්ට ඓතිහාසිකව වැදගත් වන ගොඩනැගිලි හා වස්තූන් තිබෙනා බව ප්‍රකාශ කරයි.[192] මෙම ආරෝව පැන නැගුනේ, මෙම භූමිය විමලධර්මසූරිය රජු විසින් යාබද ගම්මානයක් වන රුවන්දෙණියේ සිටි බෞද්ධ භික්ෂුවක් වූ පූජ්‍ය රත්නාලංකාර හිමියන්ට පිදූ බවට වන

189 නිදසුනක් ලෙස බලන්න, 'Vatican issues new document on Christian burial and cremation', Vatican Radio, 25 October 2016, http://en.radiovaticana.va/news/2016/10/25/vatican_issues_new_document_on_christian_burial,_cremation/1267621 [last retrieved 29 August 2017]. ආදාහනයට වඩා භූමදානය කෙරෙහි ඇති ක්‍රිස්තියානි තෝරා ගැනීම පිළිබඳ වඩාත් ගැඹුරු සාකච්ඡාවක් සඳහා බලන්න තෝමස් එන්. මැකිනිස්, The Christian Burial Case: An Introduction to Criminal and Judicial Procedure (Greenwood Publishing Group 2001). එමෙන්ම බලන්න ස්ටීවන් ප්‍රොතෙරෝ, Purified by Fire: A History of Cremation in America (University of California Press 2001).

190 Secretariat for Muslims, Of Sacred Sites and Profane Politics – Volume I, op. cit.

191 Secretariat for Muslims, Of Sacred Sites and Profane Politics: Tensions over Religious Sites and Ethnic Relations – Volume II Deegavapi and Dambulla (October 2015).

192 Secretariat for Muslims, Of Sacred Sites and Profane Politics – Volume I, op. cit. at 5.

ප්‍රකාශය සමගිනි.[193] වාර්තාවන අන්දමට, මෙම පර්වතයේ වන සෙල්ලිපියක් මගින් මෙම පූජාකිරීම වාර්තා කොට ඇත.බොදු බල සේනා, සිංහල රාවය වැනි කලහකාරී කණ්ඩායම් මගින් ප්‍රකාශ කොට සිටින්නේ මෙම පූජා කළ භූමිය තිබෙන්නේ මෙම පර්වතය අසල වන මුස්ලිම් ජනාවාසයක් තුළ බවට වන අතර, දෙවනගලින් මුස්ලිම්වරුන් ඉවත් කිරීම සඳහා ඔවුන් ව්‍යාපාරයක් ගෙන යයි.[194] මෙම කණ්ඩායම් මගින් ප්‍රදේශයේ මුස්ලිම් පදිංචිකරුවන්ට එරෙහිව වෛරී ප්‍රකාශයන් සහ ප්‍රචාරණයන් ගෙන යන්නේ, ඔවුන් මෙම පුරාවිද්‍යා භූමිය පැහැරගෙන 'පූජනීය' භූමිය තුළ පදිංචි වී සිටිනා බව ප්‍රකාශ කරමිනි.[195] මේ අතර මුස්ලිම්වරුන් විසින් මෙම ප්‍රකාශයන් හා හිමිකම් කීම් ප්‍රතික්ෂේප කර සිටිනා අතර, තමන්ට මෙම භූමියේ රැඳී සිටීමට අයිතියක් ඇතැයි යන ස්ථාවරය ඔවුන් පවත්වා ගෙන යයි. මාවනැල්ල මිත්‍රත්ව සංගමය (MFF) සහ දෙවනගල මිත්‍රත්ව සංගමය (DFF) වැනි ප්‍රජා කණ්ඩායම් විසින් එවක් පටන්ම මෙම තරගකාරී ප්‍රකාශයන් විචාරමින් වඩාත් සාමකාමී විසඳුමකට පැමිණීම සඳහා උත්සාහ දරමින් සිටී. සැබවින්ම මාවනැල්ල මිත්‍රත්ව සංගමය විසින් 2014 දී වාර්තා කොට සිටියේ, විමලධර්මසූරිය රජු විසින් ප්‍රදානය කරනු ලැබූ අක්කර 72 ක් වන භූමි භාගය පිහිටා ඇත්තේ අසල්වාසී රුවන්දෙණිය ග්‍රාමයේ මිස පර්වත පරිශ්‍රයේ නොවන බවටයි.[196] කෙසේ හෝ මාවනැල්ල මිත්‍රත්ව සංගමය සහ දෙවනගල මිත්‍රත්ව සංගමය යන දෙකම, මුස්ලිම් පදිංචිකරුවන්ව ඉවත් කිරීම සඳහා ව්‍යාපාරයන් ගෙන යන කණ්ඩායම් මගින් හිරිහැරයට සහ තර්ජනය කිරීම් වලට ඉලක්ක විණි.[197]

දීඝවාපිය සහ දඹුල්ල වැනි භූමීන් සම්බන්ධයෙන්ද වූ ආරෝවන්, 'පූජනීයභාවය' සහ පුරාවිද්‍යාත්මක වැදගත්කම වැනි හුරුපුරුදු ප්‍රකාශයන්ගෙන් සමන්විත විණි. අපවත්වී වදාළ ගංගොඩවිල සෝම හිමි වැනි බෞද්ධ භික්ෂූන් විසින් තිරව ප්‍රකාශ කොට සිටියේ, දීඝවාපිය වැනි 'පූජනීය භූමි' විශේෂයෙන්ම බෞද්ධයින්ට අයත් වන බවටයි.[198] මීට සමාන ලෙසින්ම දඹුල්ල පන්සලට ආසන්නයේ පිහිටා තිබූ මස්ජිද්-උල්-කයිරියා පල්ලියට එරෙහිව වූ මැර ප්‍රහාරයන් (සහ පසුව භද්‍රකාලි කෝවිල බිඳ හෙලීම) සම්බන්ධයේදීද මෙම 'පූජනීය' තත්වය අවධාරණය කෙරිණි.[199] මෙම ඊනියා 'පූජනීය' ස්ථානයන්හි ඇති මුස්ලිම් පුද පූජා ස්ථානයන්ට එරෙහිව සිදුවූ ප්‍රමුඛ සිදුවීම්, 2015 ජනවාරි බලය මාරුවීමෙන්

193 එම. at 5.

194 එම.

195 බලන්න කාලිංග ටියුඩර් සිල්වා, අෆ්රා නිවාස සහ ඩබ්. එම්. කේ. බී. වික්‍රමසිංහ, Religious Interface and Contestations between Buddhists and Muslims in Sri Lanka: A Study of Recent Developments in Selected Multi-Religious and Cross-Cultural Sites (ICES 2016), at 10-12.

196 බලන්න ෆිලිප් ෆ්‍රෙඩ්රික්, 'Adjudicating Antipathy: The Politics of Historical Confrontation at Devanagala, Sri Lanka' in John Clifford Holt (ed.), Buddhist Extremists and Muslim Minorities: Religious Conflict in Contemporary Sri Lanka (Oxford University Press 2016), at 157.

197 Secretariat for Muslims, Of Sacred Sites and Profane Politics – Volume I,op. cit. at 13.

198 නිදසුනක් ලෙස බලන්න, නිලීකා ද සිල්වා සහ ෆරාසා ෆරූක්, 'Dighavapi: Digging Deeper', The Sunday Times, 10 October 1999, available at http://www.sundaytimes.lk/991010/spec.html [last retrieved 29 August 2017].

199 Secretariat for Muslims, Of Sacred Sites and Profane Politics – Volume II, op. cit. at 5.

පසු අඩුවී ගොස් ඇති බවක් පෙනී යයි. එසේ වුවත් මෙම ස්ථානයන් සම්බන්ධයෙන් වන නොවිසඳුණු ආතතීන්, අනාගතයේදී ප්‍රචණ්ඩ ක්‍රියා දක්වා ඉහළ යෑමේ අවදානම නොනැසී පවතී. එනිසා, 2015 ජනවාරියේදී සිදුවූ බලය මාරුවීම මගින් ප්‍රචණ්ඩ ක්‍රියාවන් නිවාරණය කෙරෙනා බවට සහතිකයක් නොසපයයි. සැබවින්ම බලය මාරු වීමෙන් පසුව වුවද කුරගල ප්‍රචණ්ඩ ක්‍රියාවන් මගින් බරපතල අවදානමක් පිළිබිඹු වේ.

## 2.2.2 ආර්ථික ඉරි තලා යෑම්

ශ්‍රී ලංකාවේ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය ගැඹුරෙහි දිවෙන ආර්ථික ඉරිතලා යෑම් වල පෘතුල දළ සටහන, The Chronic and the Acuteys යම් තාක් දුරකට විමසා බලා ඇත. මෙම පුළුල් සන්දර්භය තුළ, ඉඩම්, නැවත පදිංචි කිරීම් සහ රාජ්‍ය සේවාවන් සම්බන්ධයෙන් වන ප්‍රාදේශීය වූ ආර්ථික ගැටුම්, 2015 බලය මාරු වීමෙන් පසුව පැමිණි කාලය තුළද පවතී.

### ඉඩම් හා නැවත පදිංචි කිරීම්

ශ්‍රී ලංකාවේ ජනවාර්ගික-ආගමික තරඟය තීව්‍ර කිරීමට බලපාන තීරණාත්මක සම්පතක් සහ කලාපයක් වන්නේ ඉඩම් ය. එය උතුරු සහ නැගෙනහිර පළාතේ දෙමළ කතා කරන ජනතාවගේ ස්වයං පාලනය සඳහා වන අරගලවල කේන්ද්‍රීය සාධකය වෙයි. මේ අතරතුර, ඉඩම් පිළිබඳ ආරවුල් පශ්චාත් යුද අවධියේ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය කෙරෙහි යටිතල සාධකයක් ලෙස පැවති අතර, 2015 ජනවාරි සංක්‍රාන්තියෙන් පසුව පවා ආතතීන් ඇති කිරීමේ නිරන්තර මූලයක් ලෙස පවතින්නේ ය.

ඉඩම් හිඟකම, නැගෙනහිර පළාතේ ස්ථාන ගණනාවකම වර්ගවාදී ආතතීන් ඇති කිරීමෙහි ලා පසුබිම් වී ඇත. නිදසුනක් ලෙස, පදුවන්කරෙයි ප්‍රදේශයේ කලින් මුස්ලිම් වැසියන්ට අයත්ව තිබූ ඉඩමක් පිළිබඳ ආරවුල් ගැන මඩකලපුවේ මුස්ලිම් සිවිල් සමාජ නියෝජිතයෝ සඳහන් කළහ. යුද්ධය අතරතුර එකී ඉඩම අත්හැර දමනු ලැබ ඇති බවත්, ඉන් අනතුරුව එය අත්පත් කරගෙන දැනට එහි වෙසෙන දෙමළ ප්‍රජාව, එහි සැබෑ හිමිකරුවන් වන මුස්ලිම් වැසියන්ට යළි පැමිණීමට නොදී වළකාලන බව සඳහන් කරන ලදී.[200] මේ අතරතුර, ඉඩම් සම්බන්ධ ජනවාර්ගික-ආගමික ආතතීන්ට රාජ්‍යය ද දායක වී තිබේ. මෑතකාලීන නිදසුන් දෙකක් මේ සංසිද්ධිය විදහා දක්වයි.

පළමුවැන්න, අම්පාර දිස්ත්‍රික්කයේ අක්කරෙයිපත්තුව සහ දීඝවාපිය යන යන ප්‍රදේශවල සවුදි අරමුදලින් ගොඩනැගෙන නිවාස 500ක ප්‍රතිලාභීන් තීරණය කිරීම සඳහා රජය අදාළ කර ගත්තේ ජනවාර්ගික අනුපාතය යි - මෙකී නිවාස මුල දී ගොඩ නගන ලද්දේ 2004 සුනාමියෙන් වින්දිතයින් බවට පත් මුස්ලිම් වැසියන් සඳහා ය. මෙහිදී ජනවාර්ගික අනුපාතය

200 අක්කරයිපත්තු මුස්ලිම් සිවිල් සමාජ ක්‍රියාකාරිකයකු සමඟ පැවැත්වූ සම්මුඛ සාකච්ඡාව 2017 මාර්තු 31.

අදාළ කර ගැනීම සමහර විචාරකයින් විසින් දකිනු ලැබුවේ මුස්ලිම් නිවාස අහිමි කිරීම සඳහා රජය චේතනාන්විතවම උපක්‍රමිකව කටයුතු කිරීමක් ලෙසිනි.[201]

දෙවැන්න, විල්පත්තු රක්ෂිතයට ආසන්න මුස්ලිම් ජනාවාසයක් ගැන වූ ආතතිමය තත්ත්වය රාජ්‍යය විසින් වඩාත් කුපිත කරවනු ලැබ තිබේ. විල්පත්තුවේ ගැටුම, මුස්ලිම් වැසියන් 75,000ක් දිගු කාලීනව අවතැන් කරමින්, 1990 දී එල්ටීටීඊය විසින් උතුරු පළාතෙන් මුස්ලිම් වැසියන් පළවා හැරීම කෙරෙහි සම්බන්ධ වන්නකි.[202] යුද්ධයෙන් අනතුරුව, මන්නාරමේ මුසාලි දකුණ ප්‍රදේශයේ සමහර පවුල්, විල්පත්තු වන සංරක්ෂිතයට යාබදව පිහිටි කරඩික්කුලි, සහ මරිචකට්ටි වැනි ප්‍රදේශවල පිහිටි තම මුල් ඉඩම් කරා නැවත ගියහ.[203] කෙසේවුවත්, එකී මුස්ලිම් ජනාවාස වන සංරක්ෂිතය තුළ පිහිටා ඇති හෙයින් එම නැවත පදිංචි වූ මුස්ලිම් වැසියන් පළවා හරින ලෙස බොදුබල සේනා වැනි යුදකාමී කණ්ඩායම් ප්‍රකාශ කර සිටියේය. අතිශයින් ධ්‍රැවීකරණය වූ මෙම ගැටුම, පරිසර හේතු මත විල්පත්තුව අත්පත් කර ගැනීමෙන් වළකින ලෙස කරනු ලැබූ හඬ නැගීම්වලින් ද සමන්විත විය.[204] එහෙත්, භූගෝල විද්‍යාව පිළිබඳ මහාචාර්ය ශාහුල් හස්බුල්ලා තර්ක කර සිටියේ මුස්ලිම් ජනාවාස වන සංරක්ෂිතය තුළ නොපිහිටන බවය.[205] නමුත්, පාරිසරික ප්‍රජාව මෙම ප්‍රකාශයට සහාය දක්වන බවක් නොපෙනේ. මේ අතරතුර, වන්නි දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී රිෂාඩ් බදියුදීන් වැනි මුස්ලිම් දේශපාලන නායකයින් මුස්ලිම් වැසියන් ඉන් ඉවත් කිරීමට එරෙහිව දැඩිව තර්ක කළහ. මෙකී තරඟකාරී ඉල්ලීම් තිබියදීත්, ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන පරිසර ඇමති ලෙස, කරඩික්කුලි සහ මරිචකට්ටි ඇතුළු මුස්ලිම් වැසියන් වෙසෙන ප්‍රදේශ ගණනාවක් විල්පතු වන සංරක්ෂිතයේ කොටස් ලෙස ප්‍රකාශ කරමින් 2017 මාර්තු 24 වන දින ගැසට් නිවේදනයක් නිකුත් කළේය.[206] මෙම ක්‍රියාව විසින් හඟවනු ලැබුවේ මුස්ලිම් ජනාවාස වන සංරක්ෂණය ආක්‍රමණය කිරීමක් ලෙස හුවා දැක්වීමට රජයට තිබූ අභිලාෂයයි; එක් ආකාරයකින් රටෙහි ඉහළම විධායකය විසින් කළ මෙම ක්‍රියාව යුදකාමී කණ්ඩායම්වල ව්‍යාපාර සුජාතකරණය කිරීමක් ද විය. මේ අතරතුර, ගැසට් නිවේදනය අවලංගු කිරීමට ක්‍රියා කරන බවට රිෂාඩ් බදියුදීන් ප්‍රතිඥා දුන්නේය. මෙලෙස, විල්පත්තුව වැනි ඉඩම් සහ නැවත පදිංචි වූ ප්‍රදේශ පිළිබඳ ආරවුල්, ජනවාර්ගික - ආගමික ආතතීන්වල මූලාශ්‍ර ලෙස පවතින අතර, ඒවා අනාගතයේ මුස්ලිම් වැසියන්ට එරෙහි නිදන්ගත ප්‍රචණ්ඩත්වයන් මුදා හැරීමේ ශක්‍යතාවයකින් යුක්ත වෙයි.[207]

201 ගෙහාන් ගුණතිලක, Confronting the Complexity of Loss: Perspectives on Truth, Memory and Justice in Sri Lanka (Law & Society Trust 2015), at 26.

202 ගෙහාන් ගුණතිලක, Confronting the Complexity of Loss: Perspectives on Truth, Memory and Justice in Sri Lanka (Law & Society Trust 2015), at 26.

203 මොහොමඩ් ෂරීෆ් අසීස්, 'Resettlement of Muslim IDPs and Issues of Wilpattu', Daily FT, 6 January 2017, at http://www.ft.lk/article/589620/ft [last retrieved 29 August 2017].

204 එමග සුමති සිවමොහන්ග 'Territorializing the Environment: The Political Question of Land and the Future of the Displaced in Musali South', The Island, 2 July2015, at http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=127573 [last retrieved 29 August 2017].

205 Ibid.

206 ගැසට් නිවේදනය No. 2011/34 dated 24 March 2017.

207 අශාන්ති වරුනසූරිය, 'Muslims Up in Arms over Gazette on Wilpattu', The Sunday Leader, 2 April 2017, at http://www.thesundayleader.lk/2017/04/02/muslims-up-in-arms-over-gazette-on-wilpattu/ [last retrieved 29 August 2017].

## රාජ්‍ය සේවාවන් සහ ජීවනෝපායන් සඳහා ප්‍රවේශය

මඩකලපුව නගරයේ සහ කාතන්කුඩිහි වැසියන් සමග පැවැත් වූ සංවාදවලින් හෙළිදරව් වූයේ, කසළ බැහැර කිරීම වැනි රාජ්‍ය සේවාවන් සැපයීම වූ කලී මුස්ලිම් සහ දෙමළ වැසියන් අතර ජනවාර්ගික-ආගමික ආතතීන් කෙරෙහි ප්‍රධාන මූලාශ්‍රයක් වන බවය.[208] කාත්තන්කුඩි වැනි ප්‍රදේශවල වෙසෙන මුස්ලිම් වැසියන් සාම්ප්‍රදායිකව එකිනෙකාට සමීපයෙන් නිවාස ඉදි කොට ගත්හ. මෙම පුරුද්ද තදබදය සහ සමහරවිට මිනිසු පිරීතිරී යාම කෙරෙහි හේතු වී තිබේ. එමෙන්ම මෙය නිසි ලෙස කසළ බැහැර කිරීම සඳහා වන ඉඩ ද සීමා කොට තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස කසළ බැහැර කිරීම සඳහා ඉඩම් වෙන් කිරීමට මෙන්ම, කසළ එක්රැස් කිරීම කෙරෙහිද බරපතල අභියෝග එල්ල වී තිබේ. මෙම සන්දර්භය තුළ, කාත්තන්කුඩි නගර සභාව විශාල කසළ ප්‍රමාණයක් එක්රැස් කිරීමේ අරගලයට මුහුණ දෙයි. මේ නිසා, ප්‍රජාවන් සිය නගර සීමාවෙන් ඔබ්බෙහි ප්‍රදේශවලට තම කසළ බැහැර කිරීමට පෙළඹෙති.[209] මෙම විකල්ප ප්‍රදේශ පිහිටා තිබෙන්නේ බොහෝ දුරට දෙමළ වැසියන් ප්‍රධාන කොට වෙසෙන ආරයම්පති වැනි ප්‍රදේශවල ය. මෙම සිදුවීම මුස්ලිම් සහ දෙමළ ජනතාව අතර ආතතීන් ඉහළ යාමට මඟ පාදා ඇති අතර, සමහර නිරීක්ෂකයින්ට අනුව කසළ බැහැර කිරීමේ අයිතිය මත ප්‍රජාවන් අතර කලහයන් ඇති කිරීමට හේතු වී තිබේ.[210] නාගරික ප්‍රදේශවල තදබදය ඉහළ යාමත් සමඟ මෙකී ජනවාර්ගික ආතතීන් වර්ධනය වීමේ හැකියාව වැඩි වන අතර, එමඟින් ප්‍රචණ්ඩත්වය ඇති වීමේ අවදානම ද ඉහළ යයි.

උතුරු පළාත තුළ දෙමළ-හින්දුත්වවාදයේ යළි පිබිදීම ද, නැගෙනහිර පළාතේ මඩකලපුව දිස්ත්‍රික්කය තුළ නිරීක්ෂණයට ලක් විය. තවදුරටත්, ශිව සේනා නමැති නව දෙමළ-හින්දු ජාතිකවාදී කණ්ඩායම විසින් භාවිතා කරනු ලබන අලංකාරෝක්ති ප්‍රයෝගයක් මුස්ලිම් ප්‍රජාවේ විවේචනයට ලක් වී තිබේ.[211] මෙම කණ්ඩායම ප්‍රකාශ කරන්නේ නැගෙනහිර පළාතේ හින්දූන් මුස්ලිම් වැසියන් නිසා වඳ වී යාමේ තර්ජනයට මුහුණ පා සිටින බවය.[212] මෙලෙස, ප්‍රාදේශීය මුස්ලිම් විරෝධී කතිකාවන්, කසළ බැහැර කිරීම වැනි රාජ්‍ය සේවාවන් මත ඇති වන සන්දර්භගත ආතතීන් සමඟ එකතු වුව හොත්, ප්‍රචණ්ඩත්වයන් ඇති වීමේ බරපතල අවදානමක් පවතී.

---

208 මඩකලපුව දිස්ත්‍රික්කයේ ශාන්ත ජෝන් ගිලන්රථ සංගමයේ නියෝජිතයකු සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡාව, 2017 මාර්තු 30

209 එම. එමෙන්ම, බලන්න ජනවාර්ගික අධ්‍යයනයසඳහා වන ජාත්‍යන්තර කේන්ද්‍රයල Community Perceptions of Religious Tolerance and Religious Tensions in Batticaloa and Trincomalee (forthcoming), at 25.

210 එම. මෙය 2017 මාර්තු 30 මඩකලපුව සිවිල් සමාජ සංසදය සමඟ සහ 2017 මාර්තු 31 කල්මුනේ වෙළඳ සංගමය සමග පැවැත් වූ ඉලක්කගත සම්මුඛ සාකච්ඡාවල දී තහවුරු විය.

211 'Now, a 'Siva Senai' group in Sri Lanka', The Hindu, 13 October 2016, http://www.thehindu.com/news/international/south-asia/Now-a-%E2%80%98Siva-Senai%E2%80%99-group-in-Sri-Lanka/article16070094.ece [last retrieved 29 August 2017].

212 පී. කේ. බාලචන්ද්‍රන්, 'Siva Senai Formed in Sri Lanka to Enable Hindus to Face Threats from Other Religions', The New Indian Express, 12 October 2016, http://www.newindianexpress.com/world/2016/oct/12/siva-senai-formed-in-sri-lanka-to-enable-hindus-to-face-threats-from-other-religions-1527283.html [last retrieved 29 August 2017].

### 2.2.3 දේශපාලනික විභේදනයන්

උතුරු සහ නැගෙනහිර පළාත් එක් කිරීම පිළිබඳ නොඑකඟතාවන් වැනි දිගුකාලීන දේශපාලනික විභේදනයන් දෙමළ සහ මුස්ලිම් ප්‍රජාවන් අතර ආතතීන් කෙරෙහි හේතුකාරක වෙයි. එමෙන්ම, සුළුතර ප්‍රජාවන් බහුලව වෙසෙන විශේෂ ප්‍රදේශ තුළ සිංහල-බෞද්ධ සංස්කෘතික පැනවීම් හේතුවෙන් සිංහල-බෞද්ධ සහ සුළුතර ප්‍රජාවන් අතර සබඳතාව පලුදු වී තිබේ. උතුරු සහ නැගෙනහිර පළාත් එක් කිරීම පිළිබඳ මෙම දේශපාලනික විභේදන සහ එකී ප්‍රදේශවල සිදු වන සංස්කෘතික පැනවීම්, සමකාලීන ජනවාර්ගික-ආගමික ආතතීන් සහ ප්‍රචණ්ඩත්වයන් කෙරෙහි මූලාශ්‍ර ලෙස පවතී.

### උතුර සහ නැගෙනහිර ඒකාබද්ධ කිරීම

ආණ්ඩුවේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා න්‍යාය පත්‍රය හේතුවෙන් උතුරු සහ නැගෙනහිර පළාත් එක් කරන්නේද නැද්ද යන්න පිළිබඳ විවාදය යළි මතුපිටට පැමිණ තිබේ.[213] 1987 ඉන්දු-ලංකා ගිවිසුම සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයෙන් අනතුරුව මෙම පළාත් දෙක එක් කරනු ලැබූ නමුත්, 2006 ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවෙන් පසුව නැවත වෙන් කරනු ලැබුවේය. [214]

එක් අතකින්, උතුරු සහ නැගෙනහිර පළාත් වූ කලී, ස්වකීය සාම්ප්‍රදායික නිජබිම්වල කොටසක් ලෙස දෙමළ ජනතාව විසින් හඳුනාගනු ලැබ ඇති අතර, එකී පළාත් දෙක එක් කරන මෙන් ඉල්ලා සිටියහ. වෙරිටේ පර්යේෂණ ආයතනය සහ ආසියා පදනම මඟින් මෑතක දී සිදු කරනු ලැබූ අධ්‍යයනයක් අනුව, වත්මන් පළාත්බද සීමාවන් තමාට වාසිදායක යයි නැගෙනහිර පළාතේ දෙමළ ජනතාව නොසළකති.[215] ඒ වෙනුවට ඔවුන්ගේ අවබෝධය වන්නේ තමන් 'සිංහල-මුස්ලිම් බහුතරවාදී එකමුතුවක් මඟින් කොන් කරනු ලබූවන්' වන බවය.[216] මෙලෙස, එම අධ්‍යයනය අනුව නැගෙනහිර පළාතේ දෙමළ ජනතාව කෙරෙහි ප්‍රායෝගික වන එකම විසඳුම නම් තමන්ට බහුතර තත්ත්වයක් ලබා ගත හැකි පරිදි උතුරු සහ නැගෙනහිර පළාත් එක් ඒකකයක් ලෙස පිහිටුවීමයි.[217]

---

213 2016 ජනවාරි 9 වන දින පාර්ලිමේන්තුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් ලෙස රැස් වීමට අගමැති රනිල් වික්‍රමසිංහ යෝජනාවක් ගෙන ආවේය. 2016 මාර්තු 9 වන දින මෙම යෝජනාව පාර්ලිමේන්තුව විසින් - යම් වෙනස්කම් සහිතව - ඒකමතිකව සම්මත කරන ලදී. 2016 අප්‍රේල් 5 වන දින පැවති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ පළමු රැස්වීමේ දී අගමැති විසින් මුලසුන දරණ සාමාජිකයින් 21 දෙනෙකුගෙන් සමන්විත මෙහෙයුම් කමිටුවක් පත් කරන ලදී. මෙහෙයුම් කමිටුවේ කාර්යභාරය වූයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් පසුව සාකච්ඡා කරනු ලබන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සඳහා යෝජනා සකස් කිරීම යි.

214 වෙරිටේ රිසර්ච් සහ ආසියා පදනම, Sri Lanka Strategic Assessment 2016 :2016), at 24. 2006 දී ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය උතුරු සහ නැගෙනහිර පළාත් ඒකාබද්ධ කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විරෝධී යයි තීන්දු කළේය. ඒ අනුව තනි උතුරු-නැගෙනහිර පළාත වෙන් කොට 2007 දී වෙන් වෙන්ව උතුරු සහ නැගෙනහිර පළාත් බවට පත් කරන ලදී.

215 එම.

216 එම

217 එම

අනෙක් අතට, එක් කරන ලද උතුරු-නැගෙනහිර පළාත පිළිබඳව මුස්ලිම් ප්‍රජාවේ අදහස පරෙස්සම් සහගතය - මන්ද යත්, ප්‍රධාන වශයෙන්ම එබඳු එක් කරනු ලැබූ පළාතක මුස්ලිම් වැසියන් ප්‍රාදේශීය සුළුතරය බවට පත් වන හෙයිනි. දැනට නැගෙනහිර පළාතේ බොහෝ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයන්හි බහුතරය සමන්විත වන්නේ මුස්ලිම් වැසියන්ගෙනි. වෙරිටේ පර්යේෂණ ආයතනය සහ ආසියා පදනමේ අධ්‍යනය අනුවේ: 'මුස්ලිම් වැසියන් සඳහා දෙමළ බහුතර භූමියක 'ආගන්තුකයින්' බවට පත් වීමෙන් වැළකීමේ එකම මග වෙන්ව පවතින උතුරු සහ නැගෙනහිර පළාත් එලෙසම පවත්වාගෙන යාමයි.'[218]

පළාත් එක් කිරීම සම්බන්ධයෙන් පවත්නා දෙමළ-මුස්ලිම් පරස්පරයන් ප්‍රාදේශීය මට්ටම වෙත ද පැමිණ ඇති අතර, දිගුකාලීන ජනවාර්ගික-ආගමික ආතතීන් කෙරෙහි දායක වී තිබේ. මෙම ආතතීන් කල්මුණේ වැසියන් සමඟ කරනු ලැබූ සාකච්ඡාවේ දී විශේෂයෙන්ම දක්නට ලැබුණි.[219] කල්මුනේ නගර සභාවේ මුස්ලිම් දේශපාලන නියෝජනය දෙමළ නියෝජනයට වඩා වැඩි ය - මෙය දෙමළ ජනතාව කොන් කරනු ලැබීම සහ රජයේ සේවාවන් ලබා ගැනීමේ දී සිදු වන වෙනස් කොට සැළකීම් පිළිබඳ බිහිව ඇති ප්‍රකාශ සමඟ සැසඳෙන කරුණකි.[220] මෙය ප්‍රජාවන් දෙක අතර අවිශ්වාසය වැඩි කිරීමට දඩ ඉවහල් වී තිබේ. මෙකී අසීරු තත්ත්වය විසින් ප්‍රජාවන් දෙකෙහිම වැසියන් තුළ අපේක්ෂා භංගත්වයන් නිර්මාණය කොට ඇති අතර, ස්වකීය ප්‍රාදේශීය දේශපාලන නියෝජිතයින් මෙන්ම ජාතික තලයේ නායකයින් කෙරෙහි ද පවතින විශ්වාසය පලුදු කිරීමට බලපා තිබේ.[221] ඒ අනුව මෙම අපේක්ෂා භංගත්වය විසින්, රජයේ සම්පත් හා සේවාවන් ලබා ගැනීමට තරඟ කරන ජනවාර්ගික කණ්ඩායම් අතර ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය සිදු වීමේ අවදානම ඉහළ නංවනු ලැබ ඇත.

සමාන සහ වෙනස්කොට සැළකීමකින් තොරව ස්වකීය සේවාවන් සැපයීමට රාජ්‍ය ආයතන දක්වන අසමත්කම, ප්‍රජා ආතතීන් තීව්‍ර කිරීමට බලපාන දේශපාලන අනුග්‍රාහකත්ව ව්‍යුහයන් ඇති වීමට මඟ පාදා තිබේ. නැගෙනහිර පළාතේ අදහස් දැක්වූ බොහෝ දෙනෙකු ප්‍රකාශ කළ අන්දමට, එම පළාතේ ජනවාර්ගික-ආගමික ආතතීන් වැඩි වශයෙන්ම දේශපාලන වුවමනාවන් සඳහා 'නිර්මාණය' කරනු ලැබූ ඒවා වෙයි.[222] 2016 දී සිදු කරනු ලැබූ ගැටුම් සිතියම්ගත කිරීමේ අධ්‍යනයක් මෙම අදහස් සමඟ සැසඳේ.[223] දේශපාලන නියෝජිතයින් ප්‍රජාවන් ධ්‍රැවීකරණය කොට අනන්‍යතා දේශපාලනය වෙත යොමු වී තිබීම

218 එම.

219 කල්මුණේ වෙළඳ සංගමය සමඟ සිදු කළ ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාව 2017 මාර්තු 31

220 වෙරිටේ රිසර්ච් සහ ආසියා පදනම, op. cit. at 25.

221 කල්මුණේ වෙළඳ සංගමය සමඟ සිදු කළ ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාව 2017 මාර්තු 31

222 මඩකලපුව සිවිල් සංවිධාන සංසදය සමඟ සිදු කළ ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාව 2017 මාර්තු 30 කල්මුණේ වෙළඳ සංගමය සමඟ සිදු කළ ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාව 2017 මාර්තු 31, සහ සයින්තමරුතු විවිධ සේවා සමුපකාර සමිතිය 2017 මාර්තු 31; මඩකලපුව දිස්ත්‍රික්කයේ ශාන්ත ජෝන් ගිලන්රථ සංගමයේ සාමාජිකයකු සමඟ සිදු කළ සාකච්ඡාව වෙරිටේ රිසර්ච් සහ ආසියා පදනම, op. cit. at 25.

223 Jayasinghe, chisxy, op. cit. at 9-10.

මඟින් එක් කණ්ඩායමකට සහයෝගය දක්වන්නන්ට අන් අය නොසළකා හරිමින් සම්පත් හා සේවාවන් සඳහා ප්‍රවේශය හිමි වන්නේය යන අදහස මුල් බැස ගෙන තිබේ. මෙබඳු දේශපාලනය විසින් ජනවාර්ගික-ආගමික සහයෝගීතාව නොසළකා හරිමින් ඡන්ද පදනම් සක්‍රිය කරනු ලැබ ඇත.

## සංස්කෘතික පැනවීම

පෙනී යන අන්දමට උතුරු සහ නැගෙනහිර පළාත් තුළ ජනගණත්ව සැකැස්ම වෙනස් කිරීමේ අරමුණින් සිංහල-බෞද්ධ ප්‍රජාවන් පදිංචි කරවීමේ රාජ්‍ය මුලපිරීම් පිළිබඳව ශාස්ත්‍රඥන් සහ දේශපාලනික ක්‍රියාකාරිකයින් නිරීක්ෂණය කොට තිබේ. 2012 ගණනාත් ඔබේසේකරගේ ලිවීම වන්නේ 'සිංහල-බෞද්ධ බහුතරය විසින් උතුරෙහි කරනු ලබන සංස්කෘතික සහ දේශපාලනික යටත්විජිතකරණය පිළිබඳ නැගී එන තර්ජනය' යන්නයි.[224] 2013 අගෝස්තු 8 වන දින දෙමළ ජාතික සංධානයේ නායක ආර්. සම්බන්ධන් විසින් මෙබඳු පරිචයන් සහ මුලපිරීම් පිළිබඳව සවිස්තරාත්මක සාක්ෂි පාර්ලිමේන්තුව හමුවේ තබමින් 'සිංහලකරණ' ව්‍යාපෘති නවතන ලෙස එවක රජයෙන් ඉල්ලා සිටියේය. ඔහුගේ සාක්ෂි විශේෂ ගැටළු දෙකක් හා සම්බන්ධ වෙයි.

පළමුව, රජය විසින් දෙමළ ජනතාව ඉඩම් අහිමි වූවන් බවට පත් කිරීමට 'සැළකිය යුතු ඉඩම් ප්‍රමාණයන් අත්පත් කර ගනිමින්' සිටින බව සහ 'නිසි ක්‍රමවේදයන් අනුගමනය කිරීමෙන් තොරව සහ වෙනස් කොට සළකන, විනිවිදභාවයෙන් තොර ආකාරයට' බහුතර ප්‍රජාවේ වැසියන් පදිංචි කරවන බවට ප්‍රකාශ කරනු ලැබේ.[225] තිරියාලයි, සෙම්බිමලයි, ඉලන්තයිකුලම්, කුච්චුවේලි, උප්පුරල්, ඉලංගතුරයි, මුහතුවාරම් සහ වෙරුගල් වැනි ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ප්‍රදේශ මේ සම්බන්ධයෙන් පෙන්වා දෙනු ලැබේ.

දෙවනුව, 'ආගමික සහ සංස්කෘතික ස්ථාන පැවති බවට වන සාක්ෂි විනාශ කිරීමෙන් මකා දැමීමේ උත්සාහය' තුළ දෙමළ-හින්දු වැසියන්ට වැදගත් වන ආගමික සහ සංස්කෘතික ස්ථාන අපවිත්‍ර කිරීම සහ අවමන් කිරීම සිදු වන බව ද ප්‍රකාශ කෙරේ.[226] මුත්තූර්, කන්ගුවේලිහි අගස්තියාර් සිදම්බරම් ශිව කෝවිල සහ ත්‍රිකුණාමලයේ කින්නියා උණුවතුර ළිං මේ සම්බන්ධයෙන් උදාහරණ ලෙස හුවා දැක්වේ.

රජයට එරෙහිව සම්බන්ධන් ගෙන ආ යෝජනාව රජයේ අක්‍රියත්වය පිළිබඳව පමණක් නොව, චේතනාන්විත රාජ්‍ය ප්‍රතිපත්තියක් ද වන බවට පෙන්වා දෙනු ලැබූවකි. මෙම ප්‍රතිපත්තිය වූ කලී 'උතුරු සහ නැගෙනහිර ජනගණත්ව සැකැස්ම වෙනස් කිරීමේ

224 ගණනාත් ඔබේසේකර, 'Book Review: Biased and Prejudiced Collection on Sri Lanka' (2012) Vol. XLVII No. 4 Economic & Political Weekly 29-31, at 31.

225 පාර්ලිමේන්තු හැන්සාර්ඩ් වාර්තාල Thursday, 8 August 2013, at 327.

226 එම

අරමුණින් එම ප්‍රදේශවල සංස්කෘතික සහ භාෂාමය අනන්‍යතාවන් වෙනස් කිරීමේ සැළසුමක්'' වන බව ඔහු අවධාරණය කළේය.[227] මෙම ප්‍රතිපත්තිය, මීට අමතරව නැගෙනහිර පළාතේ ඉඩම් විශාල වශයෙන් අත්පත් කර ගැනීම සහ උතුරු පළාතේ මහා පරිමාණ වශයෙන් ඉඩම්වල හමුදාව රැඳී සිටීම සැළසුම් කළ බවට චෝදනා ලැබූ රාජපක්ෂ පාලනය සමඟ බෙහෙවින්ම බැඳී පැවතුණි.[228] කෙසේවුවත්, උතුරේ සහ නැගෙනහිර ආගමික හා සංස්කෘතික අනන්‍යතාවන් යටපත් කිරීම සඳහා සකස් කළ ප්‍රත්පත්ති පිළිබඳ සංවේදනයන් 2015 ජනවාරි මස සිදු වූ ප්‍රජාතන්ත්‍රවාදී බල හුවමාරුවෙන් පසුව ද පවතින්නේය. ආගමික සුළුතරයක් වෙසෙන ප්‍රදේශවල සිංහල-බෞද්ධ පිළිම, ප්‍රතිමා සහ සංකේත හඳුන්වා දීමට රාජ්‍ය ක්‍රියාකාරීන් සහ දේශපාලනඥන් දරන ඒකාග්‍ර උත්සාහය නැගෙනහිර පළාතේ නිරීක්ෂකයෝ පෙන්වා දෙති.[229] නිදසුනක් ලෙස, රාජ්‍ය අමාත්‍ය දයා ගමගේ ගේ සහයෝගයෙන් ඉරක්කාමන් වැනි මුස්ලිම් බහුතරය වෙසෙන ප්‍රදේශවල බුදු පිළිම ගොඩනංවා ඇති බව ඔවුහු ප්‍රකාශ කළහ. මෙම ගොඩනැංවීම්වලට රජයේ අමාත්‍යවරයකු සෘජුව සම්බන්ධ වන්නේය යන ප්‍රකාශය තහවුරු කිරීමට නිශ්චිත සාක්ෂි නොමැති නමුත්, මෙම ප්‍රදේශවල බුදු පිළිම ගොඩ නංවා ඇති බව පුවත්පත් වාර්තා මඟින් තහවුරු වී තිබේ. එබඳු එක් වාර්තාවක් අනුව, මුස්ලිම් ගම්මානවල බුදු පිළිම ගොඩ නැංවීම මුස්ලිම් නියෝජ්‍ය අමාත්‍යවරයකු වන මොහොමඩ් මන්සූර් විසින් නිරූපණය කරනු ලබන්නේ සංහිඳියාවට එල්ල විය හැකි තර්ජනයක් ලෙසිනි.

[230]මෙලෙස, සිංහල-බෞද්ධ සංස්කෘතික පැනවීම් 2015 ජනවාරි පරිවතනයෙන් පසුව ද ජනවාර්ගික-ආගමික ආතතීන්හි මූලාශ්‍රයක්ව පවතී. මෙකී පැනවීම් වූ කලී, උතුරු සහ නැගෙනහිර සුළුතර කණ්ඩායම්වල ජනවාර්ගික-ආගමික අනන්‍යතාවන් යටපත් කිරීමේ දේශපාලන ව්‍යාපෘතියක් ලෙස වටහා ගනු ලැබ ඇත. පෙර කරන ලද ගැටුම් සිතියම්ගත කිරීමේ අධ්‍යයනයක් තුළ ද ජනවාර්ගික-ආගමික සම්බන්ධතාවන් 'දේශපාලනීකරණය' වීම ප්‍රාදේශීය තලයේ ප්‍රජා ආතතීන් ඉහළ යාමට දායක වූ ප්‍රධාන සාධකයක් ලෙස හඳුනා ගෙන තිබේ.[231] මෙලෙස දේශපාලනීකරණය වූ සංස්කෘතික පැනවීම් විසින් ශ්‍රී ලංකාවේ ජනවාර්ගික-ආගමික ආතතීන් කෙරෙහි බලපාන බරපතල විභේදනයන් ඉහළ නංවා තිබේ.

227 tu. at 328.

228 උතුරු පළාතේ ඉඩම්වල හමුදා රැඳී සිටීම පිළිබඳ සවිස්තර වාර්තාවක් සඳහා බලන්න විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, Occupation of Land in the Northern Province (March 2016).

229 කල්මුණේ වෙළඳ සංගමය සමඟ සහ සයින්තමරුතු මොහිදීන් ජුම්මා මහ පල්ලියේ භාරකරුවන් සමඟ සිදු කළ ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාව 2017 මාර්තු 31.

230 නිදසුනක් සඳහා බලන්න, 'Chinese donation for Buddhist temples for North and East', Sri Lanka Mirror, 10 November 2016, at http://srilankamirror.com/news/410-chinese-donation-for-buddhist-temples-in-north-east[last retrieved 13 October 2017]. දිවාගිරි ප්‍රදේශයේ මුස්ලිම් ගම්මානයක ගොඩ නංවන ලද බෞද්ධ ප්‍රතිමාවක් සහ 'බුද්ධාගමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලබා දී ඇති ප්‍රමුඛත්වය' නිසා එම ප්‍රතිමාව යළි පිහිටුවිය යුතු යයි අමාත්‍ය දයා ගමගේ කළ ප්‍රකාශය පිළිබඳව මෙම ලිපිය විස්තර කරයි.

231 ජයසිංහ, දවග ජසළග at 9-10.

# 3 පරිච්ඡේදය
# ජනවාර්ගික-ආගික ප්‍රචණ්ඩත්වයේ මුල් බැස ගැනීම

## 3.1 රාජ්‍යය සහ සුළුතර සම්බන්ධතා

මෙම පරිඡේදය තුළ සාකච්ඡා කෙරෙන්නේ 2015 ජනවාරි සංක්‍රාන්තියෙන් පසුව පවා දිගටම පවතින ශ්‍රී ලංකාවේ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය සහ එම ප්‍රචණ්ඩත්වයට බලපාන ප්‍රධාන විභේදනයන්ය. මෙම සාකච්ඡාව තුළින් ඉස්මතු වනුයේ ශ්‍රී ලංකාවේ ජනවාර්ගික -ආගමික ප්‍රචණ්ඩත්වය කෙරෙහි එක් නිශ්චිත රජයක ප්‍රතිපත්තිමය තෝරා ගැනීම්වලින් ඔබ්බට යන මුල් බැසගත් සාධක පවතින්නේය යන වේදනාකාරී යථාර්ථයයි. 2015 දී රජය මාරු වීමට, රටෙහි ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වයට තිත තැබීමේ අපේක්ෂාව ඉටු කළ නොහැකි වූයේ සැබවින්ම මේ හේතුව නිසා ය. ආගමික සුළුතරයන්ගේ ඉමහත් සහයෝගය තිබිය දී සහ රාජපක්ෂ පාලනයට සාපේක්ෂව වඩාත් ලිබරල් දෘෂ්ටියක් සහිත තත්ත්වයක පවා, ආගමික සුළුතරයන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමට වත්මන් රජයට නොහැකි වී තිබේ. මෙම අසාර්ථකත්වයට විග්‍රහයන් දෙකක් සුලුතරයන් හමුවේ ඇත. එක් අතකින්, මෙම අසාර්ථකත්වය වනාහී රටේ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය කෙරෙහි බලපාන මෙහෙයවීම් යටපත් කිරීමට රජයට ඇති ශක්‍යතාව - ඇත්තෙන්ම අධිෂ්ඨානය - නොමැතිකම හේතුවෙන් සිදු විය හැකිය. අනෙක් අතින්, මෙම අසාර්ථකත්වය වත්මන් රජය - හෝ අඩුම තරමේ එහි නිශ්චිත කොටස් - ඇත්තෙන්ම ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය කෙරෙහි බලපාන මෙහෙයවීම්වලට අනුබල වීම හා සහයෝගය දැක්වීම හේතුවෙන් සිදු වන්නක් විය හැකිය. මේ දෙකෙන් කවරක දී වුවත්, මෙම මෙහෙයවීම් රටේ සංස්කෘතික සහ සමාජ-දේශපාලනික සැකැස්ම තුළ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය මුල් බැස ගැනීම කෙරෙහි දායක වන බව පැහැදිළි ය. ඊළඟ කොටසේ දී එබඳු මෙහෙයවීම් තුනක් පිළිබඳව සාකච්ඡා කෙරේ.

ශ්‍රී ලංකාවේ ආගමික සුළුතරයන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයන්හි වැඩි කොටසක් සිදු කරන්නේ රාජ්‍ය-නොවන ක්‍රියාකාරීන්ය. මෙම සන්දර්භය තුළ, ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් රාජ්‍යයේ බැඳීම් සමීපව අධ්‍යයනය කළ යුතුය. ආගමික නිදහස යන සන්දර්භය තුළ රාජ්‍ය සහ රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් අතර සම්බන්ධය විශ්ලේෂණය කරමින් හයිනර් බීල්ෆෙල්ට්, නසිලා ගනියා සහ මයිකල් වීනර් මෙම බැඳීම් විසංයෝජනය කර දක්වති.[232] ඔවුන් විග්‍රහ කරන්නේ අඩුම තරමේ හේතු තුනක් නිසා රාජ්‍ය සහ රාජ්‍ය නොවන ක්‍රියාකාරීන්ගේ භූමිකාව දැඩි ලෙස වෙන් කර දැක්වීම අසීරු වන බවය. පළමුවෙන්ම, ආගමික නිදහස භුක්ති විඳීමට හෝ එයට බාධා කිරීමට ඉඩ සළසන පරිසරය

232 හයිනර් බීල්ෆෙල්ට්, නසිලා ගනියා සහ මයිකල් වීනර්, *Freedom of Religion or Belief: An International Law Commentary* (Oxford University Press 2016), at 320.

සකස් කිරීමෙහි ලා රාජ්‍යය අතිශයින් වගකිව යුතුය. ඔවුන්ගේ තර්කය නම් මෙම පරිසරය අන්තර් ආගමික සම්බන්ධතා හා එහි ප්‍රතිඵලයක් ලෙස බහුතර-සුළුතර සම්බන්ධතා කෙරෙහි 'පසුබිම සකස් කරන' බවයි.[233] දෙවනුව, ආගමික සුළුතරයන්ට එරෙහි 'අනවරත වෙනස් කොට සැළකීම් මාලාවක්'[234] බිහි කිරීමෙහි ලා රාජ්‍ය සහ රාජ්‍ය නොවන ක්‍රියාකාරීහු බොහෝ විට සහයෝගයෙන් ක්‍රියා කරති. මෙබඳු අවස්ථාවලදී ව්‍යුහාත්මක ආකාරයේ ප්‍රචණ්ඩත්වයන් කෙරෙහි රාජ්‍යය වඩාත් ඍජුව මැදිහත් වෙයි. තෙවනුව, 'මුල්බැසගත් වෙනස් කොට සැළකීම්' ආපසු හැරවීම සඳහා රජයට ඇති සාධනීය බැඳීම ඉටු කිරීමට එය බොහෝ විට අසමත් වීම, 'රාජ්‍යයෙන් බැහැර කිරීමකට වඩා සමාජ පසමිතුරුතාවක්'[235] ලෙස විද්‍යමාන වෙයි. මෙබඳු අවස්ථාවල දී රාජ්‍යයේ මැදිහත් වීම බොහෝවිට වක්‍ර එකකි. එහෙත්, ආගමික සුළුතරයන්ට එරෙහි ව්‍යුහාත්මක හිංසනයන් සිදු වීම පිළිබඳව යම් වගකීමක් රජය දරා සිටියි.

මෙකී බැඳීම් රාජ්‍යයේ මූලික මානව හිමිකම් බැඳීම් ලෙස ද රාමුගත කළ හැකිය: එනම්, ආගමික බිදයස හා වෙනස් කොට නොසළකනු ලැබීමේ අයිතියට ගරු කිරීම, ආරක්ෂා කිරීම සහ පූරණය කිරීමයි. මෙකී අයිතිවාසිකම්වලට 'ගරු කිරීම' යන්නට ඒවා ඍජුව උල්ලංඝණය කිරීමෙන් වැළකී සිටීම අයත් වෙයි. මෙකී අයිතිවාසිකම් 'ආරක්ෂා කිරීම' යන්නට අත්අඩංගුවට ගැනීම, විමර්ශනය කිරීම සහ වැරදි කළ තැනැත්තන්ට එරෙහිව නඩු පැවරීම මෙන්ම, වින්දිතයින් ආරක්ෂා කිරීම ද ඇතුළත් ය. මෙබඳු නීතිය බලාත්මක කිරීමේ සහ අභිචෝදනා නැගීමේ ප්‍රතිචාර, වැරදිකරුවන් වගවීමට ලක් නොකිරීමෙන් බිහි විය හැකි දණ්ඩ මුක්තිය සහිත සංස්කෘතිය වැළැක්වීම කෙරෙහි තීරණාත්මක වෙයි. මෙකී ප්‍රතිචාර, එබඳු ප්‍රචණ්ඩත්වයන් රාජ්‍යය විසින් නොඉවසන බව සංකේතවත් කරන අතර, යම් දුරකට වැරදි සිදු කළ හැකි පුද්ගලයින්ට ද බාධාවක් ලෙස ක්‍රියා කරයි. අවසාන වශයෙන්, මෙකී අයිතිවාසිකම් 'පූරණය කිරීම' යන්නට ශක්තිමත් ආයතන, අධ්‍යාපනික වැඩසටහන් සහ සහජීවනයේ සංස්කෘතියක් ඇති කිරීම වැනි, අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමට අවැසි කොන්දේසි සපුරා ලීම ඇතුළත් වෙයි.

ශ්‍රී ලංකාවේ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වයේ මුල් බැසගත් ස්වභාවය විසින් පිළිබිඹු කරනු ලබන්නේ ශ්‍රී ලංකා රාජ්‍යයේ අවිනිශ්චිත යථාර්ථයයි. අති-ජාතිකවාදී සහ සාපේක්ෂව බහුත්වවාදී රජයන්, අඛණ්ඩව මෙබඳු ප්‍රචණ්ඩත්වයන් සිදු කරනු ලැබූවන්ට දණ්ඩ මුක්තිය හිමි කර දෙමින් විවිධ මට්ටමින් ඒවා ඉවසා සිටිනු ලබා ඇත. මෙම සන්දර්භය තුළ, ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කිසියම් ව්‍යුහාත්මක නිදහසක් ශ්‍රී ලංකා රාජ්‍යය තුළ ගැබ් වේ. රාජපක්ෂ පරිපාලනය සහ වර්තමාන පරිපාලනය අතර වෙනස අවසානයේ ගත් විට එහි ප්‍රමාණය පමණි. රජය මාරු වීමේ දී වඩාත් අභ්‍යන්තරික තියුණු

233 එම
234 එම
235 එම

ප්‍රචණ්ඩත්වයන්ගේ ස්වභාවයන් පමණක් අඩු වී තිබේ. මුස්ලිම් සහ ක්‍රිස්තියානි වැනි ආගමික සුළුතරයන් මුහුණ දුන් නිධන්ගත ප්‍රචණ්ඩත්වය දිගටම පැවතී ඇත. ස්වකීය ආගමික සහ සංස්කෘතික අනන්‍යතාවන් සෝදා පාළු කර දැමීම අරමුණු කර ගත් අතිශය අවමානයන් විඳ දරා ගත් හින්දූන්, නව පරිපාලනය යටතේ ද එකී තර්ජනයන්ම දරා ගනිමින් සිටිති.

ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වයට අදාළ නෛතික ප්‍රතිපාදනවලින් සමන්විත වන්නේය. නිදසුනක් ලෙස, 1883 අංක 2 දරණ දණ්ඩ නීති සංග්‍රහය තුළ ආගමික ප්‍රජාවන්ට එරෙහිව සිදු වන ශාරීරික සහ වාචික ප්‍රහාර පිළිබඳ වැරදි රාශියක් ඇතුළත් වෙයි.[236] 1865 අංක 16 දරණ පොලිස් ආඥා පනත ද සාමය කඩ කිරීම, ශාරීරික පහර දීම්, තර්ජන සහ අපහාස කිරීම ඇතුළුව ආගමික කණ්ඩායම්වලට එරෙහි යම් ආකාරයේ ප්‍රහාර අපරාධ ලෙස වර්ග කරයි.[237] 2007 අංක 56 දරණ අන්තර්ජාතික සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සම්මුතියේ පනතේ 3(1) වගන්තිය සඳහන් කරන්නේ: 'කිසිම තැනැත්තකු විසින් යුද්ධය පැතිරවීමට හෝ වෙනස් කොට සැළකීමට, එදිරිවාදිකම්වලට හෝ ප්‍රචණ්ඩ ක්‍රියාවලට යොමු කිරීම සංයුක්ත වන ජාතික, ජනවාර්ගික, හෝ ආගමික වෛරය සඳහා පෙළඹවීම නොකළ යුතුය' යනුවෙනි. මෙහි අන්තර්ජාතික සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සම්මුතියේ 20(2) වගන්තිය ඵලදායී ලෙස ඇතුළත් කොට තිබේ. මෙහි වැරදි පිළිබඳව අනන්‍ය අධිකරණ බලය මහාධිකරණය සතු වන අතර, ඒ සම්බන්ධ නඩු විභාගවලට ඉහළ ප්‍රමුඛතාවක් හිමි වේ.[238]

ශාරීරික සහ ශාරීරික නොවන ප්‍රචණ්ඩත්වය පිළිබඳව අදාළ වන සවිස්තර දණ්ඩන විධිවිධාන හැරුණු කොට, ශ්‍රී ලංකාවේ විධිමත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා රාමුව තුළින්ද ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වයන් සඳහා ප්‍රතිකර්ම සපයා දෙනු ලැබේ. ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් පෙත්සම් විභාග කිරීමේ අධිකරණ බලයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 වන ව්‍යවස්ථාවෙහි සඳහන් සිතීමේ, හෘදය සාක්ෂියේ සහ ආගමික නිදහස මෙන්ම 14(1) (ඉ) ව්‍යවස්ථාවෙහි සඳහන් ආගමක් හෝ විශ්වාසයක් ඇදහීමේ අයිතිය ද ඇතුළත් වෙයි. ආගම පදනම් කර ගත වෙනස් කොට සැළකීමට එරෙහි ප්‍රතිකර්ම ලබා ගැනීම

---

236 දණ්ඩ නීති සංග්‍රහයේ 290 වගන්තිය මඟින් 'ඕනෑම පංතියක ආගමට අපහාස කිරීමේ චේතනාවෙන් වන්දනා ස්ථානයකට හානි කිරීම හෝ විනාශ කිරීම' අපරාධ වරදක් බවට පත් කරයි. 290(ආ) වගන්තිය අනුව 'ඕනෑම පන්තියක ආගමකට අපහාස කිරෙමේ චේතනාවෙන් ආගමික වන්දනා ස්ථානයකට කරනු ලබන ක්‍රියාවක්' අපරාධයකි. 291, 291 (අ) සහ 291 (ආ) වගන්ති පිළිවෙලින් 'ආගමික රැස්වීමකට බාධා කිරීම', 'ආගමික හැඟීම්වලට හානි කිරීමේ අරමුණින් වචන ප්‍රකාශ කිරීම' සහ 'ඕනෑම පන්තියක ආගමික හැඟීම්, ආගමට හෝ ආගමික විශ්වාසයන්ට අපහාස කිරීමෙන් අවුස්සනසුළු චේතනාන්විත සහ ද්වේශ සහගත ක්‍රියා' අපරාධ වෙයි.

237 79(2) වගන්තිය අනුව: 'පොදු ස්ථානයක හෝ පොදු රැස්වීමක සිටින තැනැත්තකු, සාමය කඩ කිරීමේ අරමුණින් හෝ එසේ සාමය කඩ වේ යයි දනිමින් නින්දා සහගත හෝ අපහාසාත්මක වචන භාවිතා කිරීම හෝ එසේ හැසිරීම මෙම වගන්තිය යටතේ වරදක් වෙයි.'

238 ICCPR පනතේ 3(5) වගන්තිය අනුව: 'මෙම වගන්තිය යටතේ වරදක් සිදු කළ තැනැත්තකුට එරෙහිව මහාධිකරණයේ විභාග වන නඩු අනෙකුත් නඩුවලට ප්‍රථමයෙන් විභාග කළ යුතු අතර, වාර්තා කරනු ලබන කිසියම් නොවැලැක්විය හැකි හේතුවක් නිසා මිස කල් නොදමා දිනපතා විභාගයට ගත යුතුය.'

සඳහා ද මෙම අධිකරණ බලය මාර්ගයක් වෙයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(2) අනුව: 'කිසිම තැනැත්තකු වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භේදය මත හෝ ඉන් කවර හේතුවක් මත හෝ වෙළඳසල්වලට, පොදු භෝජනාගාරවලට, ආපන ශාලාවලට, පොදු විනෝද ස්ථානවලට හෝ තමාගේ ආගමට අයත් පොදු පූජනීය ස්ථානවලට ප්‍රවේශ වීමට අශක්නුතාවකට, බැඳීමකට, සීමා කිරීමකට හෝ කොන්දේසියකට යටත් නොවන්නේය.' මෙලෙස, ශ්‍රී ලංකාවේ විධිමත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය සහ ව්‍යවස්ථාපිත රාමුව තුළින් ශාරීරික, ශාරීරික නොවන සහ ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා ප්‍රමාණවත් නෛතික ප්‍රතිපාදන සපයා දී තිබේ. එහෙත්, මෙම ප්‍රතිකර්ම පැවතීම, ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වයට එරෙහිව සටන් කිරීම සඳහා ගනු ලබන අවංක ක්‍රියාමාර්ග බවට පරිවර්තනය වී නොමැත.

ක්‍රිස්තියානි ප්‍රජාවට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳව අධිකරණමය ක්‍රියාමාර්ග පිළිබඳ අධ්‍යයනයක් කරන සබ්‍රිනා යුසුෆාලි වැදගත් නිරීක්ෂණ කිහිපයක් ඉදිරිපත් කරයි.[239] පළමුවෙන්ම මහේස්ත්‍රාත් අධිකරණයේ පවරන ලද නඩු අධ්‍යයනය කරන ඇය නිගමනය කරන්නේ 'ආගමික නිදහස තහවුරු කරන නෛතික සහ ප්‍රතිපත්තිමය රාමුවක් තිබිය දී පවා...ආගමික ප්‍රචණ්ඩත්වයෙන් සුළුතර ප්‍රජාව ආරක්ෂා කිරීමට පහළ අධිකරණ කටයුතු කිරීම දුර්ලභය.'[240] දෙවනුව ඇය සඳහන් කරන්නේ ආගමික සුළුතර අයිතිවාසිකම් ඉහළ අධිකරණ විසින් ඉඳහිට සුරක්ෂිත කොට ඇති බවයි. නිදසුනක් ලෙස, ශ්‍රී ලංකාවේ ෆෝර්ස්ක්වෙයාර් ශුභාරංචි දේවස්ථානය සහ ඩී. ජී. ඩබ්. ජයලත් පියතුමා එ. කැලණිය ප්‍රාදේශීය සභාව සහ අනෙක් අය[241] යන නඩුවේ දී ගොඩනැගිල්ලක් ඉදි කිරීමේ බලපත්‍රයක් අවලංගු කිරීමට එරෙහිව අභියාචනාධිකරණය විසින් සර්ටියෝරාරි රිට් ආඥාවක් නිකුත් කරන ලදී. එකී අවලංගු කිරීම 'එම භූමිය තුළ සිදු වන ආගමික කටයුතුවලට විරුද්ධ වීමක් ලෙස මිස, පෙත්සම්කරුගේ ගොඩනැගිලි බලපත්‍රය නිශ්චිත ලෙස උල්ලංඝණය කිරීමක් මත පදනම්ව සිදු වූවක් නොවන හෙයින්' එකී ක්‍රියාව සිය බලතල ඉක්මවා යාමක් වන බවට අධිකරණය ප්‍රකාශ කරන ලදී.[242] මෙලෙස, ආගමික ප්‍රචණ්ඩත්වය පිළිබඳ සන්දර්භයේ දී අපරාධ යුක්තිය පිළිබඳ පහළ අධිකරණවල ගතානුගතික ප්‍රවේශය මෙන් නොව, අභියාචනා අධිකරණ විසින් ඉඳහිට රාජ්‍යයේ නීති විරෝධී ක්‍රියාවන් බලරහිත කොට තිබේ. එහෙත් මෙබඳු මැදිහත්වීම් අතිශයින් දුර්ලභ ය. එමෙනම්, යුසුෆාලි නිවැරදිව නිගමනය කරන අන්දමට, අභියාචන අධිකරණවල සාමාන්‍ය ප්‍රවේශය වී ඇත්තේ රාජ්‍යයේ ක්‍රියාවන්හි නෛතිකභාවය මිස, ආගමික නිදහස වැඩිදියුණු කිරීම හෝ ආගම පදනම් කර ගත් වෙනස් කොට සැළකීම් නොවේ.[243] මෙම ගතානුගතික ප්‍රවේශය ෆරිල් සහ වෙනත්

239 සබ්රිනා යුසුෆාලි *Judicial Responses to Religious Freedom: A Case Analysis* (Verité Research and NCEASL 2015).

240 එම. at 8.

241 CA Writ Application 781/2008 [2009].

242 යුසුෆාලි, *op. cit.* at 9.

243 එම

අය එ. බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව සහ වෙනත් අය[244] යන නඩුවේ දී පැහැදිළිව පෙනී ගියේය. මෙම නඩුවට අදාළ වූයේ බණ්ඩාරගම ප්‍රදේශයේ මුස්ලිම් මද්‍රසා පාසලක් (ආගම උගන්වන පාසලක්) ගොඩ නැංවීම පිළිබඳ සිදුවීමකි. පාසලක් වෙනුවට පල්ලියක් ඉදි කරන්නේය යනුවෙන් බෞද්ධ හාමුදුරුවරු සහ ගම්වැසියෝ එක්ව එය ඉදි කිරීමට විරුද්ධව විරෝධතා පැවැත්වූහ. විරෝධතාවලින් අනතුරුව, පොලීසිය සහ ප්‍රාදේශීය සභාව විසින් ඉදිකිරීම අත්හිටවනු ලැබුවේ, ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයෙන් නිසි අවසරය ලබා ගෙන නැතැයි යන පදනම මතය.[245] එබැවින් සමානාත්මතාව සහ වෙනස් කොට නොසැළකීම යන ස්වකීය අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම පිළිබඳව පෙත්සම්කරුවෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කළහ. පොලීසිය සහ ප්‍රාදේශීය සභාවේ නිලධාරීන් 'අර්බුදකාරී අවස්ථාවක්' ඇති වීම වැළැක්වීම සඳහා උද්ඝෝෂණයන් කෙරෙහි නිසි 'නිසි අවධානය' ලබා දී තිබුණේ යයි අධිකරණය තීරණය කළේය.[246] ඒ අනුව එය පෙත්සම ඉවත දැමූ අතර, අදාළ අමාත්‍යාංශයෙන් පූර්ව අනුමැතිය ලබා නොතිබූ හෙයින් අධිකාරීන් විසින් ගෙන ඇති පියවර නීත්‍යානුකූල යයි තීරණය කරන ලදී.[247] මෙලෙස, ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය පිළිබඳ ප්‍රතිචාර ගතානුගතික ලෙස පැවතී ඇති අතර, අවසාන වශයෙන් එය ශ්‍රී ලංකාවේ පවත්නා දණ්ඩ මුක්ති සංස්කෘතියට එරෙහිව සටන් කිරීමට අසමත් වී තිබේ.

අධිකරණය හැරුණු විට, ශ්‍රී ලංකාවේ නීතිය බලාත්මක කිරීමේ සහ අභිචෝදනා නැගීමේ පද්ධතීන් ද යුක්තිය නගා සිටුවීමට සහ ආගමික සුළුතරයන්ට එරෙහිව සිදු වන ප්‍රචණ්ඩ ක්‍රියාවලට එරෙහිව ක්‍රියා කිරීමේ වගවීමට අසමත් වී තිබේ. මෙම අක්‍රියත්වය පිළිබඳව පුදුම සහගත නිදසුනක් නම් ICCPR පනත පනවනු ලබා වසර 10ක් ගත වන තෙක් එහි 3(1) වගන්තිය යටතේ කිසිවකුත් වරදකරුවකු කොට නොතිබීමයි. උදාහරණයක් ලෙස, 2014 අලුත්ගම කැරළි කෝළාහලවලදී ප්‍රචණ්ඩත්වයන් සිදු කිරීම පිළිබඳව කිසිදු තැනැත්තකු වරදකරුවකු කරනු ලැබ නැත. එහෙත්, ඇත්තෙන්ම 2017 ගින්තොට සිදුවීමට සම්බන්ධ තැනැත්තන් 22නෙකුට එරෙහිව රජය විසින් ICCPR පනත යටතේ චෝදනා එල්ල කර තිබේ.[248] එම අධිචෝදනා එබඳු පළමු චෝදනා වන අතර, රටේ පවත්නා නීතිය අනාගතයේ බලාත්මක කිරීමට රජයට ඇති වුවමනාව යම් තරමකට විදහා දක්වයි.

244 S.C (FR) Application No.92/2016.

245 මෙම නඩුවේ වගඋත්තරකරුවන් ප්‍රකාශ කළේ දහම් පාසලක් ගොඩ නැංවීම සඳහා ආගමික කටයුතු අමාත්‍යාංශයේ පූර්ව අවසරය අවශ්‍ය වන බවයි. Circular No. MBRA/2-SAD/10/Con.Gen/2013.

246 S.C (FR) Application No.92/2016, per Goonaratne J., at 11.

247 *Ibid.* at 13-14.

248 ශාමින්ද්‍රා ප්‍රනාන්දු, 'Suspects charged under Int'l Covenant on Civil and Political Rights Act Gintota violence', *The Island*, 3 December 2017, http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=176019 [last retrieved 5 December 2017].

පවත්නා නීතිය බලාත්මක කිරීමට වඩා නීති ප්‍රතිසංස්කරණ කෙරෙහි නව රජය ඉදහිට උනන්දුව දක්වා තිබේ. මෑතකදී රජය පවත්නා නීතිය ජනවාර්ගික හෝ ආගමික වෛරය වැළැක්වීමට පවත්නා නීතිය අසමත් යයි උපහාසාත්මක ලෙස ප්‍රකාශ කර, පවතින අපරාධ නීතියට සංශෝධන යෝජනා කරන ලදී. 2015 දෙසැම්බර් මස දී එවක අධිකරණ අමාත්‍යවරයා දණ්ඩ නීති සංග්‍රහය සහ අපරාධ නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා කෙටුම්පත් දෙකක් ගෙන ආවේය. වෛරය පැතිරවීම සම්බන්ධ වැරදි හඳුන්වා දීමට එකී කෙටුම්පත් මගින් උත්සාහ දරන ලදී. එහෙත්, සමීපව බැලූ කල්හි පෙනී ගියේ එම කෙටුම්පත් 1979 අංක 48 දරණ ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 2(1) (උ) වගන්තිය හා සමපාත වන බවයි. එනම්;

> විවිධ ප්‍රජාවන් හෝ ජනවාර්ගික හෝ ආගමික කණ්ඩායම් අතර, ප්‍රචණ්ඩ ක්‍රියා, ජනවාර්ගික හෝ ප්‍රජාමය අසමඟිය හෝ ක්‍රෝධය හෝ පසමිතුරුතා හැඟීම් ඇති කිරීමේ චේතනාවෙන්, වහරන හෝ කියවන වචනයෙන් හෝ පැහැදිළි සංඥාමය ප්‍රකාශනයන් මගින් නොඑසේනම් එකී අරමුණින් යම් ක්‍රියාවන් සිදු කරන (ඕනෑම තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරයි.)

රජයේ මෙම මුලපිරීම මගින් බරපතල ගැටළු දෙකක් පැන නැගුණි. පළමුවැන්න, එයට සමපාත වන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අවභාවිතා කිරීමේ දිගු ඉතිහාසයක් පවතින නිදා එම වගන්තිය හරයාත්මක ලෙස ගැටලුකාරී වන්නකි. සුළුතර ප්‍රජාවන්හි හඬ නගන ජනමාධ්‍යවේදීන් සහ දේශපාලන ක්‍රියාකාරිකයින්ට හිරිහැර කිරීමට සහ දඬුවම් කිරීමට මෙම වගන්තිය විශේෂයෙන් භාවිතා කරනු ලැබ ඇත. නැගෙනහිර පළාතේ දෙමළ සිවිල් වැසියන්ට එරෙහිව ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදා විසින් යුධ අපරාධ සිදු කිරීම සම්බන්ධයෙන් චෝදනා නැගූ දෙමළ ජනමාධ්‍යවේදී ජේ. එස්. තිස්සනායගම්, 2009 දී මෙම වගන්තිය යටතේ වැරදිකරුවකු කරනු ලැබීය.[249] 2013 දී දඹුල්ල පල්ලියට එල්ල වූ ප්‍රහාරයන්ට සම්බන්ධ වූවන්ට නඩු පැවරීමට අසමත් වීම පිළිබඳව රජය විවේචනය කළ මුස්ලිම් දේශපාලනඥයකු වූ අසාද් සාලි අත්අඩංගුවට ගැනීමට සහ රඳවා තබා ගැනීමට මෙම වගන්තියම උපයෝගී කර ගන්නා ලදී.[250] මෙලෙස, මෙම නව කෙටුම්පත් දෙකට විරෝධය පළ කිරීමට යොදා ගත් ප්‍රධාන අදහසක් නම් ඒවා, අතීතයේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ 2 (1) (උ) වගන්තිය ලෙසම, ප්‍රතිරෝධය දැක්වීම් මැඩ පැවැත්වීමට සහ මාධ්‍ය නිදහස ප්‍රතික්ෂේප කිරීමට භාවිතා කරනු ඇති බවයි. දෙවනුව, මෙම නව

249 කිශාලි පින්ටෝ-ජයවර්ධන, ජයන්ත ද අල්මේදා ගෙහාන් ගුණතිලක The JudicialMind: Responding to the Protection of Minority Rights (Law & Society Trust 2014), at 243-244. කතුවරුන් ප්‍රකාශ කරන්නේ: 'නඩු පැවරීමේ මූලික ප්‍රශ්නය වූයේ දෙමළ ජනමාධ්‍යවේදියකු බහුතර සිංහල හමුදාවට චෝදනා කරමින් (දෙමළ සිවිල් වැසියන්ට එරෙහි යුධ අපරාධ ගැන) ලියන ලද ලිපියක් මගින් සිංහලයින් විසින් දෙමළ ජනතාවට එරෙහි ප්‍රචණ්ඩ ක්‍රියා සිදු කරනු ඇතැයි හෝ ජනවාර්ගික හෝ ප්‍රජා අසමඟිය ඇති කරනු ඇතැයි යන චෝදනාවයි. එමෙන්ම, බලන්න, Democratic Socialist Republic of Sri Lanka v. J.S. Tissainayagam, H.C. 4425/2008, විනිසුරු දීපාලි විජේසුන්දර

250 පින්ටෝ-ජයවර්ධන සහ තවත් අය op. cit., at 262.

කෙටුම්පත් දණ්ඩ මුක්තිය වැළැක්වීමට වඩා එය ඇති කිරීමට දායක වනු ඇතැයි යන අදහසයි. ජනවාර්ගික හෝ ආගමික වෛරය පැතිරවීම සම්බන්ධ නව නීති හඳුන්වා දීම මගින්, ICCPR පනතේ විධිවිධාන තිබියදීත් එවකට ශ්‍රී ලංකා නීතිය යටතේ එය අපරාධ වරදක් නොවන්නේය යන අදහස නිර්මාණය කරන්නට ඇත. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(6) ව්‍යවස්ථාව මගින් අපරාධ නීතිය අතීතයට බලපාන ලෙස අදාළ කර ගැනීම විශේෂයෙන් තහනම් කරයි.[251] එහෙයින්, වෛරය පැතිරවීම අපරාධ වරදක් බවට පත් කෙරෙන ඕනෑම නීතියක් අදාළ වනු ඇත්තේ අනාගතයට පමණක් වන අතර, එමගින් අතීත වැරදිකරුවන්ට එරෙහිව නඩු පැවරීම අවම කෙරෙනු ඇත. නිදසුනක් ලෙස, 2014 ජුනි මස අලුත්ගම කෝලාහලවලින් අනතුරුව ඥානසාර හිමියන් විසින් කරන ලද ප්‍රකෝපකාරී කතා කිසිදු නව නීතියක වපසරියට අයත් නොවනු ඇත. ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියෝගයට ලක් කිරීම,[252] සිවිල් සමාජ විරෝධය[253] සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ දැඩි ප්‍රතිචාරයෙන්[254] අනතුරුව එකී සංශෝධන කෙටුම්පත් දෙක අහෝසි කරනු ලැබීය. එහෙත්, මෙම සිදුවීම විසින් පිළිබිඹු කරනු ලැබුවේ නව රජයේ අසහනකාරී අංගයකි - එනම්, නීති සම්පාදන ක්‍රියාවලිය තුළට පීඩාකාරී වුවමනාවන් කාන්දු වීමට සහ එය මෙහෙයවීමට ඉඩ සැලසීමට එයට ඇති අවශ්‍යතාවයයි.

රාජපක්ෂ පාලනය අතරතුර ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය සිදු කළ තැනැත්තන් පොදුවේ භුක්ති විඳි දණ්ඩ මුක්තිය නව රජය යටතේද දිගටම පැවතුණි. 2017 දී මෙම දණ්ඩ මුක්තිය තීව්‍ර අවස්ථාවකට එළඹුණි. නව පාලනයට වසර දෙකක් සපිරෙන විට වගවීම පිළිබඳව නව රජය ද බරපතල ලෙස නොසිතන බව සන්නද්ධ කණ්ඩායම්වලට වැටහී ගියේය. මෙම අවබෝධයෙන් දිරිමත් වූ බොදු බල සේනා වැනි කණ්ඩායම් සිය ක්‍රියාකාරකම් තීව්‍ර කිරීම ආරම්භ කළහ. නීතිය බලාත්මක කිරීමේ යාන්ත්‍රණයන්ට විවෘතවම විරෝධය දැක්වීමට එහි නායකයෝ පටන් ගත්හ. මේ සඳහා හොඳම අවස්ථාවක් නම් ඥානසාර හිමියන්ට විවෘත වරෙන්තු දෙකක් තිබියදී පවා ඔහු අත්අඩංගුවට ගැනීමට රජය අසමත් වීම යි - මෙය ආණ්ඩුව ප්‍රසිද්ධියේ ඔවුන්ට එකඟත්වය දැක්වීම හෝ මෙම කණ්ඩායම්වලට සහයෝගය දැක්වීම නිසා සිදු වූවක් විය හැකිය. 2016 ජනවාරි 25 වන දින හෝමාගම මහේස්ත්‍රාත් අධිකරණයේ කලබල ඇති කිරීම සහ කුරානයට අපහාස කිරීම

251 ගෙහාන් ගුණතිලක, 'Hate Speech in Sri Lanka: How a New Ban Could Perpetuate Impunity' *Oxford Human Rights Hub Blog*, 11 January 2016, at http://ohrh.law.ox.ac.uk/hate-speech-in-sri-lanka-how-a-new-ban-could-perpetuate-impunity[last retrieved 13 October 2017].

252 'Two Petitions in SC against Govt. Amendments to Penal Code on Hate Speech', *The Daily FT*, 16 December 2015, at http://www.ft.lk/article/509053/Two-petitions-in-SC-against-Govt--amendments-to-Penal-Code-on-hate-speech[last retrieved 29 August 2017].

253 'Civil Society urges Govt. to Withdraw Bills Criminalizing Hate Speech', *Colombo Telegraph*, 15 December 2015, at https://www.colombotelegraph.com/index.php/civil-society-urges-govt-to-withdraw-bills-criminalizing-hate-speech[last retrieved 29 August 2017].

254 Human Rights Commission of Sri Lanka, Letter to the Prime Minister dated 15 December 2015, at http://hrcsl.lk/english/wp-content/uploads/2015/12/Proposed_-amendment_to-_the_Penal_code_on_Hate_Speech.pdf[last retrieved 29 August 2017].

හා 2014 ජාතික බල සේනාහි මාධ්‍ය සම්මන්ත්‍රණයට බාධා කිරීම[255] පිළිබඳව බොදු බල සේනාහි මහ ලේකම්වරයාට විරුද්ධව අපරාධ නඩු දෙකක් පවරන ලදී. කුරුණෑගල දී ඔහු අත්අඩංගුවට ගැනීමේ මූලික වෑයම බොදු බල සේනා ආධාරකරුවන් විසින් වළක්වනු ලැබූ අතර,[256] 2017 ජුනි 21 වන දින ඔහු කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණය වෙත භාර වීමෙන් අනතුරුව ඇප මත මුදා හරින ලදී..[257]

මේ අතරතුර, සමහර රාජ්‍ය ක්‍රියාකාරීහු මානව හිමිකම් වෙනුවෙන් පෙනී සිටින්නන්ට තර්ජනය කිරීමට සහ අපහාස කිරීමට සෘජුව සම්බන්ධ වූහ. එක් බරපතල සිද්ධියක දී එවක අධිකරණ අමාත්‍යවරයා වූ විජේදාස රාජපක්ෂ විසින් මානව හිමිකම් නීතිඥ ලක්ෂාන් ඩයස් නීතිඥ වෘත්තීයෙන් නෙරපීමට නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බවට තර්ජනය කළේය. එයට හේතුව ඔහු 2015 ප්‍රජාතන්ත්‍රවාදී සංක්‍රාන්තියෙන් අනතුරුව ක්‍රිස්තියානීන්ට එරෙහිව ප්‍රචණ්ඩ ක්‍රියා 190ක් සිදු වී ඇතැයි ජාතික රූපවාහිනී වැඩසටහනක දී ප්‍රකාශ කිරීමයි.[258] වත්මන් පරිපාලනය තුළ ගැඹුරින් මුල් බැසගත් අගතීන් මෙන්ම බලයේ සිටින රජය කුමක් වුවත් සුළුතරයට-එරෙහි රාජ්‍ය ව්‍යුහයන් කෙබඳු මට්ටමේ ආස්ථානයන් ගන්නේ ද යන්නත් රාජපක්ෂගේ මෙම සිදුවීමෙන් පිළිබිඹු කෙරෙයි.

'ආයතනික ක්ෂය වීම' පිළිබඳව නීල් ඩි වොටා තහවුරු කරන සුළු විග්‍රහය, ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතන ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය අර්ථවත් අන්දමින් අවසන් කිරීමට හුදෙක්ම අසමත් වී ඇත්තේ මන්දැයි යන්න වටහා ගැනීමට ඉවහල් වෙයි. ඩි වොටා තර්ක කරන අන්දමට 'තනි පුද්ගලයින්ට රාජ්‍යය සමඟ කේවෙල් කිරීමට ක්‍රියාකාරී වීමට අවශ්‍යසම්බන්ධතා ජාල සපයා දීම, ප්‍රභූන් හා මහජනයා සඳහා/අතර උපාය මාර්ගික හැසිරීම් වෙනුවෙන් පරාමිතීන් නිර්ණය කිරීම, රාජ්‍යය සහ ආණ්ඩුක්‍රමය අතර සමීප වෙමින් යන අපේක්ෂාවන් වැඩිදියුණු කිරීම... සහ අනුමාන කිරීමේ හැකියාව උපදවීම යනාදිය ආයතන විසින් සපයා දෙනු ලබයි.'[259] ඔහු නිරීක්ෂණය කරන්නේ 'රාජ්‍යයේ ආයතනික නීති සම්පාදනය, අදාළ කිරීම, විනිශ්චය කිරීම සහ බලාත්මක කිරීම එක් කණ්ඩායමකට පක්ෂපාතීව අනෙක් කණ්ඩායම්වල සුජාත දුක්ගැනවිලි ඉවත දැමීම' මත

255 'Arrest warrant on Gnanasara Thera', *Daily Mirror*, 15 June 2017, at http://www.dailymirror.lk/130948/Arrest-warrant-on-Gnanasara-Thera[last retrieved 29 August 2017].

256 'BBS clash with Police in Kurunegala', *Daily News*, 22 May 2017, at http://dailynews.lk/2017/05/22/local/116578/bbs-clash-police-kurunegala [last retrieved 29 August 2017]. According to subsequent news reports, the government decided to withdraw the case concerning GnanasaraThero's alleged attack on the Quran.

257 'Gnanasara Thera surrenders to court', *The Sunday Times*, 21 June 2017, at http://www.sundaytimes.lk/article/1023973/gnanasara-thera-surrenders-to-court [last retrieved 29 August 2017]; 'Gnanasara Thera gets bail twice in two days', *Daily News*, 22 June 2017, at http://www.dailynews.lk/2017/06/22/law-order/119728/gnanasara-thera-gets-bail-twice-day [last retrieved 29 August 2017].

258 Human Rights Watch, *Sri Lanka: Minister Threatens Defender of Minority Rights*, 19 June 2017, https://www.hrw.org/news/2017/06/19/sri-lanka-minister-threatens-defender-minority-rights [last retrieved 29 August 2017].

259 ඩි වොටා, 'From ethnic outbidding to ethnic conflict', *op. cit.* at 146.

සිදු වන විට ආයතනික ක්ෂය වීම පටන් ගන්නා බවයි.[260] ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත් විට, ජනගහණයෙන් තුනෙන් දෙකකට වඩා පිරිසකට අදාළ වන ජනවාර්ගික-ආගමික අනන්‍යතා ගැටළුව වසන් කිරීම, ඇත්තෙන්ම මෙම ආයතනික් ක්ෂය වීම තීව්‍ර කිරීමට සහ පවත්වාගෙන යාමට ඉවහල් වී ඇත. මෙම අධ්‍යයනයේ නිගමන පරිච්ඡේදයේ තර්ක කොට ඇති අන්දමට සංස්කෘතික සංක්‍රාන්තියක් සඳහා වන අව්‍යාජ සහ අර්ථවත් ක්‍රියා පටිපාටියකින් තොරව මෙම ආයතනික ක්ෂය වීම නැවත හැරවීමට නොහැකි වනු ඇත.

## 3.2 මුල් බැසගත් ප්‍රචණ්ඩත්වයේ මෙහෙයවීම්

මින් අනතුරුව එළඹෙන විග්‍රහයෙන් හෙළිදරව් වන්නේ 2015 ජනවාරියේ සිදු වූ ආණ්ඩු මාරුව, ශ්‍රී ලංකාවේ රාජ්‍ය ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය කෙරෙහි සිදු කරන ලද බලපෑම අල්ප බවය. යුදකාමී කණ්ඩායම්වලට තිබූ අවකාශයන් යම් තරමකින් පටු වූ නමුත්, එකී කණ්ඩායම් වගවීමෙන් බඳවා තැබීමට රාජ්‍යය පසුබට වූ බව පැහැදිළිය. මෙම පූර්වාදර්ශය රටේ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය මුල්බැස ගැනීමට මග පාදා තිබේ. එකී මුල්බැස ගැනීමට මෙහෙයවනු ලබන සාධක විසංයෝජනය කර බැලීම වැදගත්ය. එබඳු මෙහෙයවීම් තුනක්ක් හඳුනා ගත හැකියඃ (1) සිංහල-බෞද්ධන්ගේ හිමිකාරත්ව සංකීර්ණත්වය (entitlement complex); (2) සිංහල-බෞද්ධන් වඳ වී යනු ඇති යන බිය; සහ (3) බෞද්ධ ආගමික නායකයින්ට හිමි බැහැර වී සිටීමේ හැකියාව.

මෙම මෙහෙයවීම් සාකච්ඡා කිරීමට පෙර, ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වයේ සාපේක්ෂ සංකීර්ණත්වය යළිත් කෙටියෙන් අවධාරණය කිරීම වැදගත්ය. ඩේවිඩ් ස්මොක් මෙම සංකීර්ණත්වය යම් ගැඹුරකින් සාකච්ඡා කරමින් විස්තර කරන්නේ, ජනවාර්ගික සහ ආගමික දිශානතීන් එකට ගැට ගැසීම ජනවාර්ගික-ආගමික ගැටුම් නිරාකරණය කිරීම විශේෂයෙන්ම අසීරු කරවන අන්දමයි.[261] එමන්ම, සෙත් කැප්ලන් නිරීක්ෂණය කරන්නේ ඊශ්‍රායලය/පලස්තීනය, බොස්නියාව, නයිජීරියාව සහ ඇත්තෙන්ම ශ්‍රී ලංකාව වැනි රටවල ගැටුම් තුළ ජනවාර්ගික මෙන්ම ආගමික දිශානතීන් ද ගැබ් වන බවයි.[262] එක් අතකට, මෙම ගැටුම් තුළ, විශේෂයෙන්ම ඒවායේ මුල් අවධියෙහි, ශක්තිමත් ජනවාර්ගික දිශානතීන් ගැබ් විය. අනෙක් අතට, මෙම ජනවාර්ගික ගැටුම් ආගමික දිශානතීන් ඇතුළත් කර ගනිමින් වර්ධනය වී ඇති අතර, එමඟින් ජනවාර්ගික-ආගමික ගැටුම්වල හැඩය ගෙන තිබේ. කැප්ලන් නිරීක්ෂණය කරන අන්දමට 'බැහැර කිරීමේ න්‍යාය පත්‍රයක් ක්‍රියාත්මක කිරීම අරමුණු කර ගත් නායකයින්ට හෝ අන්තවාදීන්ට ආගම උපකරණයක් විය හැකිය; ආගමික අනන්‍යතාව සහ විශ්වාසය ජනවාර්ගික සංවේදනයන්ට කළ නොහැකි අන්දමට

260 එම.

261 එම.

262 සෙත් කැප්ලන්, 'Religion, Development, and Fragile States' in Emma Tomalin (ed.), *The Routledge Handbook of Religions and Global Development* (Routledge 2015), at 422.

සටන්කරුවන් සක්‍රිය කිරීමට භාවිතා කළ හැකිය.'[263] මෙලෙස - විශේෂයෙන්ම කැප්ලන් සඳහන් කරන 'බිඳෙනසුළු' රාජ්‍යවල - නායකයින්, 'බලය ලබා ගැනීමට, පවත්වා ගැනීමට සහ ආරක්ෂා කිරීමට, ජනවාර්ගිකත්වය වැනි සිය අනන්‍යතා සළකුණු සමග ආගම ද 'අවස්ථාවාදී ලෙස භාවිතා කිරීමට' පෙළඹෙති.[264]

ආගමික ගැටුම් ජනවාර්ගික ගැටුම්වලින් වෙනස් කොට සැලකිය හැකිය. කැප්ලන්ට අනුව, 'ජනවාර්ගික ක්‍රියාකාරීන්ට වඩා ආගමික ක්‍රියාකාරීහු ගැඹුරු යටිතල ව්‍යුහයන් සහ වඩාත් දියුණු විශ්වාස පද්ධතීන් කෙරෙහි යොමු වෙති.'[265] එහෙයින්, ආගමික ගැටුම් සමථ කිරීම ඉතා අසීරු විය හැකිය. එමෙන්ම, ආගමික ගැටුම් දේශීයකරණය වූ ජනවාර්ගික ගැටුම්වලට වඩා ගෝලීය කතිකාවන්ගේ ආභාසය ලබයි.[266] එහෙත්, ආගමික සම්බන්ධතාවලට වඩා ජනවාර්ගික සම්බන්ධතා වඩාත් ස්ථිර ඒවා වෙයි. එහෙයින් ආගමික ඒවා අවසන් කිරීම අසීරු ය.[267] මෙම ආකාර දෙකෙහිම ගැටුම් ඒවා නිරාකරණය කිරීමට අසීරු වන ආවේණික ලක්ෂණවලින් සමන්විත වන්නේ නම්, ජනවාර්ගික-ආගමික ගැටුම්වල සංයුක්ත සංකීර්ණතාවන්, ඒවා විසඳීම වඩාත් අසීරු කරනු ඇත. නිදසුනක් ලෙස, ඩේවිඩ් ලිට්ල් පෙන්වා දෙන්නේ, ආගම 'ජනවාර්ගිකකරණය' වී ඇති ලෙබනනය, සිරියාව, ඉරාකය සහ උතුරු අයර්ලන්තය වැනි ගැටුම්වල පාලනය කළ නොහැකි ස්වභාවය විසින් සමාජීය බෙදීම් වඩාත් ස්ථිර කරනු ලැබ තිබේය යනුවෙනි.[268] එහෙයින් ජනවාර්ගික සහ ආගමික යන දෙආකාරයේම ස්වභාවය ගන්නා ගැටුම් 'අවසන් කිරීමට ඉතා අසීරු බව තහවුරු වෙයි.'[269]

ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය සහ අන්තර්ඡේදනීයත්වය පිළිබඳ සංකල්පය අතර සමාන්තර බවක් දැකිය හැකිය. ආගමික සහ ජනවාර්ගික සුළුතර තත්ත්වයන් දෙකෙහිම ස්ථානගත වන පුද්ගලයින්, ආගමික හෝ ජනවාර්ගික ප්‍රචණ්ඩත්වයන් වෙනවෙනම ගත් විට එහි එකතුවට වඩා ප්‍රමාණයකින් ප්‍රචණ්ඩත්වයන්ට මුහුණ දෙති. එහෙයින්, සංකීර්ණත්වය සහ පාලනය කළ නොහැකි බව අතින් එම ප්‍රචණ්ඩත්වයේ සාමූහික බලපෑම එයටම ආවේණික වෙයි. ආගමක් හෝ විශ්වාසයක් ඇදහීමේ නිදහස පිළිබඳ හිටපු විශේෂ නියෝජිත අබ්දල්ෆතා අමෝර් මේ සම්බන්ධයෙන් තීරණාත්මක නිරීක්ෂණයක් කරයි:

---

263 *Ibid.*

264 එම. The author observes that Nigeria and Sudan are two examples of 'how religion became interwoven with longstanding grievances among identity groups.'

265 එම.

266 එම.

267 එම

268 ඩේවිඩ් ලිට්ල්, 'Religion, Nationalism, and Intolerance', in T. Sisk (ed.), *Between Terror and Tolerance: Religious Leaders, Conflict, and Peacemaking* (Georgetown University Press 2011), 9-28.

269 කැප්ලන්, *op. cit.* at 423.

> ආගමික නිදහසේ අයිතිවාසිකම සහ ජනවාර්ගික කණ්ඩායමකට හෝ සුළුතරයකට අයත් වීමේ අයිතිවාසිකම තනි පුද්ගලයකුට හෝ පුද්ගල කණ්ඩායමකට සිදු වන විට, එකී ප්‍රචණ්ඩත්වය හුදු සාමාන්‍ය වරදක් හෝ වෙනස් කොට සැළකීමක් ලෙස ස්ථාපනය වීමක් සිදු නොවේ. එය හුදෙක් වැරදි ගණනාවක් එක්රැස් වීමක් නොවේ. වැරදි දෙකක් එකතු වීම මඟින්, එකී සංකල්පවල වෙන් වූ ස්වභාවය හේතුවෙන් සිදු වන වෙනස් තීව්‍රතාවයන් සහිතව නව, වඩාත් උග්‍ර - බරපතල වෙනස් කොට සැළකීමක් - නිර්මාණය කරයි.[270]

සිංහල-බෞද්ධ බහුතරය සහ දෙමළ සුළුතරය (අවශ්‍යයෙන්ම ජනවාර්ගික බෙදීම ඔස්සේ) සිදු වූ ගැටුම් අතර, මුස්ලිම් සහ ක්‍රිස්තියානි සුළුතරය (අවශ්‍යයෙන්ම ආගමික බෙදීම් ඔස්සේ) ශ්‍රී ලංකාව අත් දැක ඇත. එහෙත්, මෙම ගැටුම් බොහෝ විට වටහා ගනු ලබන්නේ වෙනස් ඒවා ලෙසය; ඒවා තනි ජනවාර්ගික-ආගමික ගැටුමක ප්‍රවේශයන් ලෙස විග්‍රහ කරනු ලබන්නේ කලාතුරකිනි. කෙසේවෙතත්, මෙම පරිච්ඡේදයේ මීන් අනතුරුව එන උප කොටස්වල සාකච්ඡා කොට ඇති පරිදි, මෙම ගැටුම් තුළ  පොදු ලක්ෂණ ගැබ් වන අතර, අවම වශයෙන් පොදු ලක්ෂණ තුනක් අනුව මෙහෙයවනු ලබන බව පෙනී යයි. එහෙයින් ශ්‍රී ලංකාවේ බහුතර හා සුළුතර ප්‍රජාවන් අතර ගැටුම නව රාමුගත කිරීමක් ඔස්සේ සළකා බැලීම වටී: එනම්, ජනවාර්ගික සහ ආගමික රේඛාවන් ඔස්සේ වටහා ගන්නා ලද සිංහල-බෞද්ධ බහුතරය සහ විවිධ සුළුතර කණ්ඩායම් අතර තනි ජනවාර්ගික -ආගමික ගැටුමකි.[271]

### 3.2.1 හිමිකාරත්ව සංකීර්ණය (entitlement complex)

යටත් විජිතකරණයට පෙර සිංහල-බෞද්ධ අධිපතිත්වය පිළිබඳ මහාවංශ අදහස් ශ්‍රී ලංකා-වේ සිංහල-බෞද්ධ ප්‍රජාවේ නිශ්චිත සමාජීයකරණය කෙරෙහි දායක වී තිබේ. මහාවංශය, නොඑසේනම් 'මහා වංශ කතාව' ශ්‍රී ලංකාවේ බුද්ධාගමේ නැගී ඒම සම්බන්ධ ඓතිහාසික වෘත්තාන්තය ලෙස සළකනු ලැබේ.[272] බහුතර සිංහල-බෞද්ධ ප්‍රජාව මහාවංශය කියවා

---

270 හයිනර් බීල්ෆෙල්ට්, නසිලා ගනියා සහ මයිකල් වීනර්,, *op. cit.* at 320-321. See United Nations General Assembly, *Interim Report by the Special Rapporteur of the Commission on Human Rights on the Elimination of All Forms of Intolerance and of Discrimination based on Religion or Belief*, 8 September 2000, A/55/280, at para.111.

271 මෙම හැඳින්වීම අවශ්‍යයෙන්ම ශ්‍රී ලංකාවේ ජාතක බහුතර ප්‍රජාව - සිංහල බෞද්ධයින් - සහ විවිධ ජනවාර්ගික -ආගමික සුළුතර කණ්ඩායම් අතර ගැටුම විග්‍රහ කරයි. එකී ගැටුම වූ කලී ශ්‍රී ලංකාවේ එකම ගැටුම හෝ එකම ප්‍රජා ගැටුම යයි ඉන් අදහස් නොවේ. නිදසුනක් ලෙස දෙමළ සහ මුස්ලිම් ප්‍රජාව හෝ හින්දු සහ ක්‍රිස්තියානි ප්‍රජාව අතර සිදු වන ගැටුම් මෙම වපසරියට ඇතුළත් කර නොමැත. එමෙන්ම, ප්‍රභූන් සහ ශ්‍රමිකයින් අතර පවතින පන්ති ගැටුම් ද මෙම වපසරියට ඇතුළත් වී නැත; මෙබඳු ගැටුම් ජනවාර්ගික-ආගමික අනන්‍යතා සීමාවන් තුළ සහ අතර ඇති විය හැකිය.

272 නීල් ඩි වොටා, *Sinhalese Buddhist Nationalist Ideology: Implications for Politics and Conflict Resolution in Sri Lanka* (East-West Center Washington 2007), at 5.

නැති විය හැකි වුවත්, එකී ලියවිල්ල 'ඔවුන්ගේ සාමූහික පැවැත්මේ අත්‍යන්ත කේන්ද්‍රය ලෙස පෙනී සිටී.'[273] ඒ අනුව බොහෝ දෙනෙක් රටෙහි හිමිකාරත්වය පිළිබඳ හැඟීමක් අත් කරගෙන සිටිති. මෙම හිමිකාරත්වය පිළිබඳ සංකීර්ණය, වසර 2,500කට පෙර සිංහලයාගේ ආදී වාසියා ලෙස සැළකෙන[274] විජය කුමරුගේ ආගමනය පිළිබඳ ප්‍රබන්ධය දක්වා මුල් බැසගෙන තිබේ.[275] ඇත්තෙන්ම, සිංහල-බෞද්ධ ජාතිකවාදය රඳෙන්නේ බුදුන් විසින් විජය අභිෂේක කිරීම සහ බුදු දහම ස්ථාපනය කෙරෙන 'ලංකාව' නම් ස්ථානය පිළිබඳ සඳහන මතය. දෙවියන්ට අග්‍ර වූ ශක්‍රයා අමතමින් කළ දේශනය පහත පරිදි වේ:

> සිංහබාහුගේ පුත් විජය, හත් සියයක් අනුගාමිකයින් සමඟ ලාල රටේ සිට පැමිණ තිබේ. දෙවියන්ගේ භූමිය වන ලංකාවේ මගේ ආගම ස්ථාපනය වනු ඇති අතර එහෙයින් ඔහුගේ අනුගාමිකයින් සහ ලංකාව විසින් ප්‍රවේශමෙන් සුරකිනු ඇත.[276]

මෙම ඡේදය ශ්‍රී ලංකාව යනු බෞද්ධ භූමියක් ලෙස වර්ග කරන අතර, එකී වර්ගීකරණය ලංකාවේ පළමු සිංහල රජු වන විජයගේ සහ ඔහුගේ අනුගාමිකයින්ගේ දිව්‍යමය ආරක්ෂාව ආරක්ෂාව හා බැඳ තබයි. එහෙයින් මෙම ඡේදය ශ්‍රී ලංකාව බෞද්ධ රටක් වන්නේය සහ සිංහල-බෞද්ධයින්ට බුදුන්ගේ ඉල්ලීම අනුව දිව්‍යමය ආරක්ෂාවක් හිමි වන්නේය යනුවෙන් ශක්තිමත් මිථ්‍යාමය පදනමක් සපයයි. මෙම මිථ්‍යාමය කතාන්තරය සිංහල-බෞද්ධ පරිකල්පනය තුළ ඉමහත් අභියෝගයකට ලක් වී නොමැත. ගණනාත් ඔබේසේකර නිවැරදිව නිරීක්ෂණය කරන පරිදි 'ඓතිහාසික පෙරළියක ප්‍රතිඵලයක් ලෙස මිනිසුන්ට සිය මූලය සහ අනන්‍යතාව පිළිබඳ ගැටළුවලට මුහුණ දීමට සිදු වන්නේ නම් මිස, කණ්ඩායමක මූලය සහ ජනවාර්ගික අනන්‍යතාව අර්ථ ගන්වනු ලබන මිථ්‍යාවන් සංවාදයට ලබා දෙන්නේ සුළු ඉඩකි.'[277] මෙම මිථ්‍යාවන් ඒ අනුව 'අවිවාදාත්මක ඉතිහාසය'[278] ලෙස පිළිගනු ලැබ ඇති අතර, සිංහල-බෞද්ධ හිමිකාරත්ව සංකීර්ණයට අඩිතාලම සපයනු ලැබ තිබේ.

273 එම.

274 එම. at 6.

275 ශ්‍රී ලංකාවේ මිථ්‍යාවන්හි බිහි වීම පිළිබඳ රසවත් විග්‍රහයක් සඳහා බලන්න ඇලන් ස්ට්‍රැතර්න්, 'The Vijaya origin myth of Sri Lanka and the strangeness of kingship' (2009) 203 *Past and Present* 3–28. බලන්න ඇලන් ස්ට්‍රැතර්න්, 'Vijaya and Romulus: Interpreting the Origin Myths of Sri Lanka and Rome' (2014) 24(1) *Journal of the Royal Asiatic Society* 51-57.

276 විල්හෙල්ම් ගෛගර්, *TheMahavamsa or the Great Chronicle of Ceylon: Translated into English* (1950), chapter VII, verse 4. Also see Gunawardana, *op. cit*. at 5; John Holt, *The Sri Lanka Reader: History, Culture, Politics* (Duke University Press 2011), at 21.

277 ගණනාත් ඔබේසේකර, 'Myth models of the parricide: Oedipus in Sri Lanka' in *The Work of Culture: Symbolic Transformation in Psychoanalysis and Anthropology* (1990), at 147.

278 නීල් ඩි වොටා, *Sinhalese Buddhist Nationalist Ideology*, *op. cit.* at 6.

මෙම හිමිකාරත්ව සංකීර්ණයේ වඩා මෑතකාලීන ඓතිහාසික මූලයන් 19 වන සියවසේ සහ විසි වන සියවසේ මුල් භාගයේ බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරය තෙක් දිවේ.[279] මෙම ව්‍යාපාරයට හික්කඩුවේ සිරි සුමංගල හිමි,[280] අනගාරික ධර්මපාල සහ පියදාස සිරිසේන වැනි සුවිශේෂී නායකයින් පෙරමුණ ගත්හ. මෙම ව්‍යාපාරය, යටත්විජිතකරණයට පෙර රටේ සිංහල-බෞද්ධ අධිපතිත්වය පිළිබඳ මහාවංශ අදහස මත පදනම් විය. මේ සම්බන්ධ ගතානුගතික කතාන්තරයක් නම්, 'බුදු දහම සහ සිංහල ජාතිය රැක ගැනීම සඳහා' සිංහල-බෞද්ධ දුටුගැමුණු රජු 'විදේශීය පාලක' එළාර රජු පරාජය කිරීමේ 'කීර්තිමත්' යුද ජයග්‍රහණයයි.[281] එල්ටීටීඊයට එරෙහි සන්නද්ධ ව්‍යාපාරය 'දේශමාමක යුද්ධයක්' ලෙස රාමුගත කිරීම සඳහා රාජපක්ෂ පරිපාලනය මෙම කතාන්තරය මත දැඩිව එල්බ ගත් අතර, ඒ පදනම මත සිංහල-බෞද්ධ සහයෝගය සක්‍රිය කිරීමෙහි ලා සාර්ථක විය.[282]

මෙම ඓතිහාසික හැඩගැසීම ආර්. ඒ. එල්. එච්. ගුණවර්ධන විවාදයට ලක් කරයි. ඔහු තර්ක කරන්නේ මෙම ඓතිහාසික ව්‍යාපාර සිංහල-බෞද්ධ උරුමය පිළිබඳ අදහස ඉහළ නැංවීමට වඩා, භූමිය අත්පත් කර ගැනීම ඉලක්ක කර ගත් බවයි.[283] එහෙත්, සිංහල-බෞද්ධ මනස තුළ 'සමාජීයකරණය' වීම දක්වා, මේ රට ඓතිහාසිකව සිංහල-බෞද්ධයින්ට උරුමව තිබුණේය යන අදහස දේශපාලන වේදිකාවේ සිට පංති කාමරය දක්වා[284] ප්‍රධාන ධාරාවට එක් කොට තිබේ.[285] ගුණදාස අමරසේකර සහ නලින් ද සිල්වා වැනි ලේඛකයින් විසින් වසර 2,000ක් තිස්සේ විකාශනය වන සිංහල බෞද්ධ බහුතරය සම්බන්ධව ජාතික චින්තනය යන අදහස සංකල්පගත කොට තිබේ.[286] ඔවුන් තර්ක කරන්නේ පූර්ව යටත් විජිත ශ්‍රී ලංකාවේ, 'අධිපති සංස්කෘතික ධාරාව තමාගේම ලෙස සැළකූ' සුළුතරයට, නිසි ගරුත්වය ලබා දුන් 'තනි, උසස් සිංහල-බෞද්ධ සංස්කෘතියක්' පැවති බවයි.[287] මෙම අදහස ශ්‍රී ලංකාවේ සිංහල-බෞද්ධ හිමිකාරත්ව සංකීර්ණයේ පැවැත්ම තුළට අන්තර්ග්‍රහණය වී

279 ගොම්බ්‍රිජ් සහ ඔබේසේකර Gombrich and Obeyesekere, *op. cit.* at 202-238.

280 ඈන් බ්ලැක්බර්න්, *Locations of Buddhism: Colonialism and Modernity in Sri Lanka* (The University of Chicago Press: 2010) for an in-depth discussion on the work of early revivalists such as Hikkaḍuwe Sri Sumangala Thera.

281 සසංක පෙරේරා, *The Ethnic Conflict in Sri Lanka: A Historical and Sociopolitical Outline* (World Bank 2001), at 4.

282 සුනිල් බැස්ටියන්, 'The Political Economy of Post-War Sri Lanka' *ICES Research Papers*, Research Paper No. 7 (May 2013), at 9.

283 ගුණවර්ධන, *op. cit.* at 15.

284 ගුණතිලක, *The Chronic and the Acute*, *op. cit.* at 35-36. කතුවරයා සඳහන් කරන්නේ: 'ඉතිහාස පෙළ පොත් බරපතල ලෙස හා විවේචනාත්මක නොවන ලෙස මහාවංශය උපුටා දක්වයි. නිදසුනක් ලෙස, 6 ශ්‍රේණියේ ඉතිහාස පෙළ පොතේ 6 වන පරිච්ඡේදය එළාර නම් 'විදේශීය' දෙමළ ආක්‍රමණිකයා පරාජය කළ සිංහල පාලකයකු වූ දුටුගැමුණු පිළිබඳව සඳහන් කරන්නේ 'රට විදේශ පාලනයන්ගෙන් ගලවා ගැනීම 'රට එක්සේසත් කිරීම' සහ 'බුදුදහම ආරක්ෂා කිරීම' යන අරමුණු සඳහා එය කළ බවය..

285 පෙරේරා, *op. cit.* at 8.

286 අයේෂා සුහයිර්, *Dynamics of Sinhala Buddhist Ethno-Nationalism in Post-War Sri Lanka* (Centre for Policy Alternatives 2016), at 13. කලණ සේනාරත්න, 'JathikaChinthanaya and the Executive Presidency' in AsangaWelikala (ed.), *Reforming Sri Lankan Presidentialism: Provenance, Problems and Prospects*, (Centre for Policy Alternatives 2015), at 208.

287 සුහයිර් *op. cit.* at 13.

තිබේ. මෙම සංකීර්ණය වූ කලී මේ වන විට බොහෝ සිංහල-බෞද්ධන්ගේ සැබෑ සහ (අනෙකුත් ප්‍රජාවන්ගේ) පරිකල්පිත සමාජීයකරණයේ කොටසකි. එය සමහර මානවවංශ අධ්‍යයනයන්හි ද පිළිබිඹු වී තිබේ. නිදසුනක් ලෙස, නැගෙනහිර පළාතේ ප්‍රජා සම්බන්ධතා පිළිබඳ මෑතකාලීන අධ්‍යයනයක් විසින් හෙළිදරව් කරනු ලැබුවේ ක්‍රිස්තියානි, හින්දු සහ මුස්ලිම් ඇතුළු සුළුතර කණ්ඩායම් විසින් සිංහල බෞද්ධයින් 'මෙම රටෙහි සැබෑ හිමිකරුවන්' ලෙස දකින බවය.[288]

සිංහල බෞද්ධ හිමිකාරීත්ව සංකීර්ණය ශ්‍රී ලංකාවේ පශ්චාත්-නිදහස් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා චින්තනය තුළට බෙහෙවින් කාන්දු වී තිබේ. (බ්‍රිතාන්‍යය විසින් පත් කරනු ලැබූ සෝල්බරි කොමිසම මගින් රාමුගත කළ) 1947 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බුද්ධාගමට විශේෂ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය තත්ත්වයක් ඇත කර දුන්නේ නැත. නමුත්, බෙන්ජමින් ශෝන්තල් සඳහන් කරන අන්දමට, මෙම මුල්කාලීන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ලේඛනය විවේචනය කිරීමට තුඩු දුන් එක් ප්‍රධාන පදනමක් වූයේ බුදුදහම විධිමත්ව සුරක්ෂිත කිරීමට එය අසමත් වීමයි.[289] පශ්චාත්-යටත් විජිත සිංහල-බෞද්ධ ජාතිකවාදය ඉන් අනතුරුව පණ ලැබූ අතර නෛතික, ආයතනික සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිපාදන මාලාවක එය පිළිබිඹු විය. පළමුව, එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක රජය විසින්, පරිපාලන භාෂාව සිංහල බවට පත් කරමින් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනත පනවන ලදී. මෙය බෙහෙවින්ම සැළසුම් කරන ලද්දේ රාජ්‍ය සහ වෘත්තිමය සේවාවන්හි සිංහල භාෂාව කතා කරන්නන් රැකියාවෙහි නිරත වීම ඉහළ නැංවීම උදෙසාය. මන්ද, එම කාලය වන විට සිය ඉංග්‍රීසි හැසිරවීමේ කුසලතා හේතුවෙන් වැඩි දෙමළ නියෝජනයක් දක්නට ලැබුණි.[290] ස්ටැන්ලි තම්බයියා සඳහන් කරන්නේ මෙම පනත 'සිංහල- දෙමළ භේදය ගැඹුරු කිරීමටත්... සිංහලයින් සහ දමිළයින් අතර සාමූහික ප්‍රතිවිරෝධයන් ඇති කිරීමටත්' දායක වූ බවය.[291]

දෙවනුව, 1970 ගණන්වලදී රජය විශ්ව විද්‍යාලවලට ඇතුළත් වීම කෙරෙහි අදාළ වූ කුසලතා පදනම් කරගත් ක්‍රමවේදය අහෝසි කරමින් 'ප්‍රමිතිගතකරණ' ප්‍රතිපත්තිය හඳුන්වා දුන්නේය. විශ්ව විද්‍යාල ප්‍රවේශය විභාග පැවැත් වූ භාෂාවට සමානුපාතික වූ නිසා මෙම නව ක්‍රමය සිංහල අපේක්ෂකයින්ට ප්‍රතිලාභ ගෙන දුන්නේය. එහෙයින්, සමස්ත විභාග

288 ජනවාර්ගික අධ්‍යනය සඳහා වන ජාත්‍යන්තර කේන්ද්‍රය, *Community Perceptions of Religious Tolerance and Religious Tensions in Batticaloa and Trincomalee* (forthcoming).

289 බෙන්ජමින් ශෝන්තාල්, 'Buddhism and the Constitution: The Historiography and Postcolonial Politics of Section 6' in AsangaWelikala (ed.), *The Sri Lankan Republic at 40: Reflections on Constitutional History, Theory and Practice* (Centre for Policy Alternatives 2012), at 213.

290 පෙරේරා, *op. cit.* at 11ග කතුවරයා සඳහන් කරන්නේ: නිදහස ලැබෙන විට දෙමළ ජනතාව රාජ්‍ය සේවයට ඇතුළත් වීමේ ප්‍රතිශතය 30%ක් විය. මෙය සමස්ත ජනගහණය තුළ ඔවුන්ගේ අනුපාතයට වඩා වැඩි විය. - ශ්‍රී ලංකා සහ ඉන්දීය දෙමළ ජනගහණය මුළු පුරවැසියන්ගෙන් 25% ඉක්මවා ගොස් නැත. 1956 වන විට දුම්රිය, තැපැල් සහ රේගු සේවාවලින් 50%ක් ද, වෛද්‍යවරුන්ගෙන්, ඉංජිනේරුවන්ගෙන් සහ නීතිඥවරුන්ගෙන් 60% ක්ද, අනෙකුත් කම්කරු සේවාවලින් 40%ක් ද දෙමළ ජනතාවගෙන් සමන්විත විය.'

291 ස්ටැන්ලි ජේ. තම්බයියා, *Sri Lanka: Ethnic Fratricide and the Dismantling of Democracy* (1986), at 75.

ප්‍රතිඵල නොසළකා, සිංහල සහ දෙමළ භාෂාවලින් විභාගයට පෙනී සිටි අපේක්ෂකයින්ගේ අනුපාතය අනුව සිංහල සහ දෙමළ අපේක්ෂකයින් සඳහා වන ඉඩ වෙන් කරනු ලැබීය.

තුන්වනුව, 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව සිංහල ජාතික භාෂාව ලෙස විධිමත්ව පිළිගත් අතර, බුද්ධාගමට 'ප්‍රමුඛස්ථානය' ලබා දුන්නේය.[292] බුද්ධාගමට විශේෂ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය තත්ත්වයක් හිමි කර දීමේ යෝජනාව 1960 ගණන්වල ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) විසින් ඉදිරිපත් කරනු ලැබූ අතර, අවසානයේ දී 1970 එක්සත් පෙරමුණු ප්‍රතිපත්ති මාලාවට ද එක් විය.[293] 1970 එය ලැබූ මැතිවරණ ජයග්‍රහණයෙන් පසුව, 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 6 වන කොටසට පහත වගන්තිය එකතු කිරීමට ශ්‍රීලනිප කටයුතු කළේය:

> ශ්‍රී ලංකා ජනරජය බුද්ධාගමට ප්‍රමුඛස්ථානය ලබා දිය යුතු අතර, 18(1)(ඈ) වගන්තියේ සඳහන් ආගමික අයිතීන් සුරකිමින් බුද්ධාගම ආරක්ෂා කිරීම සහ පෝෂණය කිරීම රාජ්‍යයේ වගකීමක් විය යුත්තේය.

මෙම විධිවිධාන 19878 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වගන්තිය තුළ ප්‍රතිනිර්මාණය කරන ලදී.[294] නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ද සිංහල ජාතික භාෂාව ලෙස තබා ගත් නමුත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය මඟින් දෙමළ ද ජාතික භාෂාවක් ලෙස පිළිගනු ලැබීය.

බුද්ධාගම විසින් දැරූ ප්‍රමුඛස්ථානය ශ්‍රී ලංකාවේ ආගමික නිදහස සම්බන්ධ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීති විද්‍යාවේ කේන්ද්‍රය බවට පත්ව තිබේ.[295] *Provincial of the Teaching Sisters of the Holy Cross of the Third Order of Saint Francis in Menzingen of Sri Lanka (Incorporation)*[296] හිදී ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය 'කතෝලික ආගම පිළිබඳ දැනුම' ප්‍රචාරය කිරීම අරමුණු කරගත් ආගමික ආයතනයක් ස්ථාපනය කිරීමට අදාළ කෙටුම්පතක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල බව විමසා බලන ලදී.[297] ආයතනයේ බලතල තුළට අනාථයින්, ළමුන් සහ වැඩිහිටියන් වෙනුවෙන් ආරක්ෂිත නිවාස සැපයීම ඇතුළත් විය. බුද්ධාගමට 'ප්‍රමුඛස්ථානය' දෙන වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 ව්‍යවස්ථාවට

---

292 1972 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 6 සහ 7 ව්‍යවස්ථා බලන්න..

293 ශෝන්තාල්, 'Buddhism and the Constitution', *op. cit.* at 213. Also see ශෝන්තාල සහ අසංග වැලිකල, 'Buddhism and the Regulation of Religion in the New Constitution: Past Debates, Present Challenges, and Future Options', *CPA Working Papers on Constitutional Reform*, Working Paper No. 3 (July 2016), at 6.

294 9 ව්‍යවස්ථාව මඟින් ප්‍රකාශ කරන්නේ: ශ්‍රී ලංකා ජනරජය බුද්ධාගමට ප්‍රමුඛස්ථානය ලබා දෙන අතර, ඒ අනුව අනෙක් සියලු ආගම් සඳහා 10 සහ 14(1) (ඉ) ව්‍යවස්ථාව මඟින් තහවුරු කොට ඇති අයිතිවාසිකම් සුරක්ෂිත කරමින්, බුද්ධ ශාසනය ආරක්ෂා කිරීම රාජ්‍යයේ වගකීමක් විය යුත්තේය.' 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 ව්‍යවස්ථාව අතර ඇති එකම භෞතික වෙනස නම් 'බුද්ධාගම' යන වචනය 'බුද්ධ ශාසනය' යනුවෙන් වෙනස් කොට තිබීමයි. .

295 මේ පිළිබඳ අංග සම්පූර්ණ විග්‍රහයක් සඳහා ශෝන්තාල් සහ වැලිකල බලන්න., *op. cit.* 14-20.

296 S.C. Special Determination No. 19/2003.

297 එම. at 2.

පටහැණි බව පවසමින් ශ්‍රේෂ්ඨාධිකරණය මෙම කෙටුම්පත අවලංගු කරන ලදී.[298] තම ආගමෙන් පිටස්තර තැනැත්තන්ට භෞතික ප්‍රතිලාභ සපයමින් අන් ආගමිකයින් සිය විශ්වාසයන් 'පැතිරවීම' 9 ව්‍යවස්ථාව මගින් සීමා කර ඇතැයි එය ප්‍රකාශ කළේය. බුද්ධාගමේ සහ බුද්ධ ශාසනයේ පැවැත්මට අවහිර වන හෙයින්, (භෞතික ප්‍රතිලාභ ලබා දීමෙන්) ක්‍රිස්තියානි ආගම පැතිරවීම සහ ව්‍යාප්ත කිරීම සඳහා අවසර දිය නොහැකි බවට එය තීන්දු කළේය.[299]

සඳහන් කළ යුතු තවත් කරුණක් නම් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 ව්‍යවස්ථාව, 1972 ව්‍යවස්ථාවේ සඳහන් 'බුද්ධාගම' පමණක් නොව, 'බුද්ධ ශාසනය' ද ආරක්ෂා කිරීම සහ පෝෂණය කිරීම පිළිබඳව අදාළ වෙයි. බෙන්ජමින් ශෝන්තල් සහ අසංග වැලිකල නිරීක්ෂණය කරන්නේ මෙම ලිඛිත වෙනස්කම මගින් 'බහුතර ආගම සඳහා වන රාජ්‍ය ආරක්ෂාවේ වපසරිය පුළුල් කිරීමේ' අරමුණ පිළිබිඹු කරන බවය.[300] ශාසනය යන යෙදුම සාමාන්‍යයෙන් යොදා ගන්නේ බුදුන්ගේ ඉගැන්වීම අදහස් කිරීමටය.[301] එහෙත්, ඔබෙසේකර ඉදිරිපත් කරන අන්දමට ශ්‍රී ලාංකික සන්දර්භය තුළ මෙම යෙදුමට එකට බැඳුණු අරුත් දෙකක් තිබේ; 'විශ්වීය' අර්ථයෙන් ගත් විට එය පුළුල් බෞද්ධ 'විහාරය' හෝ 'ප්‍රජාව' නියෝජනය කරන අතර, 'විශේෂිත' අර්ථයෙන් ගත් විට එය ශ්‍රී ලංකාව වූ කලී 'බුදුන්ට කැප වූ භූමියේ භෞතික සීමාවයි' යන ඓතිහාසික අදහස නියෝජනය කරයි.[302] එහෙයින් ඔහු තර්ක කරන්නේ 'ජාතිය' යන යෙදුමට සිංහල ශබ්ද කෝෂයේ සමාන යෙදුමක් නොමැති බවත්, 'ජාතිය' නමැති සමාන 'බහුවිධ පංතියකට' අයත් වීම ශාසනය ලෙස වටහා ගත යුතු බවත්ය.[303] දහතුන් වන සංශෝධනයේ කෙටුම්පත තීරණය කිරීමේ නඩුවේ දී ස්වකීය විරුද්ධ මතය තුළ, මෙම අර්ථ නිරූපණයේ එක් අනුවාදයක් වනසුන්දර විනිසුරුතුමා විසින් පෙන්වා දෙයි.[304]

ශෝන්තල් සහ වැලිකල සඳහන් කරන අන්දමට, බුද්ධ ශාසනය යන යෙදුමේ 'මතුපිට සහ සාරගර්භ ස්වභාවය' පිළිබඳ වනසුන්දර විනිසුරුතුමාගේ නිරීක්ෂණ බලපෑම් සහගත වී තිබේ.[305] ඔවුන් තර්ක කරන අන්දමට, මෙම නඩුවේ වනසුන්දර විනිසුරුතුමාගේ අදහස සුළුතර මතය වුවත්, එය 'ශ්‍රී ලංකාවේ තත්වාකාර නීති විද්‍යාත්මක භාෂිතයක් බවට පත්ව

298 එම. at 7.
299 එමග එමෙන්ම බලන්න යුසුෆාලි, *op. cit.* හි 10.
300 ශෝන්තාල් සහ වැලිකල, *op. cit.* at 17.
301 See කැරොල් ඇන්ඩර්සන්, *Pain and its Ending: The Four Noble Truths in the Theravada Buddhist Canon* (Routledge 2013), at 33; ඩේමියන් කෙවොන්, *A Dictionary of Buddhism* (Oxford University Press 2004), at 45.
302 ඔබේසේකර, 'Buddhism, Ethnicity and Identity', *op. cit.* at 207.
303 එම
304 *In the Matter of the Thirteenth Amendment to the Constitution and Provincial Councils Bill* (1987) 2 Sri. L.R. 333.
305 ශෝන්තාල් සහ වැලිකල, *op. cit.* at 17.

ඇති අතර, අධිකරණ දේශන සහ තීන්දුවල නිරන්තරයෙන් උපුටා දක්වනු ලැබේ.'[306] එහෙයින්, ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය රාමුව සහ නීති විද්‍යාව සිංහල-බෞද්ධ ජාතියට විශේෂ ස්ථානයක් ප්‍රදානය කරන අතර, මෙය සිංහල-බෞද්ධයින්ගේ හිමිකාරීත්ව සංකීර්ණය කෙරෙහි දායක වී තිබේ.

සිංහල-බෞද්ධ හිමිකාරීත්වය පිළිබඳ සංකල්ප 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිමත් ලේඛනය තුළ පිළිබිඹු වී මෙන්ම යටපත් වී තිබෙනු ද දැකිය හැකිය. එක් අතකින් ගත් විට මෙකී අදහස් බුද්ධාගමට ප්‍රමුඛස්ථානය දෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 ව්‍යවස්ථාව තුළ පිළිබිඹු වී තිබේ. අනෙක් අතින්, සිංහල-බෞද්ධ හිමිකාරීත්වය, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවවේ විධිමත් ලේඛනය ඉක්මවා යමින් සමාජ-දේශපාලන පරිචයක් හරහා පිට වන, ශ්‍රී ලංකාවේ 'දේශපාලනික ව්‍යවස්ථාව' ලෙස හඳුන්වන සංකල්පය නිර්මාණය කර තිබේ. එනම්, අසංග වැලිකල නිරීක්ෂණය කරන අන්දමට මෙම 'දේශපාලන ව්‍යවස්ථාව උපදින්නේ සිංහල-බෞද්ධ දේශජවාදය පිළිබඳ මිත්‍යාමය-ඓතිහාසික ලෝක දැක්ම' තුළිනි. එය 'නෛතික ව්‍යවස්ථාවෙහි වගන්ති තුළ පිළිබිඹු වන නෛතික නූතනත්වය' නිරන්තරයෙන් යටපත් කරයි.[307]

ඉන් අනතුරුව එළඹෙන ගැටළුව නම් මෙම හිමිකාරීත්ව සංකල්පය ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය මුල් බැස ගැනීමට මඟ පාදන්නේ කෙසේද යන්නයි. මෙය පළමුවෙන්ම රට තුළ, සිංහල-බෞද්ධයින් තමන් 'සත්කාරකයින්' ලෙස ද, අනෙක් සියලු කණ්ඩායම් 'ආගන්තුකයින්' ලෙස ද සලකන 'සත්කාරක-ආගන්තුක' ගතිකයක් නිර්මාණය කරයි. 'සත්කාරකයා' එසේ පිළිගනු ලැබීමට උරුමකම් කියන අතර, 'ආගන්තුකයින්'ට ගරුත්වයෙන් සහ ඉවසීමෙන් සළකනු ලබතැයි අපේක්ෂා කෙරේ. පූර්ව-නූතන යුගයේ දී ද මෙම ගතිකය නිරීක්ෂණය කරනු ලබා ඇති අතර, 'එක් හෙජමොනික ආගමික රාමුවක් තුළ' සාමාන්‍යයෙන් මෙහෙයවනු ලැබීය.[308] පවත්නා බල ව්‍යුහයන්ට අභියෝග නොකරන තාක්, විවිධ ආගමික පරිචයන් අඩු වැඩි වශයෙන් 'ඉවසා' සිටින ලදී. ඇත්තෙන්ම, පෞරාණික බෞද්ධ ශිෂ්ටාචාරයන්හි දී පවා එබඳු ඉවසා සිටීම් නිරීක්ෂණය කළ හැකි විය. නිදසුනක් ලෙස, බෞද්ධ රජු අශෝක අනෙකුත් ආගමික පරිචයන් 'අති මහත් ' ලෙස ඉවසා සිටීම ප්‍රගුණ කළ බව පැවසේ.[309] 'සත්කාරක-ආගන්තුක' ගතිකය තුළ ඉවසීම පිළිබඳ අදහසේ පැහැදිලි සීමාවන් ඉස්මතු වන්නේ 'ආගන්තුකයා' එම ගතිකයට වෙනසක් ඉල්ලා සිටින - වැඩි ස්වාධිපත්‍යයක් සඳහා දෙමළ ඉල්ලීම වැනි - හෝ 'සත්කාරකයාගේ' අධිපතිත්වය යටපත් කරන - මුස්ලිම් වෙළඳ සාර්ථකත්වය හෝ ක්‍රිස්තියානි අන්‍යාගමිකකරණය වැනි - අවස්ථාවල දී ය. මෙම උදාහරණවල දී 'සත්කාරක-ආගන්තුක' ගතිකය 'සත්කාරක-

306 එම.

307 අසංග වැලිකල, 'Ethnocracy or Republic? Paradigms and Choices for Constitutional Reform and Renewal in Sri Lanka' (2015) 4(1) *The South Asianist* 1–24, at 10.

308 හයිනර් බීල්ෆෙල්ට්, නසිලා ගනියා සහ මයිකල් වීනර්, *op. cit.* at 5.

309 එම.

ආක්‍රමණික' ගතිකයක් බවට පත්වේ. සමාජ-දේශපාලනික පිළිවෙල ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ප්‍රචණ්ඩ මාර්ග අනුගමනය කරන්නේ මෙම අවස්ථාවේ දී ය. ශ්‍රී ලංකාවේ මෙබඳු ප්‍රචණ්ඩත්වයන් යුක්ති සහගත කරනු ලැබීමට මිථ්‍යාමය-ඓතිහාසික මූලයන් යොදා ගනු පෙනේ. ඩි වොටා නිරීක්ෂණය කරන අන්දමට, දුටුගැමුණු මිථ්‍යා කතාව 'ශතවර්ෂ දෙකක් තිස්සේ සිංහලයින් සහ දමිළයින් ප්‍රතිමල්ලවයින් ලෙස සිටි බව විශ්වාස කිරීමට (අවිශ්වාස සහගත) සන්දර්භයක් සපයනවා පමණක් නොව, ධර්මය සුරැකීමට සහ පෝෂණය කිරීමට අත්‍යවශ්‍ය නම්, සිංහල නොවන්නන් අමනුෂ්‍යයින් බවට පත් කිරීම ද යුක්ති සහගත කරනු ලබයි.[310]

මෙබඳු ප්‍රචණ්ඩත්වයකට අතීත උදාහරණයක් වන්නේ 1915 මුස්ලිම් විරෝධී කෝළාහල යි. මයිකල් රොබර්ට්ස් නිරීක්ෂණය කරන අන්දමට සිංහල-බෞද්ධයින් විසින් යෝනකයින් දකිනු ලැබුවේ සිංහල බෞද්ධයින්ට හිමිව තිබූ 'ධනය සූරා ගනිමින් සිටි, ආර්ථිකමය ලෙස කෑදර, කපටි' පිරිසක් ලෙසය.[311] කෝළාහලවල පිටුපසින් සිටි බලවේග බෞද්ධයින් පමණක් නොව සිංහල ද වූ ජනවාර්ගික-ආගමික අනන්‍යතාවක් උකහා ගත් තැනැත්තන් යයි ඔහු පැහැදිලි කරයි.[312] මේ අතරතුර, එම්. ඒ. නුහුමාන් සඳහන් කරන්නේ බ්‍රිතාන්‍ය යටත් විජිත ප්‍රතිපත්ති මුස්ලිම් පක්ෂපාතීත්වය දිනා ගැනීම සඳහා නිර්මාණය කරන ලද බවයි. නිදසුනක් ලෙස, මුස්ලිම් වැසියන්ට ධනය අත්පත් කර ගැනීමට ඉඩ සලසමින්, ලන්දේසීන් විසින් මුල දී පනවා තිබූ පුද්ගල බද්ද අහෝසි කිරීම දැක්විය හැකිය.313 ඔහු තර්ක කරන අන්දමට, සාර්ථක ව්‍යාපාරික ප්‍රජාවක් ලෙස මුස්ලිම්වරුන් නැගී ඒම 'සිංහල වෙළඳ ධනපතීන්ගේ ශක්තිමත් සහයෝගය ලද' සිංහල බෞද්ධ ජාතිකවාදීන්, මුස්ලිම්-වරුන්ට එරෙහිව කැළඹිලි ඇති කිරීමට ක්ෂණිකව පෙළඹවීය.[314] නිදසුනක් ලෙස, 1915 සිංහල-බෞද්ධ පුනර්ජීවන නායක අනගාරික ධර්මපාල මෙසේ ලිවීය:

> ෂයිලොක් ආකාරයේ පිටස්තර වැසියන් වූ මුහම්මද්වරු යුදෙව්වන් මෙන් සමෘද්ධිමත් වූහ. වසර 2358ක මුතුන් මිත්තන් ඇති භූමි පුත්‍රයින් වූ සිංහලයින් පිටස්තර ආක්‍රමනිකයින්ගෙන් ස්වකීය රට ගලවා ගැනීමට ලේ ගංගාවන් හෙලූහ....බ්‍රිතාන්‍ය ඇසට ඔවුන් පිටස්තරයින් පමණි. ලංකාවට

310 ඩි වොටා, *Sinhalese Buddhist Nationalist Ideology*, *op. cit.* at 8ග කතුවරයා සඳහන් කරන්නේ, එළාරට එරෙහි සටනේ දී ඝාතනය කළ 'මිලියනයක්' වැසියන් පිළිබඳව පසුතවුනු බව දුටුගැමුණු රජු පිළිබඳ මහාවංශ කතාන්තරය තුළ සඳහන් වන බවයි. ඔහු අස්වැසූ බෞද්ධ භික්ෂූන් පිරිසක් ප්‍රකාශ කළේ මෙහි මරා දමා ඇත්තේ මිනිසුන් එකහමාරක් පමණක් බව පවසමිනි.

311 මයිකල් රොබර්ට්ස්, 'Teaching Lessons, Removing Evil: Strands of Moral Puritanism in Sinhala Nationalist Practice' (1996) 19 *South Asia: Journal of South Asian Studies* (Special Issue) 205-220, at 207.

312 එම. at 208.

313 එම්. ඒ. නුහුමාන් 'Sinhala Buddhist Nationalism and Muslim Identity: One Hundred Years of Conflict and Coexistence' in John Clifford Holt (ed.), *Buddhist Extremists and Muslim Minorities: Religious Conflict* (Oxford University Press 2016), at 27.

314 එම at 28.

> පැමිණි අතීත දකුණු ඉන්දීය පිටස්තර මොහාම්මද්වරු වෙළඳාම කෙරෙහි කිසිදු පළපුරුද්දක් නැති අත්හැර දමනු ලැබූ ගම්වැසියන් දුටුවහ. ප්‍රතිඵලය නම් මොහම්මද්වරු සඵල වීමත් භූමි පුත්‍රයින් පිරිහීමත්ය.[315]

ප්‍රජාවන් අතර ආතතීන් සහිත මේ පසුබිම මත, බෞද්ධ පෙරහැරක් මුල් කරගත් ආරවුලක් නිසා 1915 දී මුස්ලිම් විරෝධී කෝලාහල හට ගත්තේය.[316] පල්ලිය පසු කර යන විට බෞද්ධ පෙරහැර 'ශබ්ද පූජාව' නැවැත්විය යුතු යයි මුස්ලිම්වරු තර්ක බල කළහ. මෙම ඉල්ලීම අනම්‍ය සහ අයුක්තිසහගත එකක් යයි සිංහල-බෞද්ධන් විසින් සළකන ලදී. රොබර්ට්ස් විස්තර කරන්නේ 'භූමියෙහි ආගම' ලෙස බුද්ධාගම සතු වූ අධිපතිවාදී තත්ත්වයට එල්ල විය හැකි යයි පෙනුණු මුස්ලිම් තර්ජනය, මුස්ලිම් ප්‍රජාවට එරෙහි (සිංහල) දූක්ගැනවිලි අඥෝනාවන්' සමඟ එක්ව, ප්‍රජා ආතතීන් සඳහා අවශ්‍ය පසුබිම සකස් කළේය යනුවෙනි.317 එහෙයින් 1915 කෝලාහල වූ කලී, සිංහල-බෞද්ධයින් හා සුළුතර කණ්ඩායමක් අතර අවසානයේ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වයෙන් අවසන් වූ, 'සත්කාරක-ආගන්තුක' ගතිකයේ බිඳ වැටීම පිළිබඳ මුල්කාලීන නිදර්ශනයකි.

'ordinary virtues' නම් මයිකල් ඉග්නාටිෆ්ගේ මෑතකාලීන වියමන, සමාජයක මෙකී 'සත්කාරක-ආගන්තුක' ගතිකයන් ඉස්මතු වන්නේ මන්දැයි වටහා ගැනීමට උදව් වේ. ඉග්නාටිෆ් තර්ක කරන අන්දමට 'විශ්වීය' සදාචාරාත්මක සහජ ඥානය පුද්ගලයින්ට පහසුවෙන් හිමි වන්නක් නොවේ; 'ස්වකීය' අයිතිය පිළිබඳව ඔවුන්ට ශක්තිමත් හැඟීමක් පවත්නා නමුත් 'අනෙකා' සම්බන්ධයෙන් එසේ නොමැත.[318] එහෙයින් ජනවාර්ගිකත්වය සහ ආගම සම්බන්ධ අනන්‍යතා සලකුණු කිරීම්, අත්පත් කර ගැනීම සහ අයිතිය පිළිබඳ ඉල්ලීම් බවට ඉක්මනින් විකාශනය විය හැකි අතර, මෙකී සලකුණු කිරීම්වලින් පිටත ප්‍රජාවන් 'අනෙකා' ලෙස නම් කෙරේ. ශ්‍රී ලංකාවේ සිදු වූ පරිද්දෙන් 'සත්කාරක-ආගන්තුක' ගතිකයන් ඉස්මතු වන විට සම්පත්, දේශපාලන හෝ සමාජ-සංස්කෘතික පරිචයන් මත සිදු වන අනන්‍යතා පදනම් වන තරඟකාරීත්වයන් ප්‍රචණ්ඩත්වය දක්වා ඉහළ යා හැකිය.

බෞද්ධ දර්ශනයේ එන 'අවිහිංසාවාදී' අදහස් ප්‍රචණ්ඩත්වය මැඩ පැවැත්වීම සඳහා ප්‍රමාණවත් නොවන බව සඳහන් කිරීම වටී. මීට පටහැණි ලෙස, රිචර්ඩ් ගොම්බ්‍රිච් සහ

---

315 එම. at 29 ආනන්ද ගුරුගේ උපුටා දක්වමින් (ed.), *Return to Righteousness: A Collection of Speeches, Essays and Letters of Anagarika Dharmapala* (Department of Government Printing 1965).

316 කුමාරි ජයවර්ධන, 'Economic and Political Factors in the 1915 Riots' (1970) 29(2) *The Journal of Asian Studies* 223-233.

317 රොබර්ට්ස්, *op. cit.* at 208. Also see Michael Roberts, *Exploring Confrontation – Sri Lanka: Politics, Culture and History* (Harwood Academic Publishers 1994) at 158.

318 මයිකල් ඉග්නාටිෆ්, *The Ordinary Virtues: Moral Order in a Divided World* (Harvard University Press 2017). The present author had the benefit of hearing Michael Ignatieff speak on this new publication during a lecture titled 'Human Rights, Global Ethics and the Ordinary Virtues' on 27 October 2016 at Merton College, University of Oxford. Also see Michael Ignatieff, 'Human Rights, Global Ethics and the Ordinary Virtues' (2017) 31(1) *Ethics & International Affairs* 3-16, at 7.

ගණනාත් ඔබේසේකර වැනි ශාස්ත්‍රඥයින් තර්ක කරන්නේ සිංහල-බෞද්ධ ජාතිකවාදයේ දෘෂ්ටිවාදය 'බෞද්ධ සංස්ථාපනයේ කේන්ද්‍රීය මූලය වනාහී ප්‍රචණ්ඩත්වය' බවට පත් කරනු ලැබීමට හේතු වී ඇති බවයි.[319] ඇත්තෙන්ම ඔබේසේකර නිරීක්ෂණය කරන්න අන්දමට, බෞද්ධයින් ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය සිදු කරන්නේ කෙසේද යන ප්‍රශ්නයම අයෝග්‍ය එකකි.[320] ඔහු මෙසේ විස්තර කරයිඃ 'ජාතිකකට වින කරන පුළුල් සමාජීය සහ ආර්ථික විපත්වලට ගොදුරු නොවන ලෝකයේ වෙනත් ආගමකින් බුදු දහම වෙනස් නොවේ.'[321] ජයදේව උයන්ගොඩ සඳහන් කරන්නේ සිංහල-බෞද්ධත්වය විසින් 'අවිහිංසාවාදී සමාජ දෘෂ්ටිවාදයක් විකාශනය සඳහා කිසිදු වැදගත් දායකත්වයක් සපයා නොමැති බවය.[322] ඔහු තර්ක කරන අන්දමට මීට පටහැණි ලෙස සිංහල-බෞද්ධ 'ඓතිහාසිකකරණ සම්ප්‍රදාය සහ දෘෂ්ටිවාදය, ජනවාර්ගික දේශපාලනික ප්‍රචණ්ඩත්වයට සහයෝගය දැක්වීමෙහි උරුමකම් කියයි.'[323] එහෙයින් බෞද්ධයින් ලෙස හඳුනා ගන්නා තැනැත්තන්ට බොහෝ විට ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය සිදු කිරීමට හැකියාව ඇත.

මෙම ඉහළින් පවතින සන්දර්භය තුළ, බොහෝ සිංහල-බෞද්ධයින්ගේ හිමිකාරීත්ව සංකීර්ණය සහ එකී හිමිකාරීත්වය තුළ මුල් බැසගත් ජාතිකවාදී දෘෂ්ටිවාදයේ නැගී ඒම, දේශපාලන බලය පවත්වා ගැනීමේ මාර්ගයක් ලෙස ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය භාවිතා කිරීම කෙරෙහි මඟ පාදා තිබේ. එහෙයින්, ශ්‍රී ලංකාවේ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය තුරන් කිරීම සඳහා සිංහල-බෞද්ධ හිමිකාරීත්වයේ පරස්පර අදහස් පිළිග ැනීම සහ එයට මුහුණ දීම අවශ්‍ය වන්නේය.

### 3.2.2 පැවැත්ම පිළිබඳ බිය

සිංහල-බෞද්ධ ප්‍රජාව යනු 'සුළුතර සංකීර්ණත්වය සහිත බහුතර ප්‍රජාවක්' ලෙස ස්ටැන්ලි තම්බයියා විග්‍රහ කරයි.[324] යතාර්ථය තුළ ගෝලීය ප්‍රජාවන් වන දෙමළ, මුස්ලිම් සහ ක්‍රිස්තියානි වැනි ශ්‍රී ලංකාවේ අනෙකුත් ප්‍රජාවන්ට වඩා බොහෝ සිංහල-බෞද්ධයින්ට ගැඹුරින් දැනෙන පැවැත්ම පිළිබඳ බිය විසින් සිංහල-බෞද්ධයින් සැබෑ සුළුතරය බවට පත් කරයි. 'භෞමික වශයෙන් සහ ජනගහණයක් වශයෙන් ශ්‍රී ලංකාවේ කුඩා ප්‍රමාණය මෙන්ම, අගතිගාමී ලෙස අර්ථ දක්වනු ලැබූ, ඉන්දියාව සමඟ විශේෂයෙන් දකුණු ඉන්දියාව සමඟ ඇති සම්බන්ධතාවල ස්වභාවය' නිසාද මෙම බිය ඇති විය හැකි යයි ඔහු විස්තර කරයි.[325]

319 ගොම්බ්‍රිජ් සහ ඔබේසේකර, *op. cit.* at x.

320 ඔබේසේකර, 'Buddhism, Ethnicity and Identity', *op. cit.* at 192.

321 එම.

322 ජයදේව උයන්ගොඩ, 'Militarisation, Violent State, Violent Society: Sri Lanka; in Kumar Rupesinghe and Khawar Mumtaz (eds.), *Internal Conflicts in South Asia* (SAGE Publications 1996), at 129.

323 එම.

324 තම්බයියා, *Sri Lanka: Ethnic Fratricide*, *op. cit.* at 92-93.

325 එම

පැවැත්ම පිළිබඳ සිංහල-බෞද්ධ බිය කෙරෙහි හේතු වන සාධක තුනක් හඳුනා ගත හැකිය. මීට පෙර විස්තර කරනු ලැබූ උප කොටසෙහි සඳහන් හිමිකාරීත්ව සංකීර්ණයට මෙය නිසර්ගයෙන්ම සම්බන්ධ වේ. අනිවාර්යයෙන්ම මෙකී සාධක සිංහල-බෞද්ධ හිමිකාරීත්ව සංකල්පය බිඳ දැමීමටත් එහෙයින් පැවැත්ම පිළිබඳ බිය ඇති කිරීමටත් දායක වේ. පළමුවැන්න, ස්වයං නිර්ණය පිළිබඳ දෙමළ ජාතිකවාදී අරගලය සිංහල-බෞද්ධ ප්‍රජාවේ පැවැත්ම පිළිබඳ තර්ජයක් ලෙස අර්ථ දක්වනු ලැබීය. දකුණු ඉන්දියාවේ වෙසෙන අතිමහත් දෙමළ ජනගහණය සමඟ සැළකිය යුතු දෙමළ ඩයස්පෝරා ප්‍රජාවන් වූ කලී, ශ්‍රී ලංකාවේ සිංහල-බෞද්ධ අධිපතිත්වය මුළුමනින්ම නැති වී යාමට හේතුවක් විය හැකි යයි යන බියට දායක වී තිබේ.[326] දෙමළ ජාතිකවාදය වූ කලී 'ප්‍රතිචාරාත්මක සංසිද්ධියක්', එනම්, අනුක්‍රමිකව ශ්‍රී ලංකාවේ රජයන් වැළඳ ගත් 'ජනවාර්ගිකත්ව කේන්ද්‍ර ප්‍රතිපත්තිවලට දැක්වූ ප්‍රතිචාරයක්' ලෙස ශාස්ත්‍රඥන් විසින් හඳුන්වා දී තිබේ.[327] එහෙත්, දෙමළ ජාතිකවාදයේ යුධකාමී ප්‍රකාශ වීම සිංහල-බෞද්ධ පැවැත්ම පිළිබඳ බිය තවදුරටත් මුල් බැස ගැනීමට දායක වී තිබේ. 1985 මැයි මස දී එල්ටීටීඊය විසින් අනුරාධපුරයේ භික්ෂූන් සහ වන්දනාකරුවන් ඇතුළු 146 දෙනෙකු ඝාතනය කළහ; 1987 ජූනි මස අම්පාර අරන්තලාවේ තරුණ භික්ෂූන් 33ක් සහ ඔවුන්ගේ උපදේශක හැගොඩ ඉන්ද්‍රසාර හිමියන් ඝාතනය කළහ; එමෙන්ම, 1998 ජනවාරි මස දී මහනුවර දළදා මාලිගාවට බෝම්බ එල්ල කළහ.[328] නීල් ඩී වොටා නිරීක්ෂණය කරන අන්දමට බලතල බෙදීමට එල්ල වූ සිංහල-බෞද්ධ විරෝධය 'බුදු දහමේ උතුම් ලෙස සැළකු සංකේතයන්ට එල්ටීටීඊය විසින් කරන ලද ප්‍රහාරයන්ට පින්සිදු වන්නට ශක්තිමත් විය.'[329]

දෙවනුව, ශ්‍රී ලංකාවේ මුස්ලිම් ජනගහණයේ පෙනෙන සුළු වර්ධනය සිංහල-බෞද්ධයින්ගේ සංඛ්‍යාත්මක බහුතරය පවත්වා ගැනීමට තර්ජනයක් ලෙස හඳුනා ගන්න ලදී. සංඛ්‍යාත්මකව ගත් විට, 1981 සහ 2012 අතර කාල පරිච්ඡේදයේ ශ්‍රී ලංකාවේ යෝනක ජනගහණයේ ප්‍රමාණය මුළු ජනගහණයෙන් 7% සිට 9% දක්වා ඉහළ ගොස් තිබේ.[330] මෙම පෙනෙන සුළු වර්ධනය සමඟ සම්බන්ධ වූ තවත් කරුණක් නම් ශ්‍රී ලංකාවේ 'වෙළඳාම පාලනය' මුස්ලිම් ප්‍රජාව විසින් සිදු කරන්නේය යන කරුණයි. සිංහල-බෞද්ධ සහ මුස්ලිම් ප්‍රජාවන් අතර ගැටුම් සිතියම්ගත කිරීමේ අධ්‍යයනයන් බොහෝ විට පෙන්වා දෙන්නේ එබඳු

326 මෙම ගැටලුව පිළිබඳ ගැඹුරු සාකච්ඡාවක් සඳහා බලන්න රාජන් හූල්, 'The Tamil Secessionist Movement in Sri Lanka (Ceylon): A Case of Secession by Default?' in Metta Spencer (ed.), *Separatism: Democracy and Disintegration* (Rowman & Littlefield1998).

327 ඩී වොටා, *Sinhalese Buddhist Nationalist Ideology*, *op. cit.* at 37. Also see Robert N. Kearney, *Communalism and Language in the Politics of Ceylon* (Duke University Press 1967), Tambiah, *Sri Lanka: Ethnic Fratricide*, *op. cit.*; Nigel Harris, *National Liberation* (I.B. Tauris 1990); M. R. Narayan Swamy, *Tigers of Lanka: From Boys to Guerrillas* (South Asia Books 1995).

328 ඩී වොටා, *Sinhalese Buddhist Nationalist Ideology*, *op. cit.* at 38.

329 එම. එමෙන්ම බලන්න බැස්ටියන්, *op. cit.* at 9. බැස්ටියන් නිරීක්ෂණය කරන්නේ 2009 එල්ටීටීඊය පරාජය කිරීම සහ 'කේන්ද්‍රීය රාජ්‍යයක් තහවුරු කර ගැනීම' මගින් සිංහල-බෞද්ධ ජාතිකවාදයේ උත්තරීතරත්වය ශක්තිමත් වූ බවයි.

330 ගුණතිලක, *Confronting the Complexity of Loss*, *op. cit.* at 17.

ආතතීන් යටින් වෙළඳ පසමිතුරුතා සහ තරගකාරීත්වය පවතින බවය.[331] මෙම අදහස් සහ ආතතීන් විසින්, බහුතර ජනගහනය වෙත පශ්චාත්-යුද ආර්ථික සමෘද්ධිය ළඟා කර දීමට රජය අසමත් වීමේ බිල්ල බවට මුස්ලිම් ප්‍රජාවන් පත් කොට තිබේ.[332] මෙම අධ්‍යයනයේ පළමු පරිච්ඡේදය තුළ සාකච්ඡා කොට ඇති පරිදි, විශේෂයෙන්ම මුස්ලිම් බහුතරයක් වෙසෙන ප්‍රදේශවල මුස්ලිම් සංස්කෘතික පරිචයන්ගේ වැඩිපුර පෙනී යාම මෙම බිය තීව්‍ර කොට තිබේ.[333] නිදසුනක් ලෙස, 'ස්වකීය අනන්‍යතාව අහිමි වනු ඇති යන බියජනක හැඟීම', සිංහල බෞද්ධයින් සංඛ්‍යාත්මකව අඩුවෙන් වෙසෙන දිස්ත්‍රික්කයක් වන අම්පාරේ සිංහලයින් අතර පවතින බව නිරීක්ෂණය කොට තිබේ. එමෙන්ම, කාත්තන්කුඩි වැනි ප්‍රදේශවල කාන්තාවන් නිකාබය ඇඳීම වැනි ගතානුගතික පරිචයන් ඉහළ ගොස් ඇත.[334] මොහොමඩ් ෆස්ලාන් සහ නදීන් වන්නියසිංහම් විසින් නිරීක්ෂණය කළ අන්දමට, මෙබඳු දෘශ්‍ය අනන්‍යතා සලකුණු 'මුස්ලිම් ජනගහණය ඉහළ ගොස් ඇතැයි යන මායාව නිර්මාණය කළ අතර, මුස්ලිම් ප්‍රජාවේ අභිප්‍රායන් සහ එහි 'පීඩාකාරී' සංස්කෘතිය පිළිබඳ බහුතර ප්‍රජාවේ බියට එක් වී තිබේ.'[335] එමෙන්ම, මෙම පරිචයන් ශ්‍රී ලංකාවේ වහාබිවාදය ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගත් සෞදි අරාබියානු අරමුදල් සපයන්නන්ගේ මුදල් සහ සහයෝගය ලබා ගැනීමට ඇති තරගය විසින් මෙම පරිචයන් දිරි ගන්වනු ලැබ ඇත.[336] ඒ අනුව, පැහැදිලිව පෙනී යන මුස්ලිම් ප්‍රජාව අතර ගැටුම සහ මුස්ලිම් කල්ලිවාදය, රැඩිකල් ඉස්ලාමය සමග සම්බන්ධ වෙමින්, පැවැත්ම පිළිබඳ සැබෑ තර්ජනයක් එල්ල කරන්නන් ලෙස මුස්ලිම් ප්‍රජාව දෙස බැලීමේ සිංහල-බෞද්ධ සැකය වැඩිදියුණු කිරීමට දායක වී තිබේ. අම්පාර, කොළඹ සහ ගාල්ල ඇතුළු ප්‍රදේශවල ගැටුම් සිතියම්ගත කිරීමේ අධ්‍යයනයන්හි මෙම සැකය නිරීක්ෂණය වී තිබේ.[337]

තුන්වනුව, ක්‍රිස්තියානි අන්‍යාගමිකකරණය ශ්‍රී ලංකාවේ සිංහල-බෞද්ධ සංඛ්‍යාත්මක සහ සංස්කෘතික අධිපතිත්වය කෙරෙහි තර්ජනයක් එල්ල කොට තිබේ.[338] ක්‍රිස්තියානි ධර්ම ප්‍රචාරය බොහෝ විට සැළකිය යුතු බෞද්ධයින් ප්‍රමාණයක් ක්‍රිස්තියානි ආගමට හරවා ගනු ලැබූ යටත් විජිත මිෂනාරි ව්‍යාපෘති සමග සම්බන්ධ වන නිසා, මෙම තර්ජනයට ඓතිහාසික මූලයන් පවතී. බුදු දහමට එරෙහිව යටත් විජිත පරිපාලනයන් විසින් එල්ල කළ භෞතික, භෞතික නොවන සහ ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වය පිළිබඳ ඓතිහාසික මතකයන් ද එමගින්

331 ජයසිංහ, *op. cit.* at 5-6.

332 අහිලන් කදිරගාමර්, 'The Political Economy of Anti-Muslim Attacks', *The Island*, 2 March 2013, at http://www.island.lk/index.php?page_cat=articledetails&page=article-details&code_title=73829[last retrieved 13 October 2017]; Jayasinghe, *op. cit.* at 6.

333 ජයසිංහ, *op. cit.* at 3.

334 2017 මාර්තු 31 වන දින සයින්තමරුතු මොහිදීන් ජුම්මා මහ පල්ලියේ භාරකරුවන් සමග කරන ලද ඉලක්කගත සම්මුඛ සාකච්ඡාවේදී මෙය නිරීක්ෂණය කරන ලදී.

335 ෆස්ලාන් සහ වන්නියසිංහම්, *op. cit.*, at 1.

336 එම. at 22.

337 ජයසිංහ, *op. cit.* at 7.

338 බෙන්ජමින් ශෝන්තාල් *Buddhism, Politics and the Limits of Law*, *op. cit.* at 224.

පුබුදු කරවයි..[339] නිදසුනක් ලෙස, පෘතුගීසි පරිපාලනය යටතේ බෞද්ධ විහාර අත්පත් කර ගැනීම සහ විනාශ කිරීම පිළිබඳව කේ. එම්. ද සිල්වා ලියයි.[340] ඔහු තර්ක කරන අන්දමට, පෘතුගීසීන් යටතේ රෝමානු කතෝලික ධර්මය ස්ථාපනය කිරීම වූ කලී බුදු දහම ඇතුළු සාම්ප්‍රදායික ආගම් අදහන්නන්ට එල්ල කළ 'අතිමහත් වේදනාකාරී සහ අවමන් සහගත' ක්‍රම මඟින් සිදු කරනු ලැබූවකි.[341] බ්‍රිතාන්‍යයින් යටතේ ද බෞද්ධයින් ප්‍රචණ්ඩත්වයට මුහුණ දුන්හ. නිදසුනක් ලෙස, 1815 උඩරට ගිවිසුම අත්සන් කිරීමෙන් අනතුරුව කාලයේ බ්‍රිතාන්‍යයින් විසින් බෞද්ධ සහ හින්දු ආගමික ස්ථාන කොල්ල කෑ බවට සාක්ෂි තිබේ.[342]

අද වන විට රෝමානු කතෝලික පල්ලිය සහ ලංකා පල්ලිය වැනි ප්‍රධාන ධාරාවේ පල්ලි තුළ අන්‍යාගමිකකරණය දක්නට නොලැබුණ ද,[343] කුඩා පල්ලි මෙම 'පැවැත්ම පිළිබඳ තර්ජනය' තවදුරටත් එල්ල කරමින් සිටී.[344] ඇත්තෙන්ම, ප්‍රධාන ධාරාවට අයත් නොවන ක්‍රිස්තියානි කණ්ඩායම්වල වැඩි වෙමින් යන අන්‍යාගමිකකරණය, සිංහල-බෞද්ධ බහුතරයට පමණක් නොව, රෝමානු කතෝලික පල්ලිය වැනි ප්‍රධාන ධාරාවේ ක්‍රිස්තියානි පල්ලිවලට ද තර්ජන එල්ල කරයි. එහෙයින්, ශ්‍රී ලංකාවේ රෝමානු කතෝලික පල්ලියේ නායකත්වය බොහෝ විට කුඩා ක්‍රිස්තියානි කණ්ඩායම් ප්‍රචණ්ඩත්වයට මුහුණ දෙන විට නිහඬව සිට ඇත.[345]

ස්වකීය බලය, සංඛ්‍යාත්මක වරප්‍රසාදය සහ සංස්කෘතික අධිපතීත්වය සුළුතර කණ්ඩායම් අතින් බරපතල තර්ජනයකට ලක් වී ඇතැයි යන පුළුල් බිය සිංහල-බෞද්ධ බහුතරය තුළ ඇති කිරීමට මෙකී සාධක එක්රැස්ව දායක වී තිබේ. දශක ගණනාවක් තිස්සේ මෙම බිය, ත්‍රස්තවාදයට එරෙහිව සටන් කිරීම සහ ජාතික ආරක්ෂාව සුරැකීම යන රැවටීම යටතේ, දෙමළ ජාතිකයින්ට එරෙහි රජයේ අනුග්‍රහය ලැබූ ප්‍රචණ්ඩත්වය සාධාරනීකරණය කොට තිබේ.[346] පශ්චාත්-යුධ සමයේ මෙම බිය මුස්ලිම් සහ ක්‍රිස්තියානි වැසියන්ට එරෙහි ජනවාර්ගික

339 එම

340 කේ. එම්. ද සිල්වා, *A History of Sri Lanka* (Penguin Books India 2005), at 258.

341 එම. at 128.

342 සුජිත් සිවසුන්දරම්, 'Cosmopolitanism and Indigeneity in Four Violent Years: The Fall of the Kingdom of Kandy and the Great Rebellion Revisited' in Zoltan Biedermann and Alan Strathern (eds.), *Sri Lanka at the Crossroads of History*, at 199.

343 නිර්මාල් රංජිත් දේවසිරි, *New Buddhist Extremism and the Challenges to Ethno-Religious Coexistence in Sri Lanka* (ICES 2016), at 16ග කතුවරයා තර්ක කරන්නේ: 'ශ්‍රී ලංකාවේ බෞද්ධාගම සහ ක්‍රිස්තියානි ආගම අතර ආතතියට ඉතිහාසයක් පවතින නමුත්, එකිනෙකාගේ බලපෑම් කලාපයන් පරයා නොයන බවට මෙම ආගමික සංස්ථාපනයන් දෙක නිහඬ මෑත දශකයන් තුළ ගිවිසුමකට පැමිණ තිබේ. මෙම නිහඬ ගිවිසුමේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රධාන ධාරාවේ ක්‍රිස්තියානීන් සහ බෞද්ධයින් අතර ප්‍රධාන ගැටුම් පැන නැඟී නැත.'

344 එම. at 6.

345 නිදසුනක් සඳහා බලන්න, 2017 ජුනි 17 වන දිනකාදිනල් මැල්කම් රංජිත් පියතුමා සමඟ පැවැත්වූ රූපවාහිනී සම්මුඛ සාකච්ඡාව. එහිදී යම් ක්‍රිස්තියානි කණ්ඩායම්වලට එරෙහි ප්‍රචණ්ඩත්වය පැන නඟින්නට හේතු විය හැක්කේ ඔවුන් ක්‍රිස්තියානීන් වාසය නොකරන ප්‍රදේශවල පල්ලි ගොඩ නැංවීම නිසා විය හැකි යයි කොළඹ අගරදගුරු පවසයි. බලන්න, 'No such attacks on churches - Cardinal Ranjith', *adaderana.lk*, 17 June 2017, at http://www.adaderana.lk/news/41372/no-such-attacks-on-churches-cardinal-ranjith[last retrieved 13 October 2017].

346 පින්ටෝ-ජයවර්ධන සහ තවත් අය, op, cit. at 279-280.

-ආගමික ප්‍රචණ්ඩත්වයට පදනම් විය. එහෙයින් යුධකාමී කණ්ඩායම් සහ සිංහල-බෞද්ධ ජාතිකවාදී දෘෂ්ටිවාදයන්, ආගමික සුළුතරයට එරෙහි ප්‍රචණ්ඩත්වය යුක්ති සහගත කිරීමට සහ උසි ගැන්වීමට පැවැත්ම පිළිබඳ බිය උපයෝගී කර ගෙන තිබේ. හලාල් සහතිකයට එරෙහි ව්‍යාපාරය,[347] නිකාබය තහනම් කිරීමේ ව්‍යාපාරය සහ 'ආචාර ධාර්මික නොවන අන්‍යාගමිකකරණය' වැනි වෛරී ව්‍යාපාර ගණනාවක්, බොහෝ සිංහල-බෞද්ධයින් අතර පවතින මෙම පැවැත්ම පිළිබඳ බියට අනුගත වන ලෙස ප්‍රවේශමෙන් සැලසුම් කරන ලද ඒවා වෙයි. එමෙන්ම, මුස්ලිම්වරුන් විසින් නිෂ්පාදනය කරන ලද භාණ්ඩ සිංහල-බෞද්ධ කාන්තාවන් වඳ වීමට හේතු වන්නේය යන වැරදි තොරතුරු සහිත ව්‍යාපාරය වැනි මෙබඳු යුධකාමී කණ්ඩායම්වල ප්‍රචාරණ ද පැවැත්ම පිළිබඳ බිය අනුව ක්‍රියාත්මක වෙයි.[348] මුස්ලිම් ව්‍යාපාර සහ ආගමික ස්ථානවලට හා ක්‍රිස්තියානි පාදිලිතුමන්ට සහ පල්ලිවලට එරෙහිව භෞතික සහ භෞතික නොවන පැතිරුණු ප්‍රචණ්ඩත්වයක් මෙකී ව්‍යාපාර සහ බිය විසින් මෙහෙයවා තිබේ. එහෙයින්, සිංහල-බෞද්ධ ප්‍රජාවේ සමහරුන් නිරන්තරයෙන්ම සිය පැවැත්ම පිළිබඳ බිය සමනය කිරීමේ මාර්ග ලෙස ප්‍රචණ්ඩත්වය භාවිතා කිරීමේ ආශාවට මුහුණ දෙති. නිර්මාල් රංජිත් දේවසිරි තර්ක කොට ඇති අන්දමට, මෙම හිංසනය 'සිංහල-බෞද්ධ ජාතිකවාදී පරිකල්පනයේ මූලික ආශාව' ලෙස මෙම ප්‍රචණ්ඩත්වය ඉස්මතු වී තිබේ.[349]

### 3.2.3 බෞද්ධ ආශ්‍රමික ව්‍යතිරේකීත්වය (Buddhist monastic exceptionalism)

ශ්‍රී ලංකාවේ බෞද්ධ භික්ෂූන් 'අති ගෞරවනීය ලෙස සැළකෙන'[350] අතර, එහෙයින් ශ්‍රී ලංකා සමාජය තුළ ව්‍යතිරේකී ස්ථානයක් දරයි. නීල් ඩි වොටා සහ ජේසන් ස්ටෝන් විස්තර කරන අන්දමට, සිවුර මඟින් බුදුන් සහ ධර්මය (සසුන) නියෝජනය කරන හෙයින්[351] බෞද්ධ භික්ෂූන්ගේ ක්‍රියාවන් - හිත්වක්කාර අයගේ පවා - ඉවසනු ලබන බවයි. 'බුදු දහම සහ රාජ්‍යය අතර ඓතිහාසික සම්බන්ධතා, භික්ෂූන් බලපෑම්සහගත අය බව තහවුරු කොට' ඇති බව ද ඔවුහු නිරීක්ෂණය කරති.[352] එහෙයින්, සිංහල බෞද්ධයින්ගේ හිමිකාරීත්ව සංකීර්ණයේ සහ පැවැත්ම පිළිබඳ බියෙහි ඇති වීමට හෝ අහෝසි කර දැමීමට බෞද්ධ භික්ෂූන්ගේ සමාජ-දේශපාලනික ක්‍රියාකාරීත්වයේ බලපෑම අධ්‍යයනය කළ යුත්තේ මෙම ආශ්‍රමික ව්‍යාතිරේකීයත්වය පිළිබඳ පසුබිම තුළය.

---

347 ගුණතිලක, *The Chronic and the Acute*, *op. cit.* at 35. යම් නිෂ්පාදන සඳහා මුස්ලිම් නිෂ්පාදකයින් හලාල් සහතිකය ලබා ගැනීමට අවශ්‍ය විය. මෙය වෙළඳපොල ඒකාධිකාරයක් පවත්වා ගැනීමට මුස්ලිම්වරුන්ට ඉඩ දෙන ක්‍රමයක් යයි බොදු බල සේනා වැනි යුධකාමී කණ්ඩායම් විසින් හඳුන්වනු ලැබීය. මන්ද යත්, එසේ සහතිකයක් ලබා ගැනීම නිසා මුස්ලිම් පාරිභෝගිකයින් මුස්ලිම් නොවන නිෂ්පාදන මිලදී නොගනු ඇති හෙයිනි.

348 බලන්න ලුක්මන් හරීස්, 'Un-official Police& Hate Goons Are Back!', *Colombo Telegraph*, 18 May 2017, at https://www.colombotelegraph.com/index.php/un-official-police-hate-goons-are-back/[last retrieved 13 October 2017].

349 දේවසිරි, *op. cit.* at 37.

350 ඩි වොටා සහ ස්ටෝන්, *op. cit.* at 32.

351 එම

352 එම

වල්පොළ රාහුල හිමියන් වැනි ශාස්ත්‍රඥ භික්ෂූන්ගේ ලිවීම් ඔස්සේ බෞද්ධ ආගමික නායකයින්ගේ වත්මන් සමාජ-දේශපාලනික ක්‍රියාකාරීත්වය ඓතිහාසිකාකරණය වී තිබේ.[353] සමාජ සේවය සහ දේශපාලන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ආගමික නායකයින්ගේ භූමිකාව රාහුල තෙරුන් විසින් අවධාරණය කොට තිබේ.[354] බුදුන්ගේ සමයේ සිටම බෞද්ධ භික්ෂූන් සමාජ-දේශපාලනික ක්‍රියාකාරකම්හි යෙදුණේය යන පදනම මත ඔවුන් එම්බිදු කටයුතුවලට මැදිහත් විය යුතු යයි උන් වහන්සේ පවසති.[355] ආශ්‍රමික දේශපාලන පක්ෂ ගොඩ නැංවිය යුතු යයි රාහුල තෙරුන් විසින් අදහස් නොකරන්නට ඇත.[356] එහෙත්, උන් වහන්සේ ඉදිරියට ගෙන ආ ආශ්‍රමික දැක්ම, සිය පක්ෂ සාමාජිකත්වය තුළට බෞද්ධ භික්ෂූන් ඇතුළත් කරර් ගත් ජාතික හෙළ උරුමය වැනි සිංහල-බෞද්ධ ජාතිකවාදී දේශපාලන පක්ෂ නිර්මාණය කිරීමෙහි ලා තීරණාත්මක භූමිකාවක් රඟ දක්වා තිබේ. ඩි වොටා සහ ස්ටෝන් විග්‍රහ කරන්නේ රාහුල හිමියන්ගේ බලපෑම ලද භික්ෂූන්, පාර්ලිමේන්තු දේශපාලනය විනය (භික්ෂු හැසිරීම් නීති) කඩ කිරීමක් ලෙස නොසැළකූ බවත්, ඒ වෙනුවට 'එබඳු ක්‍රියාකාරීත්වය භික්ෂූන් ලෙස කරනු ලබන සිය සේවයේම දිගුවක් ලෙස සැළකූ බවත්' ය.[357]

ජූලියාන් ශෝබර් සඳහන් කරන අන්දමට බෞද්ධ භික්ෂූන් තමන්ව දකින්නේ මහජනතාව ඔවුන්ව දකින්නේ 'ජාතියේ රැකවලුන් සහ ධර්මය සුරකින්නන්' ලෙසය.[358] එහෙයින් ඔවුන්ගේ ක්‍රියාවන් 'බුදු දහමෙන් සුපෝෂිත' ශ්‍රී ලංකාව සුරකීම සහ සිංහල අනන්‍යතාව ආරක්ෂා කිරීම සඳහා වන ක්‍රියාවන් ලෙස හඳුනා ගැනේ.[359] එමෙන්ම, මහාවංශය ලියන ලද්දේ බෞද්ධ භික්ෂූන් විසින් යැයි කියැවේ; එනයින්, නිසර්ගයෙන්ම සංඝයා වහන්සේලා සිංහල-බෞද්ධ ඉතිහාසයේ 'භාණ්ඩාගාරය' ලෙස සළකනු ලැබේ.[360] මෙම සන්දර්භය තුළ විශේෂයෙන්ම බුදු දහම සහ සිංහල අනන්‍යතාව සුරැකීම යන මතුපිට අරමුණ සහිත,

353 සුහයිර්, *op. cit.* 9. Also see WalpolaRahula, *BhiksuvageUrumaya (The Heritage of the Bhikku)* (1946).

354 එම

355 සුහයිර්, *op. cit.* 9. Also see H. L. Seneviratne, 'Buddhist Monks and Ethnic Politics', in ජයදේව උයන්ගොඩ, (ed.), *Religion in Context: Buddhism and Socio-Political Change in Sri Lanka* (Social Scientists' Association 2007), at 88. බලන්න ඩි වොටා සහ ස්ටෝන්, *op. cit.* at 35.

356 වල්පොළ රාහුල ආයතනය භාර ගල්කන්දේ ධම්මානන්ද හිමියන්ට අනුව 1940 ගණන්වල බෞද්ධ භික්ෂූන්ගේ සමාජ-දේශපාලනික ක්‍රියාකාරකම් ඉලක්ක වූයේ නිදහස් අධ්‍යාපනය සුරක්ෂිත කිරීම සඳහාය. එහෙත්, 1950 ගණන්වලදී එම ක්‍රියාකාරකම් දේශපාලනය හැසිරවීම සඳහා වන ජාතිකවාදී න්‍යාය පත්‍රයක් දෙසට හැරුණු අතර, නියම රාහුල දැක්ම දෙසට නැවත හැරුණේ නැත. බලන්න, ධනේෂි යටවර,, '"Respect public opinion" – Ven. GalkandeDhammananda', *The Daily Mirror*, 20 July 2017, at http://www.dailymirror.lk/article/-Respect-public-opinion-Ven-Galkande-Dhammananda-133166.html [last retrieved 5 December 2017].

357 ඩි වොටා සහ ස්ටෝන්, *op. cit.* at 36.

358 ජූලියන් ශෝබර් 'Buddhism, Violence and the State in Burma (Myanmar) and Sri Lanka' in ලිනෙල් ඊ. කාර්ඩි සහ ෂෙල්ඩන් ඩබ්. සයිමන් (eds.), *Religion and Conflict in South and Southeast Asia: Disrupting Violence* (Routledge 2006), at 62.

359 එම

360 ටෙසා ජේ. බර්තොලමියුස් සහ චන්ද්‍රා රිචර්ඩ් ද සිල්වා, 'Buddhist Fundamentalism and Identity in Sri Lanka' in Tessa J. Bartholomeusz and Chandra Richard De Silva (eds.), *Buddhist Fundamentalism and Minority Identities in Sri Lanka* (SUNY Press 1998), at 7.

භික්ෂූන්ගේ සමාජ-දේශපාලනික ක්‍රියාකාරකම් බවට පත් වීමට හෝ ඒවා ශක්තිමත් කිරීමට ආශ්‍රමික ව්‍යාතිරේබීකරණය බල පෑ හැකිය. එම මතුපිට අරමුණ සඳහාම, භික්ෂූන් විසින් ගෙන යන ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය 'යුක්ති සහගත කිරීම සහ දිරි ගැන්වීම'[361] සඳහා මෙම ව්‍යාතිරේබීකරණය උදව් වෙයි.

භික්ෂූන් දේශපාලන කලාපයට ප්‍රවේශ වීම[362] සහ බුදු දහම සඳහා 'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලව සුරකිනු ලැබූ ව්‍යාතිරේබීයත්වය ඇතුළුව විවිධ සන්දර්භයන් තුළ බෞද්ධ 'ව්‍යාතිරේබීයත්වය' ශාස්ත්‍රඥයින් විසින් අධ්‍යයනය කොට තිබේ.[363] එහෙත්, බෞද්ධ ආගමික නායකයින් විසින් සිදු කරනු ලැබූ ප්‍රචණ්ඩත්වය සඳහා වගවීමෙන් මිදීම සම්බන්ධ ව්‍යාතිරේබී තත්ත්වය පිළිබඳව ඇත්තේ අඩු අධ්‍යයනයකි. මෙම ව්‍යාතිරේබීයත්වය පිළිබඳ යම් ඉඟි 1959 අගමැති එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක ඝාතනයෙන් අනතුරුව දක්නට ලැබුණි. තල්දුවේ සෝමරතන නමැති හිමි නමක්[364] විසින් අගමැතිවරයා ඝාතනය කරනු ලැබූ අතර, පසුව ඔහු ඒ සඳහා වරදකරු වී මරණ දණ්ඩනය නියම කරනු ලැබීය. රැඩිකල් ජාතිකවාදී ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙන බවට වූ පොරොන්දුව ඉටු කිරීමට අසමත් වීම නිසා අගමැතිවරයා ඝාතනය කරන ලදැයි සැළකේ.[365] මෙම ඝාතනය වටා ගොඩනංවනු ලැබූ ඓතිහාසික කතාන්තරයට, අගමැතිවරයා විසින් බෞද්ධ භික්ෂූන්ට එරෙහිව පළිගැනීම් නොකළ යුතු යයි මිය යාමට පෙර කරන ලදැයි සැළකෙන ප්‍රකාශයක්ද ඇතුළත්ය.[366] බණ්ඩාරනායක ද බුදු දහම වැළඳ ගත්තකු වූ අතර, දේශපාලනික බුද්ධාගම වැළඳ ගත් පළමු ජාතික නායකයින්ගෙන් කෙනෙක් විය.[367] සරදම් සහගත ලෙස, ඔහුගේ ඝාතකයා වූ සෝමාරාම හිමි එල්ලා මැරීමට දින කිහිපයකට පෙර ක්‍රිස්තියානි ආගම වැළඳ ගත්තේය (එසේ කිරීමට බල කරනු ලැබුවා විය හැකිය).[368] ඒ අනුව, බණ්ඩාරනායක

---

361 නීල් ඩි වොටා, *Sinhalese Buddhist Nationalist Ideology*, *op. cit.* at 10.

362 අයිස්ලින් ෆ්‍රයිඩන්ලන්ඩ්, 'Particularist Goals through Universalist Means' in හිරොකෝ කවනමි (ed.), *Buddhism and the Political Process* (Springer 2016), at 110. ලේඛිකාව තර්ක කරන්නේ බෞද්ධ භික්ෂූන් අදේශපාලනික විය යුතු යයි යන බෞද්ධ විධානයට පටහැණිව, ජාතික හෙළ උරුමය මෙයට ව්‍යාතිරේබී ලෙස දේශපාලනයට එළඹීම යුක්ති සහගත කළ බවයි.

363 බලන්න මැතිව් ජේ. වොල්ටන්, 'Buddhism, Nationalism and Governance' in මයිකල් ජෙරිසන් (ed.), *The Oxford Handbook of Contemporary Buddhism* (Oxford University Press 2016) at 539.

364 මයිකල් හර්ට්ස්බර්ග්, 'The March of the Monks' in Camilla Brautaset and Christopher M. Dent (eds.), *The Great Diversity: Trajectories of Asian Development* (Wageningen Academic Publishers 2013) at 111; චාල්ස් එෆ්. කීස්, 'Theravada Buddhism and Political Violence' in ජේම්ස් කේ. වෙල්මන් (ed.), *Belief and Bloodshed: Religion and Violence Across Time and Tradition* (Rowman and Littlefield 2007), at 155.

365 ඩී. බී. එස්. ජෙයරාජ්, 'The Assassination of Prime Minister S.W.R.D. Bandaranaike 55 Years Ago', *dbsjeyaraj*.com, 1 October 2014, http://dbsjeyaraj.com/dbsj/archives/33515 [last retrieved 13 October 2017].

366 බලන්න ඩී. බී. එස්. ජෙයරාජ්, *SWRD Bandaranaike: Assassination of a Prime Minister*, 25 September 2009, at http://dbsjeyaraj.com/dbsj/archives/1101[last retrieved 13 October 2017].

367 කීස්, *op. cit.* at 155. Also see James Manor, *The Expedient Utopian: Bandaranaike and Ceylon* (Cambridge University Press 1989); ස්ටැන්ලි ජේ. තම්බයියා, *Buddhism Betrayed?: Religion, Politics, and Violence in Sri Lanka* (University of Chicago Press 1992).

368 'Buddhist baptized on eve of execution', *The Times* (London), 5 July 1962, at 10.

ඝාතනය වෙනුවෙන් බෞද්ධ භික්ෂුවක් එල්ලා මරණ ලද්දේ යයි ඉතිහාසය තුළ වාර්තා නොවේ; අපරාධය සඳහා එල්ලා මරණ ලද තැනැත්තා අවසානයේ ක්‍රිස්තියානි ආගම වැළඳ ගත්තකු විය.

ශ්‍රී ලංකාවේ සිංහල-බෞද්ධ ජාතිය ආරක්ෂා කිරීමේ මතුපිට අරමුණ වෙනුවෙන් සිදු කරන ලද ප්‍රචණ්ඩත්වය සඳහා වගවීමෙන් බෞද්ධ ආගමික නායකයින්ට මුක්තිය ලබා දීමේ නැඹුරුතාව බණ්ඩාරනායක ඝාතන කතාන්තරය තුළින් පෙන්නුම් කෙරේ. සෝමාරාම හිමි වැනි විශේෂිත තනි පුද්ගලයින් සම්බන්ධයෙන් මෙම මුක්තිය ක්‍රියාත්මක කළ නොහැකි විට, ඔහු වගවීමෙන් බැදීමට පෙර ඔහුගේ බෞද්ධ අනන්‍යතාව අහිමි කරවන ලදී. මෙම ඓතිහාසික ව්‍යතිරේඛීයත්වය කාලයත් සමඟ දණ්ඩ මුක්ති සංස්කෘතියක් දක්වා විකාශනය වී ඇති අතර, එය වර්තමානයේ බෞද්ධ භික්ෂූන් විසින් කරණ ලද හෝ උල්පන්දම් දුන් ප්‍රචණ්ඩත්වයන් පිළිබඳව දරන ආකල්පය තුළින් පිළිබිඹු වෙයි.

බෞද්ධ භික්ෂූන් විසින් භුක්ති විඳින දණ්ඩ මුක්තිය පිළිබඳව හොඳ උදාහරණයක් වන්නේ මඩකළපුවේ මංගලාරාම විහාරයේ විහාරාධිපති අම්පිටියේ සුමනරතන හිමියන්ගේ සිදුවීමයි. පොලිස් නිලධාරීන්ට හිරිහැර කිරීම, මහජන දේපළ විනාශ කිරීම සහ ජාතිවාදී වචනවලින් රාජ්‍ය නිලධාරීන්ට බැණ වැදීම පිළිබද වීඩියෝ දර්ශන මාධ්‍ය මඟින් ප්‍රචාරය කරනු ලැබීය.[369] එහෙත් එම භික්ෂුව සිය ක්‍රියාවන් සඳහා තවමත් අපරාධ චෝදනා ලබා නැත. මේ අතර, බොදු බල සේනා මහා ලේකම් ඥානසාර හිමි දින ගණනාවක් අත්අඩංගුවට ගැනීමෙන් මඟහැර ගිය අතර, අවසානයේ අධිකරණයට ඉදිරිපත් වූ පසු ඉක්මණින්ම ඇප ලබා දෙනු ලැබීය.[370] නව රජය යටතේ ඔහුට හිමි වූ දණ්ඩ මුක්තිය, රාජපක්ෂ පරිපාලනය යටතේ ඔහු භුක්ති විඳි සීමාරහිත මුක්තියට සාපේක්ෂව සැළකිය යුතු ලෙස අවම වුවත්, ඔහු අත්අඩංගුවට ගැනීම සහ රඳවා තබා ගැනීම සම්බන්ධයෙන් පොලීසිය සහ අධිකරණය දැක් වූ පැකිළීම, ශ්‍රී ලංකාවේ බෞද්ධ ආශ්‍රමික ව්‍යතිරේඛීයත්වය පිළිබඳ අදහස යළි බලාත්මක කරන්නකි. 1997 අංක 30 දරණ ඇප පනතේ 14(1) වගන්තිය යම් තැනැත්තකුට ඇප ලබා දීම ප්‍රතික්ෂේප කිරීමේ නිර්ණායක පැහැදිළිව දක්වයි. අධිකරණය පහත කරුණු විශ්වාස කිරීමට හේතු ඇති විට එසේ කළ හැකියඃ (අ) සැකකරු (i) විමර්ශනය හෝ නඩු විභාගයට පෙනී නොසිටිනු ඇතැයි, (ii) තමාට එරෙහි සාක්ෂිකරුවන්ට හෝ සාක්ෂිවලට බලපෑම් කරනු ඇතැයි, නොඑසේනම් යුක්තිය පසිඳලීමට බාධා කරනු ඇතැයි, හෝ (iii) ඇප මත සිටින විට යම් වරදක් සිදු කරනු ඇතැයි; හෝ (ආ) මහජන ප්‍රතිචාරයක් හෝ කැළඹීමක් ඇති කිරීමට තරම් එකී වරද බරපතල වන්නේ යයි. මෙම නිර්ණායකවලින්

369 ‘AmpitiyeSumanarathana: The Untold Truth’, *Frontpage*, 29 November 2016, at http://www.frontpage.lk/page/Ampitiye-Sumanarathana-The-Untold-Truth/16809[last retrieved 13 October 2017].

370 ‘Gnanasara Thera gets bail twice in two days’, *Daily News*, 22 June 2017, at http://www.dailynews.lk/2017/06/22/law-order/119728/gnanasara-thera-gets-bail-twice-day[last retrieved 13 October 2017].

අඩුම තරමේ එකක් හෝ ඥානසාර හිමියන්ගේ සිදුවීමට අදාළ වෙයි. එහෙත්, ශ්‍රී ලංකාවේ බෞද්ධ ආගමික නායකයින්ට හිමි වන අති විශේෂ ප්‍රතිලාභ ඔහුට ද හිමි වීම හැරුණු කොට, ඔහුට දිගටම ඇප හිමි වීම පුදුම සහගතය.

කෙසේවුවත්, ආගමික නායකයින්ට හිමි වන ව්‍යතිරේඛීයත්වය දේශපාලනික රික්තයක් තුළ අධ්‍යයනය නොකළ යුතුය. යථාර්තවාදීව ගත් විට, මෙම ව්‍යතිරේඛීයත්වය දේශපාලනික ක්‍රියාකාරීන්ගේ තීරණ ගැනීමට දායක වන අතර රාජ්‍යය තුළ බලවත් ක්‍රියාකාරීන් සතු දේශපාලන අනුග්‍රාහකත්වය සවිමත් කරයි.[371] බෞද්ධ ආගමික නායකයින් සහ දේශපාලනඥන් අතර පවත්නා 'සහජීවනාත්මක' සම්බන්ධතාව හේතුවෙන් මෙය හට ගනී.372 මෙම මෙම සහපැවැත්මට ගැඹුරු ඓතිහාසික මූලයන් පවතී යයි පිළි ගැනේ. නිදසුනක් ලෙස, පරාක්‍රමබාහු වැනි 'ස්වදේශික' පාලකයින් සහ නිශ්ශංකමල්ල වැනි 'විදේශීය' පාලකයින් ද ඓතිහාසිකව 'සිංහල-බෞද්ධ ආණ්ඩුක්‍රම පුබුදුවාලීම' පිළිබඳව ගෞරව ලබති.[373] මෙම සන්දර්භය තුළ බෞද්ධ ආශ්‍රමික ප්‍රජාවට පුද සත්කාර කිරීම සිංහල-බෞද්ධ ආණ්ඩු ක්‍රමය තුළ පාලකයකුගේ සුජාතබව තහවුරු කිරීමේ ස්වාභාවික ක්‍රමයක් විය. බොහෝ සිංහල-බෞද්ධ ඡන්දදායකයින්ගේ මනස තුළට ව්‍යතිරේඛීයත්වය කා වැදී ඇතැයි විශ්වාස කෙරෙන නිසා, වර්තමාන දේශපාලන ක්‍රියාකාරීහු ද එය යළි බලගන්වති. බෞද්ධ භික්ෂූන්ට පුද සැළකිලි පැවැත්වීම දේශපාලන ප්‍රභූන්ට, විශේෂයෙන්ම ග්‍රාමීය සහ උපනගර ආශ්‍රිත පසුබිමින් එන්නන්ට හුරුපුරුදු දෙයකි. එහෙයින්, ආශ්‍රමික ව්‍යතිරේඛීයත්වය යළි බල ගැන්වෙන ක්‍රියාවන් සහ වචන බොහෝ විට සිංහල-බෞද්ධ ඡන්ද දායකයින්ගේ සංස්කෘතික සුජාතබව පිළිබඳ ප්‍රකාශනවලට එක් වේ. එබඳු සංස්කෘතික සුජාතබවක් අභිමි වඩාත් අගනාගරික දේශපාලන ප්‍රභූන් පවා එම ඡන්දදායකයින්ගේ කැමැත්ත ලබා ගැනීම සඳහා ආශ්‍රමික ව්‍යතිරේඛීයත්වය ඉවසා සිටීමට පෙළඹිය හැකිය.

ඥානසාර හිමි මුලින්ම අත්අඩංගුවට ගැනීමට අසමත් වීම සහ ඔහු නිදහස් කිරීමට ඉක්මන් වීම මෙම යථාර්ථය පිළිබිඹු කරයි. දණ්ඩ මුක්තියට එරෙහිව කැප වන බවට ප්‍රකාශ කරමින් ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය පිළිබඳව කැබිනට් අමාත්‍යවරුන් ප්‍රකාශයන් නිකුත් කළ නමුත්,[374] ඇත්තෙන්ම කැබිනට් අමාත්‍යවරුන් ඥානසාර හිමියන් ආරක්ෂා කළ බවට අනුමානයන් පවතී.[375] මෙම ආරක්ෂා කිරීමට හේතු ගණනාවක් තිබිය හැකි වුවත්,

---

371 මෙම මාතෘකාව පිළිබඳව සිය අදහස් සහ විමර්ශන ලබා දීම ගැන ලේඛකයා ශරින්ද පෙරේරාට විශේෂයෙන් ස්තුතිවන්ත වෙයි.

372 සුහයිර්, *op. cit.* at 9, citing JayadevaUyangoda 'Paradoxes of Buddhism' in ජයදේව උයන්ගොඩ, (ed.), *Religion in Context: Buddhism and Socio-Political Change in Sri Lanka* (Social Scientists' Association 2007), at 1-2.

373 තම්බයියා, *Sri Lanka: Ethnic Fratricide*, *op. cit*, at 94.

374 ආගමික ස්ථානවලට එල්ල කළ ප්‍රහාර පිළිබඳව කැබිනට් මණ්ඩලයේ ප්‍රකාශය *Official website of the Department of Government Information*, 14 June 2017, at https://www.dgi.gov.lk/news/latest-news/1271-statement-by-cabinet-of-ministers-on-recent-attacks-on-religious-places[last retrieved 13 October 2017].

375 සැකි ජබා, 'Minister hiding Gnanasara Thera?', *The Island*, 8 June 2017, http://island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=166393[last retrieved 13 October 2017].

බෞද්ධ ආගමික නායකයින් සතුටු කිරීමට රාජ්‍යයට තිබෙන පොදු කමැත්ත ඒ අතර වී යයි අනුමාන කිරීම සාධාරණ ය. ඩි වොටා විග්‍රහ කරන පරිදි, සංඝ සභාව භුක්ති විඳින ඉහළ ගෞරවය, හිතුවක්කාර භික්ෂූන්ට පවා 'අමනාපසහගත ගෞරවයකින්' සැළකීමට හේතු වී තිබේ'[376]

2017 ජුනි 20 වන දින අස්ගිරිය නිකායේ මහනායක ශ්‍රී ලංකාවේ පවත්නා මෙම ආශ්‍රමික ව්‍යතිරේඛීයත්වය පිළිබඳව මෙන්ම ඇත්තෙන්ම එය ඥානසාර වැනි මැර භික්ෂූන් කෙරෙහි ද අදාළ බවට වන තහවුරුවකි. ඥානසාර හිමිගේ 'කළහකාරී' ප්‍රවේශය අනුමත නොකරන නමුත්, එම ප්‍රකාශය ඔහුගේ ව්‍යාපාර යුක්ති සහගත කරයි. ඥානසාර හිමි විසින් කරන ලද ප්‍රකාශවල සත්‍යාසත්‍ය බව විමර්ශනය නොකොට ඔහුගේ ප්‍රකාශ 'බැහැර කළ නොහැකි' යයි එය කියයි.[377] බොදු බල සේනාව විසින් සිදු කරන ලද වෛරී සහගත ප්‍රකාශ හෝ ප්‍රචණ්ඩකාරී ක්‍රියා හෙළා දැකීම එම ප්‍රකාශය මඟ හැර තිබුණි. හෙයින්, ප්‍රධාන ධාරාවෙන් පිටත් භික්ෂූන්ගේ පවා වගවීම තහවුරු කිරීමට හෝ අඩුම තරමේ එය වර්ධනය කිරීමට හෝ ප්‍රධාන ධාරාවේ බෞද්ධ සංස්ථාපනයන් අකමැති වී තිබේ. මෙම ව්‍යතිරේඛීයත්වය රටේ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය මුල් බැස ගැනීමට දායක වී ඇත. මෙකී ප්‍රචණ්ඩත්වයෙන් සැළකිය යුතු කොටසක් සෘජුවම හෝ අනුබල දීම මඟින් මෙහෙයවන ලද්දේ ඥානසාර වැනි බෞද්ධ භික්ෂූන් විසිනි. එම ප්‍රචණ්ඩත්වය දිගින් දිගටම ඉවසා සිටීම නිසා එය නැවත සිදු වීමට සහ අවසානයේ මුල් බැස ගැනීමට ඇරයුම් කරයි.

2015 ආණ්ඩු වෙනසින් පසුව පවා ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය නොනැසී පැවතුණේ කෙසේද යන්න සහ ඊට හේතු කවරේ ද යන්න තරමක් දුරට සිංහල-බෞද්ධන්ගේ හිමිකාරීත්ව සංකීර්ණය සහ පැවැත්ම පිළිබඳ බිය සමඟ බෞද්ධ ආශ්‍රමික ව්‍යතිරේඛීයත්වය සමත් වෙයි. මෙම ප්‍රචණ්ඩත්වය ශ්‍රී ලංකා සමාජය තුළ සහ එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකා රාජ්‍යය තුළ ගැඹුරින් කා වැදී ඇති අතර හුදු ආණ්ඩු වෙනසක් මඟින් පිටුදැකිය නොහැකිය. එහෙයින් ශ්‍රී ලංකාවේ මුල් බැසගත් ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය මෙකී මෙහෙයවීම්වල අඛණ්ඩ අදාළත්වය නිසා ඇති වන්නේ යයි පැවසිය හැකිය. සිංහල-බෞද්ධ ක්‍රියාකාරීන්ගේ ප්‍රචණ්ඩත්වය මුල් බැස ගැනීම කෙරෙහි මෙහෙයවන් සාධකම කලාපීය සහ ප්‍රාදේශීය බහුතරයන් සම්බන්ධයෙන් ද ක්‍රියාත්මක විය හැකිය. සුවිශේෂී කලාපීය හෝ ප්‍රාදේශීය සන්දර්භයන්හි බහුතර තත්ත්වය භුක්ති විඳින විට හින්දූන්, මුස්ලිම්වරුන් සහ ප්‍රධාන ධාරාවේ ක්‍රිස්තියානීන් සතුව හිමිකාරීත්ව සංකීර්ණයන් සහ පැවැත්ම පිළිබඳ බිය පැවතිය හැකිය. කලාපයක හෝ ප්‍රදේශයක නිශ්චිත අධිපති තත්ත්වය පවත්වා ගැනීම සඳහා ඔවුන්ද 'තමන්' සහ 'අනෙකා' වැනි 'ද්විත්වයන්' අදාළ කර ගන්නවා විය හැකිය.[378]

---

376 නීල් ඩි වොටා, *Sinhalese Buddhist Nationalist Ideology*, *op. cit.* at 38.

377 'Asgiriya chapter issues tough statement', *Daily Mirror*, 20 June 2017, at http://www.dailymirror.lk/article/Asgiriya-chapter-issues-tough-statement-131273.html[last retrieved 13 October 2017].

378 බර්තොලමියුස් සහ ද සිල්වා, *op. cit.* at 17.

නිදසුනක් ලෙස, හින්දු බහුතරයක් වෙසෙන ප්‍රදේශවල මුස්ලිම් සහ ක්‍රිස්තියානි වැසියන්ට එරෙහිව ප්‍රචණ්ඩ ක්‍රියා සිදුවීම විග්‍රහ කිරීමට මෙකී සංකීර්ණ සහ බිය අදාළ කරගත හැකිය. එමෙන්ම, 'ආචාරධාර්මික නොවන අන්‍යාගමිකකරණය' ප්‍රමිතිගත් කිරීම සඳහා හින්දු කණ්ඩායම්වලින් සහ රෝමානු කතෝලික පල්ලියෙන් කෙරෙන පොදු ඉල්ලීම එකී සංකීර්ණ සහ බිය හේතුවෙන් පන නගින්නක් විය හැකිය. ඉහළින් පවතින මෙම සන්දර්භය තුළ, ශ්‍රී ලංකාවේ සුළුතරයන්ට එරෙහිව සිදු වන නිධන්ගත සහ සියුම් ප්‍රචණ්ඩත්වයන් වැළැක්වීමේ අනාගත මැදිහත් වීම් සැළසුම් කළ යුත්තේ පවත්නා හිමිකාරීත්ව සංකීර්ණ, පැවැත්ම පිළිබඳ බිය සහ ව්‍යතිරේකීයත්වයන් උදාසීන කිරීම සඳහාය. එහෙයින්, ජනවාර්ගික -ආගමික ප්‍රචණ්ඩත්වය තිරසාර ලෙස මැඩ පැවත්වීමට රට තුළ රැඩිකල් පරිවර්තනයක් සිදු වීමට අවශ්‍ය බව පැහැදිළිය.

# හතරවන පරිච්ඡේදය
# නිගමනයඃ ජනවාර්ගික-ආගමික සබඳතා පරිණාමනය කිරීම

බහුතර ජනගහණයන් තුළ වන හිමිකාරීත්ව සංකීර්ණයන්ට, පැවැත්ම පිළිබඳව ඇති භීතීන්ටමෙන්ම බෞද්ධ ආගමික ව්‍යතිරේකවාදයන්ට, අනන්‍යතා දේශපාලනය ඉතා දැඩි අන්දමින් හැඩගැස්වීමට හැක. ඒවාට බහු සංස්කෘතික සමාජයන් තුළ ගැඹුරින් කාවැදී තිබෙමින්, ප්‍රජාවන් අතර ප්‍රචණ්ඩත්වයට රුකුල් දීමට හැක. ශ්‍රී ලංකාවේදී මෙම කරුණු මගින් ඉෂ්ට වී ඇත්තේ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය ස්ථාපිත කිරීමයි. එවිට පැන නගිනා පැනය වන්නේ එවැනි ප්‍රචණ්ඩත්වයක් සඵලව සහ තිරසාරව මැඩපවත්වන්නේ කෙසේද යන්නයි. නීති බලධාරීන් මගින් අපරාධකරුවන් අධිකරණය ඉදිරියට පැමිණුවීමට ඉඩ සලසන නීතියේ පාලන ප්‍රවේශයකින් මේ ආකාරයේ ප්‍රචණ්ඩත්වය මර්දනය කළ හැකිද? මේ සම්බන්ධයෙන් වන ශ්‍රී ලාංකේය අත්දැකීම මගින් තේරුම් ගත හැක්කේ, උක්තාකාරයේ ප්‍රවේශයක් මත විශ්වාසය තැබීම අතිශයින්ම ප්‍රමාණවත් නොවනු ඇති බවයි. මන්දයත්, බොහෝ විට නීති අධිකාරීන් නැඹුරු වන්නේ 'ක්ෂණික උග්‍රතා' ආකාරයේ ප්‍රචණ්ඩත්වය පමණක් මැඩපැවැත්වීමටයි.

නීතියේ පාලන බලය සහිත ප්‍රවේශයක් හා සම්බන්ධ කරමින් ඉදිරිපත් වන, ආගමික නිදහස සහ සුළුතර අයිතීන් සඳහා අනුග්‍රයහ හා ආරක්ෂාව ලබාදෙන මානව හිමිකම් ප්‍රවේශයකට ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය මැඩපැවැත්වීමට හැකි වනු ඇතිද? අබ්දුල්ලාහි අන්-නා'යිම් ඇතුළු බුද්ධිමතුන් යෝජනා කරන්නේ, මෙවැනි ප්‍රවේශයක් වුවත්රාජ්‍ය-කේන්ද්‍රීයහා නෛතික නියමයන් සහිතව රාමුගත කළහොත්, එය අසාර්ථක වනු ඇති බවයි. මෙම අවසාන පරිච්ඡේදයෙන් උත්සාහ කරන්නේ, ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත් විට අන්-නා'යිම් නිවැරදි වීමේ හැකියාවක් ඇත්තේ මන්දැයි යන්න හරියාකාරයෙන් අවබෝධ කරගැනීමටයි. මෙයින් සාකච්ඡා කෙරෙන්නේ ශ්‍රී ලංකාවේ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වයට රුකුල් දෙමින් පවත්නා කාරකයන් තුනක් අතර වන සබැඳියාව සහ, රාජ්‍ය-කේන්ද්‍රීය, නෛතික මානව හිමිකම් ප්‍රවේශයක තිබිය හැකි දුර්වලතාවයන් වේ. ඉන් අනතුරුව මෙම පරිච්ඡේදය මගින් සංස්කෘතික පරිණාමනය වෙත කේන්ද්‍රගත වූ විකල්ප ප්‍රවේශයක් සාකච්ඡා කෙරෙන අතර, එවැනි පරිණාමනයක් සාක්ෂාත්කරගැනීමට සහාය වනු ඇති මැදිහත් වීමේ උපාය මාර්ගයන්ද ඉදිරිපත් කෙරෙනු ඇත. ශ්‍රී ලංකාවේ මුල් බැසගෙන ඇති ප්‍රචණ්ඩත්වය මර්දනය කරනු වස්, ජනවාර්ගික-ආගමික සම්බන්ධතා පරිණාමනය කිරීමට සහ ආගමික නිදහසේ හා සමාන පුරවැසිභාවයේ සංස්කෘතියක් ස්ථාපනය කිරීමට සැලසුම් කෙරුණා වූ වඩාත් රැඩිකල් වූ, 'පාරම්පරික' වූ ව්‍යාපෘතියක් අවශ්‍ය වේය යන සිද්ධාන්තය එයින් ගවේෂණය කෙරෙනු ඇත.

## 4.1 සංස්කෘතික සුජාතභාවය

අන්-නා'යිම් ඉදිරිපත් කරන්නේ, ජාත්‍යන්තර මානව හිමිකම් සංග්‍රහයේ මූලික විරුද්ධාභාසයන් දෙකක් අඩංගු වන බවයි. ඉන් පළමුවැන්න විශ්වීයත්වයේ විරුද්ධාභාසයයි. එනම් 'සාර්වභෞමික' නැතිනම් 'විශ්වීය' යන නාමකරණය මගින්ම, මානව අයිතිවාසිකම් සම්මතයන්ට සඳහා විවිධ සංස්කෘතීන්ට එපිටින් සහාය ලැබෙනු ඇතැයි සාවද්‍ය ලෙසින් ප්‍රකාශ කරයි. සංස්කෘතික සාපේක්ෂතාවය මත පදනම් වෙමින් මානව හිමිකම් සඳහා වන විරෝධතාවයන් අතිමහත් ප්‍රමාණ වීම සරලව ම සැලකිල්ලට ගත් විට මෙම ප්‍රකාශය සාවද්‍ය වන බව අපි දනිමු.[379] මක වූ මුටුවාල[380] සහ ඩේවිඩ් කෙනඩි[381] වැන්නන් ඇතුළු බුද්ධිමතුන් විසින් විස්තර කරනා ආකාරයට, විශ්වීය මානව හිමිකම් සම්මතයන් න්‍යායිකව පැවතීමට හැකි වුවත්, 'විශ්වීය' මානව හිමිකම් සම්මතයන්ගේ වත්මන් අරුත් ගැන්වීම පෙනෙනා ලෙසට විශාල වශයෙන් බටහිර ලිබරල් අදහස් වල ආභාෂය ලබා ඇති අතර, අන්-නා'යිම් පවසන ලෙසටම කිවහොත්'සංස්කෘතික සුජාතභාවයෙන්' හීන වේ. අන්-නා'යිම් විසින් සිත් ඇදගන්නා සුළු අයුරින් තර්ක කරනා ආකාරයට 'විවිධ සංස්කෘතික සම්ප්‍රදායන් තුළ මානව හිමිකම් වල සුජාතභාවයක් තිබීම, ජාත්‍යන්තර මානව හිමිකම් සම්මතයන්ගේ න්‍යායිය විශ්වීයභාවයට සහ ප්‍රායෝගික සඵලත්වයට අත්‍යාවශ්‍ය වේ.[382]

සාර්ව භෞමිකවාදී විරුද්ධාභාසයට ශ්‍රී ලංකාවේ ආගමික නිදහසට සුවිශේෂී සම්බන්ධතාවයක් ඇත. ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාව මගින් ආගමික නිදහස හඳුනාගන්නේය හා ආරක්ෂා කරන්නේය යන කරුණ තිබියදීවුවත්, මෙම නිදහස -විශේෂයෙන්ම ප්‍රාදේශීය තලයේදී- සංස්කෘතික සුජාතභාවයකින් තොර බව පෙනේ. ප්‍රාදේශීය තලයේ වන ප්‍රපංචයන් දෙකක්, මෙම ප්‍රකාශය සනාථ කිරීම සඳහා ඉදිරිපත් කළ හැක. පළමු කොටම, ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය පිටුදැකීම සඳහා ජාතික තලයේදී රජය මගින් දැරූ ප්‍රයත්නයන් තිබියදී වුවද ප්‍රාදේශීය තලයේදී නිදන්ගත ප්‍රචණ්ඩත්වය නොනැසී පැවතිණි. මෙසේ සුළුතර ප්‍රජාවන්ගේ ආගමික නිදහස පැවතියේ, බෞද්ධ ආගම මගින් අත්පත් කොටගෙන තිබූ ආධිපත්‍යයික අවකාශයට බලෙන් ප්‍රවිශ්ට නොවීම වැනි යම් යම් කොන්දේසි සහිතවවිණි. තවත් ආගමක් ප්‍රචාරණය වැනි වූ, උක්ත කී ආධිපත්‍ය ඇති අවකාශයට වූ ඕනෑම තර්ජනයක් ප්‍රචණ්ඩත්වය පිළිතුරු ලෙසින් ලැබීමෙන් අවසන් වූ අතර, එය රජය මගින්ද ඉවසා සිටින ලදී. ප්‍රායෝගික තලයේදී ආගමික නිදහස යනු විශ්වීය සම්මතයක් ලෙසින් පිළිනොගැනුනි. ඒ වෙනුවට එවැනි නිදහසක්, බුද්ධාගමේ

379 අබ්දුල්ලායි. 'Universality of Human Rights: Mediating Paradox to Enhance Practice' in Miodrag A. Jovanovic and Ivana Kristic (eds.), Human Rights Today - 60 Years of The Universal Declaration (Eleven International Publishing 2010), at 34-35.

380 මකවූ මුටුවාල 'Savages, Victims, and Saviours: The Metaphor of Human Rights' (2001) Harvard International Law Journal 201.

381 ඩේවිඩ් කෙනඩි, 'The International Human Rights Movement: Part of the Problem' (2002) 15 Harvard Human Rights Journal 101.

382

ආධිපත්‍යය පවත්වා ගැනීම සඳහා නිර්මාණය වූ යම් යම් විශේෂ කොන්දේසි යටතේ 'ප්‍රදානය කෙරී' තිබිණි. දෙවෙනුව, යුමුෆ් අල් විසින් පෙන්වා දී ඇති පරිදි, ශ්‍රී ලංකාවේ පහළ මට්ටමේ උසාවි මගින් ආගමික සුළුතරයන්ට එරෙහිව මුදාහැරුණු ප්‍රචණ්ඩත්වය ආගමික නිදහස සම්බන්ධ කොට ගෙන රාමු කිරීම සිතා මතාම මග හැර ඇත. ඇය මෙසේ නිරීක්ෂණය කරයි:

> බොහෝ විට ආගමික කරුණු ඔස්සේ පෙළඹවුණු ප්‍රචණ්ඩත්වය, පහළ මට්ටමේ උසාවි වලින් ඒ ලෙසින්ම පිළිගැනෙන්නේ කලාතුරකිනි. මෙම බැහැර කිරීම ඔස්සේ, අපරාධකරුවන්ට ආගමිකව පෙළඹවීම ලැබුණු සාපරාධී චර්යාව සඳහා නොව හුදු සාපරාධී චර්යාව වෙනුවෙන් දඬුවම් කිරීමේ රැල්ලක් ඇතිවී ඇත. මෙහි ප්‍රතිඵලයක් වන්නේ එම ප්‍රචණ්ඩත්වය සැබවින්ම ඇතිවූ සන්දර්භයෙන්, එම ප්‍රචණ්ඩත්වය ගැලවීමේ හැකියාවක් ඇතිවීමයි. මෙම ගැලවීමේ නැතිනම් විසම්බන්ධ කිරීමේ ක්‍රියාවලිය ඔස්සේ, සුළුතර ආගමික ප්‍රජාවන්ට එරෙහිව සිදුකෙරෙන ප්‍රචණ්ඩත්වය හෙලා දැමීමක් නොමැති වුවත්, මෙම ආගමික සුළුතරයන්ට එරෙහිව වෙනස්කම් සිදුකිරීම අනුදත් රාමුවක් ගොඩනැගී ඇත.[383]

පහළ මට්ටමේ උසාවි වල ඇති නීති පද්ධතිය මගින් සුළුතර ප්‍රජාවන්ගේ ආගමික නිදහස වෙනුවෙන් ආරක්ෂාව සහ අනුග්‍රහය ලබාදීමේ වැදගත් කම අඩු තක්සේරු කොට ඇත. මෙම කී නීති පද්ධතිය මගින් ස්ථිර කොට සිටින්නේ, ආගමික නිදහස සඳහා වන අයිතිවාසිකමට වඩා භෞතික ප්‍රචණ්ඩත්වයෙන් ආරක්ෂා වීමේ අයිතිය පමණි. එයින් පිළිබිඹු කෙරෙන්නේ සුළුතර ප්‍රජාවන්ගේ ආගමික නිදහස සඳහා සංස්කෘතික සුජාතභාවයක් නොමැත්තේය යන කරුණයි. එනම් අපරාධකරුවන්ට වගකීම පැවරෙන්නේ සුළුතරයන්ගේ ආගමික නිදහසට එරෙහිව ප්‍රචණ්ඩත්වය මුදාහැරීමට යොදාගත්ක්‍රියාවන් සඳහා පමණි. සුළුතර ප්‍රජාවන්ගේ ආගමික නිදහසට වැට බැඳීම වැනි එහි අවසන් ප්‍රතිඵලයන්, ආගමික නිදහසට සම්බන්ධ කිසිදු මානව හිමිකම් සම්මතයක් ඔස්සේ ප්‍රශ්න නොකෙරෙයි.

අන්-නා'යිම් විසින් සඳහන් කළ දෙවන විරුද්ධාභාසය මගින් සැලකිලිමත් වන්නේ රාජ්‍යයේ ස්වයං-නියාමනය සම්බන්ධයෙනි. ඔහු තර්ක කරන්නේ වර්තමානයේ සංකල්පගත කොට ඇති ආකාරයට මානව හිමිකම් සඵලදායී ලෙසින් ආරක්ෂා කිරීමට නම් 'ප්‍රාදේශීය, ජාතික සහ ජාත්‍යන්තර තලයන්ගෙන් දේශපාලන අභිප්‍රායන් හැකි උපරිම මට්ටමින් ක්‍රියාවේ යෙදවිය යුතු' බවටයි.[384] ඔහු එයට එකතු කරන්නේ, 'මානව හිමිකම් දේශපාලන සුජාතභාවය හෝ සන්දර්භීය ජීව ගුණයෙන් තොරව තේරුම් ප්‍රත්‍යක්ෂ කරගැනීමට නොහැකි වන්නේ නම්, එවැනි දේශපාලන අභිප්‍රායක් ඇතිවීම හෝ පැවතීම සැක සහිත' බවයි.[385] රජය මගින්

383 අන්-නාම්, op. cit. at 30.
384 අන්-නාම්ල op. cit. at 36.
385 එම. at 36-37.

එක් කොටසකට විශේෂයෙන් සංස්කෘතිකමය වරප්‍රසාදයක් ලබාදුන් විට මෙවැනි ගතිකයන් සැබෑ වෙයි. ශ්‍රී ලංකාවේ නම් සිංහල-බෞද්ධ හිමිකාරීත්ව සංකල්පය රජය තුළද ගැඹුරින් මුල් බැස තිබෙනා අතර, එය ව්‍යවස්ථාමයමෙන්ම සමාජ-දේශපාලනික ව්‍යුහයන් තුළද පිළිබිඹු වේ. රජයේ පාලන යථාර්ථය වන්නේ එවැනි බහුතරවාදයක් නම්, එම රජය මගින් සුළුතර ප්‍රජාවන්ගේ ආගමික නිදහස අයිතිවාසිකම් සම්බන්ධ කරුණක් ලෙසින් සලකමින් ආරක්ෂා කිරීම සහ ඊට අනුග්‍රහය දැක්වීම, ඉතාමත් අඩමාන දෙයක් පමණක් නොව තිරසාර නොවන දෙයක්ද වේ. මේ අනුව අන්-නා'යිම් පැහැදිලි කරන්නේ, "ජාත්‍යන්තර මානව හිමිකම් සම්මතයන් වෙත වන පටු, රාජ්‍ය කේන්ද්‍රීය, නීතිගත සහ ප්‍රතික්‍රියක ප්‍රවේශයක් සඳහා වුවමනාවට වඩා අවධාරණයක් ලබාදී ඇති' බවටයි.[386] ඔහු පැහැදිලි කරනා ලෙසට 'රාජ්‍ය කේන්ද්‍රීය හා නීතිගත' යන්නෙන් ඔහු අදහස් කරන්නේ 'මානව හිමිකම් සම්මතයන්ගේ සුජාතභාවය සහ අධිකාරීත්වය, රාජ්‍යයේ නෛතික බැඳීම මත ස්ථාපනය වූවක් ලෙසින් අර්ථ දක්වා ගැනීමේ නැඹුරුව' වෙයි.[387]බෙන්ජමින් ෂොන්තාල් ඇතුළු අනෙකුත් බුද්ධිමතුන් විසින් යෝජනා කොට ඇත්තේ, ප්‍රතිසංස්කරණයන් සඳහා සම්පූර්ණයෙන්ම නීතිගත ප්‍රවේශයන්ගෙන් අපගමනය වූ ප්‍රවේශයන් වේ. ෂොන්තාල් විසින් සිත් කාවදින සුළු තර්කයක් ගෙන එමින් පවසන්නේ, 'ව්‍යවස්ථානුකූල මැදිහත්වීම' - එනම් ඔහු විසින් අර්ථ දක්වන ආකාරයට ව්‍යවස්ථානුකූල නෛතික ක්‍රියාමාර්ගයන් ඔස්සේ ගැටුම් විසඳීම- මගින් ජනවාර්ගික-ආගමික ගැටුම් තවදුරටත් ධ්‍රැවීකරණය කිරීමටත්, ඒ ඔස්සේ එම ගැටුම් වඩ වඩාත් නොමැඩිය හැකි තැනට පත් කිරීමටත් හේතු වනු ඇති බවයි.[388]

ආගමික නිදහස සම්බන්ධයෙන් කථා කරන්නන් බොහෝ විට නැඹුරුතාවයක් දක්වන්නේ, 'වියුක්ත නැතිනම් තනි තනි අයිතිවාසිකම් කෙරෙහි සහ අධිකරණමය හෝ පරිපාලනමය ප්‍රතිකර්මයන් ඔස්සේ තනි තනි [අයිතිවාසිකම්] උල්ලංඝනයන් සඳහා වන විශේෂ විසඳුම් සෙවීම කෙරෙහි' අවධානය කේන්ද්‍රගත කිරීමටයි.[389] අන්-නා'යිම් තර්ක කොට සිටින්නේ එවැනි ප්‍රවේශයක් තිරසාර නොවන්නාක්සේම, එයින් මානව හිමිකම් උල්ලංඝනයන්'පසුපස ගැබ්ව ඇති හේතු ප්‍රත්‍යයන්' වෙත ආමන්ත්‍රණය කිරීමටදනොහැකි බවටයි. ශ්‍රී ලංකාවේ ආගමික සුළුතරයන් මුහුණ දී ඇති දිගින් දිගටම පවත්නා නිදන්ගත ප්‍රචණ්ඩත්වයට ඇතැම් විට හේතු වී ඇත්තේද රටේ මෙම ආගමික නිදහස සම්බන්ධයෙන් පවත්නා කතිකාවේ වන ඉහත සඳහන් කෙරුණු දුර්වලතාවයම විය හැක. ශ්‍රී ලංකාවේ ආගමික නිදහස, මෙම ප්‍රචණ්ඩත්වය පසුපස ඇති හේතු ප්‍රත්‍යයන් සඳහා ආමන්ත්‍රණය කිරීමට තවමත් අපොහොසත්ව ඇත. අවසාන වශයෙන් ගත් විට, සුළුතර ප්‍රජාවන්ගේ ආගමික නිදහස ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා රජය මගින් දියත් කරනු ලබන නෛතික බැඳීමක් මත

386 එම at 38.
387 එම. at 38-39.
388 බෙන්ජමින් ශෝන්තාල් , Buddhism, Politics and the Limits of Law, op. cit. at 219.
389 අන්-නාමිල op. cit. at 39.

යැපීම යන කරුණ, එම නිදහස රාජ්‍යය හැඩගසනා සංස්කෘතිකමය ව්‍යවහාර ධර්මයන් තුළ සුජාත යැයි නොපිළිගැනෙන්නේ නම් නිරර්ථක එකක් වනු ඇත. එනිසා උක්ත කී සංස්කෘතික ව්‍යවහාර ධර්මයන් නැවත අරුත් දැක්වීමේ ක්‍රියාවලියක්, ශ්‍රී ලංකාවේ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය අවසාන කිරීමට සහ සුළුතර ප්‍රජාවන්ගේ ආගමික නිදහසට ආරක්ෂාව හා අනුග්‍රහය ලබාදීමටඅතිවැදගත් වනු ඇත.

## 4.2 පොදු ව්‍යවහාරික සුචරිතයන් සහ සංස්කෘතික පරිණාමනය

නීතියේ ආධිපත්‍යය සහ රාජ්‍ය-මූලික මානව හිමිකම් ප්‍රවේශයන්, ශ්‍රී ලංකාවේ ජනවාර්ගික -ආගමික ප්‍රචණ්ඩත්වය හා සාර්ථකව සටන් වැදීමට ප්‍රමාණවත් නොවන බව සනාථ වී ඇත. මෙම ප්‍රවේශයන් සරලවම, සිංහල බෞද්ධ හිමිකාරීත්වයේ හා පැවැත්මේ භීතීන්ගේ යතාර්ථය සහ ව්‍යතිරේඛවාදයට ආශ්‍රමික අභියෝග කිරීමට අසමර්ථව ඇත. උක්ත දැක්වෙන කරුණු සියල්ල, ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය ජයගැනීම සඳහා අවබෝධ කොටගෙන, ආමන්ත්‍රණය කර යුතු ඒවා වේ.මෙවැනි අප්‍රමාණවත් බවක් හමුවේ, වෛකල්පීය ප්‍රවේශයක් ගෙන ඒමට හා උරගා බැලීමට සිදුවේ. The Chronic and the Acuteහි කතුවරයා විසින් ශ්‍රී ලංකාවේ ප්‍රජාවන් අතර ප්‍රචණ්ඩත්වය හා කටයුතු කිරීමට හැකි මැදිහත්වීමේ උපාය මාර්ගයන් කිහිපයක්ම සාකච්ඡා කොට ඇත. මෙම උපාය මාර්ග යන්, වර්තමානයේ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය හා කටයුතු කිරීම සඳහාද උචිත වේ. එය එසේ වුවත්, ශ්‍රී ලංකාවේ අද්‍යතන සන්දර්භය හා ගලපනු වස් ඊට වැඩි විස්තර කිරීමක් අවශ්‍ය වනු ඇත.

මෙම පළමු මැදිහත්වීම් උපාය මාර්ගයන් දෙක වන නීතිය බලාත්මක කිරීම සහ අදාළ ආයතනයන් සවිබල ගැන්වීම, නීතියේ ආධිපත්‍යය නම් ප්‍රවේශයට සම්බන්ධ වේ. මේවා, ක්ෂණිකව උග්‍ර වන ප්‍රචණ්ඩත්වය සහ යම් ප්‍රමාණයකට නිදන්ගත ප්‍රචණ්ඩත්වය වැළැක්වීමට හා මැඩපැවැත්වීමට අදාළව පවතී.එසේම ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය සිදුවන, ප්‍රතිවිපාක නොලැබීමේ සංස්කෘතිය හා කටයුතු කිරීමටද මේවා අත්‍යාවශ්‍ය වේ. නීල් ඩිවොටා විසින් පෙන්වා දී ඇති පරිදි 'තනි පුද්ගලයින් හා කණ්ඩායම් ඇතැම්විට උපරිම ප්‍රතිලාභයන් එක් රැස් කරගැනීමට උත්සාහ කරන්නේය යන්න සැලකූ විට, බහුවාර්ගික සමාජයන් සඳහා විශේෂයෙන්ම අපක්ෂපාතී මැදිහත්වීම් ලබාදෙන හා ඊට අනුග්‍රහය දක්වන ආයතනයන් නිර්මාණය කිරීම අවශ්‍ය වේ.[390] එනිසා තිබෙනා නීති බලාත්මක කිරීමට සහ නීති අධිකාරීන් සහ අධිකරණමය ආයතන බලගැන්වීම උදෙසා යම් යම් සම්පත් ලබාදීම දිගින් දිගටම සිදුවිය යුතුවේ. එසේ වුවත් මෙම උපාය මාර්ගයන්ට උරුම සීමාවන් තිබෙන්නේය යන්න පිළිගැනීම මත ඒවාට පදනමක් ලබාදිය යුතුවේ. බ්‍රයන් තමනාහා විසින් දක්වා ඇති ආකාරයට, නීතිය යන්න 'සමාජ ජීවිතය සහ පොදු ජනතාවගේ වැටහීම'

390 ඩි වොටා, 'From ethnic outbidding to ethnic conflict', op. cit. at 146.

හා ගැටෙන ලෙසින් හෝ ඇත් වන ලෙසින් පිහිටුවිය නොහැක.[391] නීතියේ ආධිපත්‍යය යන ප්‍රවේශය එයට පාදක වූ සංස්කෘතික සුජාතභාවයක් නොමැති විටකදී බොහෝ විට අසාර්ථක වීමට ඉඩ ඇත්තේය.

ප්‍රජා මූලික පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතීන් සම්බන්ධ වූ තුන්වෙනි උපාය මාර්ගය The Chronic and the Acute හි නිර්දේශ කොට ඇත්තේ, ජනවාර්ගිකව සහ ආගමිකව විවිධත්වයෙන් යුතු ප්‍රදේශයන්හි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පියවරක් ලෙසිනි. මෙම උපාය මාර්ගය අද දිනටද වලංගු වන්නේ, අනතුරට ලක්විය හැකි සුළුතර ප්‍රජාවන්ට ලැබිය යුතු සඵලකාරීව ආරක්ෂාව මෙවැනි පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතීන් මත රඳා පැවතිය හැකි බැවිනි. පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතීන් අදාළ වන ප්‍රශස්තම පරිචයන් මගින් අවධාරණය කරන්නේ, ඒ සඳහා සිවිල් සමාජ සහ යෞවන සහභාගීත්වයේ වැදගත්කමයි.[392]උදාහරණ ලෙසින් දක්වන්නේ නම්, බොකෝහරාම් ත්‍රස්තවාදයෙන් පීඩා විඳි ප්‍රදේශයක් වූ නයිජීරියාවේ බෝර්නෝ ප්‍රාන්තයේ Search for Common Ground සංවිධානය මගින් ස්ථාපනය කළ පූර්ව අනතුරු ඇඟවීම් පද්ධතියේ 'ප්‍රජා වේදිකාවන්' තිබුණු අතර, එයින් ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණය කොට වාර්තාවන් සකස් කිරීමට හැකි තරුණයින්ව හඳුනා ගැනිණි.[393] මෙම පද්ධතියට කෙටි පණිවුඩ සේවයක්ද (SMS) ඇතුළත් වූ අතර, ඒ ඔස්සේ ප්‍රජා සාමාජිකයින් හට අවධානයට ලක් විය යුතු කරුණු ඍජුවම උපදේශන කමිටුවට වාර්තා කළ හැකි අතර, එම තොරතුරු විශ්ලේෂණය සඳහා පුහුණුවෙන් සහ මෙවලමින් උපදේශන කමිටුව සන්නද්ධව සිටී.මෙම තොරතුරු තහවුරු කරගත් පසුව එය ප්‍රජා ෆෝරමයට ඉදිරිපත් කරන අතර, එහිදී සුදුසු ක්‍රියාමාර්ගයන් නිශ්චය කරනු ලබයි.[394]මෙම ආකාරයේ පූර්ව අනතුරු ඇඟවීම් ක්‍රම, ශ්‍රී ලංකාවේ උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම මගින්ද නිර්දේශ කර ඇත.[395] කෙසේ වුවත් මෙම පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතියක හැකියාව ප්‍රජාවන් අතර ආතතීන් ප්‍රචණ්ඩ අරගලයක් කරා වැඩිවර්ධනය වීම නැවැත්වීමට පමණක් සීමා වන අතර, බොහෝ විට ඊට ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය ගැඹුරෙහි ඇති කාරකයන් හා කටයුතු කිරීමේ හැකියාව නැත.

The Chronic and the Acute මගින් ඉදිරිපත් කොට ඇති සිවුවෙනි මැදිහත්වීමේ උපාය මාර්ගය සාමය ගොඩනැංවීමට, මානව හිමිකම් අධ්‍යාපනයට සහ සංවාද පරිණාමයට සම්බන්ධ වේ. මෙම උපාය මාර්ගයට මානව හිමිකම් හා සාම අධ්‍යාපන වැඩසටහන්, ආර්ථික උත්තේජකයන් හා සහයෝගීතා වැඩසටහන් අවශ්‍යයෙන්ම ඇතුළත් වේ.[396] මේ

391 බ්‍රයන් තමනහාල 'The Primacy of Society and the Failures of Law and Development' (2011) 44(2) Cornell International Law Journal 209-248, at 244.

392 ස්ටීවන් ලීච්, Preventing Violence: Community-based Approaches to Early Warning and Early Response (CSS ETH Zurich 2016).

393 එම. at 21.

394 එම

395 උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිසමේ වාර්තාව : 2011 නොවැම්බර්), at para.8.274.

396 ගුණතිලක, The Chronic and the Acute, op. cit. at 55.

අනුව මෙම අධ්‍යයනය මගින් නිර්දේශ කරනු ලබන්නේ, ආගමික නිදහස සම්බන්ධයෙන් වන ජාතික කතිකාව 'සියලුම ආගමික ප්‍රජාවන් සඳහා සමාන තත්වයක් අවධාරණය' වෙත නැවත හැඩගැන්විය යුතු බවටයි.[397] එලෙසින්ම ඒ මගින් නිර්දේශ කරනා තවත් කරුණක් වන්නේ දේශීය තලයේ පවත්නා 'සත්කාරක-ආගන්තුක' ගතිකය වෙනුවට, 'සංඛ්‍යාත්මක වශයෙන් වූ විශාල වෙනස්කම් නොසලකා සමාන තත්වයක් ඇති ආගමික කණ්ඩායම් සහපැවැත්මෙන් යුතු වීමේ වාතාවරණයක් ඇතිවිය යුතු බවයි.[398] ශ්‍රී ලංකාවේ ජනවාර්ගික -ආගමික ප්‍රචණ්ඩත්වයේ වර්තමාන තත්වය මගින් හෙළිදරවු කරන්නට යෙදුණේ, මෙම සිවුවෙනි උපාය මාර්ගයේ ඇති වැදගත් කමයි. සහ පැවැත්මේ වාතාවරණයක් සහ සමාන පුරවැසිභාවයක් ස්ථාපිත කිරීමේ ඕනෑම සැබෑ ප්‍රයත්නයක මධ්‍යයේ සංවාද පරිණාමය තිබේ. මෙවැනි පරිවර්තනයක් ලඟා කර ගැනීමේ නිශ්චිත වැඩපිළිවෙල වලට වැඩිදුර සිතීම සහ විස්තර විභාග කිරීම අවශ්‍ය වේ. උදාහරණයක් ලෙසින් දක්වන්නේ නම්, නීතිගරුක සහ රාජ්‍ය-කේන්ද්‍රීය මානව හිමිකම් ප්‍රවේශයක් සැඳහුම් රාමුවක් ලෙසින් ගනිමින් ඒ මත හුදෙක්ම යැපෙන මානව හිමිකම් අධ්‍යාපන වැඩසටහන්, බහුතර ප්‍රජාවගේ සිතීම පරිවර්තනයට ලක්කිරීමෙහි ලා සාර්ථක වීමේ හැකියාව සිදුනොවීමට වඩාත් ඉඩ තිබේ. නීතියේ ආධිපත්‍යයට ගරු කරනා 'සංස්කෘතියක්' නිර්මාණය කිරීම සඳහා සැලසුම් කළ ව්‍යාපෘතීන්ද, සංස්ථායික ප්‍රතිසංස්කරණයන් අසාර්ථක වීමට ඉඩ ඇති හේතුව මතම අසාර්ථක වනු ඇති බවට ටමනාහා විසින් කළ අනතුරු ඇඟවීම මෙහිදී සැලකිල්ලට ගැනීමට වටනේයි.[399] ඔහු විසින් තර්ක කොට සිටින්නේ සංස්කෘතිය සහ සංස්ථාවන් 'අන්‍යොන්‍ය වශයෙන් සංස්ථාවක් නිර්මාණය සාධක වන' බවත්, ඒවා එකම මොහොතක පැන නැගී එක්ව වර්ධනය වන බවත් වේ.[400] එසේ වුවත් සංස්කෘතික පරිණාමයේ ක්‍රියාවලිය වර්ධනීය සහ පරිවර්තනයට විෂය වන ප්‍රජාව හා අනුනාද වන වාග්මාලාවක් මතමූලිකවම යැපෙන්නේ නම්, ටමනාහා ගේ අභියෝගය යම්තාක් දුරකට ඇතැම් විට ජයගැනීමට හැකිවනු ඇත.[401] මෙම සන්දර්භය මත, අන්-නා-යිම් ගේ සංස්කෘතික පරිණාමයක් සඳහා වන ප්‍රවේශය හැකියාවක් ඇති විකල්පයක් ලෙසින් සලකා බැලීම වටිනු ඇත. ඔහු තර්ක කොට සිටින්නේ, නීතියේ ආධිපත්‍යය සහ රාජ්‍ය-කේන්ද්‍රීය මානව හිමිකම් භාෂිතයක් බොහෝ විට දේශීය ප්‍රජාවන් හා අනුගත වීමට අපොහොසත් වන බවටයි. මෙම භාෂිතයන් ඇතැම් විට සිය අයිතිවාසිකම් ප්‍රගමනය සඳහා බලාපොරොත්තු වන වින්දිතයින් හා අනුනාද වුවත්, තමන්ගේ අවශ්‍යතාවයන් ඉටු කරගැනීම සඳහා හිමිකම් රාමුවක් මත යැපෙන්නට අවශ්‍යතාවයක් නැති ආධිපත්‍යයික ප්‍රජාවකට ආමන්ත්‍රණය කිරීමේදී එය බොහෝ විට අසාර්ථක වේ. එවැනි සන්දර්භයකදී 'විශේෂිත ප්‍රජාවක් මගින් විශ්වාසනීය

397 එම

398 එම

399 තමනහා, op. cit. at 214.

400 එම

401 අන්-නයීම්, op. cit. at 39. n,kak ie,S tx.,a fuÍ, Human Rights and Gender Violence: Translating International Law into Local Justice (University of Chicago Press 2005), at 219-221. දේශීය ප්‍රජාවන් සමඟ තිරසාර ලෙස සමපාත වන පැරිසි මානව හිමිකම් අදහස් 'ස්වභාෂාකරණය' කිරීමේ වැදගත්කම මෙරී අවධාරණය කරයි.

හෝ යෝග්‍ය යැයි පිළිගනු ලබන ඕනෑම සැඳහුම් රාමුවක් සම්බන්ධයෙන්, එම ප්‍රජාව නම්මා ගැනීමට ඉඩ ඇති ඕනෑම තර්කයන්, නැතිනම් එම ප්‍රජාවේ වටහා ගැනීම් හා සැලකිලිමත් වීම් වෙත ආමන්ත්‍රණය කළ හැකි තර්කයන්' භාවිතා කළ යුතු බවට අන්-නා-යිම් විසින් තර්ක කොට සිටින්නේ සිටී.[402]

මයිකල් ඉග්නාටියෙෆ් ගේ මෑතකාලීන කෘති මගින් මෙම දෘෂ්ටියට සහාය ලැබෙන බව පෙනී යයි. ඔහු විසින් තර්ක කොට සිටින්නේ, 'අනෙකුන්ගේ' මානව හිමිකම් පිළිබඳ විශ්වීය වූ සදාචාරාත්මක හඳුනාගැනීමක් සංස්කෘතීන් ඔස්සේ මනාව ස්ථාපනය නොවන බවටයි. මෙවැනි සන්දර්භයකදී ඔහු යෝජනා කොට සිටින්නේ, සැලකිල්ලට බඳුන් වන සුවිශේෂී ප්‍රජාවන් සමගින් අනුගත විය හැකි ඌනපූරක භාෂිතයක් ලෙසින් 'පොදු සදාචාර ගුණයන්' මත රඳා පැවතිය හැකි බවටයි.[403] එනිසා ඔහු උපදෙස් දෙන්නේ 'අනෙකාව' පිළිගැනීමට සහ'අනෙකාට' ගරු කිරීමට පුද්ගලයින්ට හා ප්‍රජාවන්ට ඒත්තු ගැන්වීම සඳහා දයාකරුණාව, ඉවසීම, අන්‍යාන්‍ය පිළිගැනීම හා සමාව දීම වැනි 'පොදු සද්ගුණයන් වෙත වඩාත් අවධාරණාත්මක අගයක් තැබිය යුතු බවටයි.

වසර තුනක් තිස්සේ රටවල් අටක පවත්වන ලද අධ්‍යයනයක දී ඉග්නාටිෆ් සොයා ගනු ලැබුවේ තැනැත්තන් 'මනුෂ්‍ය වර්ගයා වෙනුවෙන් පොදු වගකීම පිළිබඳ අදහස් උපදවා ගන්නේ කළාතුරකින් වන බවත්, ඒ වෙනුවට, ප්‍රාදේශීය, අවිනිශ්චිත, මෙහි සහ දැන් - තමාට සමීප දේට බැඳුණු සහ තමාට බැඳුණු - දේ සම්බන්ධව තාර්කික වන බවත්'ය.[404] සාමාන්‍ය ගතිගුණ පිළිබඳ අදහස අයිතිවාසිකම් භාෂාව ප්‍රතිස්ථාපනය කිරීමට වඩා පවත්නා අයිතිවාසිකම් පිළිබඳ කතිකාව පරිපූර්ණ කිරීමට සහ ශක්තිමත් කිරීමට භාවිතා කළ යුත්තේ යයි ඔහු පැහැදිළි කරයි. නිදසුනක් ලෙස, අමුත්තකුට 'තෑග්ගක්' දීම පිළිබඳ අදහස, අමුත්තකුගේ 'අයිතිවාසිකම්' පිළිබඳ අදහසට වඩා ශක්තිමත් සහ විශ්වීය ආකර්ෂණයකින් යුක්ත වන්නේ යයි සොයා ගෙන තිබේ. ඒ අනුව ඉග්නාටිෆ් යෝජනා කරන්නේ සරණාගතයින්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳව වැඩ කිරීමට ප්‍රාදේශීය ප්‍රජාවන් සමඟ සම්බන්ධ වන විට 'ආගන්තුක සත්කාර' පිළිබඳ අදහස බහුලව භාවිතා කළ යුතු බවය.[405] ප්‍රාදේශීය තලයේදී වැඩි ප්‍රායෝගික අදාළත්වයක් පවතින බැවින්, මානව හිමිකම් වෙනුවෙන් වැඩ කරන්නන් සාමාන්‍ය ගතිගුණ පිළිබඳ අදහස හොඳින් වටහා ගෙන තිබිය යුතු යයි ඔහු නිර්දේශ කරයි.

ඉතිරිව ඇති ප්‍රශ්නය වන්නේ ආගමික නිදහස වෙනුවෙන් නගනු ලබන තර්ක 'වඩාත් මූලික හෝ පුළුල්ව-පිළිගත් වටිනාකම්වලට ආකර්ශණීය' කළ හැකිද යන්නයි.[406] ශ්‍රී ලාංකික

---

402 එම

403 ඉග්නාටිෆ්, 'Human Rights, Global Ethics and the Ordinary Virtues', op. cit. at 4.

404 එම. at 10.

405 එම. at 11. මයිකල් ඉග්නාටිෆ්ල 'Human Rights, Global Ethics and the Ordinary Virtues' (2017) 13 (1) Journal of International Law and International Relations 1-9, at 7.

406 අන් නයීම්, op. cit. at 39.

සන්දර්භය තුළ එබඳු වටිනාකම් අවබෝධ කරවීමට දෙපැත්තක් සහිත උපාය මාර්ගයක් අදාළ කර ගත හැකිය.

පළමුව, ආගමික නිදහස සහ සමාන පුරවැසිබව අගය කරන දේශීය වටිනාකම් හඳුනා ගෙන, සිංහල-බෞද්ධ බහුතරය විසින් අගය කරන ප්‍රධාන ධාරාවේ වටිනාකම් ලෙස ප්‍රවර්ධනය කළ යුතුය. මේ සම්බන්ධව අදාළ ප්‍රශ්නයක් ගණනාත් ඔබේසේකර නගයිඃ

> විනාශකාරී සිංහල ජාතිකවාදය බිහි කිරීම දෙසට නැඹුරු නොවන, බෞද්ධ ආගමික වටිනාකම් මගින් මෙහෙයවනු ලබන නව සමාජීය දැක්මක් නිර්මාණය කිරීමට බලපෑම් කළ හැකි, සමකාලීන ජීවිතය පිළිබඳ විවේචනයක් ගෙන ඒම වෙනුවෙන් උනන්දු වන බෞද්ධ සාමාන්‍ය වැසියන් සහ භික්ෂූන්ට කළ හැක්කේ කුමක්ද?[407]

බෞද්ධ ආගමික වටිනාකම් සහ ආගමික නිදහස සමඟ එකඟ වන සමාජීය දැක්මක් වැඩිදියුණු කිරීම වෙනුවෙන් වන මෙබඳු අන්තරාසර්ග ව්‍යාපෘතියක් ඉතා තීරණාත්මක වෙයි. එහෙත්, 'පුළුල්ව-පිළිගත් වටිනාකම්වල' නිශ්චිත ස්වභාවය සහ ඇතුළත් වන දෑ තරමක් අපැහැදිළිය. එකී වටිනාකම් කවරේද යන්න නිශ්චිතව අනාවරණය කිරීම සඳහා මෙම අධ්‍යයනයේ වපසරියෙන් ඔබ්බට ගිය අනුභූතික පර්යේෂණයක් අවශ්‍ය වනු ඇත. කෙසේවෙතත්, එබඳු වටිනාකම් පවතින බව සහ ඒවා සොයා ගත හැකි වනු ඇතැයි අනුමාන කළ හැකිය. එක් අතකින්, 'ප්‍රතිඋපකාර' සහ 'ගෞරවය' වැනි සාමාන්‍ය ගතිගුණ ප්‍රජාවන් අතර පවතින අතරම, ආගමික නිදහස අසහා සමාන පුරවැසිබව පිළිගැනීම යුක්ති සහගත කිරීම උදෙසා භාවිතා කළ හැකි වනු ඇත. අනෙක් අතට, මෛත්‍රිය සහ කරුණාව වැනි බෞද්ධ පිළිගැනීම් 'ඉවසීම' යන පීතෘමූලික අදහස මත පදනම් නොවන සහජීවනයේ සංස්කෘතිය පෝෂණය කිරීමට භාවිතා කළ හැකිය. සුළුතරයන්ගේ ආගමික නිදහස සංස්කෘතිකව යුක්ති සහගත කිරීමට නම්, මෙම ගතිගුණ සහ පිළිගැනීම අර්ථවත් ලෙස ගවේෂණය කොට සිංහල-බෞද්ධ බහුතරය තුළ ප්‍රධාන කතිකාවන්ට එක් කළ යුතුය. අනෙක් පැත්තෙන් ආගමික සුලුතරයන් ද, ප්‍රතිඋපකාර සහ අන්‍යෝන්‍ය ගරුත්වය පෙන්වීම සඳහා මේ සමාන ගතිගුණ සහ පිළිගැනීම් වැළඳ ගත යුතුය. නිශ්චිතවම මෙබඳු ක්‍රියා පටිපාටියක් ශ්‍රී ලංකාවේ පරිකල්පන කපාලයෙන් පිටත පවතින්නක් නොවේ. නිදසුනක් ලෙස, ජනවාර්ගික අධ්‍යයනය සඳහා වන ජාත්‍යන්තර කේන්ද්‍රයේ 'ප්‍රත්‍යස්ථ ප්‍රජාවන් ගොඩ නැංවීම' නම් වූ ප්‍රජා-පාදක ව්‍යාපෘතිය මෙම ප්‍රවේශය අදාළ කර ගනී. අන්තර්-ප්‍රජා අවබෝධය සහ දයාව වැපිරීමේ වැදගත්කම අවබෝධ කර ගනිමින් එම ව්‍යාපෘතිය 'ඉවසීම පිළිබඳ සීමිත සුසමාදර්ශයෙන් ඔබ්බට යාම[408] වර නගයි. එමෙන්ම, ගල්කන්දේ ධම්මානන්ද වැනි බෞද්ධ ආශ්‍රමික ප්‍රජාවෙහි චින්තකයින්, ජනවාර්ගික - ආගමික ප්‍රජාවන්

407 ඔබේසේකර, 'Buddhism, Ethnicity and Identity', op. cit. at 192.

408 ගුණතිලක, The Chronic and the Acute, op. cit. at 35-36.

අතර විශ්වාසය ගොඩ නැංවීම සඳහා සාකල්‍ය හා ඇතුළත් කර ගන්නා සුළු ප්‍රවේශයක් ඉල්ලා සිට ඇත.[409]අවසානයේ, ජනවාර්ගික-ආගමික සහජීවනය ළඟා කර ගත හැක්කේ, ස්වකීය ආගම හෝ විශ්වාසය, සම්පත් සඳහා ප්‍රවේශය සහ බලය බෙදීම ලෙස අවබෝධ කර ගැනීම වෙනුවෙන් ප්‍රජාවන් අතර සාමකාමී කොන්දේසි සමාජ-සංස්කෘතික සහ දේශපාලනික සාකච්ඡා ක්‍රියාවලියක් ඔස්සේය.

දෙවනුව, ආගමික නිදහස සහ සමාන පුරවැසිබව සමඟ මූලිකව පරස්පර වන විශ්වාස පද්ධතීන් ආමන්ත්‍රණය කළ යුත්තේ සංස්කෘතික පරිවර්තනමය ක්‍රියාවලියක් ඔස්සේ ය. ආගමික නිදහස සහ සමාන පුරවැසිබව ඉහළ නැංවීම පිළිබඳව වර නගන වාග් මාලාවන්, ආගමික පසමිතුරුතාවන් ප්‍රවර්ධනය කරන තරඟකාරී විශ්වාස පද්ධතීන් විසින් සීමා කරනු ඇත. ශ්‍රී ලංකාවේ හිමිකාරීත්ව සංකීර්ණය, පැවැත්ම පිළිබඳ බිය සහ ව්‍යාතිරේකීයත්වය අන්තර්-ප්‍රජා පසමිතුරුතාවන් ඉහළ දැමීමට හේතු වන අතර, බොහෝ විට ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වයට ද පදනම් වෙයි. බහුතර ප්‍රජාවන් තුළ ඇති ස්වයං දැක්ම මූලිකව හැඩගැස්වීමට සහ සිය පැවැත්මට ඇති තර්ජනයන් තක්සේරු කිරීමට ඒවා ඉවහල් වෙයි. මෙම විශ්වාසයන් යුක්ති සහගත කරන සහ බිහි කරන කතිකාවන් වෙනස් කළ යුතුය.

පුද්ගලයින්ගේ අනන්‍යතා සහ විශ්වාසයන් හැඩ ගස්වනු ලබන තීරණාත්මක කලාපයක් ලෙස ප්‍රාථමික සහ ද්විතීයික පාසල් විෂය නිර්දේශය හැඳින්විය හැකිය. නිදන්ගත සහ සියුම් ප්‍රචණ්ඩත්වය පිළිබඳ අධ්‍යයනයේදී නිරීක්ෂණය කළ අන්දමට, ශ්‍රී ලංකාව සිංහල-බෞද්ධ රටක් ලෙස ද අනෙක් ප්‍රජාවන් 'අනෙකා' ලෙස ද රාමුගත කරනු ලබන සමාජීයකරණ ක්‍රියාවලියකට, පහසුවෙන් වෙනස් කළ හැකි ළමයින්ගේ මනස විවෘත කරනු ලැබේ. 2016 දෙසැම්බර් මස දී ප්‍රකාශයට පත් කළ යුනෙස්කෝ පත්‍රිකාවක මෙසේ දැක්වේ;

ශ්‍රී ලංකාවේ තුළ පෙළපොත් මඟින් දිගු කලක් තිස්සේ ජනවාර්ගික කණ්ඩායම් අතර පසමිතුරුතා පෝෂණය කරනු ලැබීය. සිංහල පෙළපොත්වල ආක්‍රමණික් ලෙස හැඳින් වූ දෙමළ ජනතාව පරාජය කළ සිංහල රජවරුන් සහ වීරයින් පිළිබඳව සඳහන් වෙයි. සැබෑ ශ්‍රී ලාංකිකයින් ලෙස ඉදිරිපත් කරන්නේ සිංහල බෞද්ධයින්ය. පළමුවන විජයබාහු සහ පරාක්‍රමබාහු වැනි රජවරුන් හෝ ප්‍රමුඛ සිංහල දේශපාලනඥයින් වැනි සම්පූර්ණයෙන්ම සිංහල ආදර්ශවත් චරිත පෙළපොත් තුළින් ඉදිරිපත් කරයි. සුළුතර ප්‍රජාවන්හි සිසුන්ට දෙමළ හෝ මුස්ලිම් ආදර්ශවත් චරිත ලෙස හඳුනා ගත හැකි චරිත ඉදිරිපත් නොකරයි.[410]

409 නිදසුනක් සඳහා බලන්න ගල්කන්දේ ධම්මානන්ද හිමි, 'How do we build trust between communities?', public lecture organised by the Movement to Protect Democratic Rights, at https://www.youtube.com/watch?v=v4dqYD4FohE published in October 2017 [last retrieved 5 December 2017]. Also see Yatawara, op. cit.

410 යුනෙස්කෝ, 'Textbooks pave the way to sustainable development', Global Education Monitoring Report – Policy Paper No. 28, December 2016, at 11-12. Also see M. T. A. L. Cardozo, 'Sri Lanka: In Peace or in Pieces? A Critical Approach to Peace Education in Sri Lanka' (2008) 3(1) Research in Comparative and International Education 19-35. මෙම ගැටලුව පිළිබඳව සිය අදහස් සහ විමර්ශන වෙනුවෙන් අයිතිවාසිකම් ක්‍රියාකාරිනී පුනී සෙල්වරත්නම්ට කතුවරයා ස්තුතිවන්ත වෙයි.

යුනෙස්කෝ පත්‍රිකාව සඳහන් කරන්නේ සුළුතර ප්‍රජාවන් පිළිබඳ ‘දැඩි ප්‍රකාශිත ඒකාකෘතීන්’ බැහැර කිරීම සඳහා විෂය නිර්දේශයට මෑතකාලීන ප්‍රතිසංස්කරණ සිදු කරනු ලැබූ නමුත්, බොහෝ පෙළපොත් ‘රටේ සිංහල-කේන්ද්‍රීය ඉතිහාසය’ තුළට සීමා කරනු ලැබ ඇති බවය.[411] අතීතය පිළිබඳව විවේචනාත්මක ආවර්ජනයන් කිරීමට ශිෂ්‍යයින් පොළඹවන අන්දමේ ‘ඓතිහාසික සිදුවීම් පිළිබඳ විකල්ප අර්ථ නිරූපණයන්,, හඳුනා ගැනීමට මෙම පෙළපොත් අසමත් වී තිබේ.[412] ඒ වෙනුවට, ශ්‍රී ලංකාවේ පාසල් විෂය නිර්දේශය ශ්‍රී ලංකාව සිංහල-බෞද්ධ හිමිකමක් ලෙස සමාජීයකරණය වීම යළි බල ගන්වයි. මෙබඳු සමාජීයකරණ ක්‍රියාවලියක් වැඩිහිටි වූ පසුව යළි හැරවීම අසීරුය. එහෙයින් ජනවාර්ගික -ආගමික අධිපතිත්වය සහ අන්තර් ප්‍රජා පසමිතුරුතා හා ‘අවිශ්වාසය’ ඇති කරන කතිකාවන් බැහැර කිරීම අරමුණු කරගත් මූලික විෂය මාලා ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියක් අවශ්‍ය වෙයි.[413] එබඳු මුලපිරීම් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ වත්මන් කතිකාවට මුළුමනින්ම ආගන්තුක නොවේ. නිදසුනක් ලෙස, ‘සමාන ලෙස සිතන්න’ යනුවෙන් නව විෂයයක් ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 12ක මෑතකදී ආදර්ශ විෂයයක් ලෙස හඳුන්වා දෙන ලදී.[414] මෙම නව විෂය යටතේ වයස අවුරුදු තුන සහ හත අතර දරුවන්ට ස්ත්‍රී පුරුෂ සමාජභාවී සංවේදීත්වය සහ සමානාත්මතාව වැනි හරයාත්මක වටිනාකම් උගන්වනු ලැබේ. 2017 අගෝස්තු 1 වන දින, මෙම වැඩසටහන රටේ සියලු පෙර පාසල්වලට හඳුන්වා දීමට කැබිනට් මණ්ඩලයේ අවසර හිමි විය.[415] යම් හෙයකින් මෙබඳු වැඩසටහන් ක්‍රියාත්මක කොට තිරසාර ලෙස හා ඵලදායීව පවත්වාගෙන යන්නේ නම් එය අනාගත පරම්පරාවන් තුළ ආගමික නිදහස සහ සමාන පුරවැසිබව පිළිබඳ සංස්කෘතිකව සුජාත අදහස් ඇති වන සුළු ධනාත්මක පරිවර්තනයක් ඇති කිරීමෙහි ලා වැදගත් වනු ඇත.

පාසල් විෂය නිර්දේශය හැරුණු විට, රාජ්‍යයේ නිල ආඛ්‍යානයන් ද සිංහල-බෞද්ධ හිමිකාරීත්වය පිළිබඳ අදහස යළි බල ගන්වයි. මෙම නැඹුරුව පිළිබඳ නිදසුනක් නම් ජාතික සහජීවන, සංවාද සහ රාජ්‍ය භාෂා අමාත්‍යාංශය විසින් මෑතකදී පළ කළ ශ්‍රී ලංකාවේ වැසියන් නමැති ප්‍රකාශනය මෙයට නිදසුනකි.[416] එක් නිශ්චිත පරිච්ඡේදයක සඳහන් වන අන්දමට, ‘සිංහල-බෞද්ධයින්, දෙමළ-හින්දූන්, සිංහල-ක්‍රිස්තියානීන් සහ මුස්ලිමුන්’ ‘සාමයෙන් සහ සමගියෙන්’ සහජීවනය කිරීම ඉතිහාසය පුරාවටම ‘සිංහල ජාතිය පිළිබඳ සංකේතයක්’ ලෙස සනිටුහන් කරයි.[417] එහි ප්‍රතිඵලයක් ලෙස හැම විටම ශ්‍රී ලංකා රාජ්‍යයේ

411 යුනෙස්කෝ, op. cit. at 11.

412 එම. at 12.

413 මේ විෂය පිළිබඳ හරවත් සාකච්ඡාවක් සඳහා බලන්න ශමාරා වෙත්තමුණි ‘The Danger in Distorted Education: Sri Lanka’s History Curriculum’, Groundviews, 29 October 2016, at http://groundviews.org/2016/10/29/the-danger-in-distorted-education-sri-lankas-history-curriculum/ [last retrieved 26 August 2017].

414 එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය, National report submitted in accordance with paragraph 5 of the annex to Human Rights Council resolution 16/21: Sri Lanka (24 August 2017), A/HRC/WG.6/28/LKA/1, at para.29.

415 එම.

416 ජාතික ඒකාබද්ධතා, සංවාද සහ රාජ්‍ය භාෂා අමාත්‍යාංශය, People of Sri Lanka (2017).

417 එම at 14.

නිල ආඛ්‍යානය වී ඇත්තේ ශ්‍රී ලංකාව 'සිංහල ජාතියට' අයත්ව තිබූ බවය. මෙම ආඛ්‍යානය සිංහල-බෞද්ධයින්ගේ හිමිකාරීත්ව සංකීර්ණය බිහි කිරීමට දායක වන අතර, රටේ අයිතිය නීත්‍යානුකූලව සියලු ජාතීන්ට තහවුරු වන ජනවාර්ගික -ආගමික සම්බන්ධතා අර්ථවත් ලෙස පරිවර්තනය කිරීමේ අපේක්ෂාවන් බිඳ දමයි. මෙම ස්වභාවයේ නිල ආඛ්‍යානයන් නවතා ඒ වෙනුවට බහුවිධභාවයේ ඓතිහාසිකත්වයන් සහ සමාන පුරවැසිබව ස්ථාපනය කරන ආඛ්‍යානයන් ගෙන ආ යුතුය.

සංස්කෘතික කතිකාවන් බිහි කරන සහ වෙනස් කරන තීරණාත්මක කලාපයක් ලෙස සමාජ මාධ්‍ය ද පෙනී සිටී. ශිල්පා සමරතුංග සහ සංජන හත්තොට්ටුව නිරීක්ෂණය කරන පරිදි, ආගමික සුළුතරයන්ට එරෙහි වෛරී ප්‍රකාශ සඳහා වේදිකාවක් බවට සමාජ මාධ්‍ය පත් විය හැකිය.[418] එමෙන්ම, ප්‍රජා හිමිකම් සහ පැවැත්ම පිළිබඳ පිළිගැනීම් අවුස්සන සහ යළි බලාත්මක කරන ප්‍රචාරණ පතුරුවා හැරීමට යුධකාමී කණ්ඩායම් සමාජ මාධ්‍ය ජාල භාවිතා කරති. මේ අනුව ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය කෙරෙහි මඟ පෙන්වන විෂ සහිත තත්ත්වයන් ස්ථාපනය කිරීමට සමාජ මාධ්‍ය දායක විය හැකිය; (සමාජ මාධ්‍යවල පැමිණීමට පෙර ලියන ලද ලියවිල්ලක) ස්ටැන්ලි තම්බයියා එය හඳුන්වන්නේ 'අගතීන් සහ පාපිෂ්ඨබව පිළිබඳ කටකතා රැළි' යනුවෙනි.[419] විකෘති කරන ලද අදහස් සහ ක්‍රියාකාරී ප්‍රචණ්ඩත්වය බොහෝ විට 'සමාන්තර සහ පරිපූරණය වන ක්‍රියාවලීන්'[420] බව ඔහුගේ නිරීක්ෂණයයි. මෙබඳු කටකතා බිහි වීම සහ ප්‍රචාරය කිරීම 2017 නොවැම්බර් මස ගිංතොට සිදුවීමේ දී නිරීක්ෂණය විය. සමහර වාර්තාවලට අනුව, ගිංතොට සිංහල වැසියන්ට මුස්ලිම්වරුන් විසින් ප්‍රහාරයක් දියත් කිරීමට නියමිත යයි කටකතා සමාජ මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය වීමත් සමඟ ප්‍රචණ්ඩත්වය මුදා හැරුණි.[421] එහෙයින්, ආගමික නිදහස සහ සමාන පුරවැසිබව ආරක්ෂා කිරීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ සමස්ත ව්‍යාපෘතිය තුළ සමාජ මාධ්‍ය අවකාශයන්හි හඬ සමඟ විවේචනාත්මකව සම්බන්ධ වීම වැදගත් වේ.

එහෙත්, ජනවාර්ගික සහ ආගමික වෛරය මැඩ පැවැත්වීමට සහ ජාතික ආරක්ෂාව සුරැකීමේ අරමුණින් සමාජ මාධ්‍ය මත පැනවෙන රාජ්‍යයේ අතිමහත් නියාමනයට විරෝධය දැක්විය යුතුය. සමාජ මාධ්‍ය පාලනය කිරීමේ අපේක්ෂාවන් රාජ්‍ය ක්‍රියාකාරිකයින් විසින් එක් වරකට වඩා ප්‍රකාශ කොට තිබේ. නිදසුනක් ලෙස, 2014 දී හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ ප්‍රකාශ කළේ 'ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාවට ඇති අවසන් තර්ජනය

418 ශිල්පා සමරතුංග සහ සංජන හත්තොටුව, op. cit. at 21.

419 ස්ටැන්ලි ජේ. තම්බයියා, Leveling Crowds: Ethnonationalist Conflicts and Collective Violence in South Asia (University of California Press 1997), at 291.

420 Ibid.

421 Social Media Rumours Escalate Buddhist-Muslim Violence in Sri Lanka', Global Voices, 23 November 2017, at https://globalvoices.org/2017/11/23/social-media-rumors-escalate-buddhist-muslim-violence-in-sri-lanka/ [last retrieved 5 December 2017].

නම් සමාජ මාධ්‍ය ඇතුළුව තාක්ෂණය විසින් මෙහෙයවනු ලබන නව මාධ්‍ය' වන්නේය.[422] අගමැති රනිල් වික්‍රමසිංහ වැනි වත්මන් රාජ්‍ය නිලධාරීන් ද 'අන්තවාදය' වැළැක්වීමේ අරමුණින් සමාජ මාධ්‍ය නියාමනය කිරීමේ කැමැත්ත ප්‍රකාශ කොට තිබේ.[423] එමෙන්ම, මෑතකාලීන ගිංතොට සිදුවීම විසින් සමාජ මාධ්‍ය නියාමනය කිරීම සඳහා රාජ්‍යයේ අරමුණට තවදුරටත් අවස්ථාව ලබා දී තිබේ.[424]

එහෙත්, බීල්ෆෙල්ඩ් සහ තවත් ය මෙබඳු ප්‍රවේශයක් පිළිබඳව සක පහළ කරන අතර, එයට ප්‍රාථමික හේතුව නම් 'අන්තවාදය' රාමුගත කරන්නේ සහ අර්ථ නිරූපණය කරන්නේ කෙසේද යන්න අවිනිශ්චිත වන හෙයිනි.[425] ඔවුන් තර්ක කරන්නේ මෙබඳු ආකාරයට රජය විසින් නියාමනය කිරීම 'ආගමික ප්‍රජාවන් මත රාජ්‍යයේ පාලනය තීරණාත්මක ලෙස ඉහළ නංවන' බවය. ශ්‍රී ලාංකික සන්දර්භය තුළ මෙම නියාමනය විශේෂයෙන්ම ප්‍රශ්නකාරී වන්නේ රාජ්‍යය බහුතරය වෙත වෙනස් ඉහළ සැලකීමක් සිදු කරන හෙයිනි. ප්‍රචණ්ඩත්වය වැළැක්වීමට වඩා සුළුතර ප්‍රජාවන් ආගම පිළිබඳව කරන පරිපූර්ණ ලෙස යුක්ති සහගත කතා සහ ප්‍රකාශන මැඩ පැවැත්වීමට මෙමගින් මග පාදා දිය හැකිය. ප්‍රචණ්ඩත්වය ඇති කිරීම පිළිබඳ නීති බලාත්මක කිරීම අරමුණු කරගත් ප්‍රවේශයක් සහ සමාජ මාධ්‍යවල සිදු වන ද්වේෂ සහගත ප්‍රකාශවලට එරෙහි ප්‍රති-පණිවුඩ යැවීමේ ක්‍රමවේදයක් අත්‍යවශ්‍ය වනු ඇත.[426] වෛරී ප්‍රකාශන මැඩ පැවැත්වීමට රාජ්‍යය විසින් සිදු කරන නියාමනයට විකල්ප ලෙස Rabat Plan of Action වැනි ක්‍රමවේද ඇත්තෙන්ම යෝජනා කරන්නේ මෙම ප්‍රති-පණිවුඩ යැවීමයි.[427] වැදගත් කරුණ නම්, අන්-නයීම් සහ ඉග්නාටිෆ් වැනි ශාස්ත්‍රඥන් සමාන වාග් මාලාවන් භාවිතා කිරීම පිළිබඳව දැරූ කේන්ද්‍රීය අදහස් එමගින් යළි බලාත්මක කිරීමයි. 'ජාත්‍යන්තරව පිළිගත් මානව හිමිකම් පිළිගැනීම සහ ප්‍රමිතීන් හා සැසඳෙන ධනාත්මක සාම්ප්‍රදායික වටිනාකම්වලට වෛරය ඇවිස්සීමට එරෙහිව ක්‍රියා කළ හැකි වනු ඇත' යනුවෙන් එය පවසයි.[428] එහෙයින්, සමාජ මාධ්‍ය ඔස්සේ පැතිරෙන හානිකර කතිකාවන්ට එරෙහි වීම වූ කලී, ශ්‍රී ලංකාවේ ආගමික නිදහස සහ සමාන පුරවැසිබව සංස්කෘතිකව සුජාතකරණය කිරීම සඳහා වැදගත් ක්‍රියාකාරකමක් වෙයි.

---

422 ගෝඨාභය රාජපක්ෂ, 'Reconciliation will enhance national security', The Sunday Observer, 31 August 2014, http://www.sundayobserver.lk/2014/08/31/fea02.asp [Last retrieved on 26 August 2017].

423 අමාලි මල්ලවආරච්චි, 'Laws needed to regulate social media: Premier', The Daily News 14 December 2016, at http://dailynews.lk/2016/12/14/local/101872 [last retrieved 27 August 2017].

424 'Gintota situation under control, 19 arrested', The Daily Mirror, 18 November 2017, http://www.dailymirror.lk/140639/Gintota-situation-under-control-arrested [last retrieved 5 December 2017].

425 Rabat Plan of Action on the Prohibition of Advocacy of National, Racial or Religious Hatred that constitutes Incitement to Discrimination, Hostility or Violence (Conclusions and recommendations emanating from the four regional expert workshops organised by OHCHR, in 2011, and adopted by experts in Rabat, Morocco on 5 October 2012) (2012).

426 ඩිජිටල් අවකාශය නියාමනය පිළිබඳ විග්‍රහයක් සඳහා බලන්න නාලක ගුණවර්ධන, Digital Transformation in Sri Lanka: Opportunities and Challenges in Pursuit of Liberal Policies (Friedrich Naumann Foundation 2017), at 74-78.

427 Rabat Plan of Action on the Prohibition of Advocacy of National, Racial or Religious Hatred that constitutes Incitement to Discrimination, Hostility or Violence (Conclusions and recommendations emanating from the four regional expert workshops organised by OHCHR, in 2011, and adopted by experts in Rabat, Morocco on 5 October 2012) (2012).

428 එම at para.27.

ශ්‍රී ලංකාවේ සංස්කෘතික පරිවර්තනයේ මන්දගාමී ක්‍රියාවලිය පදනම් වන්නේ, ආගමික නිදහස සහ සමාන පුරවැසිබව හා සමපාත වන සාමාන්‍ය ගතිගුණ සහ පොදුවේ පිළිගත් වටිනාකම් ප්‍රවර්ධනය කිරීම මතය. එමෙන්ම එය එකී නිදහස සහ පුරවැසිබව ප්‍රතික්ෂේප කරන පසමිතුරුකාරී කතිකාවන් සහ ආඛ්‍යානයන් බැහැර කිරීම මත ද පදනම් වෙයි. මෙම පරිවර්තන ක්‍රියාවලියේ අවසාන ඉලක්කය නම් භෞතික, භෞතික නොවන සහ ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වයන් මුල් බැස ගැනීම නතර වන සමාජයකි.

මෙම අධ්‍යයනය සිදු කරනු ලැබුවේ ශ්‍රී ලංකාවේ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය වූ කලී සංස්කෘතික, සමාජ-දේශපාලනික සහ රාජ්‍ය ව්‍යුහයන් තුළ 'මුල් බැසගත්' එකක් වන්නේය යන්න සහ එය පිටුදැකීම සඳහා රැඩිකල් මැදිහත් වීම අවශ්‍ය වන්නේය යන උපකල්පනයන් සාක්ෂාත් කිරීම සඳහා ය. එය පළමුවෙන්ම ශ්‍රී ලංකාවේ ප්‍රජා ප්‍රචණ්ඩත්වයේ ස්වභාවය විමසා බැලූ අතර, එකී ප්‍රචණ්ඩත්වය අප අවබෝධ කර ගන්නේ කෙසේද යන්න ගැන යළි සිතා බැලීමට ඇරයුම් කරන ලදී. සිංහල-බෞද්ධ බහුතර ප්‍රජාව සහ සුළුතර ප්‍රජාවන් අතර සිදු වන ප්‍රචණ්ඩත්වය වූ කලී වෙන් වෙන් 'ජනවාර්ගික' සහ 'ආගමික' ගැටුම් නොව, තනි 'ජනවාර්ගික-ආගමික' ගැටුමක කොටසක් වන්නේ යයි එය තර්ක කළේය. මෙම සන්දර්භය තුළ ශ්‍රී ලංකාවේ ගැටුම 'ජනවාර්ගික' මෙන්ම 'ආගමික' ගැටුම් යන ස්වභාවයන් දෙකම දරා සිටී. එමෙන්ම, මෙබඳු ආකාරයේ ප්‍රචණ්ඩත්වයන්ගේ සංයුක්ත බලපෑම සුවිශේෂී ලෙස හික්මිය නොහැකි සහ 'මුල් බැස ගත්' ලක්ෂණ බිහි කොට ඇති අතර, එමගින් ශ්‍රී ලංකාවේ ජනවාර්ගික-ආගමික ගැටුම විසඳීම විශේෂයෙන් අභියෝගාත්මක එකක් බවට පත් කොට තිබේ.

විශේෂයෙන්ම නිදන්ගතව පවතින ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය 2015 ජනවාරි ප්‍රජාතන්ත්‍රවාදී සංක්‍රාන්තියෙන් පසුව ද පවතී බව මෙම අධ්‍යයනය තුළින් අවධාරණය කෙරිණ. එහෙයින්, රටේ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය අවසන් කිරීමෙහි ලා ආණ්ඩු වෙනස කර ඇත්තේ අඩු බලපෑමකි. මේ අතරතුර, සිංහල-බෞද්ධ යුධකාමී කණ්ඩායම් ප්‍රධාන ධාරාවට එක් වීම, මුස්ලිම් ප්‍රජාවන් ඇතුළත සිදු වූ බණ්ඩනයන් සහ දෙමළ-හින්දුත්වයේ යළි පිබිදීම ඇතුළුව රටේ සිදු වූ නව සංවර්ධනයන් ජනවාර්ගික-ආගමික ආතතීන් තවත් සංකීර්ණ කිරීමට සහ සම්මිශ්‍රණය කිරීමට හේතු වී තිබේ. එහෙයින් ශ්‍රී ලංකාවේ වත්මන් හික්මිය නොහැකි ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය වූ කලී සංස්කෘතික සහ සමාජ-දේශපාලනික පසුබිමෙහි කොටසක් ලෙස මුල් බැසගෙන ඇතැයි යන්න නිගමනය කළ හැකිය. මෙම සන්දර්භය තුළ එකී ප්‍රචණ්ඩත්වය යටින් ඇති මෙහෙයවීම් පිළිබඳව තවදුරටත් ආවර්ජනය කර බැලීමට මෙම අධ්‍යයනය ඇරයුම් කර සිටියේය.

ශ්‍රී ලංකාවේ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වයේ කේන්ද්‍රයෙහි ප්‍රධාන මෙහෙයවීම් තුනක් දක්නට ලැබේ. පළමුවැන්න, සුවිශේෂී හිමිකාරීත්ව සංකීර්ණයක් කෙරෙහි මග පාදා ඇති දශක ගණනාවක සමාජීයකරණයකට සිංහල-බෞද්ධ ප්‍රජාව ලක්ව තිබීමයි.

මෙම සංකීර්ණය ප්‍රජාවේ බොහෝ දෙනාට තමා ශ්‍රී ලංකාවේ නියම හිමිකරුවන් සහ 'සත්කාරකයින්' ලෙස හඳුන්වා ගැනීමට හේතු වී තිබේ. මෙම හෙජමොනික තත්ත්වයට සුළුතර ප්‍රජාව විසින් කරනු ලබන ඕනෑම බරපතල තර්ජනයක්, තියුණු ප්‍රතිවිරෝධයකින් මෙල්ල කරනු ලබන අතර, එය බොහෝ විට ප්‍රචණ්ඩත්වය කෙරෙහි හේතු වී තිබේ. දෙවැන්න, දෙමළ, ක්‍රිස්තියානි සහ මුස්ලිම් වැසියන් හා බැඳුණු ගෝලීය අනන්‍යතා විසින්, ශ්‍රී ලංකාව සිය එකම නිජ බිම ලෙස දකින සිංහල-බෞද්ධයින් අතර 'සුළුතර-සංකීර්ණය' (minority complex) ඇති කොට තිබේ. එහෙයින්, ස්වයං නිර්ණය සඳහා වන දෙමළ ඉල්ලීම්, ක්‍රිස්තියානි අන්‍යාගමිකකරණය සහ ඉස්ලාමීයකරණය වැනි දේශීය කතිකාවන් සිංහල-බෞද්ධ ප්‍රජාව තුළ පැවැත්ම පිළිබඳ බියක් ඇති කොට තිබේ. යුධකාමී කණ්ඩායම් හැම විටම සිංහල-බෞද්ධයින් සමඟ සමපාත වන්නේ මන්දැයි යන ප්‍රශ්නයට සහ ජනවාර්ගික-ආගමික ආතතීන් පහසුවෙන් ප්‍රචණ්ඩත්වය තෙක් තීව්‍ර වන්නේ කෙසේද යන ප්‍රශ්නයට පිළිතුර මෙම බියයි. තුන්වනුව, රාජ්‍යයේ නීතියද යටත් වන බලවත් සමාජ-දේශපාලනික බලවේගයක් ලෙස බෞද්ධ ආගික නායකත්වය දැක්විය හැකිය. මෙම ආශ්‍රමික ව්‍යතිරේකීත්වය විසින් ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය සිදු කරන්නන්, විශේෂයෙන් මෙම හිංසනය ප්‍රාදේශීය මට්ටමින් බෞද්ධ භික්ෂූන් විසින් සිදු කරනු ලැබූ විට ඔවුන් වගවීමට ලක් කිරීමට නීතිය බලාත්මක කරන ආයතන පසුබට වීමට තරම් දණ්ඩ මුක්තිය පිළිබඳ සංස්කෘතියක් නිර්මාණය කොට තිබේ. මෙම සාධක තුන එක්ව ශ්‍රී ලංකාවේ සංස්කෘතික, සාජ-දේශපාලනික සහ රාජ්‍ය ව්‍යුහයන් තුළ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය මුල් බැස ගැනීමට හේතු වෙයි.

ශ්‍රී ලංකාවේ මුල් බැසගත් ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය තුරන් කිරීමේ විකල්ප ප්‍රවේශයක් පිළිබඳව මෙම අධ්‍යයනය විමසා බැලීය. ප්‍රචණ්ඩත්වය මැඩ පැවැත්වීමෙහි ලා නීතියේ ආධිපත්‍යයේ සහ රාජ්‍යය කේන්ද්‍ර කර ගත් මානව හිමිකම් ප්‍රවේශවල පවතින බරපතල සීමාවන් එය පෙන්වා දුන්නේය. රාජ්‍යය ද බහුතරවාදී න්‍යාය පත්‍රයක් සහිත වූවක් බැවින් ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය අවසන් කිරීම සඳහා රාජ්‍යය මතම අපේක්ෂාවන් දල්වා ගැනීම අසාර්ථක සහ නොගැලපෙන ක්‍රියාවකි. ඒ වෙනුවට, සියලු මට්ටම්වල සහජීවනය ප්‍රවර්ධනය කරා සංස්කෘතික පරිවර්තන ක්‍රියාවලියක් මෙම අධ්‍යයනය තුළින් නිර්දේශ කොට තිබේ. එමෙන්ම, එබඳු ව්‍යාපෘතියක භාවිතා වන වාග් මාලාව 'සමපාත' වන්නක් විය යුතු යයිද එය යෝජනා කළේය. එහෙයින්, ආගමික නිදහස සහ සමාන පුරවැසිබව පිළිබඳ රාමුවක් තුළ සහජීවනයෙන් විසීමේ වැදගත්කම සම්බන්ධයෙන් බහුතර සහ සුළුතර ප්‍රජාවන්ට අවධාරණය කිරීමට නම්, 'සාමාන්‍ය ගතිගුණ' සහ 'පොදුවේ පිළිගත් වටිනාකම්' කෙරෙහි විශ්වාසය තැබිය යුතුය. එබඳු ව්‍යාපෘතියක ඉලක්කය වන්නේ ශ්‍රී ලංකාවේ ගැටෙන ප්‍රජාවන්හි මූලික කොන්දේසි, ගැඹුරු තරඟකාරීත්වයේ හා පසමිතුරුතාවයේ සිට ප්‍රත්‍යුපකාරය සහ අන්‍යෝන්‍ය ගරුත්වය තෙක් පරිවර්තනය කිරීමයි.

# නිදන්ගතව, මුල්බැසගෙන ඇති ශ්‍රී ලංකාවේ ජනවාර්ගික - ආගමික ප්‍රචණ්ඩත්වය

**ගෙහාන් ගුණතිලක**

2015 ජනවාරි මස සිදු වූ ප්‍රජාතන්ත්‍රවාදී සංක්‍රාන්තිය ශ්‍රී ලංකාවේ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වයට තිත තැබීමට පොරොන්දු විය. වසර තුනකට අධික කාලයකින් අනතුරුව එම පොරොන්දුව තවමත් ඉටු කළ යුත්තක්ව පවතී. ආණ්ඩු වෙනස සිදු වුවද, ආගමික සුළුතරයන්ට එරෙහි නිධන්ගත ප්‍රචණ්ඩත්වය රට පුරා දිගටම පැවතුණි. ශ්‍රී ලංකාවේ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය මෙහෙයවන්නේ කවරක් ද යන්න තවදුරටත් විමසා බැලීමට මෙම සංසිද්ධිය විසින් පොළඹවනු ලැබේ. යම් ආකාරයක ප්‍රචණ්ඩත්වයක් රජයේ අනුග්‍රහය නොලත් ගැඹුරින් මුල් බැසගත් අගතීන් සහ විශ්වාසයන් තුළින් පැන නගින බව සහ ප්‍රජාතන්ත්‍රවාපරිවර්තනයක් තුළින් පමණක් ආමන්ත්‍රණය කළ නොහැකි යයි එය පෙන්වා දෙයි; සමකාලීන ශ්‍රී ලංකාවේ ප්‍රජා ප්‍රචණ්ඩත්වයට මුල්බැස ගත හැකි වීමේ ස්වභාවය ද එය පෙන්වා දෙයි.

මෙම අධ්‍යයනය පශ්චාත් 2015-ජනවාරි සන්දර්භය කැණ බලා, ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය පැවතුණේ කෙසේද යන්න අධ්‍යනය කරයි. එකී ප්‍රචණ්ඩත්වය මුල් බැස ගැනීමට හේතු වූ යම් සාධක එය සාකච්ඡා කරයිඃ එනම්, සිංහල බෞද්ධ හිමිකාරීත්ව සංකීර්ණය සහ පැවැත්ම පිළිබඳ බිය මෙන්ම බෞද්ධ ආගමික නායකත්වය හා බැඳුණු ව්‍යතිරේඛීයත්වය යනාදියයි. මෙම සාධක සියල්ලක්ම ශ්‍රී ලංකාවේ සංස්කෘතික සහ සමාජ-දේශපාලනික පසුබිම තුළට කා වැදී ඇති අතර ශ්‍රී ලංකා රාජ්‍යයේ ස්වභාවය මූලිකව හැඩ ගස්වනු ලබයි. මෙම සන්දර්භය තුළ ශ්‍රී ලංකාවේ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය තුරන් කිරීමේ වත්මන් ප්‍රවේශයන් ප්‍රමාණවත් නොවන බව මෙම අධ්‍යනය මඟින් පෙන්වා දෙයි. එබඳු ප්‍රවේශයන් රාජ්‍ය-කේන්ද්‍රීය මෙන්ම ආයතන ශක්තිමත් කිරීම පිළිබඳව අවධානය යොමු කර තිබේ. ජනගහණයෙන් තුනෙන් දෙකකට වඩා පොදු වන ජනවාර්ගික-ආගමික අනන්‍යතා අර්බුදය යටපත් කිරීම, එය තීව්‍ර වීමට සහ රාජ්‍ය ව්‍යුහයන් ක්ෂය කරමින් දිගටම පැවතීමට හේතු වී තිබේ. එකී ක්ෂය වීම දණ්ඩ මුක්තිය අහෝසි කිරීමට සහ ආගමික නිදහස ඉහළ නැංවීමට රජයට ඇති ශක්‍යතාව හා උනන්දුව මන්දගාමී කොට තිබේ. එහෙයින් මෙම අධ්‍යයනය නිගමනය කරන්නේ ශ්‍රී ලංකාවේ ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය අවසන් කිරීම වූ කලී සැබෑ සහ අර්ථවත් සංස්කෘතික පරිවර්තන ක්‍රියාවලියකින් තොරව සිදු කළ නොහැක්කක් වන බවය.

INTERNATIONAL CENTRE FOR ETHNIC STUDIES

equitas
Centre international d'éducation aux droits humains
International Centre for Human Rights Education

ISBN 978-955-580-215-4

Printed by **Horizon Printing (Pvt) Ltd.**